87 වන කාණ්ඩය
2 වන කලාපය

සෙනසුරාදා
1969 අගෝස්තු 30

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

## නිල වාර්තාව

### අන්තර්ගත ප්‍රධාන කරුණු

රජයේ ගිණුම් කාරක සභාවේ වාර්තාව [තී. 253]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තී. 254]

වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්නය : නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ වැඩ කටයුතු පිළිබඳව 69.8.30 දින "සිරිලක" පත්‍රයේ පළවූ වාර්තාව [තී. 274]

විසර්ජන පනත් කෙටුම්පත (1969-70) [තී. 276] [එකොළොස් වන වෙන් කළ දිනය] :

ශීර්ෂ 14-18 කාරක සභාව විසින් සළකා බලන ලදී.

පරිපූරක මුදල් [තී. 461]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 87
இல. 2

சனிக்கிழமை
30 ஓகஸ்ட் 1969

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

## பிரதிநிதிகள் சபை

அதிகார அறிக்கை

பிரதான உள்ளடக்கம்

அரசாங்கக்கணக்குக் குழு அறிக்கை [ப. 253]

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப. 254]

சிறப்புரிமை விடயம் : 30.8.69 " ஸ்ரீலக " ப் பத்திரிகையின் சபைநிகழ்ச்சி அறிக்கை [ப. 274]

ஒதுக்கீட்டு மசோதா (1969–70) [ஒதுக்கப்பட்ட பதினோராம் நாள்] [ப. 276] :
குழுவில் ஆராயப்பட்டது (தலைப்புக்கள் 14–18)

குறைநிரப்புத்தொகை [ப. 461]

---

Volume 87
No. 2

Saturday
30th August 1969

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

PRINCIPAL CONTENTS

PUBLIC ACCOUNTS COMMITTEE REPORT [Col. 253]

ORAL ANSWERS TO QUESTIONS [Col. 254]

QUESTION OF PRIVILEGE : REPORT OF PROCEEDINGS OF HOUSE IN " SIRILAKA " OF 30.8.69 [Col. 274]

APPROPRIATION BILL (1969-70) [Eleventh Allotted Day] [Col. 276] :

Considered in Committee (Heads 14-18)

SUPPLEMENTARY SUPPLY [Col. 461]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

பிரதிநிதிகள் சபை

House of Representatives

**1969 අගෝස්තු 30 වන සෙනසුරාදා**

சனிக்கிழமை, 30 ஓகஸ்ட் 1969

*Saturday, 30th August 1969*

---

**පූ. භා. 10 ට මන්ත්‍රී මණ්ඩලය රැස් විය. කථානායකතුමා [ගරු එස්. සී. ෂර්ලි කොරයා] මූලාසනාරූඪ විය.**

சபை, மு. ப. 10 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [கௌரவ எஸ். சி. ஷேளி கொறயா] தலைமை தாங்கினார்கள்.

*The House met at 10* A.M., MR. SPEAKER [THE HON. S. C. SHIRLEY COREA] *in the Chair.*

---

## රජයේ ගිණුම් කාරක සභාවේ වාර්තාව

அரசாங்க கணக்குக் குழு அறிக்கை

## PUBLIC ACCOUNTS COMMITTEE REPORT

**ටී. බී. ඉලංගරත්න මයා.** (කොලොන්නාව)

(திரு. ரீ. பி. இலங்கரத்ன—கொலொன்னவ)

(Mr. T. B. Ilangaratne—Kolonnawa)

ගරු කථානායකතුමනි, රජයේ ගිණුම් කාරක සභාවේ සභාපති තැන්පත් දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) වෙනුවෙන් 1967-68 මුදල් වර්ෂය සඳහා වූ ලංකාණ්ඩුවේ ගිණුම්ද, ඒ පිළිබඳ ඔඩිටර් ජනරාල්ගේ වාර්තාවේ හතරවන කොටසද සම්බන්ධයෙන් රජයේ ගිණුම් කාරක සභාව විසින් එම කාරක සභාවේ කටයුතු සහ සාක්ෂි සටහන්ද ඇතුළත්ව, නිකුත් කළ දෙවැනි වාර්තාව මම ඉදිරිපත් කරමි.

**ගරු සී. පී. ද සිල්වා (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති හා සභානායක)**

(கௌரவ சீ. பீ. டி சில்வா—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரும் சபை முதல்வரும்)

(The Hon. C. P. de Silva—Minister of Land, Irrigation and Power and Leader of the House)

I move,

"That the Second Report from the Public Accounts Committee on the Accounts of the Government of Ceylon for the Financial Year 1967-68 and the Fourth Instalment of the Report of the Auditor-General thereon together with the Proceedings of the Committee and the Minutes of Evidence be printed."

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

**වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.**

அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.

*Ordered that the Report be printed.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු

வினாக்களுக்கு வாய்மூல விடைகள்

## ORAL ANSWERS TO QUESTIONS

### ජේ. එෆ්. බී. ජෝන්පිල්ලේ මහතා, ප්‍රධාන ආරක්ෂක නිලධාරි, කොළඹ මහ නගර සභාව

திரு. ஜெ. எப். பீ. யோன்பிள்ளை, பிரதம பாதுகாப்பு உத்தியோகத்தர், கொழும்பு மாநகர சபை

**MR. J. F. B. JOHNPILLAI, CHIEF SECURITY OFFICER, COLOMBO MUNICIPALITY**

**3. එස්. ඩී. බණ්ඩාරනායක මයා.** (ගම්පහ)

(திரு. எஸ். டீ. பண்டாரநாயக்க—கம்பஹ)

(Mr. S. D. Bandaranayake—Gampaha)

පළාත් පාලන ඇමති සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්ගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) කොළඹ මහ නගර සභාව, ජේ. එෆ්. බී. ජෝන්පිල්ලේ මහතා කොළඹ මහ නගර සභාවේ ආරක්ෂක සේවයේ ප්‍රධාන ආරක්ෂක නිලධාරියා වශයෙන් බඳවාගෙන ඇති බව එතුමා දන්නේද? (ආ) 68.9.24 දින ඒ/148/67 යොමු අංකය සහිත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලිපිය සහ 68.10.15 දින ජී. ඕ. 343 දරණ ඉන්ස්පැක්ටර් ජනරාල්ගේ නියෝගය අනුව, සහකාර පොලිස් අධිකාරිවරයකුව සිටි ජේ. එෆ්. බී. ජෝන්පිල්ලේ මහතා සාමාන්‍ය අකාර්යක්ෂමතාව හේතු කොටගෙන රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනිවාර්යයෙන් විශ්‍රාම


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. ඩී. බණ්ඩාරනායක මයා.]

යැවුණු බව එතුමා දන්නේ ද? (ඉ) රජයේ සේවකයකු වශයෙන් අකාර්යක්ෂම වූ බව පෙනී ගොස් අනිවාර්යයෙන් විශ්‍රාම යවනු ලැබ සිටි නිළධාරියකු ආරක්ෂක සේවයේ ප්‍රධානියා වශයෙන් කොළඹ මහ නගර සභාව විසින් බඳවාගන්නා ලද්දේ කවර හේතුන් මත ද? (ඊ) ජෝන් පිල්ලේ මහතා කොළඹ මහ නගර සභාවේ සේවයට බඳවා ගැනීමට පෙර, ඔහු පොලිස් සේවයෙන් විශ්‍රාම ගත්තේ මන්දැයි කොළඹ නගරාධිපති විසින් විමසා බලන ලද්දේ ද? (උ) නගරාධිපති මෙම කරුණ නොදැන සිටියේ නම්, තත්ත්වය නිවැරදි කරනු පිණිස වහා පියවර ගන්නා ලෙස එතුමා නගරාධිපතිට නියෝග කරන්නේ ද? (ඌ) රජයේ හෝ පළාත් පාලන සේවයේ යෙදී සිට සාමාන්‍ය අකාර්යක්ෂම තාව හේතු කොටගෙන විශ්‍රාම යැවුණු පුද්ගලයින්ට රජයේ, පළාත් පාලන ආයතනවල සහ සංස්ථාවල නැවත රක්ෂා ලබාදීම පිළිබඳව මෙම රජයේ හා රජයේ වගකීම ඇති සංස්ථාවල ප්‍රතිපත්තිය කුමක් ද?

உள்ளூராட்சி அமைச்சரும், தகவல், ஒலி பரப்பு அமைச்சரின் பாராளுமன்றக் காரிய தரிசியுமானவரைக் கேட்ட வினு: (அ) கொழும்பு மாநகர சபையின் பாதுகாப்புச் சேவைக்கு பிரதம பாதுகாப்பு உத்தியோகத் தராக கொழும்பு மாநகர சபை திரு. ஜே. எப். பீ. யோன்பிள்ளையை அமர்த்தி இருப் பதை அவர் அறிவாரா? (ஆ) பொது சே. ஆ. அனுப்பியதும் A/148/67 இலக்கமிடப் பட்டதும் 24.9.68 தேதியிடப்பட்டதுமான கடிதப்படிக்கும் பொலிசுப் பரிசோதகர் தலைமை அதிபதி அனுப்பியதும் ஜி. ஓ. 343 இலக்கமிடப்பட்டதும் 15.10.68 அன்று பிறப் பிக்கப்பட்டதுமான கட்டளையின் படிக்கும் பொ. சேவை ஆணைக்குழுவினால் பொது திற மையின்மை காரணமாக கட்டாயமாக இளைப் பாற்றப்பட்ட பொலிசு உதவி அத்தியட்சர் திரு. ஜே. எப். பி. யோன்பிள்ளை என்பதை யும் அவர் அறிவாரா? (இ) அரசாங்கச் சேவை திறமையற்றவர் என்று கட்டாயமாக இளைப்பாற்றப்பட்ட இவரை பாதுகாப்புச் சேவையின் தலைவர் பதவிக்கு எந்த அடிப் படையிலே கொழும்பு மாநகர சபை சேர்த் தது? (ஈ) கொழும்பு மாநகர சபை சேவைக்கு சேர்ப்பதற்கு முன்னதாக திரு. யோன்பிள்ளை பொலிசுச் சேவையிலிருந்து இளைப்பாறியதன் உண்மைகளை நகராதிபதி கவனித்தாரா? (உ) நகராதிபதி இந்த உண் மையை உணர்ந்திருந்தாரில்லையெனில் இந் நிலையை திருத்திக்கொள்வதற்கான உடன் நடவடிக்கை எடுக்கும்படி அவர் நகராதிபதி யைப் பணிப்பாரா? (ஊ) அரசாங்கச் சேவை, உள்ளூராட்சிச் சேவை, கூட்டுத்தாபனங் களின் சேவை ஆகியவற்றில் மீண்டும் வேலைக் கமர்த்திக் கொள்வதைப்பற்றி இந்த அரசாங் கத்தின் கொள்கை என்ன?

asked the Minister of Local Government and Parliamentary Secretary to the Minister of Information and Broadcasting: (*a*) Is he aware that the Colombo Municipal Council has employed Mr. J. F. B. Johnpillai as the Chief Security Officer to the Security Service of the Colombo Municipal Council? (*b*) Is he aware that Mr. J. F. B. Johnpillai was an assistant Superintendent of Police who had been retired by the Public Service Commission for general inefficiency compulsorily, vide P.S.C. letter No. A/148/67 of 24.9.68 and I.G's order G.O. 343 of 15.10.68? (*c*) On what basis has the Colombo Municipal Council recruited to the head of the Security Service an officer who had been already found inefficient as a government servant and compulsorily retired? (*d*) Did the Mayor of Colombo check on the facts as to why Mr. Johnpillai had retired from the Police Service before recruiting this person to the Colombo Municipal Council? (*e*) If the mayor had been unaware of this fact will he direct the mayor to take immediate action to have this position corrected? (*f*) What is the policy of this Government and government-sponsored corporations in respect of offering re-employment in Government, local government bodies and corporations to persons who had been in government or local government service and retired for general inefficiency?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ආර්. ප්‍රේමදාස (පළාත් පාලන ඇමති සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(கௌரவ ஆர். பிரேமதாச—உள்ளூராட்சி அமைச்சரும் தகவல், ஒலிபரப்பு அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசியும்)*

(The Hon. R. Premadasa—Minister of Local Government and Parliamentary Secretary to the Minister of Information & Broadcasting)

(අ) නැත. ජෝන්පිල්ලේ මහතා කොළඹ මහ නගර සභාව විසින් ආරක්‍ෂක නිලධාරියා වශයෙන් පත් කරන ලද්දේ තාවකාලික පදනමක් මතය. (ආ) ඔව්. රජය යටතේ නැවත සේවයට බඳවා නොගතයුතු තැනැත්තන්ගේ ලේඛනයට ජෝන්පිල්ලේ මහතාගේ නම ඇතුළත් නොකිරීමට රාජ්‍යසේවා කොමිෂන් සභාව විසින් නියෝග කර තිබේ. (ඉ) මෙම පත් කිරීම කොළඹ මහ නගර සභාවේ මනාපය පරිදි සිදුකළ හැකි අතර එය සිදුකර ඇත්තේ දැන්වීමක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගිනි. (ඊ) ඔව්. (උ) පැන නොනඟී. (ඌ) සේවයට නැවත බඳවා ගැනීම පිළිබඳ ප්‍රතිපත්තිය නිශ්චය කිරීම මෙම අමාත්‍යාංශයට පැවරී තිබෙන විෂයයක් නොවේ.

## මාතර, සුජාතා විද්‍යාලයේ සිටි ග්‍රේටා එච්. සිරිවර්ධන මහත්මිය

*கிறீற்ரு எச். சிறிவர்த்தன, சுஜாதா வித்தியாலயம் மாத்தறை*

**GRETA H. SIRIWARDENA, SUJATHA VIDYALAYA, MATARA**

4. **එස්. ඩී. බණ්ඩාරනායක මයා.**

*(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)*

(Mr. S. D. Bandaranayake)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ග්‍රේටා එච්. සිරිවර්ධන නමැති ගුරුවරිය 1955 හේ ජනවාරි මාසයේ සිට 1965 හේ ජූනි මාසය දක්වා මතර සුජාතා විද්‍යාලයේ පෙරදිග නැටුම් (උඩරට හා භාරතීය) ගුරුවරිය වශයෙන් සේවය කළ බව එතුමා දන්නවාද? (ආ) 1965 හේ ජූනි මාසයේදී සතියක් කල් දී මේ ගුරුවරිය සේවයෙන් පහ කරන ලද්දේ මක්නිසාද? (ඉ) 1960 දී පුද්ගලික පාසල් රජයට ගත් අවස්ථාවේදී ඒ පිළිබඳ පණත ප්‍රකාර මේ ගුරුවරිය රජයේ සේවයට බඳවා ගනු ලැබුවා ද? නො එසේ නම් ඒ ඔන්ද? (ඊ) මේ ගුරුවරිය රජයේ සේවයට බඳවා ගනු ලැබුවේ නැති නම්, ඈ 1965 හේ ජූනි මාසය තෙක් ගුරු මණ්ඩලයේ සේවය කරමින් වැටුපක් ලැබුයේ කෙසේ ද? (උ) 1960 අංක 5 දරන උපකෘත පාසැල් හා ගුරු විදුහල් පණතේ හා 1961 අංක 8 දරන පණතේ විධි විධාන ප්‍රකාර මේ ගුරුවරිය වහාම නැවත සේවයට බඳවා ගෙන මෙකී පණත්වල සඳහන් පරිදි සියලුම අයිතිවාසිකම් එම ගුරුවරියට ලබා දීමට එතුමා කට යුතු කරනවාද?

*கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) ஜனவரி 1955 முதல் ஜூன் 1965 வரை மாத்தறை சுஜாதா வித்தியாலயத்தில் கீழைத்தேச (கண்டி, இந்திய) நடன ஆசிரியையாக கிறீற்ரு எச். சிறிவர்த்தன என்பவர் கடமையாற்றினர் என்பதை அறிவாரா? (ஆ) இந்த ஆசிரியை 1965 ஜூன் மாதத்தில் ஒரு வார கால முன்னறிவித்தலுடன் சேவையிலிருந்து விலக்கப்பட்டதேன்? (இ) 1960 ல் தனியார்துறைப் பாடசாலைகள் பொறுப்பேற்கப்பட்டபோது, சட்டப்படி இந்த ஆசிரியை அரசாங்க சேவையில் சேர்த்துக் கொள்ளப்பட்டாரா, இல்லையெனில் ஏன்? (ஈ) இந்த ஆசிரியை அரசாங்க சேவையிற் சேர்த்துக் கொள்ளப்படாதிருந்தால் அவர் எப்படி தொடர்ந்தும் பாடசாலைப் பணியாளராக இருந்தார், 1965 ஜூன் மாதம் வரை எப்படி அவருக்குச் சம்பளங் கொடுக்கப்பட்டது? (உ) உதவி பெறும் பாடசாலைகள், ஆசிரிய பயிற்சிக் கல்லூரிகள் சம்பந்தமான 1960 ஆம் ஆண்டு 5 ஆம் இலக்க, 1961 ஆம் ஆண்டு 8 ஆம் இலக்கச் சட்டங்களின் விதிகளுக்கமைய இந்த ஆசிரியையை உடனடியாக மீண்டும் சேவையிலமர்த்தி, அங்கு குறிப்பிடப்பட்டுள்ள சகல உரிமைகளையும் வழங்க அவர் ஆவன செய்வாரா?*

asked the Minister of Education and Cultural Affairs: (*a*) Is he aware that Greta H. Siriwardena was working as Oriental Dancing Teacher (Kandyan and Indian) at Sujatha Vidyalaya in Matara from January 1965 to June 1965? (*b*) Why was this teacher dismissed from service in June 1965 with one week's notice?

PUBLIC LIBRARY
JAFFNA.
Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. ඩී. බණ්ඩාරනායක මයා.]

(c) With the take-over of private schools in 1960 was this teacher absorbed into government service according to the Act, and if not why? (d) If this teacher was not absorbed into government service how did she continue to be on the school staff and paid a salary till June 1965? (e) Will he see that this teacher is reinstated forthwith in accordance with the provisions of the Assisted Schools and Training Colleges Act, No. 5 of 1960, and Act No. 8 of 1961, and granted all the rights as specified therein?

**ගාමිණී ජයසූරිය මයා. (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. காமனி ஜயசூரிய—கல்வி, கலாசார விவகார அமைச்சரின் பாராளுமன்றக் காரிய தரிசி)*

(Mr. Gamani Jayasuriya—Parliamentary Secretary to the Minister of Education and Cultural Affairs)

(අ) ඔව්. අර්ධකාලීන නැටුම් ගුරුවරියක් වශයෙන් සේවය කර ඇත. (ආ) සේවා හා පහසුකම් ගාස්තු අරමුදලින් ඇයට තවදුරටත් ගෙවීමට නොහැකි වූ නිසා ඇයගේ සේවය අවසන් කරන ලදී. (ඉ) නැත. යෝග්‍ය ගුරු මණ්ඩලයට අයත් නැති ගුරුවරුන්ට රජයේ පත්වීම් දීමට අදාළ පණත යටතේ ඉඩකඩ නොමැත. (ඊ) ඇයට ගෙවූයේ ස්ථිර වැටුපක් නොව සේවා සහ පහසුකම් අරමුදලින් දීමනාවක් පමණි. (උ) (ආ) අනුව පැන නොනඟී.

## මාතර සාන්ත තෝමස් බාලිකා විද්‍යාලයේ සිටි විවියන් සෙනෙවිරත්න ගුරුවරිය

விவியன் செனிவிரத்தின, செயின்ற் தொமஸ் மகளிர் பாடசாலை, மாத்தறை

VIVIENNE SENEVIRATNE, ST. THOMAS' GIRLS' SCHOOL, MATARA

5. **එස්. ඩී. බණ්ඩාරනායක මයා.**

*(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)*

(Mr. S. D. Bandaranayake)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) විවියන් සෙනෙවිරත්න නමැති ගුරුවරිය 1951 සිට 1965 ජූනි මාසය දක්වා මාතර සාන්ත තෝමස් බාලිකා විද්‍යාලයේ පෙරදිග නැටුම් (උඩරට හා භාරතීය) ගුරුවරිය වශයෙන් සේවය කළ බව එතුමා දන්නවාද? (ආ) 1965 ජූනි මාසයේ දී සතියක් කල් දී මේ ගුරුවරිය සේවයෙන් පහ කරන ලද්දේ මක්නිසාද? (ඉ) 1960 දී පුද්ගලික පාසල් රජයට ගත් අවස්ථාවේදී ඒ පිළිබඳ පණත ප්‍රකාර මේ ගුරුවරිය රජයේ සේවයට අන්තර්ග්‍රහණය කරනු ලැබුවාද? නොඑසේ නම් ඒ මන්ද? (ඊ) මේ ගුරුවරිය රජයේ සේවයට අන්තර්ග්‍රහණය කරනු ලැබුවේ නැති නම්, ඇ 1965 ජූනි මාසය තෙක් ගුරු මණ්ඩලයේ සේවය කරමින් වැටුපක් ලැබුවේ කෙසේද? (උ) 1960 අංක 5 දරන උපකෘත පාසල් හා ගුරු විදුහල් පණතේ හා 1961 අංක 8 දරන පණතේ විධි විධාන ප්‍රකාර මේ ගුරුවරිය වහාම නැවත සේවයට බඳවා ගෙන මෙකී පණත් වල සඳහන් පරිදි සියලුම අයිතිවාසිකම් එම ගුරුවරියට ලබා දීමට එතුමා කටයුතු කරනවාද?

*கல்வி, கலாசார அமைச்சரைக் கேட்ட வினா: (அ) 1951 ஆம் ஆண்டிலிருந்து 1965 ஜூன் வரை மாத்தறை செயின்ற் தோமஸ் மகளிர் பாடசாலையில் கீழைத்தேச (கண்டி, இந்திய) நடன ஆசிரியையாக விவியன் செனிவிரத்தின என்பவர் கடமையாற்றினுரென்பதை அறிவாரா? (ஆ) இந்த ஆசிரியை 1965 ஜூன் மாதத்தில் ஒருவார கால முன்னறிவித்தலுடன் சேவையிலிருந்து விலக்கப்பட்டதேன்? (இ) 1960 இல் தனியார்துறைப் பாடசாலைகள் பொறுப்பேற்கப்பட்டபோது, சட்டப்படி இந்த ஆசிரியை அரசாங்க சேவையில் சேர்த்துக் கொள்ளப்பட்டாரா, இல்லையெனில் ஏன்? (ஈ) இந்த ஆசிரியை அரசாங்க சேவையில் சேர்த்துக்கொள்ளப்படாதிருந்தால் அவர் எப்படித் தொடர்ந்தும் பாடசாலைப் பணியாளராக இருந்தார், 1965 ஜூன் மாதம் வரை எப்படி அவருக்குச் சம்பளங் கொடுக்கப்பட்டது? (உ) உதவி பெறும் பாடசாலைகள், ஆசிரிய பயிற்சிக் கல்லூரிகள் சம்பந்தமான 1960 ஆம் ஆண்டு 5 ஆம் இலக்க, 1961 ஆம் ஆண்டு 8 -ஆம் இலக்கச் சட்டங்களின் விதிகளுக்கமைய இந்த ஆசிரியையை உடனடியாக மீண்டும் சேவையிலமர்த்தி, அங்கு குறிப்பிடப்பட்டுள்ள சகல உரிமைகளையும் வழங்க அவர் ஆவன செய்வாரா?*

asked the Minister of Education and Cultural Affairs: (a) Is he aware that Vivienne Seneviratne was working as Oriental Dancing Teacher

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(Kandyan and Indian) at St. Thomas Girls' School in Matara from 1951 to June 1965? (b) Why was this teacher dismissed from service in June 1965 with one week's notice? (c) With the take-over of private schools in 1960 was this teacher absorbed into government service according to the Act, and if not why? (d) If this teacher was not absorbed into government service how did she continue to be in the school staff and paid a salary till June 1965? (e) Will he see that this teacher is reinstated forthwith in accordance with the provisions of the Assisted Schools and Training Colleges Act, No. 5 of 1960, and Act No. 8 of 1961, and granted all the rights as specified therein?

ජයසූරිය මයා.
(திரு. ஜயசூரிய)
(Mr. Jayasuriya)

(අ) ඔව්. අර්ධකාලීන නැවුම් ගුරුවරියක් වශයෙන් සේවය කර ඇත. (ආ) සේවා හා පහසුකම් ගාස්තු අරමුදලින් අයට තවදුරටත් ගෙවීමට නොහැකි වූ නිසා ඇයගේ සේවය අවසන් කරන ලදී. (ඉ) නැත. යෝග්‍ය ගුරු මණ්ඩලයට අයත් නැති ගුරුවරුන්ට රජයේ පත්වීම් දීමට අදාළ පණත යටතේ ඉඩකඩ නොමැත. (ඊ) ඇයට ගෙවූයේ ස්ථිර වැටුපක් නොව සේවා සහ පහසුකම් අරමුදලින් දීමනාවක් පමණි. (උ) (ආ) අනුව පැන නොනගී.

## ඛනිජ තෙල් පෙරීමේ යන්ත්‍රාගාරයට දළ තෙල්

பெற்றோல் வழங்கும் தொழிற்சாலைக்கு சுத்திகரிக்கப்படாத எண்ணெய்

**CRUDE OIL FOR PETROLEUM REFINERY**

7. ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

වාණිජ හා වෙළඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: ඛණිජ තෙල් පෙරීමේ යන්ත්‍රාගාරයට වුවමනා දළ තෙල් ප්‍රමාණය භාණ්ඩ හුවමාරු කිරීමේ වෙළඳ ගිවිසුම් අනුව ලබා ගැනීමට එතුමා ක්‍රියා කරන්නේද? නොඑසේ නම් මන්ද?

வர்த்தக, வியாபார அமைச்சரைக் கேட்ட வினா: பெற்றோல் வழங்கும் தொழிற்சாலைக்கு வேண்டிய சுத்திகரிக்கப்படாத எண்ணெயை பண்டமாற்று வர்த்தக ஒப்பந்தம் மூலம் பெற்றுக் கொள்வதற்கு அவர் நடவடிக்கை எடுப்பாரா? இன்றேல், ஏன்?

asked the Minister of Commerce and Trade: Will he take steps to obtain crude oil for the Petroleum Refinery under bilateral trade agreements? If not, why?

ගරු හියු ප්‍රනාන්දු (වාණිජ හා වෙළඳ ඇමති)
(கௌரவ ஹியூ பெர்ணண்டோ—வர்த்தக, வியாபார அமைச்சர்)
(The Hon. Hugh Fernando—Minister of Commerce and Trade)

The possibility of obtaining crude oil for the Petroleum Refinery has received full consideration. The Ceylon Petroleum Corporation wrote to our embassy in Baghdad to elicit a reply to our invitation to offer, and the Managing Director of the Iraq National Oil Company sent the following reply dated 9th May 1967:

"Thank you for your letters dated February 19 and April 20, 1967.

We regret to inform you that we are not able at present to participate in this tender."

We cannot buy it without it being available for sale.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

ටෙන්ඩර් නොකැඳවා අපට වුවමනා කරන තෙල් වර්ගය සහ ප්‍රමාණය ගන්ට පුළුවන්ද කියා සොයා බැලුවාද?

ගරු හියු ප්‍රනාන්දු
(கௌரவ ஹியூ பெர்ணண்டோ)
(The Hon. Hugh Fernando)

ගරු කථානායකතුමනි, ඒගොල්ල අපට තෙල් සපයන්නෙ නැත්නම් අපි ගන්නෙ කොහොම ද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

ලියමනෙන් අදහස් කරන්නේ වෙන්ඩරයට උත්තරයක්වත් එවන්නට බැරි බවයි.

**ගරු හියු ප්‍රනාන්දු**
*(கௌரவ ஹியூ பெர்னாண்டோ)*
(The Hon. Hugh Fernando)

ඒ විතරක් නොවෙයි, ඊට පිටස්තරව හෝ තෙල් දෙන්න බැහැ කිව්වා.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

වෙනත් රටවලිනුත් තෙල් මිළ දී ගන්න පුළුවන්ද කියා සොයා බැලුවාදැයි මා දැන ගන්නට කැමතියි.

**ගරු හියු ප්‍රනාන්දු**
*(கௌரவ ஹியூ பெர்னாண்டோ)*
(The Hon. Hugh Fernando)

හැම රටකින්ම වගේ සොයා බැලුවා. සාර්ථක වුණේ නැහැ.

## ට්‍රැක්ටර් ගාස්තු

திருக்டர் கட்டணம்

TRACTOR CHARGES

8. **ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

කෘෂිකර්ම හා ආහාර ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: 1968 අප්‍රේල් 20 දා සිට කෘෂිකර්ම සේවාවල ට්‍රැක්ටර් වැඩ කටයුතුවල දී රජය විසින් අනුමත කරන ලද ගාස්තුවල විස්තරයක් හා 1963 ජනවාරි 15 දා සිට රජය විසින් අනුමත කරන ලද ගාස්තුවල විස්තරයක් ද එතුමා ඉදිරිපත් කරන්නේද ?

*விவசாய, உணவு அமைச்சரைக் கேட்ட வினா: 1968 ஏப்ரில் 20 ஆந் திகதி முதல் விவசாய வேலைகளுக்கு திருக்டர்களை உபயோகித்த பொழுது அரசாங்கம் அனுமதித்த திருக்டர் கட்டண விபரத்தையும், 1963 ஜனவரி 15 ஆந் திகதி முதல் அரசாங்கம் அனுமதித்த திருக்டர் கட்டண விபரத்தையும் அவர் சமர்ப்பிப்பாரா?*

asked the Minister of Agriculture and Food : Will he table particulars of the rates approved by the Government as tractor charges for agricultural work with effect from 20.4.1968 and particulars of the rates approved by Government with effect from 15.1.1963 ?

**ගරු එම්. ඩී. බණ්ඩා (කෘෂිකර්ම හා ආහාර ඇමති)**
*(கௌரவ எம். டீ. பண்டா—விவசாய உணவு அமைச்சர்)*
(The Hon. M. D. Banda—Minister of Agriculture and Food)

I table the Answer.

සභාමේසය මත තබන ලද පිළිතුර මෙසේ යි:

*சபாபீடத்தில் வைக்கப்பட்ட விடை வருமாறு :*

*The Answer tabled is as follows :*

1. (අ) රජය මගින් අනුමත කරනු ලැබ, 1968.4.20 දින සිට වලංගු වූ ට්‍රැක්ටර් මෙහෙයුම් ගාස්තු ප්‍රමාණයින් මෙසේය :—

(i) තැටි නඟුලින් සෑම—අක්කරයකට රුපියල් 60 යි.

(ii) තැටි පෝරුවෙන් පෝරු ගෑම—අක්කරයකට රුපියල් 60 යි.

(ii) (අ) දැති නඟුලින් හෑම (එක්වරක් වුවත් දෙවරක් වුවත්) අක්කරයකට රුපියල් 35 යි.

(ආ) පසු අවස්ථාවක මඩ කිරීම හා මට්ටම් කිරීම —අක්කරයකට රුපියල් 35 යි.

(iv) රොටේටරයෙන් හෑම—අක්කරයකට රුපියල් 35 යි.

(v) දිනකට පැය අටක ගොයම් පෑගීම හෝ සුළං ගැහීම—රුපියල් 80 යි.

(vi) ට්‍රෙලරය සහිත ට්‍රැක්ටරය—දිනකට පැය අටක්—රුපියල් 96 යි.

(vii) "හාලන්ඩ" හෝ එවැනි පොම්පයක් සහිත ට්‍රැක්ටරයකට—දිනකට පැය අටක්—රුපියල් 96 යි.

(ආ) 63.1.15 දින සිට ක්‍රියාත්මක වූ ගාස්තු ප්‍රමාණයින් මෙසේයි :—

(i) තැටි නඟුලින් හෑම—අක්කරයකට රුපියල් 30 යි.

(ii) ඔප්සෙට් තැටි පෝරුවෙන් තැටි පෝරු ගෑම—අක්කරයකට රුපියල් 24 යි.

(iii) "ටැන්ඩම්" තැටි පෝරුවෙන් තැටි පෝරු ගෑම—අක්කරයකට රුපියල් 20 යි.

(iv) පරිවර්ත්‍ය තැටි පෝරුවෙන් තැටි පෝරු ගෑම—

(අ) එක් මෙහෙයුමක් අක්කරයකට රුපියල් 16 යි.

(ආ) මෙහෙයුම් දෙකක් (අඛණ්ඩව) අක්කරයකට රුපියල් 27 යි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(v) දැති නඟුලෙන් හෑම—

(අ) එක් මෙහෙයුමක්, අක්කරයකට රුපියල් 16 යි.

(ආ) මෙහෙයුම් දෙකක් (අඛණ්ඩ) අක්කරයකට රුපියල් 27 යි.

(vi) දිනකට පැය අටක ගොයම් පෑගීම හෝ සුළං ගැහීම—රුපියල් 75 යි.

(vii) ට්‍රේලරය සහිත ට්‍රැක්ටරයට—දිනකට පැය අටක් රුපියල් 84 යි.

(vii) හාර්ලන්ඩ් පොම්පයක් සහිත ට්‍රැක්ටරයකට—දිනකට පැය අටක් රුපියල් 84 යි.

(அ) 20.4.1968 தொடக்கம் அரசாங்கத்தால் அங்கீகரிக்கப்பட்ட டிராக்டர் வேலைகளுக்கான கீழ் காணும் கூலி வீதங்கள் :

(i) சட்டிக்கலப்பை உழவுக்கு ஓர் ஏக்கருக்கு ரூபா 60.

(ii) சட்டிக்கலப்பையால் பரம்டித்தலுக்கு ஓர் ஏக்கருக்கு ரூபா 60.

(iii) (அ) டைன் பண்படுத்தலுக்கு (ஒன்ரோ இரண்டோ) ஓர் ஏக்கருக்கு ரூபா 35.

(ஆ) சேற்றடித்தலும் பின்னர் மட்டப்படுத்தலும் ஓர் ஏக்கருக்கு ரூபா 20.

(iv) ரொட்டாவேட்டர் கலப்பையால் உழுதல் ஓர் ஏக்கருக்கு ரூபா 35.

(v) சூடடித்தலுக்கும் தூற்றலுக்கும் அல்லது இவை இரண்டில் ஏதேனும் ஒன்றுக்கு நாளொன்றுக்கு 8 மணித்தியாலத்துக்கு ரூபா 80.

(vi) டிராக்டர், இழுவண்டியுடன் நாளொன்றுக்கு 8 மணித்தியாலத்துக்கு ரூபா 96.

(vii) டிராக்டர், ஹார்லண்ட் நீரிறைப்பு இயந்திரத்தோடு அல்லது அதற்கிணையான நீரிறைப்பு இயந்திரத்துடன் நாளொன்றுக்கு 8 மணித்தியாலத்துக்கு ரூபா 96.

(ஆ) 15.1.63 தொடக்கம் பின்வரும் கூலி விகிதம் நடைமுறையில் இருந்தது :

(i) சட்டிக்கலப்பை உழவுக்கு ஓர் ஏக்கருக்கு ரூபா 30.

(ii) ஈடு செய்சாய்வு வட்ட இயந்திரக் கலப்பையால் பரம்படித்தலுக்கு ஓர் ஏக்கருக்கு ரூபா 24.

(iii) மெது சாய்வுபட்ட இயந்திரக் கலப்பையால் பரம்படிப்பதற்கு ஓர் ஏக்கருக்கு ரூபா 20.

(iv) எதிர்ப்புற இயக்க காய்வு இயந்திரக் கலப்பையால் பரம்படிப்பதற்கு.

(அ) ஓர் ஏக்கரை ஒரு முறை அடிக்க ரூபா 16.

(ஆ) ஓர் ஏக்கரை இரு முறைகள் (தொடர்ந்து அடிக்க ரூபா 27.

(v) டைன் பண்படுத்துதலுக்கு,

(அ) ஓர் ஏக்கரை ஒரு பண்படுத்த ரூபா 16.

(ஆ) ஓர் ஏக்கரை இரு முறை (தொடர்ந்து) பண்படுத்த ரூபா 27.

(vi) சூடடித்தலுக்கும் தூற்றலுக்கும் அல்லது இவை இரண்டில் ஏதேனும் ஒன்றுக்கு நாளொன்றுக்கு 8 மணித்தியாலத்துக்கு. ரூபா 75

(vii) டிராக்டர் இழு வண்டியுடன் நாளொன்றுக்கு 8 மணித்தியாலத்துக்கு, ரூபா 84

(viii) டிராக்டர் ஹார்லண்ட் நீரிறைப்பு இயந்திரத்துடன் நாளொன்றுக்கு 8 மணித்தியாலத்துக்கு, ரூபா 84.

(*a*) The following rates for tractor operat.ons approved by Government were in force with effect from 20.4.1968 :

i. Disc ploughing Rs. 60 per acre ;

ii. Disc harrowing Rs. 60 per acre ;

iii. (*a*) Tyne tilling (irrespective of whether it is single or double) Rs. 35 per acre ;

(*b*) Mudding and levelling at a subsequent time Rs. 20 per acre ;

iv. Ploughing with Rotavator Rs. 35 per acre ;

v. Threshing and/or winnowing per day of eight hours Rs. 80 ;

vi. Tractor with trailer per day of e.ght hours Rs. 96 ;

vii. Tractor with harland or similar pump per day of eight hours Rs. 96.

(*b*) The following rates were operative with effect from 15.1.63 :

i. Disc plouging Rs. 30 per acre ;

ii. Disc harrowing with off-set Disc Harrow Rs. 24 per acre ;

iii. Disc harrowing with Tandem Disc Harrow Rs. 20 per acre ;

iv. Disc harrowing with Reversible Disc Harrow—

(*a*) one operation Rs. 16 per acre ;

(*b*) two operations (continuous) Rs. 27 per acre ;

v. Tyne tilling—

(*a*) One operation Rs. 16 per acre ;

(*b*) Two operations (continuous) Rs. 27 per acre ;

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

vi. Threshing and/or winnowing per day of 8 hours Rs. 75 per day ;

vii. Tractor with Trailer per day of 8 hours Rs. 84 per day ;

viii. Tractor with Harland pump per day of 8 hours Rs. 84 per day.

### සෞඛ්‍ය සේවක නිල ඇඳුම්

*சுகாதார ஊழியரின் உத்தியோக உடை*

### UNIFORMS OF HEALTH STAFF

1. **එම්. පී. ද සොයිසා සිරිවර්ධන මයා.** (මිනුවන්ගොඩ—බී. වයි. තුඩාවේ මයා.—මාතර—වෙනුවට)

*(திரு. எம். பீ. டி சிறிவர்தன—மினுவாங்கொட—திரு. பி. வை. துடாவ—மாத்தறை—சார்பாக)*

(Mr. M. P. de Zoysa Siriwardena—Minuwangoda—on behalf of Mr. B. Y. Tudawe—Matara)

සෞඛ්‍ය ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) සෞඛ්‍ය සේවක සේවිකාවන්ට වාර්ෂික නිල ඇඳුම් සැපයීම සමහර ආයතනයන් විසින් නිසියාකාර ක්‍රියාත්මක නොකරන බව එතුමා දන්නවද? (ආ) වාර්ෂික නිල ඇඳුම් සැපයීම පිළිබඳව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් 1967 ජූලි 10 වැනි දින නිකුත් කර ඇති චක්‍ර ලේඛනය එතුමා මෙම සභාවට ඉදිරිපත් කරනවාද? (ඉ) වාර්ෂික නිල ඇඳුම් සැපයීම සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීමට කවර පියවරක් ගැනීමට එතුමා අදහස් කරනවාද?

*சுகாதார அமைச்சரைக் கேட்ட வினா: (அ) சுகாதார ஊழியருக்கு வருடாந்த உத்தியோக உடைகளை விநியோகிப்பதைச் சில நிறுவனங்கள் சரிவரச் செய்வதில்லையென்பதை அவர் அறிவாரா? (ஆ) வருடாந்த உத்தியோக உடைகளை விநியோகிப்பது பற்றி சுகாதார சேவை அத்தியட்சகரினால் 1967 யூலை 10 ஆம் தேதி வெளியிடப்பட்ட சுற்றுநிருபத்தை அவர் இச்சபையில் சமர்ப்பிப்பாரா? (இ) வருடாந்த உத்தியோக உடைகளைத் திருப்திகரமான முறையில் விநியோகிப்பதைச் செயற்படுத்துவதற்கு அவர் என்ன நடவடிக்கை எடுக்க உத்தேசித்துள்ளார்?*

asked the Minister of Health: (*a*) Is he aware that certain institutions do not carry out properly the task of supplying uniforms to the health staff annually? (*b*) Will he table the circular issued by the D.H.S. on 10.7.67 regarding the annual supply of uniforms to staff? (*c*) What action does he propose to take so as to ensure that this task is duly performed?

**ගරු ඊ. එල්. සේනානායක (සෞඛ්‍ය ඇමති)**

*(கௌரவ ஈ. எல். சேனநாயக்க—சுகாதார அமைச்சர்)*

(The Hon. E. L. Senanayake—Minister of Health)

(*a*) Requisitions are placed by the divisional offices in October each year but at times there is delay in the execution of these requisitions on the part of the Government Stores owing to non-availability of some of the uniform material ordered. (*b*) Decentralized Unit Circular No. 480 of 10.7.67 issued by the Director of Health Services regarding the annual supply of uniforms to staff is tabled herewith. (*c*) Any instances of delay brought to the notice of the department are investigated promptly and necessary action taken.

**(ආ) සභාගත කරන ලද චක්‍රලේඛය මෙසේ යි:**

*சபா பீடத்தில் வைக்கப்பட்ட சுற்றறிக்கை வருமாறு*

*The circular tabled is as follows:*

වි. කො. චක්‍රලේඛය අංක: 480

මගේ අංකය: ඊඹජී 129/66
1967 ජූලි මස 10 වන දා, කොළඹ,

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ දීය.

සියලු, විමධ්‍යගත කොට්ඨාශවලට
හා විශේෂිත ව්‍යාපාරවලට හා ප්‍රධානයින්ට

**සේවක-සේවිකාවන්ට නිල ඇඳුම් දීමෙහි පමාව**

දැන බලා නිසි පරිදි ක්‍රියා කරනු සඳහා 67-6-18 දිනැති අංක: 575 ඊ/53 සිබ් දරන භාණ්ඩාගාර ලිපියේ පිටපතක් මෙහි මතු පළ කරමි.

2. දෙපාර්තමේන්තුවේ ආයතනවල සේවය කරන ඇතැම් සේවක-සේවිකාවනට තම නිල ඇඳුම් කලට වේලාවට නොලැබෙන බවත්, ඇතැමෙකුට ඇතැම් මුදල් අවුරුදු තුළ කිසිසේත් නොලැබෙන බවත් කීහිප විටෙක මා වෙත පැමිණිලි කොට ඇත. මෙය ඉතා කණගාටුදායක තත්ත්වයකි. මෙ සේ නොසැලකිලිමත් වීම නිසා ඒ ඒ කොට්ඨාසවල පාලනයට අපවාද නැගේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

3. නිල ඇඳුම් ලැබීමට හිමිකරුවන් වන සේවක-සේවිකාවන්ට ඒ අයගේ නිල ඇඳුම් කොටස මුදල් අවුරුද්ද මුල හරියේ දී තරම නිකුත් කරවීමට වගබලා ගැනීම, සියලු විමධ්‍යගත කොට්ඨාස වලැ සහ විශේෂිත ව්‍යාපාරවලැ ප්‍රධානයින් සතු වගකීමක් බව සැලකුව මැනවි. නිල ඇඳුම් නිකුත් කිරීම යුහුසුළු කරවනු සඳහා, අදාළ හැටියට වුව මනා නිල ඇඳුම් හෝ නිල ඇඳුම් රෙදි හෝ පිණිසැ බඩු ඉල්ලුම් පත් ඔක්තෝබරයේ දී මැ ඒ ඒ කොට්ඨාසබද කාර්යාලවලින් රජයේ ගබඩා අධිකාරී වෙත ඉදිරිපත් කොටැ, ඉන් පසු ලියුම්-කියුම් මගින් හෝ දෙඩුම් බසින් හෝ ඒ ගැනැ ඔහු සමග දිගට මැ ක්‍රියා කළ යුතු යැ. කලට වේලාවට නිල ඇඳුම් ලබා ගැනීමේ දී යම් අසීරු කමක් වෙතොත්, රජයේ ගබඩා අධිකාරිගෙන් ඊට විසඳුම් සොයනු පිණිසැ ඒ බව මා වෙත සැලකළ යුතු යැ.

4. යම් විමධ්‍යගත කොට්ඨාසයෙකැ හෝ විශේෂිත ව්‍යාපාරයෙකැ හෝ ප්‍රධානයෙකු ගේ නොසැලකිල්ල නිසා යම් මුදල් අවුරුද්දක් තුළැ සේවක පිරිසකගේ නිල ඇඳුම් නිකුත් නොකළ බව දක්නට ලැබුණොත්, මුදල් අවුරුද්ද ගෙවී යාමෙන් පසු ද නිල ඇඳුම් නිකුත් කරනු සඳහා ඊට වගකියැ යුතු නිලධාරින්ගෙන් නිල ඇඳුම් මිල අය කැරැ ගන්නා බව සිතට ගත යුතු සි.

5. මේ චක්‍ර ලේඛයේ පවත් අදාළ සියලු නිලධාරීන් වෙත දන්වනු මැනැවි.

අ. ක./ඒ. අයි. මොහිදීන්,
නියෝජ්‍ය අධ්‍යක්ෂක (පාලන),
සෞ. සේ./අධ්‍යක්ෂ වෙනුවට.

පිටපත් :—සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි ඇති අදාල සුළුසේවක වෘත්තීය සමිති වෙත.

எனது எண் ஈஓஜீ 129/66
சௌக்கிய சேவைகள் பணிப்பாளரின்
அலுவலகம்,
கொழும்பு.
10 யூலை, 1967.

**ப. கூ. சுற்றறிக்கை எண். 480**

பன்முனைப்படுத்திய கூறுகளினதும் சிறப்பியக்கங்களினதும் தலைவர்கள் யாவருக்கும்.

**ஊழியர்களுக்கு கோலவுடை வழங்கு வதிலேற்படும் தாமதம்**

18.6.67 எனத் திகதியிடப்பட்டதும், 575 ஈ/53 சீ பீ இலக்கமுடையதுமான திறைசேரிக் கடிதத்தை உங்களுக்கு அறியத்தருவதோடு தேவையான நடவடிக்கைக்கு மென இத்துடன் இணைத்துள்ளேன்.

2. இத்திணைக்களத்தின் நிலையங்களிலுள்ள ஊழியர் சிலருக்கு கோலவுடை நேரத்தோடு கொடுப்பதில்லையென்றும், சில சமயங்களில் சில நிதி ஆண்டுகளில் முற்றாகக் கொடுபடுவதேயில்லையென்றும் எனது கவனத்திற்குப் பலமுறை கொண்டுவரப்பட்டுள்ளது. இது பெரும் அதிருப்திகரமான செயலாகும். அத்துடன், இது போன்ற கவனக்குறைவான செயல்கள் சில பிரிவுகளின் நிருவாகத் தரத்தைப் பாதிப்பதாகவுள்ளன.

3. கோலவுடைகளுக்கு உரித்தான ஊழியர்கள் யாவரும் அவர்களுக்கு அனுமதிக்கப்பட்ட கோலவுடைகளை அந்நிதியாண்டின் ஆரம்பத்திலேயே பெற்றுக் கொள்கிறார்கள் என்பது பற்றி நிச்சயப்படுத்துவது பன்முனைப்படுத்திய கூறுகளினதும், சிறப்பியக்கங்களினதும் தலைவர்களின் பொறுப்பாகும் என்பதனைத் தயவு செய்து கவனித்துக்கொள்ளவும். கோலவுடைகளை வழங்குவதை விரைவுபடுத்தும்பொருட்டு, தேவைப்படும் கோலவுடைகளையே, கோலவுடைகளுக்கான துணியையோ கோரும் தேவைப்பட்டியல்களை பிரிவு அலுவலகங்கள், ஒற்ரோபர் மாதத்தின் ஆரம்பப் பகுதியிலேயே சமர்ப்பித்தல் வேண்டும். அவற்றிற்கான நடவடிக்கைகள், அரசாங்க களஞ்சியம் கண்காணிப்பாளருடன் மேற்கொள்ளப்பட வேண்டும். தேவையேற்படின் அவருடன் நேரடியாகத் தொடர்புகொள்ளல் வேண்டும். கோலவுடைகளை நேரத்தோடு பெறுவதில் ஏற்படும் எந்த இடரையும் எனது கவனத்திற்குக் கொண்டு வருதல் வேண்டும். அவ்வாறு கொண்டுவரப்படின் இவ்வலுவலகம் அவ்விடயம்பற்றி அரசாங்கக் களஞ்சியக் கண்காணிப்பாளருடன் தொடர்புகொள்ளும்.

4. பன்முனைப்படுத்திய கூறுகளினதும், சிறப்பியக்கங்களினதும் தலைவர்களின் கவனக்குறைவால், ஊழியர்களின் கோலவுடைகள் குறித்த ஒரு நிதி ஆண்டில் வழங்கப்படவில்லை எனக் கண்டுபிடிக்கப்படின், அந்நிதியாண்டில் பின்னரேனும் அக்கோலவுடைகளை வழங்கும் பொருட்டு, அதற்காகிய செலவை அதற்குப் பொறுப்பாயுள்ள உத்தியோகத்தர்களிடமிருந்தே அறவிடவேண்டி நேரிடும்.

5. தயவுசெய்து இச்சுற்றறிக்கையின் உள்ளடக்கத்தைச் சம்பந்தப்பட்ட சகல உத்தியோகத்தர்களின் கவனத்திற்கும் கொண்டுவரவும்.

(ஒப்பம்) ஏ. ஐ. மொஹிடீன்,
பி. ப. (நிருவாகம்),
சௌக்கியசேவைகள் பணிப்பாளருக்காக.

நிருவாகத் துணை அதிகாரி (3)

பிரதிகள்.—சௌக்கியத் திணைக்களத்திலுள்ள பதியப்பட்ட சகல சிற்றூழியர்களின் தொழிற்சங்கங்களுக்கும்.

My No. EOG/129/66.
Office of the Director of
Health Services,
Colombo, 10 July, 1967.

**D. U. CIRCULAR No. 480**

To : All Heads of Decentralised Units and Specialised Campaigns.

**Delay in the Issue of Uniforms to Employees**

I append overleaf a copy of Treasury letter No. 575E/53 CB of 18.6.67 for your information and necessary action.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

2. It has also been brought to my notice on several occasions that some employees attached to Institutions of this Department do not get their uniforms in time and sometimes do not get them at all during certain Financial Years. This is very unsatisfactory and this type of neglect reflects badly on the administration of certain Divisions.

3. Please note that it is the responsibility of all the Heads of Decentralised Units and Specialised Campaigns to ensure that the employees who are entitled to uniforms get their quota very early in the Financial Year. To expedite the issue of uniforms, requisitions must be placed by the Divisional Offices at the beginning of October itself for the required uniforms or uniform materials, as the case may be, and action should be pursued with the Supdt. of Govt. Stores and, if necessary by personal contact. Any difficulties experienced in getting the Uniforms in time must be brought to my notice so that this office could take up the matter with the Supdt. of Govt. Stores.

4. It should also be borne in mind that if by neglect on the part of any Heads of Decentralised Units or Specialised Campaigns, it is found that the uniforms of employees are not issued during a particular Financial Year, it will be necessary to recover the cost of such uniforms from the officers responsible so that supplies could be made even after the Financial Year.

5. Please bring the contents of this Circular to the notice of all Officers concerned.

Sgd. A. I. Mohideen
D. D. (Administration)
for Director of Health Services.

Copies to:—All Registered Minor Employees' Trade Unions in the Department of Health.

## රෝහල් මුරකරුවනට අතිකාල දීමනා

ஆசுப்பத்திரி காவற்காரர்களுக்கு மேலதிக நேர ஊழியம்

### OVERTIME FOR HOSPITAL WATCHERS

2. **ප්‍රින්ස් ගුණසේකර මයා.** (හබරාදුව—බී. වයි. තුඩාවේ මයා. වෙනුවට)

*(திரு. பிறின்ஸ் குணசேக்கர—ஹபருதுவ—திரு. பி. வை. துடாவ சார்பாக)*

(Mr. Prins Gunasekera—Habaraduwa—on behalf of Mr. B. Y. Tudawe)

සෞඛ්‍ය ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) සෞඛ්‍ය සේවකයනට ගෙවනු ලබන අතිකාල දීමනා රෝහල්වල සහ සෞඛ්‍ය ආයතනයන්හි සේවයෙහි යෙදී සිටින මුරකරුවනට නොගෙවන බව එතුමා දන්නවාද? (ආ) මුරකරුවනට මෙබඳු විශේෂයක් කිරීම අසාධාරණ හෙයින් ඔවුනට ද අතිකාල දීමනා ගෙවීමට කටයුතු කරනවාද? (ඉ) නො එසේ නම්, ඒ මන්ද?

*சுகாதார அமைச்சரைக் கேட்ட வினா: (அ) சுகாதார ஊழியர்களுக்கு வழங்கப்படும் மேலதிகநேர ஊழியத்தை ஆசுப்பத்திரிகளிலும் சுகாதார நிறுவனங்களிலும் சேவை செய்யும் காவற்காரர்களுக்கு வழங்காமலிருப்பதை அவர் அறிவாரா? (ஆ) காவல்காரர்களுக்கு இவ்விதமாக வித்தியாசம் காட்டுவது அநீதியாகையால் அவர்களுக்கும் மேலதிக நேர ஊதியம் வழங்க அவர் நடவடிக்கை எடுப்பாரா? (இ) அன்றேல் ஏன்?*

asked the Minister of Health: (*a*) Is he aware that watchers employed in hospitals and other medical institutions are not given overtime payments although other employees are given overtime payments? (*b*) Since it is unjust to make an exception in the case of the watchers, will he take action to make overtime payments to them also? (*c*) If not, why?

**ගරු ඊ. එල්. සේනානායක**

*(கௌரவ ஈ. எல். சேனநாயக்க)*

(The Hon. E. L. Senanayake)

(*a*) Yes. (*b*) Eight-hour employees are paid a commuted overtime allowance of Rs. 20 p.m. for work done in excess of eight hours daily. All watchers in the Public Service are expected to work for 12 hours and hence they are not entitled to such commuted overtime allowance. (*c*) Watchers are not in practice required to work more than 12 hours and do not therefore work overtime. Hence they are not entitled to overtime pay.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## ආහාර නිෂ්පාදක ඕවර්සියර්වරුන්ගේ හා කෘෂිකර්ම ප්‍රදර්ශකවරුන්ගේ වැටුප්

உணவு உற்பத்தி ஓவசியர் மாரினதும் விவசாய செயல்முறைகாட்டுவோரினதும் வேதனத்திட்டம்

## SALARY SCALES OF FOOD PRODUCTION OVERSEERS AND AGRICULTURAL DEMONSTRATORS

6. ද සොයිසා සිරිවර්ධන මයා. (පී. එම්. කේ. තෙන්නකෝන් මයා.—මිහින්තලේ—වෙනුවට)

*திரு. டி சொய்சா சிறிவர்தன—திரு. பீ. எம். கே. தென்னக்கூன்—மிஹிந்தலை—சார்பாக)*

(Mr. de Zoysa Siriwardena—on behalf of Mr. P. M. K. Tennekoon—Mihintale)

කෘෂිකර්ම හා ආහාර ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ආහාර නිෂ්පාදක ඕවර්සියර්වරුන් හා කෘෂිකර්ම ප්‍රදර්ශකවරුන් එකම සේවයේ යෙදී සිටින නිලධාරීන් පිරිසක් වුවත් මේ දෙපිරිස අතර පඩි ක්‍රමයේ වෙනස්කමක් පවත්නා බව එතුමා දන්නවාද? (ආ) මෙම විෂමතාවය මග හරවා ඔවුන් එකම වැටුප් ක්‍රමයක් මත තැබීමට එතුමා කට යුතු කරනවාද? (ඉ) එසේ නම් කවදාද? නො එසේ නම්, හේතු කවරේද?

*விவசாய, உணவு அமைச்சரைக் கேட்ட வினா: (அ) விவசாயத் திணைக்களத்தைச் சேர்ந்த உணவு உற்பத்தி ஓவசியர்மாரும், விவசாய செயல் முறை காட்டுவோரும் ஒரே சேவையைச் செய்யும் உத்தியோகத்தர்களான போதிலும் இவ்விரு பிரிவினர்களின் வேதனத் திட்டத்தில் வித்தியாசம் காணப்படுவதை அவர் அறிவாரா? (ஆ) இம் முரண்பாட்டை அகற்றி, இவர்களை ஒரே வேதனத் திட்டத்தின் கீழ் கொண்டுவர அவர் முயற்சி செய்வாரா? (இ) ஆமெனில், எப்பொழுது? இல்லையெனில், காரணம் யாது?*

asked the Minister of Agriculture and Food: (*a*) Is he aware that there is a difference between the salary scales of the food production overseers and of the agricultural demonstrators of the Agriculture Department although they perform the same work? (*b*) Will he take action to end this anomaly and place them on a single scale of salary? (*e*) If so, when? If not, why?

**ගරු එම්. ඩී. බණ්ඩා**

*(கௌரவ எம். டீ. பண்டா)*

(The Hon. M. D. Banda)

(*a*) Yes. (*b*) No. (*c*) Ten agricultural field demonstrators did not qualify for absorption or appointment to the grade of agricultural extension worker in terms of the approved scheme of recruitment. They will, therefore, have to continue on their present salaries and other conditions of service until such time as they qualify for promotion or leave the service.

## වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්නය: නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ වැඩ කටයුතු පිළිබඳව 69.8.30 දින "සිරිලක" පත්‍රයේ පළවූ වාර්තාව

*சிறப்புரிமை விடயம்*
*30.8.69, "ஸ்ரீலக"ப் பத்திரிகையின் சபை நிகழ்ச்சி அறிக்கை*

## QUESTION OF PRIVILEGE: REPORT OF PROCEEDINGS OF HOUSE IN "SIRILAKA" OF 30.8.69

**ගරු ඩඩ්ලි සේනානායක (අග්‍රාමාත්‍ය, ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති සහ ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු පිළිබඳ ඇමති)**

*(கௌரவ டட்லி சேனநாயக்க—பிரதம அமைச்சரும் பாதுகாப்பு, வெளிவிவகார அமைச்சரும் திட்ட அமைப்பு, பொருளாதார விவகார அமைச்சரும்)*

(The Hon. Dudley Senanayake—Prime Minister, Minister of Defence & External Affairs and Minister of Planning & Economic Affairs)

Mr. Speaker, I am sorry I could not bring this matter to your notice in Chambers.

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

Anyway, the Clerk of the House informed me.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ඩඩ්ලි සේනානායක**

*(கௌரவ டட்ளி சேனநாயக்க)*

(The Hon. Dudley Senanayake)

Yesterday during the Committee stage discussions of my Estimates I made a statement about telephone tapping.

I stated that the matter has been done legally and that no person in this House was involved. No telephone of any person in this House was tapped. It was the telephone of a person outside this House.

Now, this is the "Sirilaka" report:

**"සිරිලක" පුවත හරියට හරි අගමැතිතුමාත් පිළිගනී**

එන්. ෂන්මුගදාසන් මහතාගේ සහ පාර්ලිමේන්තු මන්ත්‍රී බර්නාඩ් සොයිසා මහතාගේත් ටෙලිපෝන් කතාබහට රහස් පොලිසිය විසින් හොර රහසේ ඇහුම්කන් දී ඇත්තේ අග්‍රාණ්ඩුකාරතුමාගේ අවසරය පිටත්, රජයේ අනුදැනුම ඇතිව බවත්, අගමැති ඩඩ්ලි සේනානායක මහතා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේදී ප්‍රකාශ කෙළේය."

This is an absolutely false report.

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

I can remember the Hon. Prime Minister definitely saying that Mr. Bernard Soysa's telephone was not tapped.

**ගරු ඩඩ්ලි සේනානායක**

*(கௌரவ டட்ளி சேனநாயக்க)*

(The Hon. Dudley Senanayake)

It was not tapped. I said the telephone of no person in this House was tapped.

**එස්. ඩී. බණ්ඩාරනායක මයා.**

*(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)*

(Mr. S. D. Bandaranayake)

Mr. Shanmugathasan's telephone was tapped.

**ගරු ඩඩ්ලි සේනානායක**

*(கௌரவ டட்ளி சேனநாயக்க)*

(The Hon. Dudley Senanayake)

I did not say even that. I said one person's telephone was tapped legally following the correct procedure.—[*Interruption*].

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

This is not an occasion for cross-talk. The Hon. Prime Minister has raised a matter of Privilege, and you cannot have a debate on it. He is explaining his position. I shall look into the matter and take necessary action.

## විසර්ජන පනත් කෙටුම්පත, 1969-70

*ஒதுக்கீட்டு மசோதா, 1969-70*

## APPROPRIATION BILL, 1969-70

**කාරක සභාවෙහිදී තවදුරටත් සළකා බලන ලදි.—[ප්‍රගතිය අගෝස්තු 29]**

**[කථානායකතුමා මූලාසනාරූඪ විය.]**

குழுவில் மேலும் ஆராயப் பெற்றது.—[தேர்ச்சி 29, ஓகஸ்ட்].

[சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்].

*Considered further in Committee.—[Progress: 29th August]*

[MR. SPEAKER *in the Chair.*]

**14 වන ශීර්ෂය—රාජ්‍යාරක්ෂක සහ විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යවරයා**

**1 වන සම්මතය: කාර්ය මණ්ඩල පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා, රු. 4,79,37,926.**

*14 ஆம் தலைப்பு:—பாதுகாப்பு, வெளிநாட்டு அலுவல்கள் அமைச்சர்*

வாக்குப்பணம் இல. 1.—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிற படிகளும், ரூபா 4,79,37,926.

HEAD 14.—MINISTER OF DEFENCE AND EXTERNAL AFFAIRS

*Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 47,937,926*

**ඉදිරිපත් කරන ලද සංශෝධනය—[අගෝස්තු 29.]**

"වැය සම්මතය රු. 10 කින් අඩු කළ යුතුය." (විභාජන අංක 1)—[ආචාර්ය එන්. එම්. පෙරේරා].

பிரேரிக்கப்பட்ட திருத்தம்—[29 ஓகஸ்ட்]

"வாக்குப் பணத்தில் ரூபா 10 குறைக்கப்படுமாக"—[கலாநிதி என் எம். பெரேரா]

*Amendment moved—[29th August],*

*"That the Vote be reduced by Rs. 10." (Apportionment No. 1)—[Dr. N. M. Perera].*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.**

வினா மீண்டும் எடுத்தியம்பப்பெற்றது.

*Question again proposed.*

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

ගරු සභාපතිතුමනි, ඊයේ මගේ කථාවේ දී කරුණු ඉදිරිපත් කරමින් මා උත්සාහ කෙළේ යුද හමුදාවල තිබෙන යම් යම් අසහනයන් කෙරෙහි ගරු අගමැතිතුමාගේ අවධානය යොමු කරන්නටයි. යුද හමුදාවේ නියුක්ත වූවන්ගේ උසස් කිරීම් පිළිබඳව අනුගමනය කරනු ලබන ප්‍රතිපත්තිවල තිබෙන සිදුරු කිහිපයක් ගැන ඊයේ මා කියමින් සිටියා. දැනට විශේෂයෙන්ම කනගාටුදායක තත්ත්වයක් ඇති වී තිබෙන්නේ ලංකා පාබළ හමුදාවේ පළමුවැනි බල ඇණියේ සිංහ රෙජමේන්තුවේත්, ගැමුණු හේවා බළ ඇණියේත් බව පෙනෙනවා. විශේෂයෙන්ම අසහනය ඇති වී තිබෙන්නේ සැරයන් වෙනුවෙන් ජ්‍යෙෂ්ඨත්වය දීමේදීයි. මේ සම්බන්ධයෙන් හමුදපතිතුමාටත් දුක්ගැනවිලි ඉදිරිපත් කර තිබෙනවා. මා ඊයේ පෙන්වා දුන් පරිදි, ගැසට් නිවේදනයේ 34 වැනි වගන්තියේ හැටියට ප්‍රමුඛත්වය නැත්නම් උසස්වීම් දෙන අයුරු පැහැදිලි කර තිබෙනවා. එහෙත් උසස්වීම් දීමේදී ඒ වගන්තියේ සඳහන් වන කරුණු අනුව ක්‍රියා කරන්නේ නැත කියන එකයි දුක්ගැනවිල්ලට හේතුව. මේ දුක්ගැනවිලි ඇති වීමට මූලික හේතුව හැටියට පෙන්වා දී තිබෙන්නේ විභාගයක් පැවැත්වීමෙන් පසු ඊට පෙනී සිටි අපේක්ෂකයන් ලබා ගත් ලකුණු හෙළි නොකිරීමයි. විභාගයේදී අපේක්ෂකයන් ලැබූ ලකුණු හෙළි කරන්නේ නැතිව උසස්වීම් දෙන විට තමන්ට හිතවත් උදවියට වැඩි ලකුණු ප්‍රමාණයක් දෙන ලදැයි හැඟීමක් ඇති වෙනවා. ඒ අනුවයි මේ උදවිය අතර දුක්ගැනවිලි ඇති වන්නේ. යම් වැඩ පිළිවෙලක් අනුව, විභාගය ගන්නා උදවියට තමන් ලැබූ ලකුණු මේවායයි දැනගන්නට ඉඩ තැබුවොත් එවැනි අසහනයක් ඇති නොවන බවයි හිතන්නේ.

සුරක්ෂිතව, රහසිගතව, විභාගාපේක්ෂකයන්ට තමන් ලත් ලකුණු දැනගන්නට ඉඩ ලැබෙන වැඩ පිළිවෙලක් ඇති කළොත් මැනැවැයි මා හිතනවා. තමන් ලැබූ ලකුණු පිළිබඳ තොරතුරු දැනගන්නට ඉඩක් ලැබුණොත්, විභාගයෙන් අසමර්ථ වූ අපේක්ෂකයන්ට නැවත වරක් එම විභාගයට සූදානම් වන විට තමන් අසමර්ථ වූ විෂයයන් කෙරෙහි වැඩි උනන්දුවක් දක්වා කටයුතු කිරීමට පුළුවන්කමක් ඇති වෙනවා. දැන් පවතින වැඩ පිළිවෙල අනුව එවැන්නකට ඉඩක් ලැබෙන්නේ නැහැ. දැන් පවතින තත්ත්වය අනුව විභාගයක් තමන් සමත් වී සිටිනවාද නැද්ද යන්න පවා දැනගන්නට පුළුවන්කමක් නැහැ. යම් පුරප්පාඩුවක් ඇති වුණාම එක්කෙනකුට උසස්වීමක් දීම සඳහා ඉදිරිපත් ක⸗නවා. ඒ වන විටයි ඒ තැනැත්තා විභාගයෙන් සමර්ථ වී සිටින බව දැනගන්නට ලැබෙන්නේ. ඒ නිසා දුක්ගැනවිල්ලක් ඇති වීමට ඉඩ තිබෙනවා. උසස්වීම් දෙන්නේ තමන් ලත් ලකුණු අනුව නොවෙන වෙන කරුණු උඩයයි සිතන්නට ඉඩ තැබීමෙන් ඒ උදවිය තුළ සාධාරණ කල කිරීමක් ඇති වීමට ඉඩ ලැබෙනවාට සැකයක් නැහැ. හැකියාවක් තිබෙනවා නම්, ඒ ඒ සෙබළා හෙවත් අපේක්ෂකයා විභාගයේදී ලබාගත් ලකුණු මෙපණයයි දැනගන්නට පුළුවන් වන පරිදි ලකුණු ලැයිස්තුවක් ඉදිරිපත් කළොත්, මේ කළකිරීම නැති වන්නට ඉඩ තිබෙනවා. ගැසට් නිවේදනයේ 34 වැනි වගන්තියට පටහැනිව උසස්වීම් කෙරෙන බවට හමුදා භටයන් තුළ ඇති සාධාරණ සැකය නිසා ඔවුන් හමුදාපති වෙත අභියාචනයක් ඉදිරිපත් කළා. හමුදාපති ඒ ගැන විභාග කොට බලා අණ දෙන නිලධාරීන්ගේ උපදෙස් අනුව නිගමනය කළා, මෙවැනි අභියාචනයක් කිරීමට ඉඩක් නැත කියා. එහෙත් තව දුරටත් ඒ පිළිබඳව සොයා බැලීම සඳහා කමිටුවක් පත් කර තිබෙනවා. එහෙත් මේ වන තුරුත් ඒ සම්බන්ධයෙන් තීරණයක් ගෙන නැහැ. මෙයට අදාළ ගැසට් නිවේදනය පළ කර තිබෙන්නේ 1950 මාර්තු 17 වැනි දායි. ඒ අනුව බලන විට මේ නිවේදනය අවුරුදු 19 ක් පරණයි. එබැවින් එය අදට නොගැළපෙන බව හමුදාපතිම පිළිගෙන තිබෙනවා. එම නිසා එය වර්තමානයට උචිත වන පරිද්දෙන් සංශෝධනය විය යුතු බවත් හමුදාපති පිළිගන්නවා. එහෙත් මේ වන තුරු එය සංශෝධනය කර නැහැ. එම නිසා එක්කෝ අදට ගැළපෙන පරිදි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]
ඒවා සංශෝධනය කරන්න ; එහෙම නැත් නම් අර අභියාචනය පිළිගෙන සාධාරණ ලෙස කටයුතු කරන්න ඕනෑ බව මතක් කරන්න කැමැතියි.

ඊළඟට තවත් කාරණයක් මතක් කරන්නට තිබෙනවා. කන්තලේ සේවය කරන හමුදා භටයන් පිරිසක් ඉන්නවා. ශ්‍රී ලංකා සීනි සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු වන ආර්. පී. ජයවර්ධන මහතාගේ ක්‍රියා කලාපය පිළිබඳව අර භටයන් ලොකු දුක්ගැනවිල්ලක් කරනවා. ජයවර්ධන මහතා ඉතාමත් අසභ්‍ය විධියට කථා කරනවාලු.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
ශ්‍රී ලංකා සීනි සංස්ථාව මගේ අමාත්‍යාංශයට අයත් නැහැ. ආර්. පී. ජයවර්ධන මහතා පිළිබඳව යම්කිසිවක් කියන්න තිබෙනවා නම්, ඒ අමාත්‍යාංශයේ වැය ශීර්ෂ සලකා බලන අවස්ථාවේදී ඒ ගැන කියන්න.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
හොඳයි, එහෙම නම් ඒ අවස්ථාවේදී ඒ ගැන කරුණු ඉදිරිපත් කරන්නම්. එහෙත් හමුදා අයත් වන්නේ අගමැතිතුමාගේ අමාත්‍යාංශයට නිසාත්, මා සඳහන් කළ සිද්ධිය හමුදා භටයන්ට අදාළ එකක් නිසාත්, අගමැතිතුමාගේ බලතල පාවිච්චි කර කරුණු සොයා බලා, ඒ භටයන්ගේ අසහනය නැති කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

පූ. භා. 10.15

ඊළඟට, තාවකාලික වාසපත්‍ර අළුත් කිරීම පිළිබඳව මේ රජය අනුගමනය කරන ප්‍රතිපත්තිය මොකක්දැයි මා දැනගන්නට කැමැතියි. අපේ රජය තිබුණු කාලයේ නම් තාවකාලික වාසපත්‍ර දික් කිරීමේදී එක්තරා ප්‍රතිපත්තියක්, ක්‍රියා මාර්ගයක් අනුගමනය කළා. එම තාවකාලික වාසපත්‍රය හිමියා නියැළි වෘත්තිය නැත්නම් ව්‍යාපාරය අයත් ඇමතිතුමාගෙන් ඔහු පිළිබඳ වාර්තාවක් අප ලබා ගත්තා. එම තාවකාලික වාසපත්‍ර හිමියා ලංකාවේ තවදුරටත් සිටීමෙන් ලංකාවට වාසියක් වෙනවාද, අවාසියක් වෙනවාද, ඔහු තවදුරටත් ලංකාවේ සිටීම ලාංකිකයන්ගේ අසහනයට හේතුවක් වෙනවාද, එයින් ලාංකිකයන්ට දැනටමත් ඇති අඩුපාඩු තවදුරටත් වැඩි වෙනවාද, ඔහුගේ නතර වීම ලංකාවට අවශ්‍ය දෙයක්ද ආදී කරුණු අඩංගු ඒ වාර්තාව පරීක්ෂා කර බලා එම තාවකාලික වාසපත්‍රය දික් කිරීම හෝ නොකිරීම පිළිබඳව අප තීරණය කළා. එසේ නැතිව, සීමාවකින් තොරව තාවකාලික වාසපත්‍ර හිමියන්ට මෙහි රැඳෙන්නට ඉඩ දුන්නොත් එය ලංකාවේ ආර්ථික තත්ත්වයට පමණක් නොව ස්වාධීනත්වයටද බලවත් තර්ජනයක් වෙනවා. අපේ විදේශ විනිමය පිටරට ඇදී යන කාණු බොහොමයක්ම කැපී තිබෙන්නේ මෙවැනි තාවකාලික වාසපත්‍ර හිමියන් අතින් බව ටිකක් විපරම් කර බැලීමේදී අපට හොඳින් පැහැදිලි වෙනවා. කොන්ත්‍රාත් ක්‍රමය අනුව වේවා රජයේ කටයුතු පිණිස එන සමහර උදවිය පවා මෙරටට කිසිදු ඇල්මක් නැතුව විදේශ විනිමය නාස්ති කරන බව ළඟදී යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) ප්‍රකාශ කළා. තාවකාලික වශයෙන් මෙහි පදිංචියට එන අයගේ කාලසීමාව තවදුරටත් දීර්ඝ කිරීමට ඉල්ලුම් පත්‍ර කැඳවන හැම විටෙකම ඇමති අංශය මගින් පරීක්ෂණයක් කොට එම කාලසීමාව තව දුරටත් දීර්ඝ කරනවාද නැද්ද යන්න පිළිබඳව නිගමනය කිරීමට යන්ත්‍රයක් සූදානම් කළොත් මෙම අසහනයෙන් මිදෙන්නට අපට පුළුවන් වෙනවා ඇති.

මෙම රජය බලයට පත් වූවායින් පසු 1965 ඔක්තෝබර් 1 වන දා සිට වාස බද්ද අවලංගු කළා. මා ඒ ගැන සුදුසු අවස්ථාවෙහිදී කරුණු ඉදිරිපත් කරනවා. එහෙත් ප්‍රතිපත්තියක් වශයෙන් මෙම අවස්ථාවේදී ඒ ගැන යමක් කියන්නට කැමතියි. වාස බද්ද අවලංගු කළායින් පසු කලින් තිබුණු ඇහිරීමවත්, විපරමවත් දැන් සිදු වන්නේ නැහැ. හුඟ දෙනකුට එම බලපත්‍ර ලබා ගන්නට තිබුණු අවහිරය දැන් මගහැරී ගොස් තිබෙනවා. 1965 ඔක්තෝබර් මස 1 වන දා සිට වාස බද්ද අවලංගු කළාට මොකද එදා වන තෙක් ඇති හිඟ මුදල් අය කර ගන්නට බැරි වී තිබෙනවා. විදේශ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවෙන් වරින්වර ලැයිස්තු එවනවා, මෙන්න මේ අය නිදහස් කරන්නය කියා. මුදල් ඇමති අංශයෙන් අසා යවා තිබෙනවා, 1965 ඔක්තෝබර් 1 වන දා වන තුරු හිඟ මුදල් කොතරම් තිබෙනවාද යන්න. මුදල් ඇමති අංශයෙන් ඒ ගැන අසන්නේ නැතුවම අවසරයක් නොලබාම 1965 ඔක්තෝබර් 1 ව දා වන තුරු ඇති හිඟ මුදල් අහෝසි කරන්නට අවසරයක් දෙනවාදැයි ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විමසා එවා තිබෙනවා. මුදල් ඇමති අංශය ඊට පිළිතුරු වශයෙන් කියා යවා තිබෙනවා, "එසේ අවසර දෙන්නට බැරිය; ඉල්ලුම් පත්‍ර එව නවා නම් අපට එවන්න" යනුවෙන්. එම නිසා මුදල් ඇමති අංශයට එම ලැයිස්තු එවනවා. අනතුරුව මුදල් ඇමති අංශයෙන් එම හිඟ මුදල් අහෝසි කරනවා. ආගමන හා විගමන පාලකතුමා භාණ්ඩාගාරයේ අංක 1965/15/97 (එස්.බී./ඊ) දරණ ලිය මනට පිළිතුරු වශයෙන් ලිපියක් යවා තිබෙනවා. 1965 ඔක්තෝබර් 1 වන දින තෙක් කොතරම් මුදලක් අහෝසි කරන්නට බලාපොරොත්තු වෙනවාදැයි අසා යැවූ ලිපියකටයි එම පිළිතුර සපයා ඇත්තේ. 1965 ඔක්තෝබර් 1 වන දින දක්වා ඒ අයගේ ගණන්වල හැටියට රුපියල් 19,81,200 ක හිඟ මුදල් බද්දක් අහෝසි කරන්නට වුවමනා බව එහි සඳහන් වෙනවා. ඔක්තෝබර් 1 වන දායින් පසු වාස බද්ද නීත්‍යානුකූලව අහෝසි කරන්නට පුළුවනි. එහෙත් මේ ආණ්ඩුව පාර්ලිමේන්තුවෙන් කිසිම බලයක් ගෙන නැහැ, 1965 ඔක්තෝබර් 1 වන දාට පෙර යම් හිඟ මුදලක් වාස බදු වශයෙන් තිබුණා නම් එය අවලංගු කරන්නට. එහෙත් මේ අවලංගු කිරීම කරන්නේ භාණ්ඩාගාරයේ ලේකම්තුමාට බදු අහෝසි කිරීමට තිබෙන විශෙෂ බලතල උඩයි. මෙම ගණන මෙහෙම වුණාට මොකද, ඒ අතරතුර පිට ගොස් සිටින නිසා ඒ අයගේ තක්සේරුව අනුව රුපියල් 12,50,000 ක් පමණ හිඟ මුදල් තිබෙනවාය කියාද එහි සඳහන් වෙනවා. මට ලැබී තිබෙන ආරංචිවල හැටියට ඒ ඉලක්කමත් වැරදියි. එදා සිට ඇති ඉලක් කම්වල ප්‍රමාණයේ හැටියට කියන්නට පුළු වනි, වාස බදු වශයෙන් ඊට වැඩි මුදලක් අහෝසි කර තිබෙන බව. දැන් සිද්ධ වන්නෙ මොකක්ද? ආගමන හා විගමන පාලකතුමා ලිපියක් එවනවා; භාණ්ඩාගා රයේ ලේකම්තුමා ඇස් වහගෙන ඒක හොඳයි කියනවා.

**ගරු යූ. බී. වන්නිනායක (මුදල් ඇමති)**
*(கௌரவ யூ. பி. வன்னிநாயக்க—நிதி அமைச்சர்)*
(The Hon. U. B. Wanninayake—Minister of Finance)

නිර්දේශ කරලයි එවන්නෙ.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

ඔව්, නිර්දේශ කර එවනවා. භාණ්ඩාගා රය ඇස් වහගෙන හොඳයි කියනවා. ඔය විධියයි දැන් අනුගමනය කරන ප්‍රතිපත් තිය. ඒ වීසා බද්ද පිළිබඳව පමණක් නො වෙයි, ආගමන විගමන දෙපාර්තමේන් තුවේ හරියාකාර ක්‍රියාකාරී යන්ත්‍රයක් නැති නිසා තවත් විශාල පාඩු සිද්ධ වෙනවා. මයිකල් ප්‍රනාන්දු නමැති මහ තෙක් ආදායම් බදු දෙපාර්තමේන්තුවට රුපියල් 6,00,000 ක් ගෙවන්න තිබුණ බවට මා ළඟ ලිපියක් තිබෙනවා. නමුත් ඒ බද්ද අය කර නැහැ. ඊට පසු ඒ ගැන වාර්තාවක් ඉල්ලූ අවස්ථාවේදී ඉදිරිපත් කර ඇති වාර්තාවෙ සඳහන් වී තිබෙන්නෙ කුමක්ද? ඒ තැනැත්තා දැන් රටින් පිට වී ගිහින් බවයි. එයා. පී. ආර්. පී. කාරයෙක්. මයිකල් ප්‍රනාන්දු කියන තැනැත්තා කවුද කියා මා හරි හැටි විස්තර දන්නෙ නැහැ.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

I am sorry to interrupt the hon. Member. He is now referring to a tax matter. I suggest that he take it up under the Finance Ministry Votes.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

සභාපතිතුමනි, මා අගමැතිතුමාගේ අව ධානය යොමු කරවන්න හදන්නේ හොඳා කාරව පරීක්ෂාකාරීව ආගමන විගමන දෙපාර්තමේන්තුව ක්‍රියා කරවීම පිණිස

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

හරියාකාර පාලන යන්ත්‍රයක් තිබෙනවා නම් මේ විධියේ දේවල් සිදු වන්නට ඉඩ නැති බවයි. ටී. ආර්. පී. කාරයන් මොන ව්‍යාපාර කරනවාද, මොන වෘත්තිවල යෙදී සිටිනවාද ආදිය ගැන පරීක්ෂා කිරීමට පාලන යන්ත්‍රයක් තිබෙනවා නම්, ආදායම් බදු දෙපාර්තමේන්තුවටත් ඔවැනි අමාරු කම්වලට මුහුණ පාන්නට සිද්ධ වෙන්නෙ නැහැ. මේ කාරණය මා ඉදිරිපත් කිරීමට අදහස් කෙළේ ප්‍රතිපත්තියක් පෙන්වා දීමක් වශයෙන් පමණයි. හය ලක්ෂයක් කිව්වම සුළු මුදලක් නොවෙයි. ඒ මිනිහ ඔක්කොම විකුණලා දාලා පැදුරටත් නො කියා ගිහින්. එම නිසා ඒවා වැළැක්වීම පිණිස මොනවා හරි යන්ත්‍රයක් තිබෙන්න ඕනැ. ටී.ආර්.පී. බලපත්‍රයක් ඉල්ලන විට, ඒ ඉල්ලුම්කරු මොන ව්‍යාපාරයක් කරන්න යනවාද, මොන තරම් ආදායමක් තිබෙනවාද, මොන තරම් ණය තිබෙනවාද, ආදිය ගැන සොයා බැලීමට යන්ත්‍රයක් තිබිය යුතු බව පමණයි මා පෙන්වා දෙන්නෙ. මේ හය ලක්ෂයේ ආදායම් බදු ප්‍රශ්නය පිළිබඳ ලිපි ගොනු අංක ආදි විස්තර පසුව දෙන්න මට පුළුවන් වේවි.

විදේශ ප්‍රතිපත්ති ගැන එපමණ දීර්ඝ ලෙස කථා කරන්නට මා අදහස් කරන්නෙ නැහැ. එහෙත් මිසර-ලංකා මිත්‍ර සංගමයේ සභාපති වශයෙන් මා එක් කාරණයක් ගැන ප්‍රශ්න කරන්න සතුටුයි. ලංකාණ්ඩුව අරාබි ප්‍රශ්නය ගැන ප්‍රතිපත්ති වශයෙන් අලුත් විධියේ නිගමනයකට පැමිණ තිබෙනවාද යන්නයි මගේ ප්‍රශ්නය. අගමැතිතුමා නිතරම ප්‍රකාශ කර ඇති ප්‍රතිපත්තිය අප දන්නවා. ඒ වාගේම එක්සත් ජාතීන්ගේ සංගමයේ ලංකාව වෙනුවෙන් පෙනී සිටින නියෝජිතයා ප්‍රකාශ කළ දේත් අපි දන්නවා. එහෙත් මේ ළඟදී අර "අල්අක්සා" මුස්ලිම් පල්ලිය පිළිබඳ ප්‍රශ්නයක් ඇති වුණ නිසා අද ලංකාවෙ මුස්ලිම් ජනතාව අතර විශාල ආන්දෝලනයක් ඇති වී තිබෙනවා. මේ නොබෝදා සහිරා විද්‍යාල භූමියේ රැස්වීමක් පවත්වා යෝජනාවක් ස්ථිර කරගෙන තිබෙනනවා. අද "ඩේලි නිව්ස්" පත්‍රයේත් මුල් පිටුවේ ප්‍රවෘත්තියක් පළ වී තිබෙනවා :

"Moors' plea

The All-Ceylon Moors' Association at an emergency meeting had decided to call upon the Government to sever diplomatic relations with Israel."

සහිරා විද්‍යාල භූමියේදීත් මේ යෝජනාවම සම්මත කරගෙන තිබෙනවා. මේ විධියට අද රට තුළ මෙම ප්‍රශ්නය සම්බන්ධයෙන් විශාල උද්ඝෝෂණයක් තිබෙනවා. ඒ වාගේම මුස්ලිම් ජනතාවගේ නායකයන් ප්‍රකාශ කර තිබෙනවා, මෙම ප්‍රශ්නය සම්බන්ධ අගමැතිතුමා හමු වී සාකච්ඡා පවත්වන්න ඕනෑය කියා.

විදේශ ප්‍රතිපත්ති ගැන සඳහන් කරමින් රාජාසන කථා විවාදයේ අපේ සංශෝධනවලට පිළිතුරු දුන් ගරු අගමැතිතුමා ප්‍රකාශ කරන්න යෙදුණා, ඊශ්‍රායෙල් රට රට සමග අපේ තිබෙන තානාපති සම්බන්ධකම් නැති කරන්නට කැමැත්තක් නැති බව. ඒ අතරතුරේ සිදු වූ මේ සිද්ධිය නිසා දැන් ප්‍රශ්නය තවත් අලුත් මගකට යොමු වී තිබෙනවා. මහජන මතයට කන් දීමටයි දැන් සිදු වී තිබෙන්නෙ. ඒ වාගේම ලංකාවෙ මෙන්ම ලෝකයේ සෑම තැනම වාගේ පැන නැඟ ඇති මතයක් තමයි, ඊශ්‍රායලය අරාබියට පහර ගැසීම ප්‍රාදේශික ප්‍රශ්නයක් නොවන බව. එය අධිරාජ්‍යවාදී ආක්‍රමණික පියවරක් විධියටයි මුළු ලෝකයම අද සලකන්නෙ. ඒ ප්‍රශ්නය අද තවත් උග්‍ර වී තිබෙනවා. මක්නිසාද ? යුදෙව්වන්ගේ ආගම ලෝක ආගමක් කිරීම සඳහා එම ආගම ව්‍යාප්ත කිරීමේ ප්‍රතිපත්තියක් ඒ රටේ සිටින ජනතාව විසින් අනුගමනය කරනවා. අන්න ඒ හේතුව නිසා අද ඒ ප්‍රශ්නය වඩාත් උග්‍ර වී තිබෙනවා.

මුස්ලිම් පල්ලිය කැඩීම ගැන ගරු අගමැතිතුමා එතුමාගේ කනගාටුව පළ කර තිබෙනවා. ඒ වගේම පත්‍රවලින් ප්‍රචාරය කර තිබෙනවා, එතුමා ඒ සම්බන්ධයෙන් යම්කිසි මුදලක් පරිත්‍යාග කිරීමට ඉදිරිපත් වෙනවාය කියා. නමුත් මා සිතන්නේ නැහැ, ගරු අගමැතිතුමාට ඒ තරම් මුදලක් පරිත්‍යාග කරන්න පුළුවන් වේය කියා. අපේ විදේශ විනිමයේ තිබෙන හිඟකම් නිසාත් අපේ නොයෙක් නොයෙක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කටයුතුවලටත් පිටරටවලින් මුදල් ලබා ගන්නා නිසාත්, මා හිතන්නේ නැහැ ඒ තරම් මුදලක් පරිත්‍යාග කරන්න පුළුවන්කමක් ඇති වේය කියා. මා ඒ මුස්ලිම් පල්ලිය දුටුවේ නැහැ. නමුත් නොයෙක් නොයෙක් විස්තර අනුව සලකා බැලූ විට එහි එක් බිත්ති කැල්ලක් සෑදීමට අවශ්‍ය තරමේ මුදල් ප්‍රමාණයක්වත් පරිත්‍යාග කිරීමේ ශක්තියක් අපට ඇතිවේවි යයි මා සිතන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, ඒ අයට වුවමනා කරන්නේ මේ සම්බන්ධයෙන් මහජන මතයක් ඇති කිරීමටයි. ඊශ්‍රායලය, ජාතික ආගමික වශයෙන් අධිරාජ්‍යවාදී ස්වරූපයක් පතුරුවා ලීම සඳහා අරාබිය අතකොළුවක් වශයෙන් ගෙන ක්‍රියා කරන බව පෙන්වමින්, එයට විරුද්ධව මහජන මතයක් ගොඩ නැංවීමටයි ඒ අයට වුවමනා කරන්නෙ. ඒ නිසා දේශපාලන අංශයෙන් ඒ අය ඉල්ලීමක් කරනවා. එක්සත් ජාතීන්ගේ සංගමයේ සාමාජික රටක් තවත් සාමාජික රටකට පහර ගැසීමේදී—එක්සත් ජාතීන්ගේ සංගමයේ ආරක්ෂක මණ්ඩලය විසින් ගෙන තිබෙන තීරණයන්ට පටහැනිව කටයුතු කිරීමේදී—ඒ රට කෙරෙහි අපේ අප්‍රසාදය දැක්වීම, ඊට විරුද්ධව මහජන මතයක් ඇති කිරීම අපේ යුතුකමක්. ඒ නිසයි මෙවැනි ඉල්ලීමක් ඉදිරිපත් වී තිබෙන්නෙ. එක්සත් ජාතීන්ගේ සංගමයේ සාමාජික රටක් වශයෙන් අපි ඒ මණ්ඩලයේ තීරණයන් අනුව ක්‍රියා කළ යුතුයි. ඊශ්‍රායලය සමග තිබෙන තානාපති සබඳකම් අහෝසි කරන්න ඕනෑ. තාවකාලික වශයෙන් හෝ නවත්වන්න ඕනෑ. මුස්ලිම් ජනතාව විසින් දැන් එකහෙළාම ඉල්ලා සිටින්නේ ඒ ඉල්ලීමයි. මුස්ලිම්වරුන් පමණක් නොව, අධිරාජ්‍යවාදයට විරුඬව නැගී සිටින, ජාතික ස්වාධීනත්වය ලබා ගැනීමට ඉදිරිපත් වී සිටින, සෑම ජාතියක් විසින්ම ඒ ඉල්ලීම කරනවා. ඒ නිසා මා ගරු අගමැතිතුමාගෙන් දැනගන්න කැමතියි. යම් කිසි විධියක අලුත් ක්‍රමයක් ඒ සම්බන්ධයෙන් යොදා ගෙන තිබෙනවාද කියා. විපක්ෂයේ අදහස් අනුව නම් අපි හැම විටම ලෑහැස්තියි, ඒ සම්බන්ධයෙන් යොදන වැඩපිළිවෙළකට සහයෝගය දෙන්න. නමුත් මේ විධියේ තත්ත්වයක් පවතිද්දී ඊශ්‍රායලය සමග අපේ සබඳකම් තව තවත් වැඩි වැඩියෙන් ඇති කර ගෙන යාම කනගාටුවට කාරණයක්.

පූ. භා. 10.30

ගරු සභාපතිතුමනි, අපි කවුරුත් දන්නවා, පොලිස් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් කිහිප දෙනෙක් එහි පුහුණු කිරීමේ පංක්තියකට සහභාගි වී තිබෙන බව. ඒ වාගේම නොයෙක් නොයෙක් සංස්කෘතික නියෝජිත පිරිස් ලංකාවෙන් ඒ රටට යවනවා. එපමණක් නොවෙයි, මේ මෑතදී ඊශ්‍රායල් අරමුදලින් ක්ෂිණික තේ කර්මාන්තශාලාවක් පිහිටුවීමට යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ සම්බන්ධයෙන් මා ලියුම් වගයක් ඉදිරිපත් කර තිබෙනවා. ගරු ආහාර ඇමතිතුමා නම් ඔළුව වැනීමෙන් මට එදා කිව්වා, ඇහෙව්වා, ඒ ගැන තවම තීරණයක් ගෙන නැත කියා. නමුත් පත්‍රවල තිබෙන ආරංචිවල හැටියට තීරණයක් අරගෙන තිබෙන බවයි පෙනෙන්නෙ. සමහර විට තමුන්නාන්සේලා එහෙම කියන්නේ ඊශ්‍රායල් අරමුදල් ඒ සඳහා නොයොදනවා කියා සිතා ගෙන වෙන්න ඇති. සමහර විට ගරු අගමැතිතුමා ටිකක් වැඩියෙන් පරීක්ෂා කර බැලුවොත් මේ කරුණ පැහැදිලි වේවි. ස්විට්සර්ලන්තය, ඇමෙරිකාව, ලංකාව යන රටවල් තුන එක් වී කරන ව්‍යාපාරයට ඊශ්‍රායලය කෙළින්ම නැතත් හැංගිහොරා ක්‍රමයකට එයට සහභාගි වෙන බවක් පෙනෙනවා. මා ඉදිරිපත් කළ කේබල් පණිවුඩ දෙකත් ඔබතුමා හොඳට පරීක්ෂා කර බැලුවොත් ඔබතුමාට ඒ ගැන වැටහීමක් ඇති කර ගන්න පුළුවන් වේවි. ඒ නිසා මා ඉල්ලා සිටිනවා, අරාබි ජනතාවට සිදු වී තිබෙන ආපදාවන් ගැන අවංකව කල්පනා කර බලා අපි අරාබි රටේ පැත්ත ගෙන ඊශ්‍රායලය සමග තිබෙන තානාපති සබඳකම් පමණක් නොව, ඔය වගේ අලුතින් ඇති කර ගෙන තිබෙන ආර්ථික සබඳකම් පවා අහෝසි කර දමන්නය කියා.

**රාජා වෙලේගම මයා.** (මොනරාගල)
*(திரு. ராஜா வெலேகம—மொனறாகலை)*
**(Mr. Raja Welegama—Monaragala)**

ගරු සභාපතිතුමනි, ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ සාකච්ඡා කර ගෙන යන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රාජා වෙලේගම මයා.]
අවස්ථාවේදී විශේෂයෙන්ම පොලිස් දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් වචන ස්වල්පයක් කතා කිරීමට මා බලාපොරොත්තු වෙනවා. පළමුවෙන්ම මේ සම්බන්ධයෙන් මගේ ප්‍රදේශයේ තිබෙන අඩුපාඩුකම් කිහිපයක් ගැන අගමැතිතුමාගේ අවධානය යොමු කරවන්න කැමතියි. තමුන්නාන්සේ දන්නවා ඇති මොනරාගල ප්‍රදේශය වෙනම පාලන දිස්ත්‍රික්කයක් වශයෙන්, වෙනම දිසාපති කෙනෙක් භාරයේ, පාලනය කර ගෙන යන බව. ඒ වාගේම මොනරාගල ප්‍රදේශයේ පොලිස් කටයුතු භාරව උප පොලිස් අධිකාරිවරයෙක් මොනරාගලට පත් කර සිටිනවා. ඒ පොලිස් අධිකාරිවරයා—මොනරාගල දිස්ත්‍රික්කය භාරව සිටින එම නිලධාරියා—තමන්ගේ රාජකාරිය කරන්නේ බදුල්ලේ ඉඳගෙනයි. එය මහජනයාට විශාල කරදරයක්. බොහෝ අවස්ථාවලදී එම සහකාර පොලිස් අධිකාරිවරයාගෙන් යම් රාජකාරි කටයුත්තක් කරවා ගැනීමට සිදු වුවහොත් බදුල්ලට යන්නට මහජනතාවට සිදු වෙනවා. මා දන්නා හැටියට සහකාර පොලිස් අධිකාරි කාර්යාලයක් මොනරාගල දිස්ත්‍රික්කයේ පිහිටුවීමට ඉඩමක් පවා වෙන් කර තිබෙනවා. එහෙත් ඒ සඳහා මුදල් වෙන් කරවා ගැනීමට මේ දක්වාම පොලිස් දෙපාර්තමේන්තුවට පුළුවන් වී නැහැ.

ගරු සභාපතිතුමනි, මොනරාගල දිස්ත්‍රික්කය ඉතා ශීඝ්‍රයෙන් දියුණුවන ප්‍රදේශයක්. එමෙන්ම එහි ජනගහණයත් ශීඝ්‍රයෙන් වැඩි වෙනවා. ජනපද ව්‍යාපාර නිසා විශාල ප්‍රදේශයක් සංවර්ධනය වී වැඩිදියුණු වන දිස්ත්‍රික්කයක්. ඒ නිසා එසේ ඇතිවන සංවර්ධනයත් සමගම මහජනතාවට අවශ්‍ය වන අනිකුත් පහසුකම් ඇති කිරීම රජයේ යුතුකමක්. ඒ නිසා මේ වර්ෂය තුළදීවත් සහකාර පොලිස් අධිකාරී කාර්යාලයක් මොනරාගල ප්‍රදේශයේ පිහිටුවීමට කටයුතු කිරීම ගැන සලකා බලන්නය කියා මා ඉල්ලා සිටිනවා.

තවත් කරුණක් ගැන මේ අවස්ථාවේදී රජයේ අවධානය යොමු කරන්නට කැමතියි. තනමල්විල ප්‍රදේශයේ පොලිස් ස්ථානයක් පිහිටුවීමට යෝජනාවක් අවුරුදු ගණනාවක සිටම තිබෙනවා. තනමල්විල ප්‍රදේශය අපරාධ පිළිබඳව—විශේෂයෙන් කන්සා වගාව පිළිබඳව—ප්‍රසිද්ධියක් දරන ප්‍රදේශයක්. උඩවලවේ සංවර්ධන යෝජනා ක්‍රමයත් සමගම දස දහසකටත් අධික විශාල ජනකායක් ඒ ප්‍රදේශයේ පදිංචි වී ගොවිතැන් කටයුතු කර ගෙන යනවා. එහෙත් තවමත් ඒ ප්‍රදේශයේ පොලිස් රාජකාරි කටයුතු කරනු ලබන්නේ හැතැප්ම අසූවක් අනූවක් පමණ ඈත පිහිටි වැල්ලවාය පොලිස් ස්ථානය මගිනුයි. එම පොලිස් ස ථානයේත් පොලිස් නිලධාරීන් ටික දෙනයි ඉන්නේ. මිනී මැරීම් මංකොල්ලකෑම් වැනි අපරාධ සිදු වූ අවස්ථාවලදී පොලිස් නිලධාරීන්ගේ අඩුකම නිසා නියම සේවයක් ලබා ගැනීමට මහජනතාවට පුළුවන්කමක් නැහැ. ලබා ගන්නට පුළුවන් වුණත් ලබා ගන්නේ බොහොම කරදර වෙලයි. ඒ ප්‍රදේශවල පොලිස් වසමකට රාජකාරිය සඳහා විශාල ප්‍රදේශයක් තිබෙනවා. එහෙත් ඒ සඳහා සෑහෙන පහසුකම් නැති බව අපට පොලිස් නිලධාරීන්ගෙන් දැන ගන්නට ලැබී තිබෙනවා. විශේෂයෙන්ම ගමනාගමන පහසුකම් නැහැ. ඇතැම් විට පොලිසියේ තිබෙන ජීප් රථයට නැත්නම් මෝටර් සයිකලයට අවශ්‍ය පැට්‍රල් ටික නැහැ. ලැබෙන ප්‍රමාණය ප්‍රමාණවත් නැහැ. ප්‍රදේශය අනුව කල්පනා කර බලන විට මාසයකට ලැබෙන පැට්‍රල් ප්‍රමාණය සතියකටවත් සෑහෙන්නේ නැහැ. මාසයකට ලැබෙන්නේ පැට්‍රල් ගැලොම් 50 යි; නැත්නම් 60 යි. ඒ නිසා අපරාධ සිදු වූ අවස්ථාවලදී ඒ සඳහා කාලය යොදා කටයුතු කරන්නට ලැබෙන්නේ නැහැ. දුම්රිය බස්රිය ආදී අනිකුත් ගමනාගමන පහසුකම් ඇත්තෙත් නැහැ. ඒ නිසා පොලිස් රාජකාරි කටයුතු අතපසු වෙනවා. මේ ප්‍රශ්නය නිරාකරණය කිරීම සඳහා තනමල්විල පොලිස් ස්ථානයක් පිහිටුවිය යුතුයි කියා පොලිස් දෙපාර්තමේන්තුව පිළිගෙන තිබෙනවා. එය අවුරුදු 10 ක පමණ කාලයක සිට තිබෙන යෝජනාවක්. ඒ නිසා අද තිබෙන අවශ්‍යතාවයන් අනුව සලකා බලා තාවකාලික ගොඩනැගිල්ලක්වත් කුලියට ගෙන තනමල්විල ප්‍රදේශයේ පොලිස් ස්ථානයක් පිහිටුවන ලෙස මා මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අද රටේ සිදු වන අපරාධ පිළිබඳවත් මේ අවස්ථාවේදී රජයේ අවධානය යොමු කරවන්නට කැමතියි. නගරබද පෙදෙස්වල පමණක් නොව ගම්බද පළාත්වලත් දැන් මේ අපරාධ ව්‍යාප්ත වී තිබෙනවා. ගම්බද ජනතාවටත් දැන් සොර සතුරු බියෙන් වැළකී ජීවත් වීමට බැරි තත්ත්වයක් ඇති වී තිබෙනවා. පසුගිය දවස්වල පොලොන්නරුවේදී කෙරුණු මංකොල්ලයක් පිළිබඳ විස්තර පුවත්පත්වල පළ වී තිබෙනු තමුන්නාන්සේත් දකින්නට ඇති. ඒවාගේම, ඇලහැර තානායමකට කඩා වැදුණු හොරුන් කණ්ඩායමක් එහි සිටි පිරිසකට නොයෙකුත් අතවර කොට පහර දී ඒ පිරිස ළඟ තිබුණු වටිනා බඩුමුට්ටු හා මිළ මුදල් පැහැර ගෙන යාමේ පුවතක් අද පත්තරයේ පළ වී තිබෙනවා. මඩකලපුවේ සිට යාපනය බලා යමින් තිබුණු බස් රථයකට පොලිස් නිලධාරීන්ගේ වේශයෙන් පැන ගත් සොර මුලක් එහි සිටින මගීන්ගේ මිළ මුදල් හා බඩු මුට්ටු මංකොල්ල කෑමේ පුවතකුත් මීට දින කීපයකට උඩදී ප්‍රවෘත්ති පත්‍රවල පළ වුණු බව තමුන්නාන්සේට මතක ඇති. මහජනතාවගේ ජීවිතය අද ඉතාමත් අන්තරායකාරී තත්ත්වයකට පත් වී තිබෙන බව මෙකී කරුණුවලින් අපට පැහැදිලි වෙනවා. මේ විධියේ අපරාධ, මංකොල්ලකෑමේ හා මිනිස් ඝාතන දැන් බහුල වශයෙන් සිදු වන්නේ මහජනතාවට නිසි ආරක්ෂාව සැලසීම සඳහා සෑහෙන ප්‍රමාණයේ පොලිස් නිලධාරීන් පිරිසක් නැති නිසයි. බොහෝ විට, විශාල ප්‍රදේශයකට තිබෙන්නේ එක් පොලිස් ස්ථානයයි. එහි සිටින්නේත් පොලිස් නිලධාරීන් 10 යි නැත්නම් ඊටත් අඩු ප්‍රමාණයක්. ජනතාවගේ ආරක්ෂාව සැලසීමට අවශ්‍ය පොලිස් නිලධාරීන් පිරිසක් නැති විට තම සේවය හරියාකාර ඉටු කරන්නට එම නිලධාරීන්ට පුළුවන්කමක් නැහැ. එම නිසා වැඩි වන ජනගහනයේ ප්‍රමාණය අනුව පොලිස් සේවය ශක්තිමත් කළ යුතුයි.

පොලිස් දෙපාර්තමේන්තුව ග්‍රාම සංවර්ධන සමිති, ප්‍රජාමණ්ඩල හා ස්වේච්ඡා සේවක කණ්ඩායම් ආදී වූ මහජන සුභසාධක ආයතන සමග සහයෝගයෙන් කට යුතු කළ කාලයක් මීට පෙර තිබුණු බව අප දන්නවා. දැන් ඒ පුරුද්ද බොහෝ දුරට මගහැරී ගොස් තිබෙන නිසා පොලිස් නිලධාරීන්ට පමණක් තනිවම මහජන ආරක්ෂාව සැලසීමට බැරි තත්ත්වයක් ඇති වී තිබෙනවා. එම නිසා පොලිස් දෙපාර්තමේන්තුවේ දැනට සිටින මිනිස් සංඛ්‍යාව වැඩි කරන අතරම ජන ජීවිතය ආරක්ෂා කිරීම සඳහා ග්‍රාම සංවර්ධන සමිති ප්‍රජා මණ්ඩල හා ස්වේච්ඡා සේවක කණ්ඩායම් ආදියේ සහයෝගය ඇතිව කට යුතු කිරීමේ වැඩ පිළිවෙළක් සකස් කර ගන්නා ලෙස මා යෝජනා කරනවා.

පොලිස් දෙපාර්තමේන්තුවේ විශේෂ ප්‍රතිසංවිධානයක් දැන් අවශ්‍යයයි මා අද හස් කරනවා. ඉස්සර වගේ පොලිසිය කෙරෙහි බියක් දැන් මිනිසුන් තුළ නැහැ. පොලිස් නිලධාරීන්ට පහර දෙන්නට තරම් සමහර අය දාමරික වී සිටිනවා. පොලිසිය විසින් හොරුන් හා වෙනත් අපරාධකරුවන් අල්ලා ගනු ලැබුවත් බොහෝ විට සාක්ෂි නැතිකම නිසා ඔවුන් උසාවිය ඉදිරියට පමුණුවා නඩු ඔප්පු කර ගන්නට බැරි වන අවස්ථා ඇති වන බව අප දන්නවා. මේ තත්ත්වය නිසා, මිනීමරුවන්, මංකොල්ලකරුවන් හා වෙනත් අපරාධකරුවන් විශාල සංඛ්‍යාවක් රට පුරා නිදැල්ලේ හැසිරෙනවා. එම නිසා, දැනට වඩා මේ පිළිබඳව සැලකිල්ලක් දක්වා දැනට වඩා තද නීති රීති ඇති කොට අපරාධ වැළැක්වීමේ වැඩ පිළිවෙළක් වහාම යෙදිය යුතුව තිබෙනවා.

පොලිස් නිලධාරීන්ගේ දුක්ගැනවිලිත් රජයේ සැලකිල්ලට භාජන විය යුතුයි. පොලිස් නිලධාරීන්ට නොයෙකුත් දුක් ගැනවිලි හා අඩුපාඩුකම් තිබෙන බව අප කවුරුනුත් දන්නවා. පසුගිය කාලයේදී මේ රජය විසින් පොලිස් කොමිසමක් පත් කරන්නට යෙදුණා. එහි නිර්දේශ රජයට ඉදිරිපත් කර තිබෙනවාද, එසේ ඉදිරිපත් කර තිබේනම්, ඒවා ක්‍රියාත්මක කිරීමට රජය ගන්නා පියවරවල් කවරේද, යන කරුණු අප දැනගන්නට කැමතියි. පොලිස් නිලධාරීන්ට ඇති අඩුපාඩුකම් හා දුක්ගැනවිලි නිසා ඔවුන්ගේ සේවය හරියාකාර ඉෂ්ට කරන්නට ඉඩ නොලැබෙන අවස්ථාත් ඇති බව අප දන්නවා. මේ සෑම කරුණක් කෙරෙහිම රජයේ අවධානය යොමු කරවමින්, මගේ කොට්ඨාශයට අදාළ ඒ.එස්.පී. කාර්යාලය හැකි පමණ ඉක්මනින් ආරම්භ කරන ලෙස ඉල්ලමින්, තණ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රාජා වෙලේගම මයා.]

මල්විල හා සියඹලාණ්ඩුව ප්‍රදේශවල යෝජිත පොලිස් ස්ථානද හැකි පමණ ඉක්මනින් ආරම්භ කරන ලෙස ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

**සිරිමාවෝ ආර්. ඩී. බණ්ඩාරනායක මිය.**
(අත්තනගල්ල)
(திருமதி சிறிமாவோ ஆர். டீ. பண்டாரநாயக்க—அத்தனகல்ல)
(Mrs. Sirimavo R. D. Bandaranaike—Attanagalla)

ගරු සභාපතිතුමනි, 18 වන වැය ශීර්ෂයේ, පළමුවන සම්මතිය යටතේ ඉන්දු-ලංකා ගිවිසුම සම්බන්ධයෙන් වචන සවල්පයක් කථා කරන්න බලාපොරොත්තු වෙනවා. ඉන්දු-ලංකා ගිවිසුම අත්සන් කර දැන් අවුරුදු හතරහමාරකට වැඩි කාලයක් ගත වී තිබෙන අතර, එය ක්‍රියාත්මක කිරීම පිළිබඳව පනතක් මෙම ගරු සභාවට ඉදිරිපත් කර දැන් අවුරුදු දෙකකුත් මාස තුනක් ගත වී තිබෙනවා. අප දැනගන්න කැමතියි ගරු අගමැතිතුමාගෙන්, කොයි තරම් දුරට මේ පනත ක්‍රියාත්මක කර තිබෙනවාද කියා.

මෙම වැය ශීර්ෂය යටතේ විශාල මුදලක් මේ සඳහා වෙන් කර තිබෙන බව පෙනී යනවා. එසේ නම් අද දක්වා ඉන්දියානු පුරවැසියන් හැටියට කී දෙනකු ඉල්ලුම් කර තිබෙනවාද, එයින් කී දෙනෙකු ලියා පදිංචි කර තිබෙනවාද, ලංකා පුරවැසියන් හැටියට කී දෙනෙකු ඉල්ලුම් කර තිබෙනවාද, එයින් කී දෙනෙකු ලියා පදිංචි කර තිබෙනවාද කියා දැනගැනීමට අයිතියක් අපට තිබෙනවා. ඒ සමගම ඉන්දියානු පුරවැසියන් හැටියට ලියා පදිංචි වී ඇති අයගෙන් කී දෙනෙකු ලංකාවෙන් ඉන්දියාවට පිටත් කර යවා තිබෙනවාදැයි ගරු අගමැතිතුමාගෙන් දැනගන්න කැමතියි. මක්නිසාද? ඒ සම්බන්ධයෙන් පරස්පර විරෝධී ප්‍රවෘත්තීන් නිතර නිතර ප්‍රවෘත්ති පත්‍රවල පළ කර තිබෙනවා අපට දකින්න ලැබෙන නිසයි. එක් ප්‍රවෘත්ති පත්‍රයක, දහඅට දහසක් ඇනට පිටත් කර යවා තිබෙනවායයි සඳහන් කර තිබුණා. ඊළඟ සතියේදී අටදහසක් පිටත් කර යවා තිබෙනවායයි පළ කර තිබුණා. එසේ නම්, මෙම පනත කොයි තරම් දුරට ක්‍රියාත්මක කර තිබෙනවාද, ඉන්දියානුවන් කී දෙනකු ලංකාවෙන් පිටත් කර යවා තිබෙනවාද, ලාංකික පුරවැසියන් වශයෙන් කී දෙනෙකු ලියා පදිංචි කර තිබෙනවාද කියන කාරණා සම්බන්ධයෙන් පැහැදිලි ප්‍රකාශයක් කිරීම හැමතින්ම ප්‍රයෝජනවත් වනවාට කිසිම අනුමානයක් නැහැ. ගරු සභාපතිතුමනි, මෙම පනත යටතේ අවුරුද්දකට ඉන්දියානුවන් අඩු ගණනේ තිස්පන් දහසක් මෙරටින් පිටත් කර යැවිය යුතුයි. නමුත් එතරම් සංඛ්‍යාවක් මේ අවුරුදු හතරහමාර තුළදීවත් පිටත් කර යවා ඇතැයි මා නම් සිතන්නේ නැහැ.

ඒ වාගේම වතු සුපිරින්ටෙන්ඩන්ට්වරුන් ආදීගෙන් අපට නිතර නිතර අසන්න ලැබෙන දෙයක් තමයි, වතුවල වැඩකරන කම්කරුවන්ට—මේ පනත යටතේ අය නොවෙයි, වීසා බලපත්‍ර යටතේ ඉන්න කම්කරුවන්ට—තමන්ගේ රැකියාව අවසන් වී විශ්‍රාම ලබා ආපසු ගමට යන්නට අවසර ලබාගැනීමට අමාරුය කියන කාරණය. සමහර විට ගරු අගමැතිතුමාත් මේ කාරණය දන්නවා ඇති. අපේ ආණ්ඩුව තිබුණු කාලයේදී අපට මෙබඳු පැමිණිලි ගැන අසන්නට ලැබුණා. ඉන්දියානු කොමසාරිස් කාර්යාලයෙන් නොනොයෙක් නොයෙක් අවහිරකම් ඇතිවෙනවාය කියන කාරණයයි අපට දැනගන්න ලැබුණේ. වතුවලින් දිය යුතු සියලුම දීමනාවන් ලබාගෙන ආපසු ගමරට යන්නට බලාගෙන සිටියත්, මෙබඳු අවහිරකම් නිසා අවුරුදු ගණනාවක් තිස්සේ යාමට නොහැකිව සිටින ඉන්දියානුවන් විශාල සංඛ්‍යාවක් සිටිනවා. මේ කාරණය ගැන සොයා බලා එසේ පිටව යාමට කැමැත්තෙන් සිටින ඉන්දියානුවන්ට යන්නට ඉඩ සලසා දීමට පියවර ගැනීම ඉතාමත්ම වැදගත් බව මතක් කර දෙන්න කැමතියි.

පූ. භා. 10.45.

ගරු සභාපතිතුමනි, මෙයට අවුරුද්දකට ප්‍රථම, එනම් 1968 ජූනි මාසයේදී, පුද්ගලයන් ලියා පදිංචි කිරීමේ—රෙජිස්ට්‍රේෂන් ඕෆ් පර්සන්ස් බිල්—පනතක් මෙම ගරු සභාවට ඉදිරිපත් කර සම්මත කර ගනු ලැබුවා. මෙම පනත යටතේ මෙතෙක් කොපමණ සංඛ්‍යාවකට හැඳින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වීමේ කාඩ් පත් නිකුත් කර තිබෙනවාදැයි දැනගන්න කැමතියි. මෙම වැය ශීර්ෂය යටතේ පුද්ගලයන්ගේ ඡායාරූප ගැනීම සඳහා රුපියල් ලක්ෂ දහයක මුදලක් වෙන් කර තිබෙනවා. 1968-69 වර්ෂයේ දීත් ලක්ෂ දහයක මුදලක් වෙන් කර තිබුණා. ඒ නිසා ඒ පනත කොයි තරම් දුරට ක්‍රියාත්මක කර තිබෙනවාදැයි අප දැනගන්න කැමතියි. ගරු අගමැතිතුමා මෙම කාරණා පිළිබඳව පැහැදිලි විස්තරයක් කරනවා ඇතැයි බලාපොරොත්තු වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ටී. බී. සුබසිංහ මයා.** (කටුගම්පොළ)
*(திரு. ரீ. பி. சுபசிங்க—கட்டுகம்பொள)*
(Mr. T. B. Subasinghe—Katugampola)

Mr. Chairman, I wish to draw the attention of the Hon. Prime Minister in his capacity as Minister of Defence to a couple of matters.

Firstly, I refer to the question of the personnel in the Ceylon Army Volunteer Corps. I know that these volunteers are sometimes called up for duty and sent for service in areas like Mannar, for instance.

I know of cases where young men drawn from villages are sent to such areas on duty, made to serve in those areas for more than two years and then suddenly sent home to join the vast army of the unemployed.

Recently, a large number of these young boys who were serving in Mannar were sent home. The reason they were suddenly sent home, I am given to understand, is that having served in that area for almost 2½ years they naturally asked that they be absorbed into the regular army.

I think that under any circumstances 2½ years of voluntary service in an area like Mannar is a pretty long period. But the moment they ask that they be absorbed into the regular army they have to go back home and join the large numbers of unemployed in the villages.

I think this is unfair. I do not know what the alternative is. I do not know the solution to this problem. The Hon. Prime Minister has to look into this matter and provide for their security of employment, or whatever you may call it, so that they may not be disillusioned and go home to while away their time for want of any kind of employment.

The other matter I have to refer to is this : I have had a number of complaints, particularly during V. C. elections, against police officers in charge of police stations over the issue of permits for the use of loudspeakers during meetings. I remember such a case in my own electorate, Katugampola, during the elections in the Hamangalla V. C. in 1968. That was during the time of the strike of the clerical servants. Some of the candidates from the Opposition parties contesting at the election had applied for permits to use loudspeakers at meetings. They were not granted.

Similarly, recently there was to be held a propaganda meeting in the Bingiriya V. C. close to Hettipola. I had a complaint made to me that when the organizers of the meeting applied for a permit to use loudspeakers for a certain number of hours they were refused th epermit and told, "You cannot have this meeting for so long." The real reason for the refusal, I was given to understand by the person who made the complaint to me, was that it was a meeting that was going to criticize the Government.

This complaint was made to me and I am bringing it to the notice of the Hon. Prime Minister. It is not that I am taking these complaints at their face value. But what is happning, I know personally, is that a good deal of pressure is brought to bear on some of these junior police officers by influential persons supporting this Government, including Members of Parliament, defeated candidates and the like, and these officers for fear of being victimized or losing their jobs or being transferred—and this has happened—play safe in order to please the powers that be.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. සුබසිංහ මයා.]

That is a very unsatisfactory state of affairs. If this situation is going to continue we are going to have plenty of trouble during the coming general election. The Hon. Minister responsible for this department will have to see that the police officers are immunized from this kind of pressure and interference. This kind of thing is definitely taking place; certain parties are favoured and certain parties have to give up enjoying their legitimate rights. I should like the Hon. Prime Minister to look into this matter and see that police officers, especially the junior police officers, are immunized from this kind of pressure.

වෛද්‍යාචාර්ය ඊ. එම්. වී. නාගනාදන් (නල්ලූර්)
(டொக்டர் ஈ. எம். வி. நாகநாதன்—நல்லூர்)
(Dr. E. M. V. Naganathan—Nallur)

Mr. Chairman, I should like to say a few words about the recruitment of personnel to the Army, the Navy, the Air Force and, in particular, the Police. I would request the Hon. Prime Minister to table in this House in the course of his speech, the numbers that have been recruited and their language, because I find that very few or practically none appear to have been selected as constables in the Police or as privates in the Army from among certain applicants who were very, very fine boys, well-trained and good athletes, with good physiques and who had done well in their examinations. There is some mistake somewhere. I shall not blame the Hon. Prime Minister or the Permanent Secretary but somewhere down the line this is occurring.

I say this matter is important, particularly in the case of the Police, because it is a department which has relations with the public. In Jaffna, for instance, or any other Tamil-speaking area or Muslim area, practically all the constables and most of the officers are Sinhala-speaking and do not know any Tamil. They are people who come into contact with the people; therefore, they must know the language of the people of the area to record the complaints that people come to make and they must know what the people want. But the complaints are recorded in Sinhala. The man writing it down does not understand Tamil properly and he records something else. So it affects even the dispensation of justice. Let there be Sinhalese policemen but they must know Tamil when they are attached to a Tamil-speaking area.

Similarly, in the Army, the Navy and the Air Force there is discrimination. I am prepared to apologize if I am proved wrong. That is why I want Hon. Prime Minister to table the facts as he knows them.

The hon. Leader of the Opposition spoke about the Sirimavo-Shastri Pact. From figures I have got—these figures are fairly authentic—I find that 37,000 people have taken Indian citizenship and left the island. But a gazette notification which was published a few days ago says only 885 people have got Indian citizenship. I always speak the truth. I am not a partisan. I may have my own point of view but I always see that what I state is just and fair. The hon. Leader of the Opposition interrupted when I was speaking. I want to tell her that I do not tell a lie. Yesterday the hon. Appointed Member (Mr. Annamalay) said that 44,000 people have got Indian citizenship. But my figure is 37,000 because the ratio is 4:7. I do not know whether there is any lag on the part of Ceylon. I am surprised that a responsible Member like the hon. Leader of the Opposition should accuse the Indian High Commission—

සිරිමාවෝ බණ්ඩාරනායක මිය.
(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)
(Mrs. Sirimavo Banadaranaike)

I did not make any accusation. I said that is what is being said.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වෛද්‍යාචාර්ය නාගනාතන්
(டொக்டர் நாகநாதன்)
(Dr. Naganathan)

I want to say that many of these stateless persons who were anxious to become citizens of Ceylon are not so anxious now. I asked one of these persons why, and he told me that in this country he is humiliated and harassed; further, if he obtained Ceylon citizenship he would have to bring his wife and children who are in India at his own expense, and he cannot afford to do it. Besides, even if he brings them, there is no place where he could stay.

I am not finding fault with the head of the department. The Controller of Immigration and Emigration is probably the best head of a department. I say so without any reservation. He is a very honourable man, very strict and fair and reasonable. That is what we want in a head of a department. I do not think that these lapses can be attributed to him. It is mainly the fault of people lower down, his assistants. For instance, some of them think that it is their privilege to harass these helpless people. They feel important in being able to harass and humiliate the people who come there even for very small matters.

I know the case of a poor man whose sister was suffering from cancer of the cheek and jaws. I referred her to the Cancer Institute at Maharagama. She was admitted but even after three months of stay she made no progress at all. The officer-in-charge told me that she is not making any progress and he does not think that any good can come by her continuing to be there. I conveyed this to the brother and he decided to take her to Vellore Hospital in India. I do not know who told him about Vellore, but he decided to take her there and applied for an emergency certificate for the two of them. But they did not get it from the officials. They came to me and I spoke to the controller, and he ordered that it be issued because the request was very reasonable. This man then took the sister to Vellore and got her admitted. After that he came to Ceylon and surrendered his emergency certificate. After about six months he got a message from Vellore informing him that his sister was all right and asking him to come and remove her. He again applied for an emergency cretificate and this time too it was refused. I spoke to the controller once more and he ordered that it be issued. He went to Vellore and brought the sister back. After some time she had a relapse and he made a further application to admit her to Vellore. This time too he was refused the emergency certificate. I spoke to the controller and he ordered that it be issued. He took her to Vellore and came back. Again when he was informed that she was all right he applied for an emergency certificate, and when it was refused I spoke to the controller and he immediately ordered that the emergency certificate be issued. He went and brought his sister back. I am very happy that she is cured, but the only thing is that she has a big scar.

Now, this person who has devoted all his time and money on his sister—he is unmarried also because of his sister—has got her engaged to be married on 7th September 1969 in India. That girl has got an Indian passport. She has chosen to be an Indian and she is going away. The brother could not get an emergency certificate for the simple reason that the controller has had an accident and is at home. There is no officer who will issue it. I spoke to them over the telephone and even wrote to them but they have not issued him an emergency certificate. They have turned him away. These people find great happiness in harassing, humiliating and hurting this poor fellow. I can mention his name but I do not want to do it publicly. I can give his name to the Permanent Secretary or the Prime Minister. He has sold all his possessions to give his sister in marriage, but she cannot go alone to India to get married. If she does not go, the marriage might fall through.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Sir, this man has been trying his best for the last one month to get this emergency certificate, but the officers concerned have been pushing him about. I was not well at the time and when I recovered I tried to contact the controller, but I was told that he has met with an accident and is on sick leave. So, I did not want to disturb him. That is the position.

In this connection I would like to mention that yet another man told me that he does not want to become a citizen of Ceylon to be humiliated, to be pushed about, and to be treated like a dog. He asks why he should become a citizen of Ceylon to be treated in that manner. Under these circumstances, I think, you will have a very few becoming citizens of Ceylon. Let the hon. Leader of the Opposition be happy that the proportion of 4 : 7 in her so-called pact will not materialize. You will not get the proportion of 4, but you will get much more than the proportion of 7.

I told these people, "Well, if you want to go, then go away. Why do you want to be humiliated here? Go to India and live like honourable men." I have encouraged them to go away. I do not encourage them to become citizens of Ceylon under these conditions.

I hope that the Prime Minister will look into this matter and see that certain officers in his department—there one or two Tamil officers also—get the treatment that they deserve. After all, a public servant is a servant of the public. He is not a tyrant of the public. They are there to serve the public, to try to help them, to try to give them guidance on what should be done and what should not be done, instead of making their life a hell.

Now I wish to deal with the question of foreign affairs. I must tell the Prime Minister—I am sorry to say it—that we have got to have as our representatives abroad the best men. I know that we had two very good representatives abroad and both of them were Army men. One of them was Major-General Wijekoon. I am sorry that he died. I have come into contact with him and I know what kind of work he has been doing abroad and how interested he was in getting first-hand information about the country and understanding the position there. Some or our representatives abroad do not get in contact with the people there. I know of one gentlemen who has been retired. He used to have cuttings of items of news from newspapers of foreign countries and write a precis there itself. Now that is a very useful thing.

We are a small country and we must have very competent representatives abroad. Much criticism was levelled against Israel, but she has excellent representatives abroad. They are experts. I am sorry to say that some superannuated bureaucrats who know nothing of foreign affairs and who are not interested in that work—they want only a job—are sent out as our representatives. Some of these people are sent merely for the purpose of satisfying their wish or for the purpose of getting some support at the next elections, irrespective of whether they know anything about foreign affairs or are interested in the work.

This is not the way in which our foreign departments should be handled. We want more dynamic and more knowledgeable foreign representation. There is so much of trade that we can get. Our foreign embassies and representatives should be directed towards getting more business. I do not know whether they have undertaken any kind of business survey or trade possibilities with other countries, and whether they are keeping contact with people who can do it to find out exactly what is necessary and what we can do. I do not think any such effort is made. The main responsibility is not to spread our culture in other countries but to see that Ceylon becomes prosperous through

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

trade. In the first place we must aim at prosperity in commerce and trade. I do not think any kind of research is being done by or any reports are coming in from our representatives, most of whom are not capable or not interested in this work. I hope the Hon. Prime Minister and also future Prime Ministers—I hope the present Prime Minister will come back—will take care to see that we have proper representation abroad—not like the directors who are appointed to our various corporations, party men and others whom you want to please. We want men who know their job and who will do things in the best interests of the country.

**ලක්ෂ්මන් ජයකොඩි මයා.** (දිවුලපිටිය)
*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி—திவுலுபிட்டிய)*
(Mr. Lakshman Jayakody—Divulapitiya)

ගරු සභාපතිතුමනි, පිළිතුරු බලාපොරොත්තුවෙන් ගරු අගමැතිතුමා වෙත කරුණු තුනක් හතරක් ඉදිරිපත් කරන්නට මා අදහස් කරනවා.

උඩරට තලවකැලේ, හැටන් ආදී ප්‍රදේශවල සිංහලයන් හා ඉන්දියානුවන් අතර කනගාටුදායක සිද්ධීන් රාශියක් ඇති වූ බව අප පුවත්පත්වලින් දැන ගත්තා. ඒ සිද්ධීන් කුමන විධියේ ඒවාදැයි පරීක්ෂා කර බැලීම සඳහා ගරු අගමැතිතුමාත් ඒ දිනවල පරීක්ෂණ රාශියක් පැවැත් වූ බව පත්‍ර මාර්ගයෙන් දැන ගන්නට ලැබුණා. ඒ පරීක්ෂණවලින් පසුව ගරු අගමැතිතුමා සිංහලයන් හා ඉන්දියානුවන් අතර හැප්පීම්වලට හේතුව මේ රටේ ජනතාවට කියා දුන්නා නම් අද දින මේ ප්‍රශ්න ටික මෙම ගරු සභාවේදී මතු කරන්නට වුවමනාවක් වන්නේ නැහැ. ඒ වකවානුවේදී එක්තරා මරණයක්ද සිදු වූ බව අපට ආරංචි වුණා. ඊට හේතුව කුමක්දැයි ගරු අගමැතිතුමාට කියන්නට පුළුවන් නම් හොඳයි. අද වුණත් හැටන්, තලවාකැලේ, ග්‍රේට් වෙස්ටර්න් යන පළාත් වල තත්ත්වය නම් ඒ තරම් සතුටුදායක නැහැ. සිංහලයනට අයිති එච්. ආර්. ඩී. ප්‍රේමචන්ද්‍ර සමාගම නමින් එක්තරා සමාගමක් ඇනත් ඊට අයත් ලොරිවලට රාත්‍රි කාලයේදී ගමනාගමන පහසුකම් නැති බවට ආරංචියක් තිබෙනවා. අද සිංහලයන් හා ද්‍රවිඩයන් අතර මිත්‍රත්වය කඩා බිඳ දැපී තිබෙනවා පමණක් නොව ජනතාව කුපිත කරවන වැඩ පිළිවෙළවල් තිබෙන බව කනගාටුවෙන් වුවත් මතක් කරන්නට සිදු වී තිබෙනවා. මේ තත්ත්වය ගැන සොයා බැලීම සඳහා රාජ්‍ය කොමිෂන් සභාවක් පත් කරන්න. අප ජාති භේදය ඇදගෙන කටයුතු කරනවා යයි සමහර විට ද්‍රවිඩ පක්ෂවලිනුත් තවත් පිරිස්වලිනුත් අපට චෝදනා එල්ල කරනවා. කෙසේ වුණත් අපට වැටහී තිබෙන කාරණා අප කිව යුතුයි.

මෙම ගරු සභාවේ පත් කරන ලද මන්ත්‍රීවරයකුගේ නායකත්වයෙන් ඇති වෘත්තීය සමිතියක් මේ රටේ සිංහලයන් හා ඉන්දියානුවන් අතර ප්‍රශ්න ඇති කිරීමට විශාල වශයෙන් කටයුතු කර තිබෙනවාදැයි සොයා බැලීම සුදුසුයි. ලංකාවේ අලුත් නායකත්වයක් බිහි වී ඇතැයිද, ඩී. එම්. කේ. එකට සම්බන්ධව අලුත් නායකත්වයක් ලංකාවේ බිහි වී ඇතැයිද, සී. ඩබ්ලිව්. සී. එකේ නායකයා වෘත්තීය සමිතිවලට පමණක් සීමා වූ නායකයකු නොවෙතැයිද, දේශපාලන වශයෙන් ඔහු මේ රටේ උසුම් ස්ථානයකට යැවිය යුතුව ඇතැයිද, ඔහු බලාපොරොත්තු තැබිය හැකි කෙනෙකැයිද කියමින් විශාල ප්‍රචාරයක් දී තිබෙනවා.

මේ අවස්ථාවේදී ගරු ඇමතිතුමාට මා එක්තරා ලාංඡනයක් ඉදිරිපත් කරන්නට කැමතියි මේ "උදය සූර්යයන්" ලාංඡනයයි. මේක ඉන්දියාවේ ඩී. එම්. කේ. එකේ ලාංඡනයයි. ඉතින් ලංකාවේ තොන්ඩමන් මහතාගේ නායකත්වය යටතේ සිටින ඉන්දියානුවන් පිරිසක් ප්‍රචාරක මාධ්‍යයක් හැටියට ඒ "උදය සූර්යයන්"—උදා වන සූර්යයා—ලාංඡනය ඉන්දියාවේ මුද්‍රණය කර තිබෙන පාටින්ම ලංකාවේත් මුද්‍රණය කර පාවිච්චි කරනවා. ඒ ලාංඡනයේ දෙමළ වචනත් ඉංග්‍රීසි වචනත් තිබෙනවා. මම ඉංග්‍රීසි වචන කියවන්නම්: "The rising sun—C. W. C. President Mr. S. Thondaman—Janasangam........Piraya"

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලක්ෂ්මන් ජයකොඩි මයා.]

පූජාවට සිටින ශ්‍රේෂ්ඨ පුද්ගලයා හැටියට මෙවැනි ලාංඡන සෑම තැනම බෙදාගෙන යනවා.

මෑතදී හොලිවුඩ් වත්තේ විශාල වැඩ වර්ජනයක් ඇති වූ බව ගරු අගමැතිතුමා දන්නවා ඇති. ඒ ගැන කල්පනා කරන විට කාටත් පෙනෙනවා, එය සම්පූර්ණයෙන්ම වෘත්තීය සමිතිවලට සම්බන්ධකමක් නැති එකක් බව. කම්කරු ව්‍යාපාරවලට සම්බන්ධ වී සිටින අප, නිතරම කම්කරුවන්ගේ දියුණුව සඳහා, උන්නතිය සඳහා ගෙන යන සටන් ව්‍යාපාරවලට එකතු වෙනවා. එහෙත් කම්කරු බල වේගය මේ රටේ අභ්‍යන්තර ප්‍රශ්න සඳහා යොදා ගන්නට උත්සාහ කරනවා නම් අපට කවදාවත් එවැනි දේට ඉඩ දෙන්නට බැහැ.

මා ඉතා බැගෑපත්ව ගරු අගමැතිතුමාගෙන් එක ප්‍රශ්නයක් අහන්නට කැමතියි. ඒ ප්‍රශ්නය නම් එතුමා දෙමළ පත්‍ර කියවනවාද යන්නයි. සිංහලයන් වශයෙන් අප කව්රුත් සිංහල පත්‍ර කියවනවා, සිංහල පත්‍රවල පළ වන කරුණු ගැන දන්නවා; සිංහල පත්‍රවලින් ගෙන යන ව්‍යාපාර ගැන අප දන්නවා. එසේම අප ඉංග්‍රීසි පත්‍ර ගැනත් ඒ විධියටම දන්නවා. එහෙත් අප ද්‍රවිඩ පත්‍ර කියවනවද? “වීරකේශරී”, “තිනපති” නමැති ද්‍රවිඩ පත්‍ර සම්පූර්ණ අසත්‍ය ප්‍රකාශ පළ කරනවා. මේ රටේ ජාතිවාදය අවුස්සන යම් මාධ්‍යයක් තිබෙනවා නම් ඒ ද්‍රවිඩ පත්‍ර බවයි, මා කියන්නේ. ඒ බව ඔප්පු කරන්නට මම කරුණු ඉදිරිපත් කරන්නම්. ඒ සඳහා දෙමළ පත්‍ර කියවන්නට මා අදහස් කරන්නෙ නැහැ. දෙමළ පත්‍රවල පළ වූ ලිපිවල පරිවර්තන රාශියක් මා ළඟ තිබෙනවා. අන්නදොරේ මහත්මයාගේ අභාවය පිළිබඳව කථා පැවැත්වීමට තොන්ඩමන් මහත්මයා ගුවන්විදුලිය පාවිච්චි කළා. ඒ ගුවන්විදුලි කථාව කිරීමේදී අන්නදොරේ මහත්මයාගේ ශ්‍රේෂ්ඨ ලක්ෂණ ගැන කළ විස්තරය අප කව්රුත් පිළිගන්නවා. එහෙත් “වීරකේශරී” පත්‍රය ඒ කථාව පළ කළේ තොන්ඩමන් කියන පුද්ගලයා කව්දයන්නත් උලුප්පලයි. ඔහුගේ තත්ත්වයත් එයින්ම ප්‍රසිද්ධ කළා.

මාර්තු 3 වැනිද “වීරකේශරී” පත්‍රයේ පළමු වැනි පිටුවේ තුන් වැනි තීරුවේ පළ වී තිබෙන අන්දමට ඒ විස්තරයෙ පරිවර්තනය මෙහෙමයි:

තොන්ඩමන් මහත්මයා, අන්නදොරේ මහත්මයා සමග ඉතාම කිට්ටු සම්බන්ධතාවයක් ඇතිව කටයුතු කරගෙන ගිය පුද්ගලයෙක්. ඒ සම්බන්ධතාව කොයි තරම්ද කියනවා නම් අන්නදොරේ මහත්මයාගේ ප්‍රතිපත්ති සියයට සියයක් අනුගමනය කරන එකම පුද්ගලයා සී. ඩබ්ලිව්. සී. එකේ නායක තොන්ඩමන් මහත්මයයි. ඔහු නියම ද්‍රවිඩ මුන්නේත්‍ර කලගම් පක්ෂයේ ප්‍රතිපත්ති ගෙන යන තැනැත්තා පමණක් නොවෙයි, උඩරට ප්‍රදේශවල ද්‍රවිඩයන්ගේ ගැළවුම්කාරයා හැටියට කටයුතු කරන පුද්ගලයා. විශේෂයෙන්ම හැටන්, තලවකැලේ ප්‍රදේශවල ද්‍රවිඩ ජනතාව ඔහුගේ නායකත්වය යටතේ සිටිනවා.

ගරු සභාපතිතුමනි, ඊතෝකා නමැති කොම්පැනියක් තිබෙනවා, තොන්ඩමන් මහත්මයාට අයිති. ඒ කොම්පැනිය ගැන පර්යේෂණ කර තිබෙනවාද කියා මා අගමැතිතුමාගෙන් අහන්නට කැමතියි. ඊයේ පෙරේදා සී. ඩබ්ලිව්. සී. වෘත්තීය සමිතියත්, වැවිලිකරු සංගමයත් අතර වෘත්තීය සමිති ප්‍රශ්නයක් ගැන සාකච්ඡා ඇති වුණා, කම්කරු පඩිනඩි ගැන සහ කම්කරු සේවා තත්ත්වය දියුණු කිරීම ආදිය ගැන. ඒ අවස්ථාවේදී තොන්ඩමන් මහත්මයාගේ වෘත්තීය සමිතිය ස්වාමි පක්ෂයෙන් එක ඉල්ලීමක් කළා. ඒ ඉල්ලීම නම් යම්කිසි වත්තක් විකුණන අවස්ථාවේදී—වත්තේ අයිතිවාසිකම වෙනස් වන අවස්ථාවේදී—ආදායම පහළ යාම හේතුකොටගෙන ඒ වත්තේ සිටින කම්කරුවන්ට ගෙවිය යුතු පාරිතෝෂික මුදල් ගෙවීමට ඒ වත්ත අයිතිකරුවන්ට බැරි නම් ඒ වත්තේ කොටස් ඊතෝකා කොම්පැනියට විකිණිය යුතු බවයි. එවැනි අවස්ථාවක ඊතෝකා කොම්පැනිය වත්ත මිළට ගන්නට සූදානම් බවත්, ඒ වත්තේ කොටස් කම්කරුවන්ට දීමට ඊතෝකා කොම්පැනිය කැමති බවත් ප්‍රකාශ කර තිබෙනවා. එපමණක් නොවෙයි, ඔහු එයින් නැවතුනේ නැහැ. මේ තත්ත්වය ගැන රජයත් සියයට සිය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යක්ම එකඟ යයි ඔහු කියා සිටියා. කම් කරුවන්ට තිබෙන අයිතිවාසිකම් උඩ වතු වල කොටස්වල අයිතිය ඔවුන්ට දීමේ වැඩ පිළිවෙලට රජය එකඟ වී තිබෙන බව ඔහු කියා සිටියා. ගරු සභාපතිතුමනි, මේ රටේ සිටින ඉන්දියානු වතු කම්කරුවන් ගේ මුදල් මේ අන්දමට මේ කොම්පැණි යට ගරා ගැනීමට සකස් වූ වැඩ පිළි වෙලක් තිබෙනවා. එවැනි ප්‍රතිපත්තිවලට අපි සම්පූර්ණයෙන්ම විරුද්ධයි. ඊතෝකා නමැති මේ විශාල ධනේශ්වර කොම් පැණිය මේ රටේ සිටින කම්කරුවන් පිරිසකුත් සම්බන්ධ කරගෙන වෘත්තීය සමිති ව්‍යාපාරයට පයින් ගසමින් උඩරට ප්‍රදේශයේ විශාල අධිරාජ්‍යයක් ගොඩගසා ගැනීමට ක්‍රියා කිරීම සම්බන්ධයෙන් අප ගේ බලවත් විරෝධය පළ කරන අතරම මේ පිළිබඳව ගරු අගමැතිතුමා සෑහෙන විස්තරයක් ඉදිරිපත් කරයි කියා අපි බලාපොරොත්තු වෙනවා.

පූ. භා. 11.15

ඊතෝකා නමැති මේ කොම්පැණිය අද වතුකරයේ හැමතැනම සමුපකාර සමිති පිහිටුවාගෙන යනවා. වතුවල සේවය කරන කම්කරුවන්ගේ මාර්ගයෙන් හැම තැනම සමුපකාර සමිති පිහිටුවාගෙන විශාල වෙළඳ ජාවාරමක් කිරීමට මේ කොම්පැණිය ක්‍රියා කරගෙන යනවා. සමුප කාර සමිති පිහිටුවනවාට අපි විරුද්ධ නැහැ. ඒක බොහොම වැදගත් ප්‍රතිපත් තියක්. එහෙත් දේශපාලන වාසි තකා උඩරට වෙළඳාම් කරන සිංහල වෙළෙ ඳුන්ට පහර ගැසීමේ අභිලාෂයෙන් මේ වගේ වෙළඳ ව්‍යාපාර හා ජාවාරම් පවත්වා ගෙන යාම ගැන ගරු අගමැතිතුමා ටිකක් ප්‍රවේසමෙන් කටයුතු කළ යුතුයි. 1965 වන විට ඇතැම් උඩරට නගරවල සිංහල කඩ රාශියක් විවෘත වී තිබුණා නම් අද එයින් සියයට 10 කට වඩා ඒ ප්‍රදේශවල නැහැ. අනික් සියල්ලම වැසී ගොස් තිබෙනවා. මේ ඊතෝකා කොම්පැණිය ඒ ඇත්තන්ගේ වෙළඳ ව්‍යාපාරය මිළදී ගැනී මේ ව්‍යාපාරයක් ගෙන ගියා.

තවත් කාරණයක් ගරු අගමැතිතුමා ගේ අවධානයට යොමු කරවන්ට කැම තියි. ඉන්දු-චීන අරගලය පැවැති අවස්ථා වේදී ඉන්දියාවට යවන්නට ඕනෑය කියන කම්කරුවන්ගෙන් ඉන්දියාවේ ආරක්ෂාව සඳහා යවන්නටය කියා සී. ඩබ්ලිව්. සී. නමැති වෘත්තීය සමිතිය විශාල මුදල් සම් භාරයක් එකතු කර ගත්තා. ඒ මුදල් වලට වුණේ මොකක්ද කියා මා අහන් නට කැමතියි. ඒ මුදල් මේ රටෙන් පිට රට යවන්නට කිසිම රජයක් කැමති වුණේ නැහැ. මධ්‍යස්ථ මතධාරී ප්‍රතිපත් තියක් අනුගමනය කරන රටක් හැටියට අපි ඒ අරගලයේදී කිසිම පැත්තක් ගත් තෙ නැහැ. ඒ අරගලය බේරීමට එකල සිටි ගරු අගමැතිණිය කටයුතු කළා මිස එහිදී පැත්තක් ගත්තෙ නැහැ. ඒ සල්ලි වලට වුණේ මොකක්ද? ඒ මුදලින් විශාල කොටසක් අද සමහර පුද්ගලයන් ගේ සාක්කුවලට ගොස් තිබෙනවා කියා පමණක් නොවෙයි; ඒ මුදලින් කොට සක් සී. ඩබ්ලිව්. සී. සංවිධානයේ නායක යින්ගේ සාක්කුවලට ගොස් තිබෙනවා කියා පමණක් නොවෙයි; ඊතෝකා කියන කොම්පැණියේ මූල ධනයටත් එයින් කොටසක් යොදා තිබෙනවා කියා මට ආරංචියක් ලැබී තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මේ රටේ ජීවත් වන ඉන්දියානුවන් අතර තාවකාලික බල පත්‍ර ලබාගෙන ඉන්න ටී. ආර්. පී. අංශයේ උදවිය සිටිනවා. සිරිමා-ශාස්ත්‍රී ගිවිසුම යට තේ ලාභිකයන් හැටියට එක් කොටසක් ලියා පදිංචි කරනු ලබනවා. මේ කොටස් දෙකට සම්බන්ධ උදවියට මේ රටේ තිබෙන ධනය පිටරට ගෙන යෑම සඳහා අවසරයක් ලැබෙන නීතියක් තිබෙනවා දැයි ගරු අගමැතිතුමාගෙන් අහන්නට කැමතියි. ටී. ආර්. පී. බලපත්‍ර යටතේ මේ රටේ සිටින උදවිය සහ සිරිමා-ශාස්ත්‍රී ගිවි සුම යටතේ පුරවැසිකම ලබාගෙන මේ රටේ සිටින උදවිය යන මේ කොටස් කෙසේ හෝ මේ රටේ ධනය පිටරට යවන බව අපට දැනගන්නට ලැබී තිබෙනවා. ඒ අයට මේ රටේ ධනය පිටරට යැවීමට හැකි යාවක් තිබෙනවාද යන්නත්, එසේ නම් ඒ අනුව යවා තිබෙනවාද යන්නත් ගරු අගමැතිතුමාගෙන් අහන්නට කැමතියි. මේ ගැන මීට පෙර ගරු අගමැතිතුමාට ලියුම් මගින් මා දන්වා යැව්වා. ඊට පිළි තුරත් එතුමාගෙන් මට ලැබී තිබෙනවා. ඒ ගැන කටයුතු කරගෙන යන බවයි මට දැනුම් දී තිබෙන්නේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලක්ෂ්මන් ජයකොඩි මයා.]

මට දැනගන්නට ලැබී තිබෙන කරුණු ස්වල්පයක් මේ අවස්ථාවේ ගරු සභාවට ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වෙනවා. එම්. සී. අරුණාචලම් යන නම් ඇති ටී. ආර්. පී. කාරයෙක් කඳපොලට ආවා. ඔහු ටී. ආ.ර් පී. කාරයෙකු හැටියටයි මුලින්ම කඳපොලට ආවේ. ඔහු විශාල වෙළඳ ව්‍යාපාරිකයෙක් දැන්. විශාල වෙළඳ ව්‍යාපාරිකයකු හැටියට පරිවර්තනය වුණාට පස්සේ ඔහු ලංකා පුරවැසි භාවය ලබා ගැනීමට ඉල්ලීමක් කළා. ටී. ආ.ර් පී. තත්ත්වය තිබුණු නිසා, අරුණාචලම් නැමැති මේ පුද්ගලයා මේ රටෙන් විශාල ධනයක් පිටරට යවා තිබෙනවා. වැන්පෝර් ප්‍රදේශයේ අරතංජී නගරයේ රුපියල් පණස්දාහකට පමණ ගෙයක් හදන්නට ඔහුට පුළුවන් වී තිබෙනවා. ඒ ගෙය ඉන්දියා ආණ්ඩුවට ඩී. ආර්. ඕ. හෙවත් ප්‍රාදේශීය ආදායම් නිලධාරි තත්ත්වයේ කාර්යාලයක් සඳහා දී මාස්පතා කුලියකුත් ලබා ගන්නට ඔහුට පුළුවන් වී තිබෙනවා. "ස්ටේට් රෙවනියු ඔපිස්" නැමැති කාර්යාලයක් පවත්වාගෙන යෑම සඳහා කුලියට දී ඇති මේ ගෙය වෙනුවෙන් ඉන්දියානු ආණ්ඩුව ඔහුට රු. 200ක කුලියක් ගෙවනවා. ලංකාවට සම්බන්ධ වෙලා ඉන්නවාය කියන මෙවැනි පුද්ගලයන්—ලංකා පුරවැසි භාවය ලබා ඇති මෙවැනි පුද්ගලයන්—මෙවැනි වැඩ කරගෙන යනවා.

ලංකා පුරවැසිභාවය ලබා සිටින තවත් බොහෝ දෙනෙක් මෙවැනි දේ කරනවා. තවත් විශාල සංඛ්‍යාවක් සම්බන්ධයෙන් තොරතුරු ඉදිරිපත් කරන්නට මට පුළුවනි. කොළඹ පරණ යොන් වීදියේ අංක 111 දරණ තැන පදිංචි ඒ. එස්. එම්. අබ්දුල් කාඩර් නැමැත්තා ලංකාවේ පුරවැසියෙක්. එහෙත් ඔහු කර තිබෙන්නේ කුමක්ද? ඔහු මදුරාසියේත්, ට්‍රිචිනාපොලියෙත් විශාල ඉඩකඩම් අරන් තිබෙනවා. ඒ නැනැත්තා හැම විටම වාගේ ටෙලිපෝනයෙන් ඉන්දියාවේ උදවිය අමතනවා. එපමණක් නොවෙයි. සෝදිසි කර බලන ඕනෑම කෙනකුට පෙනී යනවා ඇති, ඔහු ටෙලිපෝන් කරන්නේ මේ රටෙන් පිටරටවල් සමග ජාවාරම් කරන මූලස්ථානයක සිට බව. ගරු අගමැතිතුමා කරුණා කර ඒ පුද්ගලයාගේ ටෙලිපෝනය "ටැප්" කර බලන්න.

තවත් කෙනකු ගැන සඳහන් කරන්නට පුළුවනි. ඔහු තමයි රංජනා ස්ටෝස් අයිතිකාරයා. හැම වෙලාවෙම වාගේ ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමා මොහු ගැන සෝදිසියෙන් සිටිනවා. හොරෙන් මේ රටට සාරි ගෙන්වන පුද්ගලයා හැටියට පිළිගනු ලබන මේ පුද්ගලයාට විරුද්ධව ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමා යම්කිසි ව්‍යාපාරයක් ගෙන යන නමුත් මේ පුද්ගලයා තමන්ගේ ව්‍යාපාරය එසේම කරගෙන යනවා. මොහුගේ නම ආනන්ද පිල්ලේ. පිටකොටුවේ බංගසාල වීදියේ විශාල රෙදිපිළි වෙළඳ ශාලාවක මැනේජිං ඩිරෙක්ටර් තමයි ඔහු. කොයිංබටෝර්, බැංගලෝර්, ට්‍රිචිනාපොලිය ආදි ඉන්දීය ප්‍රාන්තවල සිටින අය සමග නිතර නිතර ගනුදෙනු කරනවා. මොහු ළඟදී මදුරාසියෙන් ලක්ෂ තුනකට පමණ විශාල මාලිගාවක් අරන් තිබෙනවා. මාලිගාවක්ය කියන්නේ "පැලස්" යන්න ඊට පාවිච්චි කරන නිසයි.

ලංකාවේ පුරවැසි භාවය ලබා ගෙන සිටින්නන් කොයි තරම් විශාල පිරිසක් මෙවැනි වැඩ දිගින් දිගටම කරගෙන යනවාද? මට මෙවැන්නන් විශාල සංඛ්‍යාවක් ගැන තොරතුරු ඉදිරිපත් කරන්නට පුළුවන්කම තිබෙනවා.

කේ. එම්. කාලියප්පා පිල්ලෙයි නම් පුද්ගලයෙක් පිටකොටුවේ ඉන්නවා. ඔහු විශාල ජාවාරම් ගෙන යන අතර ලංකාවේ ධනය පිටරට යවනවා. ලංකාවට ඔහු පැමිණියේ සාමාන්‍ය කම්කරුවකු හැටියටයි. ඔහු කරන්නේ කුමක්ද? ලංකාවේ තේ වතු අරන් තිබෙනවා පමණක් නොවෙ, ඔහු ඒ. අයි. සී. සී. ලෝන් එකකුත් අරන් තිබෙනවා. ටී. ආර්. පී. බලපත්‍ර ලබාගෙන ලංකාවට පැමිණ නැවත ඒ රටට ගිහිල්ලා කොයි තරම් උසස් ලෙස මේ රටේ ධනය ඒ රටේ එකතු කරගෙන තිබෙනවාදැයි සොයා බැලුවොත් මේ රටේ තාවකාලික බලපත්‍රකාරයන් හැටියට ඉන්නා විශාල පිරිසක් කෝටි සංඛ්‍යාත

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වටිනාකමින් යුත් ඉඩකඩම් අරන් ඉන්න බව පෙනේවි. මා ළඟ දීර්ඝ ලැයිස්තුවක් තිබෙනවා. වුවමනා නම් මට එය ඉදිරිපත් කරන්නටත් පුළුවනි. නොයෙක් කොම් පැනි අයිතිකාරයන් මේ අතර ඉන්නවා. එම්. කරුපයියා පිල්ලේ, වී. එස්. වේලා යුතන් පිල්ලේ, රන්ජන, ආර්. පී. මූර්ති ආදි විශාල පිරිසක් ඒ ආකාරයට කටයුතු කරගෙන යන්නන් අතර ඉන්නවා. කරුණා කර මේවා ගැන සොයා බලන්න. ලංකාවේ පුරවැසියන් හැටියටත්, වී. ආර්. පී. කාරයන් හැටියටත් ජීවත් වන බොහෝ දෙනා තමන් ළඟ තිබෙන බලපත්‍රවලින් කොයි තරම් ජාවාරම් කරනවාදැයි කරුණා කර සොයා බලන්න. අද ඕනෑම කෙනෙකු ට ඒ තරම් අමරුවක් නැතිව ඉන්දියාවට මුදල් යවන්න පුළුවනි. එසේ පිටරටට මෙරටින් හොරෙන් මුදල් යැවීම සඳහා පිළියෙළ වූ ස්ථාන පිටකොටුවේ හා ගෝල් ෆේස් එකේත් තිබෙනවා ගෝල් ෆේස් හෝටලයේ එක්තරා කාමරයකට ගොස් රුපියල් 10,000 ක් දී තමා අසුවල් දවසේ අසුවල් වේලාවට ඉන්දියාවේ අසු අසුවල් තැනින් ගොඩබසින බව කීවාම, ඔහු ගුවන් යානයෙන් බසිනවාත් සමගම ඔහුට නියමිත පරිදි මුදල් ලැබෙනවා.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)
හැබැයි, ලැබෙන්නෙ 8,000 යි.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)
ඊයෙ පෙරේදා ඉන්දියාවේ මුදල් ඇමති කමෙන් නෙරපා දැමූ මෝරාජී දේසායි කළ ප්‍රකාශයක්, 1969 අගෝස්තු 6 වැනි දා ඉන්දියාවේ "තිනමණි" පත්‍රයේ පළ කර තිබුණා. හොරෙන් හෝ වෙනත් කුට උපා ය මාර්ගයකින් හෝ වේවා පිටරටවලින් ඉන්දියාවට ගෙනෙන මුදල්වලට සියයට සියයකම ආරක්ෂාව සලසා දෙන බව ඒ ප්‍රකාශයේ සඳහන් වෙනවා. එම නිසා මේ කුට ව්‍යාපාර ගැන සොයා බැලීම අගමැති තුමාගේ යුතුකමක්.

සිරිමා—ශාස්ත්‍රී ගිවිසුම අත්සන් කර දැන් අවුරුදු හතරහමාරක් පමණ ගත වී අවසානයි. ඒ ගිවිසුම මඟින් අප බලා පොරොත්තු වුණේ අවුරුදු 15ක කාලයක් තුළදී මෙරට සිටින නොරටුන් 5,25,000ක් ඉන්දියාවට යවන්නටයි. ඒ අනුව බලන විට මේ වන විට අඩු ගණනේ 1,41,000 ක් වත් ඉන්දියාවට යවා තිබෙන්නට ඕනෑ.

**ආර්. එස්. පෙරේරා මයා.** (කැලණිය)
*(திரு. ஆர். எஸ். பெரேரா—களனி)*
(Mr. R. S. Perera—Kelaniya)
ඉන්දියාවට යන්නේ මිනිසුන් නොවෙයි, සල්ලි.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)
සභාතික ඇත්ත. මේ වන විට යා යුතුව තිබුණු ඒ නොරටුන් අතරින් සියයට 10 ක්වත් යවා තිබෙනවාද? අගමැතිතුමා නම් කියන්නට පුළුවනි, 37,000 ක් යන් නට සූදානමින් සිටිනවාය කියා. වර්ෂයක් පාසාම මේ ගරු සභාවේ කරන ප්‍රකාශයක් තමයි, ඒ. එහෙත් ඔවුන් යන්නේ නැහැ. කැමැත්තෙන් යන්නට යම් පිරිසක් ඉන්න පුළුවනි. අවුරුදු 8 ක කාලයක් තුළම 14,000 ක පමණ පිරිසක් එසේ ඉන් දියාවට යන්න ඇති. එහෙත් මෙහ ටත්, මෙහෙන් එහාටත් අවුරුදුපතා සෑහෙන පිරිසක් යනවා. ඉන්දු-ලංකා පනත සාකච් ඡාවට භාජන කළ අවස්ථාවේදීත් අගමැති තුමා තුළ ලොකු බලාපොරොත්තුවක් තිබුණා, සෑහෙන පිරිසක් සිය කැමැත් තෙන්ම ඉන්දියාවට යයි කියා. ඒ බලා පොරොත්තුව නිසා තමයි, සිරිමා-ශාස්ත්‍රී ගිවිසුමට පටහැණි අන්දමින් ඉන්දු-ලංකා පනත සකස් කළේ. ගිවිසුමේ තිබුණේ "repatriation" යනුවෙනුයි. එහෙත් පනතේ එය ලොප් කර තිබෙනවා. According to the Act, one list is to contain the names of those to be registered as Indian citizens, and the other, to contain the names of those to be registered as Ceylon citizens." ඒ තත්ත්වය උඩ අර නොරටුන් ඉන්දියා වට යැවීම ප්‍රමාද වී තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයකොඩි මයා.]

ඒ සමගම "වීරකේසරී" පත්‍රයේ සඳහන් වී තිබුණු දෙයකුත් අගමැති තුමාගේ අවධානයට ලක් කරන්නට කැම තියි. ඒ පත්‍රය අගමැතිතුමාට අයිති එකක්. එතුමා නැතැයි කියනවා නම් මම පිළිගන් නම්. "උදය" පත්‍රය ගහන්නේත් "වීර කේසරී" මුද්‍රණාලයේයි. දැන් ඒ පත්‍රයත් එස්මන්ඩ් වික්‍රමසිංහ මහතාත් අතර සම් බන්ධයක් නැතිලු. ඔය "වීරකේසරී" පත්‍රය විශාල ජාවාරම්කාරයන්ගේ නාය කත්වය ගෙන කටයුතු කරගෙන යන බව අප දන්නවා. දැන් නම් එහි අයිතිවාසිකම් එහා මෙහා වී තිබෙනවා. දැන් එය දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමාගේත්, අගමැති තුමගේත්, එක්සත් ජාතික පක්ෂයේත්, මේ රජයේත් මුර බල්ලෙක් වශයෙනුයි, සකස් වී තිබෙන්නේ.

පූ. භා. 11.30

**බර්නාඩ් සොයිසා මයා.** (දකුණු කොළඹ)
*(திரு. பெர்னாட் சொய்ஸா—கொழும்பு தெற்கு)*
(Mr. Bernard Soysa—Colombo South)

මට කිසිම කොටසක් අයිති නැති බව ප්‍රකාශ කරන්නට කැමතියි.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) මට සමාවන්න ඕනෑ. රාජ්‍ය ඇමතිතුමා ගැනයි මට සඳහන් කරන්නට වුවමනා කළේ.

ජූනි මස 18 වන දින මෙම පත්‍රයේ 2 වන පිටුවේ 6 සහ 7 දරණ තීරු අතර සඳහන් වී තිබෙන ප්‍රකාශය කුමක්ද? "1948 ට ප්‍රථම ලාංකික භාවය ලබා ගත් යමෙක් සිටිනවා නම් ඔහු මෙරටින් ඉන්දියාවට යාම නිත්‍යානුකූල නැත; ඔහුට ඇත්ත වශයෙන් ම මේ රටේ අයිතිවාසිකම්—ඡන්ද අයිතිවාසි කම් පවා—තිබිය යුතුය; එසේ හෙයින් සිරිමා-ශාස්ත්‍රී ගිවිසුමට එවැනි අය අයිති නැත; ඔවුන් මේ රටේ පුරවැසියන් හැටි යට සිටින්නට ඕනෑයයි ඉල්ලන්නට පවා වුවමනාවක් නැත." මෙවැනි කරුණුයි එහි සඳහන් වී තිබෙන්නේ. මේ රටේ නීත්‍යානු කූලව පනවා ගත් පනත්වලට විරුද්ධව ලංකාවේ පළවන පත්‍ර පවා මෙවැනි ප්‍රචාර යන් ගෙන යනවා නම් ගරු අගමැතිතුමා ඒ පිළිබඳව කුමක් කරන්නට යන්නේදැයි මා අහනවා. අද ඉන්දිරා ගාන්ධි මැතිනියට පවා සිදු වී තිබෙනවා, කෙළින්ම පත්‍ර පාල නය කිරීමේ පනත් ඉදිරිපත් කරන්නට. එමෙන්ම ඒ රටේ ඉන්දියානු ජාවාරම්කාර යන් පිළිබඳවත් විශාල රාජ්‍ය කොමිසමක් පත් කරන්නට සිදු වී තිබෙනවා. මේ රටේ පත්‍ර පිළිබඳවත් රාජ්‍ය කොමිසමක් පත් කළා. එම අවස්ථාවේදී පත්‍රවලින් ඊට විරුද්ධත්වය පෑවා. මෙරට තිබෙන සමහර කොම්පැනිවලටත් එවැන්නක් අවශ්‍ය වී තිබෙනවා.

බිර්ලා වැනි අය අද මේ රටෙත් සිටිනවා. ඒ අයගේ ගෘප් එකක් මේ රටේ තිබෙන වා. ඔවුන් ගෙන යන ව්‍යාපාර මොනවාදැයි සොයා බලන එක හොඳයි. ලංකාවේ සිටින උදවියගේ ප්‍රකාශන පමණක් නොව ඉන්දියාවේ සිටින ජාතිවාදීන්ගේ ප්‍රකාශ නත් මෙම පත්‍රවල පළවෙනවා. කිරාම නියාර් කියන පුද්ගලයා ඉන්දියාවේ ජාති වාදී පිරිස් අතර උග්‍රතම පුද්ගලයකු හැටි යට හඳුන්වා දෙන්නට පුළුවනි. ඒ රටේ ඩී. එම්. කේ. එකටත් කොන්ග්‍රස් පක්ෂය ටත් වඩා ලොකු බලගතු කෙනෙක් හැටියට ඔහු හඳුන්වා දෙන්නට පුළුවනි. ඊයේ පෙරේදා ඉන්දිරා මැතිනියටත් විරුද්ධව ඔහු අදහස් ප්‍රකාශ කර තිබෙනවා. ලංකා වෙන් ඉන්දියාවට පන් ලක්ෂයක් යැවීම සම්බන්ධව මොහු කෙළින්ම තම මතය දක්වනවා. ඉන්දියා ආණ්ඩුව ඒ අය පිළිගත යුතු නැති බවයි, ඔහුගේ හැඟීම. ඔවුන් ලංකාවෙන් ඉන්දියාවට නොඑනවා නම් අපි සන්තොෂයි. ඉන්දියානුකාරයන් මැලේ සියාවේ ගෙන යන ව්‍යාපාරයම ලංකාවේත් ගෙන යායුතු නිසා අපි මේ අය භාර ගන්නේ කුමට දැයි කිරාමනියාර් නමැති පුද්ගලයා අහනවා. 1969 ජූනි 6 වන දින "වීරකේසරී" පත්‍රයේ 3 වන පිටුවේ 1 වන හා 2 වන තීරුවල මෙම ප්‍රකාශය පළ වී තිබෙනවා. වුවමනා නම් පත්‍රය දෙන්නට පුළුවනි. ගරු අගමැතිතුමා මේවා ගැන ටිකක් කල්පනා කරන්නට ඕනෑ.

කච්චතිව් දූපත පිළිබඳව අප කුමක් හෝ පියවරක් ගතයුතුයි. ඒ ගැන දකුණු ඉන්දියාවේ සිටින සමහර ජාතිවාදීන් කියා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තිබෙන්නේ කුමක්ද? "මුරසොලී" නමැති පත්‍රය ඉන්දිරා මැතිණියට තර්ජන යක් පවා කර තිබෙනවා. කච්චතිව් දූපත ඉන්දියාවට අයිති බව ඒ අය කියනවා. එම පත්‍රයේ තිබුණු සම්පූර්ණ ප්‍රකාශනය ගරු අගමැතිතුමාට ඉදිරිපත් කරන්න වුවමනා නම් මට පුළුවනි. වීරකේසරී පත්‍රය ඉන්දියාවේ තිබෙන පත්‍රයකින් කෙලින්ම අර ගෙන මෙ රටේ ප්‍රචාරය කරනවා. ජූනි මාසයේ 2 වෙනිදා "වීරකේසරී" පත්‍රයේ 1 වෙනි පිටුවේ 6 සහ 7 වන තීරුවල මෙය පළ කර තිබෙනවා. මම දෙමළෙන් කියන්න යන්නෙ නැහැ. ඕනෑ නම් එහි ඇති විස්තර සිංහලෙන් කියන්නම්. මෙන්න මෙහෙම තිබෙනවා:

"සිංහල මිනිසුන් වැඩිපුර ද්‍රවිඩයන්. . ."

ද්‍රවිඩයන් කියන ඒ වචනයයි පාවිච්චි කර තිබෙන්නෙ.

". . . . .වැඩි පුර ද්‍රවිඩයන් ඉන්දියාවට පිටත් කිරීම සඳහා, බලහත්කාරයෙන් කටයුතු කරගෙන යයි."

මේක සම්පූර්ණයෙන්ම බොරුවක්.

"සිංහල මිනිසුන් ඉන්දියාවෙන් ලංකාවට ගෙන් වන බඩු වගී තහනම් කරගෙන යයි."

මේ සඳහන් කරන්නේ බීඩි ගැනයි.

"ලංකාවේ සිටින ස්වදේශ කටයුතු භාර ඇමති ඩඩ්ලිව්. දහනායක මහතා ලංකාවට ගෙනෙන සාරි පවා නැවැත්වීමට ජාවාරමක් කරගෙන යයි. ඒ වාගේම ඔහු ඉන්දියාවෙන් ලංකාවට එන ද්‍රවිඩ චිත්‍ර පටි පවා පාලනය කිරීමට ක්‍රියා කරගෙන යයි."

ඊළඟට කච්චතිව් ප්‍රශ්නය ගැන මොකද කියන්නෙ? ඉන්දියාවෙ කෙනෙක්ම මෙහි කියන්නේ කච්චතිව් ප්‍රශ්නය කාශ්මීර ප්‍රශ්නයට වඩා ඉන්දියාවට වැදගත් බවයි.

"දිල්ලි ආණ්ඩුවෙන් අපි කරුණාකර ඉල්ලා සිටිනවා, කච්චතිව් ප්‍රදේශයට ඇඟිලි ගසන්නට ලංකාවට ඉඩ දෙන්න එපාය කියා."

මේ ලංකාවෙ පත්‍රයකමයි—ගරු රාජ්‍ය ඇමතිතුමාගෙ පත්‍රය—මේ කරුණු පළ කර තිබෙන්නෙ.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
කවුද එහෙම කියන්නෙ?

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)
"මුරසෝලි" නැමති ඉන්දියානු පුවත් පතක කරුණානිධි නමැති මදුරාසියේ ප්‍රධාන ඇමතිවරයා කර තිබෙන ප්‍රකාශයයි මේ.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
ඔය පත්‍රය කියන දෙයක්ද, නැත්නම් වෙන කෙනෙක් කී දෙයක් පත්‍රයේ පළ වී තිබෙනවාද?

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)
මම කියන්නෙ ඉන්දියාවෙ පත්‍රයකින් අරගෙන ලංකාවෙ පළ කර තිබීම ගැනයි.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
ඔව්, ඉතින් වෙන කෙනෙක් කී දෙයක් ප්‍රවෘත්තියක් හැටියට පත්‍රයේ පළ වී තිබෙනවා.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)
ඇයි එවැනි දේවල් මෙහෙ ප්‍රචාරය කරන්නෙ?

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
ප්‍රචාරය කිරීමක් නොවෙයි. ඕනෑම පත්‍රයකට පුළුවන්, විදේශිකයෙක් හෝ ස්වදේශිකයෙක් කියන දෙයක් පත්‍රයේ පළ කිරීමට.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)
ගරු අගමැතිතුමා කොහොම කිව්වත්, මේ පත්‍රවල එක්තරා වැඩ පිළිවෙළක් තිබෙනවා. නියම තත්ත්වය ගැන රටට අවබෝධයක් දෙන්නෙ නැහැ. ජාතිවාදය ඇවිස්සීමට කටයුතු කරගෙන යනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයකොඩි මයා.]
ඒකට අගමැතිතුමා කැමතිද? ගරු අග මැතිතුමා සැම විටකම කියනවා, ජාති වදය ඇවිස්සීම ගැන එතුමා විරුද්ධයි කියා.

ගරු ජේ. ආර්. ජයවර්ධන (රාජ්‍ය ඇමති සහ අග්‍රාමාත්‍යතුමාගේත් ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේත් පාර්ලිමේන්තු ලේකම්)
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன—இராஜாங்க அமைச்சரும் பிரதம அமைச்சரதும் பாதுகாப்பு, வெளிவிவகார அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசியும்)
(The Hon. J. R. Jayewardene—Minister of State and Parliamentary Secretary to the Prime Minister and Minister of Defence & External Affairs)
මා හිතන්නෙ නැහැ ඒ පත්‍රයේ එහෙම තිබෙනවාය කියා. ඒ පත්‍රය මුද්‍රණය කරන්නෙ දෙමළ භාෂාවෙන්. මුන්නැහේ කියන්නෙ වෙන භාෂාවකින්.

ජයකොඩි මයා.
(திரு. ஜயக்கொடி)
(Mr. Jayakody)
ගරු රාජ්‍ය ඇමතිතුමා මේ දැන් මෙතැනට ආවෙ. මා මුලින් කිව්වා, මා දෙමළ කථා කරන්න දන්නේ නැත, මට දෙමළ තේරෙන්නෙත් නැත, මම එහි පරිවර්තනයක් දෙන්නම් කියා.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
එහෙනම් ඒක තමන්ම කරන පරිවර්තනයක්.

ජයකොඩි මයා.
(திரு. ஜயக்கொடி)
(Mr. Jayakody)
You are trying to mislead this House.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
You are trying to mislead the House. How do you know what is in Tamil ?

ජයකොඩි මයා.
(திரு. ஜயக்கொடி)
(Mr. Jayakody)
I have been saying that this is a translation from a Tamil paper.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
By whom ? How do you know it is correct ?

ජයකොඩි මයා.
(திரு. ஜயக்கொடி)
(Mr. Jayakody)
Please check it up.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
Why should I check it up ?

ජයකොඩි මයා.
(திரு. ஜயக்கொடி)
(Mr. Jayakody)
Because you doubt it.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
How do you know it is correct ?

ජයකොඩි මයා.
(திரு. ஜயக்கொடி)
(Mr. Jayakody)
මම රාජ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්න කැමතියි, කරුණාකර ඔය පත්‍රය ටිකක් කියවා බලා මට එහි නියම අදහස ඉදිරිපත් කරන්නය කියා.

ආචාර්ය එන්. එම්. පෙරේරා (යටියන්තොට)
(கலாநிதி என். எம். பெரேரா—யட்டியாந்தோட்டை)
(Dr. N. M. Perera—Yatiyantota)
He is taking responsibility for what he is saying.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

He says it is my paper. How dare he say it is my paper? You believe anything he says.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

I take responsibility for what I say. I have given you the date, the page and the column.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

But how do you know whether it is correct?

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

Please check up, and if it is wrong, then say so. I am prepared to accept it. I do not know why he is getting excited.

**සභාපති**
*(அக்கிராசனர்)*
(The Chairman)

The hon. Member said it was his paper. He is objecting to that. He says it is not his paper.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

එම නිසා මේ ජාතිවාදය ඇවිස්සෙන තැන කොතැනද කියා ටිකක් සොයා බලන්න. ඒ ස්ථානය මොකක්ද කියා හරි යටම සොයා බලන්න. දැනුත් ගරු රාජ්‍ය ඇමතිතුමා ටිකක් කලබල වුණා. ඔන්න ඔය විධියට තමයි ජාතිවාදය ඇවිස්සෙන්නෙ. තමාට සම්බන්ධ දෙයක් යම් තමට කියවෙන විට ඇවිස්සෙනවා. ඒ නිසා මා ගරු අගමැතිතුමාගෙන් ඉතාමත් බැගෑපත්ව ඉල්ලීමක් කරන්න කැමතියි. මේ වගේ ප්‍රකාශන රටේ හැම තැනම විසිර යනවා. ඒ සම්බන්ධයෙන් යම් යම් විපරම් කිරීම් කරනවා. ඒ විපරම් කිරීම ගැන මා නම් සතුටු වන්නේ නැහැ. ජාතිවාදය කියන දෙය සමහර විට මේ රටේ වැඩි ජනතාවට හානි වන දෙයක් විය හැකියි. සමහර විට මුස්ලිම් ජනතාවට හානි වන දෙයක් විය හැකියි. මේ රටේ වැඩි ජනතාවට හානි වන විධියට එය යම් ස්ථානයකින් පැනනැගී එනවා නම් කරුණාකර එය සොයා බැලීම සඳහා ඒ සම්බන්ධයෙන් කොමිෂන් සභාවක් පත් කරන්නය කියා මා ඉල්ලා සිටිනවා. එය අහක යන දෙයක් නොවෙයි. සිංහලයින් වෙනුවෙන් කතා කරන පුද්ගලයින් කව්ද, ද්‍රවිඩයින් වෙනුවෙන් කතා කරන පුද්ගලයින් කව්ද, මේ ජාතිවාදය තිබෙන්නේ කොතනද කියා එවිට සොයා බලන්න පුළුවනි. වැඩි ජනතාවගේ අයිතිවාසිකම්වලට පටහැනිව—මූලික අයිතිවාසිකම්වලට පටහැනිව—යම් යම් ප්‍රකාශන කර තිබෙනවා නම්, ඒවා ගැන සොයා බලා ඒවා ශුද්ධ පවිත්‍ර කර මේ ප්‍රශ්නය නිරාකරණය කිරීමට කොමිෂන් සභාවක් මගින් පුළුවන් වේවි යයි මා විශ්වාස කරනවා.

තවත් එක් කරුණක් මට කියන්න තිබෙනවා. අද සිටින පොලිස්පතිතුමාගේ කටයුතු සම්බන්ධව ගරු අගමැතිතුමා විශේෂයෙන්ම සතුටු වෙන්න ඕනෑ. මේ රටේ ජනතාව පොලිස්පතිවරුන් එම ධුරය භාරව කටයුතු කළ ආකාරය දැක තිබෙනවා. විශේෂයෙන්ම මේ පොලිස්පතිතුමාගේ කටයුතු සම්බන්ධව පළමුවෙන්ම මගේ ප්‍රශංසාව පුදකරන්න ඕනෑ. නමුත් එක් අඩුපාඩුවක් හැටියට මෙම කාරණය සඳහන් කරන්න ඕනෑ. නියෝජ්‍ය පොලිස්පතිවරුන් පිරිසක් පත් කිරීමට ගරු අගමැතිතුමා කල්පනා කළා. මා හිතන්නේ එම පත්වීම් පිළිබඳ විස්තර දැන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ඉදිරිපත් කර තිබෙනවා. තවත් එවැනි පත්වීම් කිහිපයක් අලුතින් කිරීමටත් සිදු වී තිබෙනවා. ඒ පත්වීම් කවදා කෙරෙනවාද, ඒ පත් කෙරෙන පුද්ගලයින් කව්ද කියන කරුණු ගැන මා හිතන්නේ අගමැතිතුමාටවත් මටවත් ප්‍රශ්න කරන්න පුළුවන්කමක් නැහැ. පොලිස්පතිවරයාගේ නිර්දේශ අනුවම එය වෙනවා නම් අපි බොහොම සතුටු වෙනවා. ඒ විධියට සිදු වෙනවා නම් ඉතාමත්ම හොඳයි. එයට හේතුව නම් මෙම දෙපාර්තමේන්තුවේ පරිපාලන කට



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයකොඩි මයා.]

යුතු ඉතාමත් උසස් ලෙස පොලිස්පතිතුමා කර තිබෙන නිසයි. ඒ නිසා එතුමාගේ නිර්දේශ ඉතාමත් වැදගත් වෙනවා. ඒ නිර්දේශ අනුවම කටයුතු කරන්නය කියා මා ගරු අගමැතිතුමාගෙන් ඉතාමත් කරුණාවෙන් ඉල්ලා සිටිනවා. මන්ද? මට ආරංචියි. මේ සම්බන්ධයෙන් යම් යම් ඇඟිලි ගැසීම් සිදු වෙනවාය කියා.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

කව්ද ඇඟිලි ගහන්නෙ?

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

මා මේ ස්ථානයේදී නම් ඉදිරිපත් කළාට වරදක් නැද්ද? රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජික මහත්වරුන්ගේ ඇඟිලි ගැසීම් සිදු වෙන බවයි අපට දැන ගන්න තිබෙන්නෙ. එවැනි ඇඟිලි ගැසීම් තිබෙනවාද නැද්ද කියන එක ගැන කරුණාකර සොයා බලන්න. තමුන්නාන්සේ පිළිගන්නවා ඇති, මෙය රහස් සේවයක් නොවන බව.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

තේරීමේ බලය තිබෙන්නෙ රාජ්‍ය සේවා කොමිෂන් සභාවටයි.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් තමයි පත්වීම් කරන්නෙ. පොලිස්පතිතුමාගේ නිර්දේශ කෙරෙහි විශේෂ සැලකිල්ලක් කරාවිය කියලයි මා විශ්වාස කරන්නේ. එතුමා දක්ෂයෙක් නිසා එතුමා හොඳ නිර්දේශ ඉදිරිපත් කරාවිය කියලත් මා විශ්වාස කරනවා. මුල සිටම පොලිස් සේවය ස්වාධීන සේවයක් හැටියට තිබෙන නිසා පත්වීම් සම්බන්ධව අභාග්‍යසම්පන්න තත්ත්වයක් ඇති වුණොත් එයින් මුළු සේවයම කඩාකප්පල් වී යනවා. පොලිසිය ආණ්ඩු පක්ෂයටවත් අපටවත් පක්ෂපාතීව කටයුතු කරන ආයතනයක් නොවෙයි. මැතිවරණ දෙපාර්තමේන්තුව වාගේ කිසිම අවස්ථාවක ආණ්ඩු පක්ෂයට පක්ෂවවත් අපට පක්ෂවවත් කටයුතු කරාවිය කියා අපි බලාපොරොත්තු වන්නේ නැහැ. මේ විධියටයි මැතිවරණය පවත්වන්නට ඕනෑ කියා ඩයස් අබේසිංහ මහත්මයාගේ රාජකාරිය ගැන අපි කියන්නට යනවා නම් එය වැරදියි. පොලිසියේ සිටින කොස්තාපල්වරුන් පරීක්ෂකවරුන් ආදීන්ගේ සිට උසස්ම ස්ථානයේ සිටින පොලිස්පතිතුමා දක්වා වූ හැම තැනකම යම් වරදක් අක්‍රමිකතාවක් සිදු වෙතොත් අපි මේ ගරු සභාවෙන් එය බේරුම් කර දෙන්නට ඕනෑ. එමෙන්ම පහර ගැසිය යුතු අවස්ථාවලදී පහර ගසන්නට ඕනෑ. සමහර විටක මන්ත්‍රීවරයෙක් ඉල්ලීමක් කරන්නට පුළුවන් අන්න අහවල් නිලධාරියාට කණගාටුදායක තත්ත්වයක් ඇති වී තිබෙනවා, ඒ ගැන බලන්නය කියා. එවැනි ප්‍රශ්න ගැන නොවෙයි මා කියන්නේ. මා කියන්නේ පොලිස් දෙපාර්තමේන්තුව තුළ විශ්වාසදායක තත්ත්වයක් තිබෙන්නට ඕනෑය කියන එකයි. කියන්නත් කණගාටුයි, අපට ලැබී තිබෙන ආරංචිවල අන්දමට ඒ විශ්වාසදායක තත්ත්වය ටිකක් කඩතොලු වී තිබෙනවා. හොඳටම කඩතොලු වී තිබෙනවාය කියා මා කියන්නේ නැහැ. සාමාන්‍යයෙන් රටක ආණ්ඩුව පෙරලීමේ කුමන්ත්‍රණයකට සහභාගි වී සිටියාය කී පුද්ගලයෙක් නැවත සේවයට ගත්තොත් ඒ සැකය ඇති වීම ස්වාභාවිකයි. අන්න ඒ නිසා ගරු අගමැතිතුමාගෙන් මා ඉල්ලා සිටින්නට කැමතියි. නියෝජ්‍ය පොලිස්පතිවරුන් පත් කරන විට හොඳ සේවයක් ඇති දක්ෂ පොලිස්පතිතුමෙක් යම් යම් කරුණු ඉදිරිපත් කරනවා නම් ඒවා පිළිගන්නය කියා. එසේ ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

පූ. භා. 11.45

**ආර්. ජී. සේනානායක මයා.** (දඹදෙණිය)
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க—தம்பதெனிய)*
(Mr. R. G. Senanayake—Dambadeniya)

මාත් මේ අවස්ථාවේදී වචන ස්වල්පයක් කථා කිරීමට බලාපොරොත්තු වෙනවා. ගරු සභාපතිතුමනි, අද රටේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විශාල ප්‍රශ්නයක් පැනනැගී තිබෙනවා ජාතිභේදවාදය ගැන. පොලිස් නිලධාරීන් ආදීන් රාජකාරි කරන විටත් ජාතිභේදවාදී කටයුතු කරන්නට එපාය කියන චෝදනාව පැන නගිනවා. පත්තරයක් මුද්‍රණය කරන විටත් ඒ ප්‍රශ්නය මතු වෙනවා. පාර්ලිමේන්තුවේ ප්‍රශ්නයක් ඇසුවත් ඒ ප්‍රශ්නය මතු වෙනවා. ඒ නිසා ජාතිභේදවාදය කියන්නේ කුමකටද කියා ස්ථිර වශයෙන් දැනගන්නට ඕනෑ.

පසුගිය කාලයේ රටසභා පනතට විරුද්ධව රටේ හැම තැනකම මා කථා කරන විට මා ජාතිභේදවාදියෙක් වුණා. එහෙත් ගරු අගමැතිතුමා ඒ රටසභා ප්‍රශ්නය අත්හැර දැම්මා. එතකොට මගේ ජාතිභේදවාදය එතුමා පිළිගත්තද, නැත්නම් මා එදා කථා කළේ ජාතිභේදවාදයක් නැතිවද? ඒ දෙකින් එකකට එකඟ වන්නට ඕනෑ. එසේ නැතිව යම් ප්‍රශ්නයක් පිළිබඳව සටන් කරන විට සටන ජය ගත්තොත් ජාතිභේදවාදය නැතිව යනවාද? ජාතිවාදය නම් කවදත් ජාතිවාදය වන්නට ඕනෑ. කරන සටනක යම් යුක්තිසහගත බවක් තිබෙනවා නම්, එමෙන්ම ආණ්ඩුවත් එය පිළිගන්නවා නම්, ජාතිභේදවාදය කියා එම සටන මර්දනය කරන්නට වීර්‍ය කිරීම අපරාධයක්; අයුක්තියක්.

ද්‍රවිඩ මුන්නේත්‍ර කසාගම් ප්‍රශ්නය මතු කරන්න කැමතියි. ජාතිභේදවාදය මහ නරක කැත දෙයක්ය කියා හංවඩු ගහනවා. එහෙත් නේරුතුමා තමන්ගේ රටේ ඒ පක්ෂය තහනම් කළා. එහෙනම් මේ රටේ එය කරන්නට බැරි ඇයි? දේශපාලන ප්‍රශ්නයක් නිසා ඒ සම්බන්ධව අගමැතිතුමාත් මේ ආණ්ඩුවත් යම් අදහසක් දරන්නට පුළුවන්. සිංහල කියන වචනයට යම් අකැමැත්තක් තිබෙනවා නම් හා එය මතු කිරීම ජාතිවාදයක්ය කියනවා නම්, එය දේශපාලන ප්‍රයෝජනය සඳහා කරන දෙයක්. එහෙත් එහි භයානකකම නිලධාරීනුත් ඒ අනුව කටයුතු කිරීමයි. මා දන්නවා පොලිස් නිලධාරීන් හුඟ දෙනෙක්ම දැන් ජාතිවාදය කියන එක එක්තරා විධියකට තේරුම් ගෙන තිබෙනවා. ද්‍රවිඩ මුන්නේත්‍ර කසාගම් චිත්‍රපටි පිළිබඳ දැන්වීම් අලවන විට එය ජාතිවාදය නොවෙයි.

එහෙත් "සිංහල ජාතිය" පත්‍රයේ තිබෙන දැන්වීමක් කොතනකවත් ඇලෙව්වොත් ඒක ජාතිවාදය. "සිංහල ජාතිය" පත්‍රය කියන්නේ ලංකාවට නිදහස දිනා ගැනීම සඳහා මගේ පියතුමා විසින් ආරම්භ කළ පත්‍රයක්. පියදාස සිරිසේන පඬිතුමාට අද ගරු කරන්නේ සුද්ධ භාෂාවෙන් ඒ සටන ඇරඹූ කෙනෙක් හැටියටයි. ඒ පත්‍රය මගේ පියතුමාගේ පත්‍රය. ඒ පත්‍රය අද තාප්පයක ගහන්නට යන විට ජාතිවාදය අවුස්සනවාය කියා පොලිසියට අල්ලා ගෙන යනවා. මොකක්ද අපේ රටට සිදු වී තිබෙන්නේ? සිංහල කිව්වොත් වැරදියි. වෙන ඕනෑම එකකට තැන දෙනවා. සිංහල කිව්වොත් ජාතිවාදීයි.

ගරු සභාපතිතුමනි, මේ ප්‍රශ්නය වැදගත් වන්නේ ඇයි? යම් අවස්ථාවක යම් සටනක් ගෙන යන විට ආණ්ඩුව විවේචනය කිරීමේදී සිංහල ප්‍රශ්නය උඩ විවේචනය කළොත් එය ජාතිවාදියි කියා එය නවත්වන්නට ඕනෑ කියන හැඟීම නිලධාරීන්ට ඇති වීම භයානක දෙයක්. ජාතිවාදය මේ යයි තෝරා බේරා දුන්නොත් අගමැතිතුමාටත්, නිලධාරීන්ටත්, මටත් ලොකු පහසුවක් ඇති වෙනවා. දෙමළුන් වගයක් මගේ වත්තට පැන එහි කොටසක් අල්ලා ගන්නට වීර්‍ය කළ අවස්ථාවේදී වත්ත පාලනය කළ උදවිය ඒ දෙමළුන්ට ගසා පැන්නූ විට ඔවුන් ජාතිවාදය ඇවිස්සුවා යයි චෝදනා කොට රිමාන්ඩ් භාරයේ තැබුවා. බලහත්කාරයෙන් වත්තට පැන කොටසක් අල්ලා ගන්නට හැදූ දෙමළුන්ට ගැසුවාම ජාතිවාදය ඇවිස්සුවා යයි කියමින් ඒ ගැසූ උදවිය අල්ලාගෙන ටික දවසක් රිමාන්ඩ් භාරයේ තැබුවා. තාප්පයක පත්තරයක් ඇලෙව්වොත් ඒකත් ජාතිවාදයලු. රුස්වීමක කථාවක් කළොත් ඒකත් ජාතිවාදයලු. ඇත්තෙන්ම මේ ජාතිවාදය කියන්නේ මොකක්ද?

තලවාකැලේ ඇති වුණු සිද්ධීන් දෙස බලන්න. තලවාකැලේ ඇති වුණු තත්ත්වය දැන් මුළු කඳුකරේම බෝවී ගෙන යනවා. මේ ගැන පරීක්ෂා කර බලන්නට වටිනවා. කඳුකරේ වතුවල වැඩ කරන ඉන්දියානුවන්ගේ ළමයින් අධ්‍යාපනය ලබා පාසල්වලින් පිට වූ විට ඔවුන්ට පමණක් වතුවල ලිපිකරු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ජී. සේනානායක මයා.]

තනතුරු "ටී මේකර්" තනතුරු ආදී සියලුම රක්ෂා දිය යුතු යයි එක්තරා වෘත්තීය සමිතියක් කියා සිටිනවා. සිංහලයන්ට වතුවල රක්ෂා නොදී දෙමළුන්ට පමණක් රක්ෂා දිය යුතු යයි තර්ජන ස්වරූපයෙන් කීම ජාතිවාදී ක්‍රියාවක් නොවෙයිද? එහෙත් එය ජාතිවාදී ක්‍රියාවක් නොවන විධියට සලකා තිබෙන බවයි, පෙනෙන්නට තිබෙන්නේ. තලවාකැලේ කංකානිට විරුද්ධව මතු වුණු ප්‍රධාන ප්‍රශ්නයත් ඕකයි. මින් මත්තට වතුවල දෙමළ දරුවන්ට පමණක් වතුවල රක්ෂාව දෙන්නලු. වෙනත් වෘත්තීය සමිතියක් ඔවැනි අයිතිවාසිකමක් ඉල්ලන වාද? දුම්රිය දෙපාර්තමේන්තුවේ වැඩ කරන උදවිය තමන්ගේ දරුවන්ට අනාගතයේදී දුම්රිය දෙපාර්තමේන්තුවේ රක්ෂා දිය යුතු යයි කීවත්, එය නොපිළිගෙන රටේ හැම දෙනාටම ඒ සඳහා අවස්ථාවක් දෙන්නට ඕනෑ යයි කීවා නේද? එහෙත් වතුවල වැඩ කරන පුරවැසිකම් පවා නැති උදවියගේ දරුවන්ට පමණක් වතුවල සියලුම රක්ෂා දෙන්නට ඕනෑ. මේක පුදුම වැඩක් නොවැ? මේ විධියට ගොස් අනාගතයේදී වතුවල පාලනයත් ඒ උදවිය අතට ගන්නට උත්සාහ කරනවා ඇති. පුරවැසියන් නොවූවත් වතුවල සියලු රක්ෂා ඔවුන්ට ඕනෑලු.

හෝලිරූඩ් වත්තේ ඇති වුණු සිද්ධිය මොකක්ද? ඒ වත්තේ කංකානි සිංහලයෙක්. ඔහු අස් කරන්නට හෝ මාරු කර යවන්නට හෝ දෙමළ පිරිසට වුවමනා වුණා. සිංහලයකු වීමයි, ඔහුගෙ නරකට සිටියේ. ඉතින් කොළඹ සිටින සිංහලයන් එකතු වී අසුවල් කාර්යාලයේ සිටින දෙමළ ලිපිකරුවන් අස් කළ යුතු යයි කියමින් වැඩ වර්ජනය කරනවාද? එවැනි පියවරක් ගන්නට ක්‍රියා කරන්නේ නැහැ. වෘත්තීය සමිතියකට, ප්‍රතිපත්තියක් හැටියට මෙවැනි වැඩක් ගැන බල කරන්නට පුළුවන්ද? එහෙත් දෙමළ උදවියගේ මේ ඉල්ලීම පිළිගෙන තිබෙනවා නේද? කඳුකරයේ දෙමළ උදවිය එකතු වී මෙවැනි දෙයක් ගැන බල කරන විට ඒක පිළිගන්නවා. එතකොට ඒක වෘත්තීය අයිතිවාසිකමක් හැටියට පිළිගන්නවා.

මා පසුගියදා තොන්ඩමන් මහතා සමග පෞද්ගලිකව කථා කරද්දී වතුකරයේ සිටින සියලුම සිංහල වෙළඳුන් පන්නා දමා, සමූපකාර සමිති පිහිටුවා වැඩ කරන ජනතාවට ඒ සමූපකාර සමිති මාර්ගයෙන් බඩු බෙදා හරිනවා යයි ඔහු කීවා. තලවාකැලේදී මේක කරන්නට පුළුවන් නම් අනෙක් තැන්වල මේක කරන්නට බැරිද? ඉතින් මේ ප්‍රතිපත්තිය කඳුකරය පුරාම පැතිරී යනවා නේද? එතකොට මුළු කඳුකරය දෙමළ ප්‍රාන්තයක් වෙනවා නේද? එක්තරා පිරිසකට පමණක් අමුතු වෘත්තීය සංගම් සටන් ප්‍රතිපත්ති, අමුතු බලපෑම් අමුතු තර්ජන කිරීමේ අයිතිවාසිකම් හිමි කර දී තිබෙන්නේ කුමන හේතුවක් නිසාද? තලවාකැලේ වතුවල බඩු බෙදා හැරීමට ආණ්ඩුව මඟින් සමූපකාර සමිති පිහිටුවහොත්, දෙමළ මුදලාලිලා සිටින ප්‍රදේශවල එවැනි සමූපකාර සමිති ආණ්ඩුව විසින් නොපිහිටුවන්නේ ඇයි? සිංහල වෙළෙඳ බලයක් තිබෙන නගරවල පමණක් ඒ විධියේ සමූපකාර සමිති පිහිටුවන්නේ ඇයි? පොලීසියට මේ පිළිබඳව නියම පැහැදිලි අදහසක් දී නැති නිසා, මෙය ජාතිවාදී ව්‍යාපාරයක්ද නැද්ද යන වග පොලීසිය දන්නෙ නැහැ. වෙනත් අය මෙය ජාතිවාදී ව්‍යාපාරයක් බව කියා කෑගසන විට ඒ අයට කරදර ඇති වන්නේ ඒ නිසායි. මෙය ඉතාමත් භයානක දෙයක්. එම නිසා, ජාතිවාදය යනු කුමක්දයි ඔබතුමාගේ හැඟීම අනුව පැහැදිලි කරන ලෙස මා ඉතා බැගෑපත්ව ඉල්ලා සිටිනවා. එවිට අපේ අදහස් අනුව පැහැදිලි ලෙස ක්‍රියා කරන්නට පුළුවන් වෙනවා. ජාතිවාදය කුමක්දැයි තෝරා බේරා ගන්නට එවිට නිලධාරීන්ටත් පුළුවන් වෙනවා.

පත් කළ මන්ත්‍රී තොන්ඩමන් මහත්මයාට විශේෂ සහන ලැබී තිබෙනවා. වතුවලින් ලැබෙන කම්කරු දායක මුදල් කෙලින්ම ඒ මන්ත්‍රීතුමාගේ සංවිධානයේ භාණ්ඩාගාරයට යවන ලෙස ආණ්ඩුව විසින්ම නියම කර තිබෙනවා. ඒ නිසා මුදල් එකතු කිරීම සඳහා අමුතු මහන්සියක් ගන්නට වුවමනාවක් නැහැ. චෙක්පත් කෙළින්ම තොන්ඩමන් මහත්මයාගේ සංවිධානයට යනවා. සිංහල කම්කරුවන් 50,000 ක් දෙනාත් මීට දායක මුදල් ගෙවන බව ඔබතුමා දන්නවා ඇති. මෙසේ

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

එකතු කෙරෙන මුදලෙන් සියයට 10 ක් සිංහල භාෂාවට විරුද්ධ සටන් ව්‍යාපාර ගෙන යාම සඳහා විශේෂයෙන් වෙන් කරන බව ඔබතුමා දන්නවාද? සිංහල භාෂාවට විරුද්ධව සටන් කිරීමට සිංහල යන්ගෙන්ම සල්ලි එකතු කරනවා. පුදුම වැඩක් නේද? මේ රටේ රාජ්‍ය භාෂාව සිංහලය විය යුතුය යන්න එකහෙලාම පිළි ගැනුණු ප්‍රතිපත්තියක්. එහෙත්, එක්තරා වෘත්තිය සංගමයකට බැඳී සිටින සිංහල යන්ගෙන් එකතු කරනු ලබන මුදලෙන් කොටසක් එකී පිළිගත් රාජ්‍ය භාෂා ප්‍රති පත්තියට විරුද්ධව සටන් කිරීම සඳහා යෙදවීමට ආණ්ඩුවමම ඉඩ දී තිබෙනවා. මෙහි ඇත්ත නැත්ත කුමක්ද යන වග, මොන්ටෙ ක්‍රිස්ටෝ කොමිෂන් වාර්තාව කියවුවොත් දැන ගන්නට පුළුවනි. එකී මුදල් එකතු කරන්නේ සිංහල විරෝධී සටන සඳහා බව තොන්ඩමන් මහත්මයා සාක්ෂි දෙන අවස්ථාවේදී කියා තිබෙනවා.

**සභාපති**

*(அக்கிராசனர்)*

(The Chairman)

Order, please! The Sitting is suspended till 2 P.M.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් සිටුවන ලදින්, අ. භා. 2 ට නැවත පවත්වන ලදී.**

*அதன்படி அமர்வு பி.ப. 2 மணிவரை இடை நிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று.*

*Sitting accordingly suspended till 2 P.M. and then resumed.*

**ආර්. ජී. සේනානායක මයා.**

*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*

(Mr. R. G. Senanayake)

ගරු සභාපතිතුමනි, මා සඳහන් කරමින් සිටියේ "ජාතිවාදී" කියන මෙම වචනයට විවිධ අර්ථයන් දී තිබෙන නිසා, නියම අර්ථය, නියම අදහස කුමක්ද කියා පෙන්වා දීම අගමැතිතුමාගේ යුතුකම බවයි. නිත රම ජාතිවාදී, ජාතිවාදී කියන වචනය පාවිච්චි කරනව; නමුත් මෙම ජාතිවාදී කියන වචනය කුමන අදහසින් පාවිච්චි කරනවාද කියා අප පැහැදිලි කර ගත යුතුව තිබෙනවා. රට බෙදන්න දඟලන උද විය, අවුරුදු පහක-හයක කාලයක් තිස්සේ රටේ පෙඩරල් ආණ්ඩුවක් ඇති කරන්න දඟලන උදවිය, දෙමළ රාජ්‍යයක් පිහිටු වන්න අවුරුදු ගණනාවක් තිස්සේ සටන් කරන උදවිය, ජාතිවාදීන් ලෙස හඳුන් වන්නේ නැහැ. නමුත් එසේ රට බෙදන්න එපාය කියන පිරිස ජාතිවාදීන් වශයෙන් හඳුන්වනවා. එකම ජාතිකයක් මේ රටේ ගොඩනැංවීමේත්, එකම භාෂාවක් රට පුරා පාවිච්චි කිරීමේත් අවශ්‍යතාව පෙන්වා දෙන යම් පිරිසක් සිටිනවා නම් ඒ අයට විරුද්ධව ක්‍රියා කරන, ඒවාගේම සිංහල භාෂාව මුළු රටේම පිළිගත් රාජ්‍ය භාෂාව ලෙස පාවිච්චි කිරීමට විරුද්ධව සටන් කරන, රට බෙදීමට උත්සාහ කරන, යම්කිසි පිරිසක් සිටිනවා නම් ඒ උදවිය ජාතිවාදීන් ලෙස හඳුන්වා දීමට හැම යුතුකමක්ම තිබෙනවා. රාජ්‍ය භාෂාව රට පුරාම ක්‍රියාත්මක කරන්න උපකාරි වීම, එසේම රාජ්‍ය භාෂාව නියම අන්දමට ක්‍රියාත්මක කරවාගන්න සටන් කිරීම ජාතිවාදී ක්‍රියාවක් ලෙස සලකනවා නම් එය පුදුමයට කරුණක් හැටියටයි පෙන්නා දෙන්න සිදු වී තිබෙන්නෙ. ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරවා ගන්න සටන් කරන විට ඒ අය ජාති වාදීන් රජයේ භාෂා ප්‍රතිපත්තියට පට හැණිව සටන් කරන විට, එසේ සටන් කරන පුද්ගලයන් ජාතිවාදීන් නොවීමට ඇති හේතුව නම් මට වැටහෙන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, කඳුකරයේ ජීවත් වන උදවිය වෙනමම රාජ්‍යයක් ගොඩනැංවීමට උත්සාහ දරා ගෙන යනවා පමණක් නොවෙයි, ඒ අයගේ වෘත්තීය සංගම් ඒ සඳහා අමුතු විධියේ ප්‍රතිපත්ති අනුගමනය කරගෙන යාමේ තත්ත්වයක් මතුවේගෙන එනවා. වෘත්තිය සංගම් මගින් කියනවා, ඒ උදවිය පාලනය කරන ඇතැම් නිල ධාරීන් අස් කරන්නය කියා. මුළු නගර යේ ම සිටින වෙළඳ ව්‍යාපාරිකයන් ඉවත් කර දැමීමට උපකාරයක් වශයෙන්, ආණ්ඩුවේ සංසථා ඇති කරන්නය, සමුප කාර මධ්‍යස්ථාන ඇති කරන්නය කියා වෘත්තීය සංගම් මගින් ඉල්ලීම් කරනවා. ප්‍රදේශයේ සිටින සිංහල වෙළඳ ව්‍යාපාරික යන් පන්නා දමන්න එබඳු ව්‍යාපාර ගෙන යාම ජාතිවාදී ක්‍රියාවක් ලෙස සලකන්නෙ නැහැ. එවැනි පියවරක් ගන්නට එපාය, සිංහල වෙළඳුන් පන්නා දමන්න ක්‍රියා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ජී. සේනානායක මයා.]

කරන්න එපාය කියා ඉල්ලීම ජාතිවාදී ක්‍රියාවක් ලෙස හඳුන්වනවා. විදේශවලින් චිත්‍රපට ගෙන්වීම නවතා දේශීය චිත්‍රපටවලට ආධාර කිරීම පිණිස රටේ ජනතාව නැගී සිටින විට, රැස්වීම් තබන විට, එය ජාතිවාදී ක්‍රියාවක්.

ද්‍රවිඩ මුන්නේත්‍ර කඝාගම් පක්ෂයට අයත් දකුණු ඉන්දියානු චිත්‍රපට මෙරටට ගෙන්වන්න එපාය කියා විශාල උද්ඝෝෂණයක් තිබුණා, රටපුරා රැස්වීම් පැවැත්තුවා. නමුත් පසුගියදා එවැනි පිරිසක් පොල්ගහවෙල රැස්වීමක් පවත්වන්න සූදානම් වන විට එම ස්ථානයට පොලීසියෙන් ගොස් ඒ පිරිස අල්ලා ගෙන ගොස් තිබෙනවා. හේතුව මොකද? ජාතිවාදී අදහස් පතුරුවන්න උත්සාහ කරනවාය කියා එයට බාධා පමුණුවා තිබෙනවා. විදේශික චිත්‍රපට ගෙන්වීම තහනම් කරන්නය කියා ඉල්ලා සිටින්න පුළුවන්කමක් නැහැ; ඒකත් ජාතිවාදීයි. දේශීය චිත්‍රපට කර්මාන්තය නගා සිටුවීම සඳහා සටන් කරන්න බැහැ; ඒකත් ජාතිවාදීයි. ඔන්න ඔය ආකාරයට ජාතිවාදය කියන්නේ කුමක්දැයි තේරුම් ගන්නට බැරි තත්ත්වයක් ඇති වී තිබෙනවා. අගමැතිතුමා හෝ ආණ්ඩුවේ උදවිය ජාතිවාදය කියන්නේ මෙන්න මේ දේවලටය කියා විග්‍රහ කර දෙනවා නම් අපට ඒ අනුව තර්ක කළ හැකියි. නමුත් මෙහි භයානක කරුණ වී තිබෙන්නේ ආණ්ඩුව කරන ප්‍රකාශනවලට අනුරූපව නිලධාරීන් ක්‍රියා නොකිරීමයි. දෙමළ චිත්‍රපටි මෙරටට ගෙන්වීම ගැන විරෝධය ප්‍රකාශ කරන්නට පොල්ගහවෙල රැස්වීමක් සංවිධානය කළ බව මා දැන් ප්‍රකාශ කළා. එවැනි රැස්වීම් තැබීම සාමාන්‍යයෙන් කාටත් තිබෙන අයිතිවාසිකමක්. අපට එකතුවී ඒ ආකාරයට අපේ විරුද්ධත්වය දක්වන්නට ඉඩකඩ තිබෙනවා. නමුත් මොකක්ද සිද්ධ වුණේ. පොල්ගහවෙල ඒ රැස්වීම සංවිධානය කළේ මගේ පක්ෂයේවත් විරුද්ධ පක්ෂයේවත් උදවිය නොවෙයි. එක්සත් ජාතික පක්ෂයෙම අයයි. ඒ අය සිර භරයට ගත්තා. සිර භාරයට ගෙන "මතුවට මෙවැනි රැස්වීම් පවත්වන්නට එපා; ජාතිවාදය අවුස්සන්නට එපා; බලා ගනිල්ලා" කියා තදින්ම තර්ජනය කර තිබෙනවා. මේ රටේ එවැනි පුදුම දේවල් සිද්ධ වෙනවා.

ඒවාගේම යම් දෙපාර්තමේන්තුවක ප්‍රධානියා හැටියට දෙමළ ජාතික නිලධාරියකු පත් වුණොත් වැඩි කලක් යන්නට පෙර—කුමන හේතූන් උඩද කියා මා දන්නේ නැහැ—ඒ මුළු දෙපාර්තමේන්තුවම දෙමළ ජාතික නිලධාරීන්ගෙන් පිරෙනවා. මොකද කියා ප්‍රශ්න කළොත් ජාතිවාදය මතු කරනවාය කියනවා. දෙපාර්තමේන්තුවේ සෑම තනතුරකටම දෙමළ ජාතිකයින් පමණක් බඳවා ගැනීම, දෙමළ වර්ගයාගෙන්ම දෙපාර්තමේන්තුව පිරවීම ජාතික වාදය නොවෙයි. එක සුළු ජාතියකට විශේෂයක් කර ඒ ජාතියේ අයටම රැකී රක්ෂා දීම යුතු දෙයක්ද? ඒක අයුතු දෙයක් නේද? එවැනි ක්‍රියා මාර්ග වැරදිය කීම, ඒවා පෙන්වා දීම ජාති වාදය කියනවා නම් ඒක හරිද? එමනිසා විශේෂයෙන්ම ලබන මැතිවරණය පවත්වන්නට මත්තෙන් මේ ජාති වාදය කියන වචනයේ අදහස ශුද්ධ කර දීම අප කාටත් ප්‍රයෝජන වන බව මා මතක් කරනවා.

ගරු සභාපතිතුමනි, සමහරුන් මා ජාති වාදියකු හැටියට හඳුන්වනවා. නමුත් මා ජාති වාදියකු නොවන බව ඔප්පු කරන්නට පුළුවනි. සියයට 80 ක් වන සිංහල වර්ගයාගේ අයිතිවාසිකම් ගැන සටන් කිරීම ජාති වාදය නොවෙයි; ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික යුතුකමක්. වැඩි ජනතාවගේ අයිතිවාසිකම් ගැන සටන් කිරීම ජාති වාදයය කියා මා කල්පනා කරන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, තවත් කාරණයක් තිබෙනවා. මෑතක සිට ගරු අගමැතිතුමා සංවර්ධනයටය කියා නොයෙකුත් ව්‍යාපාරවල මුදල් යොදවන විදේශිකයන් කිහිප දෙනෙකුම මේ රටට කැඳවා තිබෙනවා. බිර්ලා, ඔබරොයිඩ්, ටාටා යනාදී ඉන්දියානු ධන කුවේරයින් සමග සම්බන්ධකම් ඇති කර ගෙන තිබෙනවා. මේ පිරිසගේ එක්තරා දූෂිත වැඩ පිළිවෙළක් ගැන ඉන්දිරා ගාන්ධි මැතිණිය තීරණයක් ගෙන තිබෙන බව තමුන්නාන්සේලා දකින්නට ඇති. ලෝක් සභාවේ සෑම සැසිවාරයකදීම බිර්ලා ගැන විවේචනයක් ඇති වී තිබෙන බව මා දන්නවා. ඔය බිර්ලා වැනි උදවියගේ ජාවාරම්, බැංකු ජනසතු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කිරීමට එක හේතුවක්. ඉන්දියානු රුපියලේ අගය අඩු කරන බව කලින් දැන ගෙන මේ උදවිය ඊට කලින් මුදල් පිට කර පසුව නැවත ඒ මුදල් ගෙන්වා විශාල ලාභයක් ගත් බවටත් දූෂමාන ආරංචි තිබෙනවා. ඉන්දියානු පාර්ලිමේන්තු සාකච්ඡාවලදී බිර්ලා එතරම් පිරිසිදු පුද්ගලයකු හැටියට සලකන්නේ නැහැ. ඔය කොන්ග්‍රස් පක්ෂයේ වැඩි දෙනෙක් බිර්ලාගේ සාක්කුවේය කියා කථාවකුත් තිබෙනවා. බිර්ලාගේ ඕනෑම වැඩක් නිලධාරීන් මගින් සහ මන්ත්‍රීවරුන් මගින් කරවා ගන්නට පුළුවන්කම තිබෙනවා. ඒ තත්ත්වයෙන් බිර්ලා මුදල් පාවිච්චි කර තිබෙන බව ඉන්දියාවේ ප්‍රකට කරුණක්. එවැනි විශාල බලවත් ආණ්ඩුවක් තිබියදීත් දූෂණකම් කරමින් පෞද්ගලික ප්‍රයෝජනයට ඕනෑම කටයුත්තක්, කර ගන්නට පුළුවන්කම තිබෙන බිර්ලා වැන්නන් ලංකාවට ගෙන්වීමෙන් කුමන සංවර්ධනයක් බලාපොරොත්තු විය හැකිද යන ප්‍රශ්නය මම අහනවා. මුලින්ම බිර්ලාගේ ප්‍රශ්නය මතු කළේ අප බව මා ආඩම්බරයෙන් මතක් කරනවා. ඇත්ත වශයෙන්ම මේක බරපතල ප්‍රශ්නයක්; භයානක ප්‍රශ්නයක්. මේ පුද්ගලයා ලංකාවට ගෙන්වන්නට නුසුදුසු පුද්ගලයකුය කියා මා අනතුරු හැඟවීමක් කළා. බිර්ලාට විරුද්ධව දැන් විභාගයක් තිබෙනවා, ඉන්දියාවෙ. නමුත් අපි බිර්ලා හිස් මුදුනින් පිළිගෙන මේ රටේ අරඹන්න යන කර්මාන්තශාලාවකට මුල් ගලුත් තැබුවා. ඔහුට යම් කර්මාන්තයක් භාර දුන්නා. ඇත්ත වශයෙන්ම මෙවැනි පුද්ගලයින් ලංකාව වැනි කුඩා රටකට වැද්දගැනීම සුදුසුද ?

ඔබරොයිඩ් කණ්ඩායම ගැනත් ඉන්දියාවේ පරීක්ෂණ පවත්වාගෙන යනවා. ඔවුන් ගැනත් ඉන්දියානු ආණ්ඩුව කල කිරී සිටිනවා. ඒ කණ්ඩායමත්, ජාවාරම්වලට මැදි වුණු පිරිසක් හැටියට, විදේශ විනිමය සම්බන්ධයෙන් හොර ජාවාරම් ගෙන යන අය හැටියට, සඳහන් වුණු පිරිසක්. ඒ ඔබරොයිඩ් කණ්ඩායමත් මෙහාට ගෙන්වා ආණ්ඩුවෙන් ඉඩම් ලබා දී විශාල හෝටලයක් හැදීම ඔවුන්ට භාර දී තිබෙනවා. මේ රටේ දියුණුව සඳහා උපකාර කිරීමට ඉන්දියාවෙන් එන අය ඒ තරම් හොඳ අය නොවෙයි. මීට පෙර ඉන්දියාවෙන් චිබ් නමැති කෙනකු ගෙන්නුවා, මේ රටේ සංචාරක ව්‍යාපාරය දියුණු කිරීම් සඳහා. [බාධා කිරීමක්] කර්මාන්ත සඳහා විදේශිකයන් මේ රටට ගෙන්වා ගැනීමට අවසර දෙන්නේ ගරු අගමැතිතුමයි. ඒ අය සුදුසු නැත කියන්නට ගරු අගමැතිතුමාට අවස්ථාව තිබෙනවා. ඩී. එස්. සේනානායක අගමැතිතුමාගේ කාලයෙදීත්, යම් විදේශිකයකු ගෙන්වන්නය කියා ඇමතිවරයකු යෝජනා කළත් අගමැතිතුමා එයට කැමැත්ත දිය යුතුව තිබුණා.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

ඔය කාරණය ගැන සඳහන් කරන්න පුළුවන්, කර්මාන්ත අමාත්‍යාංශය ගැන කථා කරන විට.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

එසේ නම් මා ඒ ගැන ඒ අවස්ථාවේදී සඳහන් කරන්නට බලාපොරොත්තු වෙනවා. මේ රටේ දියුණුකිරීම සඳහා විශේෂඥයන්ය කියා ඉන්දියාවෙන් ගෙන්වා ගන්න අය ඉන්දියාවෙ පට්ටපල් හොරුන් හැටියට භාර ගත් අයය කියන්නටයි, මා උත්සාහ කෙළේ.

ගරු සභාපතිතුමනි, සිරිමා-ශාස්ත්‍රී ගිවිසුම අනුව එක්තරා කොටසකට මේ රටේ පුරවැසිකම දෙන්නට නීතියක් සම්මත කර ගන්නා ලද බව තමුන්නාන්සේට මතක ඇති. 37,000 ක පමණ පිරිසක් ඉන්දියාවට යන්නට සතුටු වුණාද, එසේ නැත්නම් ඉන්දියාවට ගියාද කියා මා හරියට දන්නෙ නැහැ, ඒ ගිවිසුමේ තිබෙන්නේ ඉන්දියාවට යාම ගැන නොවෙයි, යන්නට සතුටු වීම ගැන පමණයි. 7 දෙනකු ඉන්දියාවට යන්නට සතුටු වන විට 4 දෙනකුට මේ රටේ පුරවැසිකම දෙන්නට ඕනෑ. කෙසේ වෙතත් 37,000ක් ඉන්දියානු පුරවැසි ගොඩට වැටී තිබෙනවා. ඒ අය ඉන්දියාවට යන්නට සතුටු වුණාද, එසේ නැතිව ඇත්ත වශයෙන්ම ඉන්දියාවට ගියාද කියා මා දැන ගන්නට සතුටුයි. ඒ අනුව තවත් ප්‍රශ්නයක් පැන නගිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ජී. සේනානායක මයා.]

පුරවැසිකම ලබා ඉන්දියාවට යන කෙනකුට අඩු ගණනේ රුපියල් 4,000 කවත් විනිමයක් ගෙන යන්නට පුළුවන් බව ඒ ගිවිසුමේ තිබෙනවා. ඊට වඩා වැඩි ගණනක් වුණත් ගෙන යන්නට පුළුවනි. ගෙන යන ගණන ලක්ෂය දක්වා වුණත් වැඩි වන්නට පුළුවන්. 37,000ක් ගියා නම් ඒ පිරිස මේ රටින් ලක්ෂ කීයක් අරගෙන ගියාද කියා මා දැන ගන්නට සතුටුයි. fපික්ස් ක්‍රමයට ගෙවිය යුතු බද්ද ගෙවන්නෙ නැතිව මුදල් ගෙන යන්නට ඔවුන්ට අවසර දී තිබෙනවා. ඒ අනුව ඔවුන් ගෙන ගිය මුදල කොපමණද කියා මා දැන ගන්නට සතුටුයි. ඒ උදවිය ගොස් නවතිනවාද එසේ නැතිව ආපසු එනවාද කියාත් ඒ සමගම දැන ගන්නට සතුටුයි. මේ රටින් පිට කරන උදවිය නැවත නොඑන ආකාරයට යවා ගන්න අපේ යුද හමුදාව හා නාවික හමුදාව වෙරළ ආරක්ෂක සේවයේ යෙදී සිටින බව නිතරම අපට දැනුම් දෙනවා. නාවික හමුදාව භාරයේ තිබෙන මුර බෝට්ටු පසුගිය අවුරුද්දේ පැය කීයක් වැඩ කර තිබෙනවාද කියා ගරු අගමැතිතුමාගෙන් මා අහන්නට කැමතියි. වැඩ කළ පැය ගණන හැමවෙලේම වාර්තාවේ සටහන් කරනවා. දවසක් වැඩ කළොත් පැය 24ක් වැඩ කළාය කියා සටහන් කරනවා. ඊට අඩු නම් පැය ගණන මෙපමණයි කියා සඳහන් කරනවා. මේ ගණන් හිලව් ලොග් පොතේ සටහන් වෙනවා. අපේ උතුරු ප්‍රදේශය රකින්නට බෝට්ටු කීයක් යොදවා තිබෙනවාද, සාමාන්‍යයෙන් මාසයකට පැය කීයක් බෝට්ටුවක් මුර සේවයේ යෙදෙනවාද කියා මා දැන ගන්නට සතුටුයි. බෝට්ටුවක් පිට වෙන්නේ ඉතා කලාතුරකිනුයි. බොහෝ විට ගොඩට ඇද තිබෙන බව මට ආරංචියි. පාවිච්චි කරන්නට ලැහැස්ති වන විට මොකක් හරි කොටසක් කැඩී තිබෙන බව පෙනී යන නිසා මේවා නිතරම අළුත් වැඩියා කරනවලු. ඒවා අළුත්වැඩියා කරමින් සිටිනවා මිස කවදාවත් ඒවා වතුරෙහි ගමන් කරන බෝට්ටු නොවෙයි. ඒ බෝට්ටු මුර සේවයේ යෙදෙන බෝට්ටු නොවෙයි.

අ. භා. 2.15

ගරු සභාපතිතුමනි, මේ බෝට්ටු සුදුසු නැත්නම් සුදුසු බෝට්ටු වර්ගයක් සොයා ගන්නට ඕනෑ. මේක දැන් අවුරුද්දක දෙකක සිට පැන නැග තිබෙන ප්‍රශ්නයක් නොවෙයි. අවුරුදු ගණනාවක සිටම මේ ප්‍රශ්නය තිබෙනවා. එක වර්ගයක බෝට්ටු ගත්තාම කියනවා, මේවා පදවන්න පුළුවන්, ගැඹුරු මුහුදේ පමණය, නොගැඹුරු මුහුදේ පදවන්න බැරිය කියා. තවත් වර්ගයක් ගත්තාම කියනවා, සැර මුහුදේ මේවා පදවන්න බැරිය, මේවා පදවන්න පුළුවන් සැර අඩු මුහුදේ පමණයි කියා. තවත් වර්ගයක් ගත්තාම ඒවායේ වේගය මදිය කියනවා. අපි කුමන වර්ගයේ බෝට්ටුවක් ගත්තත් ඒ සෑම එකකම මොකක් හරි අඩුපාඩුවක් තිබෙනවලු. කල්ලතෝනින් මොන ශාස්ත්‍රයක් අනුව කරනවාදැයි මා දන්නෙ නැහැ, කොතරම් ගැඹුරු මුහුදෙ වුණත්, කොතරම් වේගය මදි වුණත් ඔවුන් නිතරම වල්ලම් මගින් මේ රටට එනවා. අපි මොකටද එංගලන්තයට ගිහින් බෝට්ටු හොයන්නෙ? අපේ නාවික හමුදාවටත් වල්ලම් ටිකක් අරන් දෙමු. මේ වැඩි ශාස්ත්‍රයට ගියාම මුර සේවයේ යොදවන්න එක බෝට්ටුවක්වත් නැතිව යනවා. කල්ලතෝනින් එන්නෙ වල්ලමෙන්. අපේ උදවියට බෝට්ටුවලින් මුර සේවය කරන්නට බැහැ. මේ කාරණය ගැන අගමැතිතුමාගේ බලවත් අවධානය යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ඊළඟ කාරණය. ගරු සභාපතිතුමනි, මේ රටේ වස්තුවෙන් කොටසක් බඩු හැටියට හොරෙන් පිටවෙනවා. ලංකාවට ගෙනෙන බඩුවලට විශේෂ ලේබලයක් යොදන්න කියා නියමයක් කරන්නට ගරු අගමැතිතුමාට පුළුවන්කමක් නැද්ද? "එක්ස් පෝර්ට්ස් වු සිලෝන්" කියා හෝ වෙනත් සුදුසු විධියකට ඒ විධියේ ලේබලයක් ගහන්නට නියම කර ඊට පසු අවුරුද්දක් ගත වුණාම මදුරාසියේ කඩයකට ගිහින් බැලුවොත් තමුන්නාන්සේට පෙනෙයි, මේ "එක්ස්පෝර්ට්ස් වු සිලෝන්" කියන ලේබල් තිබෙන බඩු කොයිතරම් විශාල තොගයක් ඒ කඩවල තිබෙනවාද කියා. මොකද, මෙහාට ගෙන්වන බඩු ඔක්කොම හොර මාර්ගවලින් යන්නෙ එහාටයි. යම්කිසි බෙහෙත් ද්‍රව්‍යයක් ගැන මම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සෞඛ්‍ය ඇමතිතුමාගෙන් ඇහුවාම උන්නැහේ කියනවා, " අයිසෙ මම ගිය අවුරුද්දේ ගෙන්වූ ප්‍රමාණයම මේ අවුරුද්දේත් ගෙන්නුවා " කියා. වර්තාත් පෙන්වනවා. එහෙත් මහජනතාව අතර බෙදන්න ඒ බඩු මෙහෙ නැහැ. බඩු වැඩි හරියක් මේ රටෙන් පිට කරනවා. අපේ දුප්පත් අසරණ ලෙඩුන් බෙහෙත් නැතිව මිය යනවා. ඒ නිසා මේ රටට ගෙන්වන බඩු සඳහා වෙනම ලේබල් ක්‍රමයක් හෝ වෙනම ඇහිරීමේ ක්‍රමයක් සකස් කරන්නට මාගර්යක් සොයා ගන්නට බැරිද කියා මා අහනවා. එවිට අපේ රටට එන බඩු අපතේ යන ආකාරය මැන ගන්න පුළුවන්. හොරෙන් පිටරට ඇදී යන ප්‍රමාණයත් මැන ගන්න පුළුවන්. මේ අන්දමට අපේ රටින් පිටරට ඇදී යන මුදල කොපමණදැයි සොයා නොගෙන කවදාවත් අපේ ආර්ථිකය සකස් කර ගන්නට පුළුවන්කමක් නැහැ. හැම රටකින්ම අපි පුළුවන් තරම් ආධාර ලබාගෙන මේ රටේ රැස් කර ගන්නට උත්සාහ කරන අතර ඒ ධනය මේ රටේ රැඳෙන්නෙ නැත්නම් ඒ මුදලින් ප්‍රයෝජන ලැබෙන්නෙ අපට නොවෙයි, ඒ ධනය හොර රහසේ ඇදී යන රටටයි.

ගරු සභාපතිතුමනි, මා මතු කරන්නට බලාපොරොත්තු වන ඊළඟ කාරණය, උතුරේ මුර සේවාවල යෙදී සිටින යුද හමුදාවත් නාවික හමුදාවත් අතර කිට්ටු සම්බන්ධතාවක් නොමැතිකමයි.

කල්ලතෝනීන් මැඩ පැවැත්වීම පිණිස ත්‍රිකුණාමලයේ මධ්‍යස්ථාන කිහිපයක් තිබෙන බව මම දන්නවා. එතන දෙතුන් දෙනෙක් නැවතී ඉන්නවා. ඒ අයට නාවුක හමුදාවත් සමග සම්බන්ධතාවක් තිබෙනවා නම් මුහුදෙන් එන උදවිය ගැන තොරතුරුවත් ලබා ගන්නට පුළුවන්කමක් ඇති වෙනවා. රේඩියෝවක්වත් ඒ අය ළඟ නැහැ. ජීප් රථයක් නම් කලාතුරකින් තිබෙනවා වෙන්නට පුළුවනි. තුඩාරමක් ගහගෙන වෙරළ අයිනේ තබාගෙන සිටියාට එයින් කිසිම ප්‍රයෝජනයක් ලැබෙන්නේ නැහැ. යම් සංවිධානයක් තිබෙනවා නම් එය යුද හමුදාවට පවරන්න. කල්ලතෝනි මර්දනය භාර අය හැටියට පැහැදිලි නියමයක් කරන්න. මගේ කල්පනාවේ හැටියට නම් කල්ලතෝනි මර්දනය සඳහා ප්‍රධාන අංශ තුනම පාවිච්චි කරන්නට ඕනෑ. අහස් යාත්‍රා, නාවුක, පාබළ යන හමුදා තුනම සම්බන්ධ කරගෙනයි මේ වැදගත් කාර්යය සාර්ථක ලෙස සිදු කිරීමට උත්සාහ කළ යුත්තේ. කල්ලතෝනි ප්‍රශ්නය විසඳීමට මා දන්න තරමින් නම් අහස්යාත්‍රාවල කිසිම සම්බන්ධතාවක් ලබාගෙන නැහැ. ඒවායින් ඉටු විය යුතු ක්‍රියා මාර්ගයක් ගැන නියමයක් නැති බවයි පෙනී යන්නේ. ඒ අයගේ කිසිම සම්බන්ධයක් නැති බව අපට නිතර අහන්නට ලැබෙනවා. ප්‍රධාන අංශ තුනේම කිට්ටු සම්බන්ධකමක් නොමැති බව මතක් කරන්නට ඕනෑ.

හෙලිකොප්ටර් යන්ත්‍ර කීපයක් තිබෙනවා. වෙරළ ආරක්ෂාවටයි ඒවා ඉතාම ප්‍රයෝජනවත් වන්නේ. සර් ඔලිවර් ගුණතිලක උන්නැහේ සභාපති වශයෙන් ඉන්න කාලයේ විශේෂ කොමිෂන් සභාවක් පත් කර තිබුණා. උන්නැහෙත් පිළිගෙන තිබුණා මුර සැලැස්මක් ඇති කරන්නට හෙලිකොප්ටර් ප්‍රයෝජනවත් බව. හෙලිකොප්ටර් දෙක තුනක් එහි ඇතත් ඒවා පාවිච්චි කරන්නේ කලාතුරකින් ඇමතිවරයකුට රැස්වීමකට යන්නට ඕනෑ වුණාම හෝ වෙනත් නිල ගමනක් යන්නට ඕනෑ වුණාමයි. ඒ හැර, මුර වැඩකට පාවිච්චි නොකරන බව ගරු අගමැතිතුමා දැනගත යුතුයි. ඒ කාරණයත් විශේෂයෙන් මතක් කරන්නට කැමතියි.

ආගමන විගමන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හැටියට වැඩිපුරම ඉන්නෙ දෙමළ නිලධාරීන් බව මතක් කරන්නට සිදු වී තිබෙනවා. මා එසේ කියන්නේ චෝදනාවක් හැටියට නොවෙයි. ඒ උදවිය පමණක් මේ තනතුරුවලට සුදුස්සන් වන්නේ මන්දැයි තේරුම් ගන්නට අමාරුයි. එහෙත් දෙමළ නිලධාරීන්ම වැඩි වශයෙන් එහි සිටීම නම් පුදුමයක්. මේ තනතුරු දෙමළ නිලධාරීන්ගෙන්ම පුරවන්නට හේතුව කුමක්ද? මට පෙනෙන හැටියට නම්, දෙමළ කෙනකු වීම ආගමන විගමන දෙපාර්තමේන්තුවේ වැඩ කිරීමට විශේෂ සුදුසුකමක් වෙලා තිබෙනවා. මොකද එහෙම වෙලා තියෙන්නේ ? මේ කාරණය ගැන කියන්නට තිබෙන්නේ කුමක්ද? දේශපාලන වශයෙන් ඒ සම්බන්ධකම් මට පෙනෙන හැටියට නම් බොහොම තදින් තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ජී. සේනානායක මයා.]

දකුණු ඉන්දියාවෙන් එන අයට නම් විශේෂ සම්බන්ධකමක් තිබෙනවා. ඒ කොයි හැටි වෙතත් මේ දෙපාර්තමේන්තුවේ ඇති තනතුරු ඒ උදවියගෙන්ම පිරවීම නුවණට හුරු නැහැ කියලයි මම නම් කියන්නේ. මේ රටේ සිටින අනෙක් උදවියටත් ඒ දෙපාර්තමේන්තුවේ සේවය කිරීමට අවකාශ වක් දිය යුතුයි.

ආගමන විගමන දෙපාර්තමේන්තුව විශාල වශයෙන් දූෂණ තිබෙන ආයතනයක් බවට අද රටේ රාවයක් තිබෙනවා. කාල සීමාව දික් කර ගන්නට වුවමනා නම් පගාවෙන් එය කර ගන්නට පුළුවන්ය කියනවා. එවැනි රාවයක් තිබෙන බවයි මා කියන්නේ. එක් පිරිසකට පමණක් දිගටම මේ ස්ථානයේ වැඩ කටයුතු කරගෙන යෑමට ඉඩ දීමෙන් තත්ත්වය වඩාත් නරක් වන්නට ඉඩ තිබෙනවා. එය අපේ රටේ ආරක්ෂාවට හේතු නොවන බව මතක් කරන්නට ඕනෑ.

"වීරකේසරී" පත්‍රය ගැනත් කියන්නට ඕනෑ. මේ පත්‍රය ගැන ඔබතුමා දන්නවා. පත්‍ර කොමිෂන් සභාව පුවත්පත් ජනසතු කිරීමට විරුද්ධව සඳහන් කර තිබුණත් ජනසතු කළයුතු එකම එක පත්‍රය හැටියට වාර්තා කර තිබුණේ මේ පත්‍රයයි. ඊට හේතුව මොකක්ද? මේ පත්‍රයේ අයිතිකාරයෝ ලංකාවේ වාසය කරන්නන් නොවෙයි. සියලු දෙනාම, ඒ කාලයේ, පිට අය නිසා 'වීරකේසරී' පත්‍රය ජනසතු කළ යුතුයි යනුවෙන් සඳහන් කර තිබුණා. පත්‍ර ජනසතු කළයුතු නම් ජනසතු කළ යුත්තේ 'වීරකේසරී' පත්‍රය පමණයි යනුවෙන් සඳහන් කර තිබුණා. දැන් පිටරට උදවියයි, මේ රටේ උදවියයි හවුල් වී කරන වාදයි මා දන්නේ නැහැ. ඒ දෙමළ පත්‍රයේ වාර්තා වගයක් දිවුලපිටියේ ගරු මන්ත්‍රීතුමා (ජයකොඩි මයා.) විස්තර කර දුන්නා. ඒවා ගැන විශේෂ සැලකිල්ලක් දක්වන්නට ඕනෑ. අපේ පාලකයන් හුඟ දෙනෙක් ඉංග්‍රීසි පත්‍රවල පළ වන ප්‍රවෘත්ති ගැන නම් නිතරම සෝදිසියෙන් ඉන්නවා. සිංහල පත්‍ර කියවන අයත් ඒ අතර ටික දෙනෙක් ඉන්නවා. එහෙත් දෙමළ පත්‍ර කියවන්නේ, ඒවායේ වාර්තා ගැන සැලකිලිමත් වන්නේ ඉතාම ටික දෙනයි. මෙරටට දෙමළ පත්‍ර 94 ක් පිටරටින් එනවා. එසේම ද්‍රවිඩ මුන්නේත්‍ර කඝාගම් පක්ෂයේ පත්‍ර අට නවයකුත් මෙරටට එනවා.

ඉන්දියාවේ බැනියම්, සාරි, පදක්කම් ආදියත් අනන්තවත් මේ රටට ගෙන්වනවා. ඒ ගැන කවුරුවත් විරුද්ධත්වයක් දක්වන්නේ නැහැ. හැබැයි චීන පදක්කම් වගයක් මෙරටට ගෙන්නුවාය කියා නම් විශාල උද්ඝෝෂණයක් කළා. මාඕ සේතුංගේ පදක්කම් ගෙන්නුවාය කියා ඒ තරම් විශාල කැළඹිල්ලක් ඇති කළත්, අන්නදොරේගේ පිංතූර බෙදීම ගැන නම් කිසිම ශබ්දයක් කරන්නේ නැහැ. ඇයි, මේ වෙනස? අපට කාගේවත් පදක්කම්, පිංතූර ආදිය වුවමනා නැහැ. නායකයන් වශයෙන්, අගමැතිතුමාගේත්, විරුද්ධ පාර්ශ්වයේ නායිකාවගේත් පදක්කම් තිබුණොම අපට ඇති. පිටරටවල නායකයන්ගේ පදක්කම්, ලේබල් අපට වුවමනා නැහැ. [බාධා කිරීමක්] හොඳයි, චෙල්වනායගම් මහත්මයාගේ ලේබලුත් තිබුණා දෙන්. අපේ රටවැසියන් වෙනත් රටවලට පක්ෂපාතිත්වයක් දක්වන්නට වුවමනා නැහැ. එසේම එක් එක් රටවලට අනෙක් රටවලට වඩා විශේෂ වරප්‍රසාද ප්‍රදානය කිරීමත් හොඳ නැහැ. ද්‍රවිඩ මුන්නේත්‍ර කඝාගම් පක්ෂයේ නායකයන්ගේ ලේබල් මේ රටේ ද්‍රවිඩයන්ට අවශ්‍ය දෙයක් නොවෙයි. මේ රටේ දියුණුවට එයින් ලැබෙන රුකුල මොකක්ද? මේ රටේ සමහර මිනිසුන් තුළ, ආණ්ඩු පක්ෂයේ හෝ විරුද්ධ පාර්ශ්වයේ නායකයන් පිළිබඳව ගෞරවයක් ඇත්තේ නැහැ. ඔවුන්ගේ ගෞරවය තිබෙන්නේ විදේශික නායකයන්ටයි. ඒ ගැන අපේ විශේෂ සැලකිල්ල යොමු වන්නට ඕනෑ.

දේශපාලන ප්‍රශ්නවලදී මධ්‍යස්ථව කටයුතු කරන්නට පොලීසිය බොහොම මහන්සි ගන්නා බව අප දන්නවා. එහෙත් රට තුළ පවතින යම් යම් මත උඩ මේ රටේ වැසියන්ගේ යම් යම් ව්‍යාපාර අපරාධකාරී ලෙස හංවඩු ගහන්නේ නැතිව, ඒවාට පහර නොගහා කටයුතු කරන ලෙස පොලීසියට අවවාද කරන ලෙස ගරු අගමැතිතුමාගෙන් ඉල්ලා සිටින්නට කැමැතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**බර්නාඩ් සොයිසා මයා.**

(திரு. பெர்னாட் சொய்ஸா)

(Mr. Bernard Soysa)

සභාපතිතුමනි, රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයට අයත් වැය ශීර්ෂ යටතේ පුරුදු පරිදි කාරණා රාශියක් කියන්නට තිබෙනවා. ඒවා නැවත නැවතත් කියන්නට සිදු වී තිබෙන්නේ ඒ පිළිබඳව නියමිත විසඳුමක් ඇති කිරීම සඳහා නිසි පියවර ගෙන තිබෙන බවට තවම සාක්ෂි නැති නිසායි.

ඒ කාරණා අතුරින් පළමුවෙන්ම සඳහන් කරන්නට තිබෙන්නේ පොලීසිය සම්බන්ධයෙනුයි. පොලීසිය ගැනත්, දැනට සිටින පොලිස්පති ගැනත් දිවුලපිටියේ ගරු මන්ත්‍රීතුමා ප්‍රශංසනීය වචන පාවිච්චි කරමින් කථා කළා.

අ. භා. 2.30

අප කාටත් එකඟ වෙන්න පුළුවන් කාරණයක් තිබෙනවා. පොලිස්පතිතුමා අපක්ෂපාතව වැඩ කටයුතු කරගෙන යන නිසාත්, පොලීසිවලට කැඳවාගෙන යන අයට මැරවරයන්ට සලකන්නාක් මෙන් නොව මනුෂ්‍යකමක් ඇතුව සලකන ලෙස පොලීසිවලට උපදෙස් දී තිබෙන නිසාත්, පොලීසිය අපරාධ මර්දන ආයතනයක් හැටියට තිබෙන නමුත් නොනිසි ලෙස බලහත්කාරකම් කිරීම නුසුදුසු නිසා එසේ නොකිරීමට උපදෙස් දී තිබෙන නිසාත්, පොලීසිවල අභ්‍යන්තරික පාලනය ඒ ආකාරයට හැඩගැස්වීම නිසාත් පොලිස්පතිතුමාට අප කාගේත් ප්‍රසංශාව හිමිවිය යුතුයි.

එහෙත් කොයි තරම් දුරට මේ උපදෙස් පිළිපදිනවාද කියන කාරණය ගැන නම් අපට මෑතක සිට යම් සැකයක් ඇති වෙනවා. රටේ අපරාධ වැඩිවේගෙන යන බව අප පිළිගන්නවා. ඊට මුල් වී ඇති මූලික හේතු ගැන අද සාකච්ඡා කරන්න වුවමනාවක් නැහැ. සමාජයේ කුමන කොටස් අතරේ වුවත් දැන් දැන් අපරාධ වැඩිවේගෙන යන බවයි අපට පෙනී යන්නෙ. බන්ධනාගාරය භාරව සිටින කොමසාරිස්වරයාගේ වාර්තාව කියෙව්වත්, පොලිස්පතිතුමාගේ වාර්තාව කියෙව්වත්, උසාවි රෙජිස්ට්‍රාර්ගේ වාර්තාව කියෙව්වත් අපට සාමාන්‍ය වශයෙන් හැඟී යන්නේ එන්න එන නම අපරාධ සංඛ්‍යාව වැඩිවේගෙන යන බවයි. මීට හේතු වශයෙන් සමාජයීය සහ ආර්ථික හේතු රාශියක් තිබෙනවා. ඒවා ගැන දැන් සාකච්ඡා කිරීමෙන් පලක් ඇතැයි කියා මම කල්පනා කරන්නේ නැහැ. මක්නිසාදයත්, මෙම හේතූන් මුලිනුපුටා දැමීමට මේ ආණ්ඩුව පියවරක් ගන්නවා යයි මට විශ්වාසයක් නැති නිසයි.

එහෙත් සමහර දේවල් ගැන නම් කටයුතු කරන්නට ආණ්ඩුවට අයිතියක් හා යුතුකමක් තිබෙනවා. අපරාධ වැඩි වන නිසා පොලීසිවලට විකක් අමාරු තත්ත්වයකට මුහුණ පාන්නට සිදු වන අවස්ථා තිබෙනවා. එම නිසා අප පොලීසිවලටම දොස් කියන්න වටින්නෙ නැහැ. සමහර ප්‍රදේශවල අපරාධ ඇති වන ප්‍රමාණයේ හැටියට, ඒ ප්‍රදේශවල වැඩ කටයුතු කරගෙන යාමට සිටින පොලිස් භට සංඛ්‍යාව මදි බවයි මගේ හැඟීම. ප්‍රදේශයේ වැඩ කටයුතු කිරීමට පොලිස් භටයන් අඩුකම නිසා ඔවුන්ට යම් කිසි බියකින්, සැකයකින් ක්‍රියා කිරීමට සිදු වෙනවා. ඒ නිසා එක පාරටම ඔවුන් බලහත්කාරකම් පෙන්වන්න යෑම පුදුමයට කාරණයක් නොවෙයි. ඒ නිසා ගරු අගමැතිතුමාගෙන් මා ඉල්ලන්න කැමතියි ඒ ඒ ප්‍රදේශවල වුවමනා ප්‍රමාණයට පොලිස් භටයින් බඳවා ගන්නය කියා. හැබැයි රට පොලිස් භටයින්ගෙන් පුරවන්නය කියා මා කියන්නෙ නැහැ. රැකී රක්ෂා ප්‍රශ්නය මේකෙන් විසඳන්න යන්න බැහැ. නමුත් අප කියා සිටින්නේ ප්‍රදේශයේ අවශ්‍යතාවන්ට සරිලන පරිදි පොලිස් භටයින් සිටිනවාද යන ප්‍රශ්නය කෙරෙහි සිත යොමු කරන්නයි.

රට කවුරුන් පාලනය කළත් මෙම ප්‍රශ්නය දේශපාලන මත උඩ ඇති වන ප්‍රශ්නයක් නොවෙයි. ඒ සම්බන්ධව බලනවා නම්, දේශපාලන ඝට්ටනවලදී මෙන් පොලිසියත් සමග ඝට්ටනය වී පොලීසියෙන් පහර කෑ කෙනෙක් හැටියටයි මා කථා කරන්නෙ. ඒ කෙසේ නමුත් ඒ ඒ පළාත්වල අවශ්‍යතාවන්ට අනුව පොලිස් භටයින්ගේ ප්‍රමාණය වැඩි කළ යුතුය කියා ඉල්ලීමක් තිබෙනවා නම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]
එයට ඇහුම්කන් නොදී සිටීමෙන් පොලීසියේ පාලන වැඩ කටයුතු කරගෙන යෑමට අවහිරයක් ඇති වෙනවා. මෙයට නිදර්ශනයක් මම දෙන්නම්.

දකුණු කොළඹට අයිති කිරිල්ලපොනේ ආරක්ෂක මධ්‍යස්ථානයක් නොහොත් "ගාඩ්රූම්" කියන මධ්‍යස්ථානයක් තිබුණා. එය නිසි විධියට සංවිධානය වූ පොලිස් කාර්යාලයක් නොවෙයි. පොලිස් භටයින් දෙතුන් දෙනෙක් එහි හිටියා. නිසි විධියට නිල බලයක් ඇති කෙනෙක් පත් වී සිටියේ නැහැ. මේ ගැන මා කීප විටක්ම මේ ගරු සභාවෙන් මින් පිටත දීත් කරුණු කීමේ ප්‍රතිඵලයක් වශයෙන් අර ආරක්ෂක ස්ථානය ඉවත් කර පොලීසියක් ඇති කළා. එහෙත් අලුතෙන් ඇති වුණ පොලීසියේ තත්ත්වය අර කලින් තිබුණ ආරක්ෂක මධ්‍යස්ථානයේ තත්වයට වඩා අමුතු වුණාය කියා පිළිගන්න අමාරුයි. එහි සාමාන්‍ය වශයෙන් උප පොලිස් පරීක්ෂකවරයෙක් පමණයි සිටින්නෙ. ඊට වඩා උසස් නිලධාරියෙක් නම් පත් වී නැහැ. මෙම උප පොලිස් පරීක්ෂක තැන නිවාඩු යන විට ඒ වෙනුවට වැඩ බැලීමට යම් යම් අය යවනවා. ඒ ආකාරයෙන් උසස්වීම් බලාපොරොත්තුව සැරයන්කම වැනි තනතුරුවල වැඩ බැලීම් කරන පොලිස් කොස්තාපල්වරුන්ට උසස්වීම් සඳහා ඉඩකඩ තිබිය යුතුය කියා මාත් පිළිගන්නවා. එහෙත් යම්කිසි වගකීමක් භාර වූ පසු එය නිසි විධියට උසුලන්නට නොහැකි කෙනෙකුට එවැනි තත්ත්වයක් භාර වූ විට පොලීසියටත් මහජනතාවටත් අනතුරට මුහුණ පාන්නට සිදු වෙනවා. ඒ බව පෙන්වන්නට හැකි සාක්ෂියක් වශයෙන් කිරිළපොනේ ඊයේ පෙරේදා ඇතිවුණු සිද්ධිය ගැන සඳහන් කළ හැකියි. මා ඒ පිළිබඳව මෙම සභාව ඉදිරියෙහි ප්‍රශ්න කළ විට කිව්වා, එම ප්‍රශ්නය උසාවි විනිශ්චයට භාර දී තිබෙන හෙයින් ඒ ගැන මෙම ස්ථානයෙහි සාකච්ඡා කරන්නට බැරි බව. එතන සිදු වුණේ මොන අන්දමේ සිද්ධියක්ද?

ගරු සභාපතිතුමනි, කාණ්ඩ දෙකක් අතර දේශපාලන වශයෙන් පදනමක් නොමැතිව එක්තරා ඝට්ටනයක් ඇති වුණා. එම සිද්ධියෙහිලා කවුරු හරිද කවුරු වැරදිදැයි සොයා බැලීම මෙම සාකච්ඡාවට වුවමනා වන්නේ නැහැ. මෙම ගැටුම නිසා එතන කලබලකාරී තත්ත්වයක් පහල වුණා. එම කලබලකාරී තත්ත්වය මෙල්ල කිරීමට ගිය පොලිස් හමුදාව භාරව සිටියේ තාවකාලිකව වැඩ බලන සුළු නිලධාරියෙක්. එතැනදී කුමක් ද ඔහු අතින් සිදු වූයේ? එතන ඇතිවූ තත්ත්වය මෙල්ල කර ගැනීම පිණිස නිසි විධියට මොළය පාවිච්චි කරන්නට ඔහුට බැරිවුණු නිසා එක පාරටම තුවක්කුව පාවිච්චි කරන්නට ඔහු තීරණය කළා. සමහර රටවල—අපේ රටෙත් එසේ සිටිනවාය කියන්නට පුළුවනි—හමුදාවල සහ පොලීසිවල ආරක්ෂක කටයුතු භාරව සිටින අය හොස්ස ළඟින් මැස්සා ගිය හැටියේ කොකා පන්නන්නයි බලන්නේ.

**ඩී. ෂෙල්ටන් ජයසිංහ මයා. (කර්මාන්ත හා ධීවර ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**
*(திரு. ஷெல்டன் ஜயசிங்க—கைத்தொழில், கடற்றொழில் அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*
(Mr. D. Shelton Jayasinghe—Parliamentary Secretary to the Minister of Industries and Fisheries)
කොකා පෙන්වනවාද පන්නනවාද?

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
ඒ විධියට ක්‍රියා කිරීමෙන් පොලිසියටත් මහජනතාවටත් අනතුරක් සිදු වෙනවා මිස අන් දෙයක් සිදු වන්නේ නැහැ. ඒ පිළිවෙළටයි කිරුළපොනේ කටයුතුත් සිද්ධ වුණේ. මිනී මැරීමේ චේතනාවෙන්, මරණයක් සිදු කිරීමේ කල්පනාවෙන්, එම සුළු පොලිස් නිලධාරියා අණ දුන්නායැයි මා කියන්නේ නැහැ. එහෙත් මිනිහා බියට පත්ව තිබෙනවා. ඔහුගේ එම බියසුළුකම නිසා ඉක්මනට තුවක්කුව පාවිච්චි කිරීමට පැන්නා. එම සිද්ධිය නිසා කීප දෙනෙකුට බලපතල තුවාල සිදු වුණා. එක්තරා දුප්පත් අම්මණ්ඩි කෙනෙක් එම සිද්ධියෙහිදී මරණයට පවා පත් වුණා. මේ පිළිබඳව පසුව ඇති වුණු පරීක්ෂණයේදී වුවමනා නැති ප්‍රමාණයට බොරු සාක්ෂි ඉදිරිපත් වුණු බව නම් මා දන්නවා. එය කනගාටුවට කරුණක්. පොලීසිය සිටියේ කොයි පැත්තේද, වෙඩි තැබුවේ කොයි පැත්තට ද යනාදී කරුණු සොයා බැලූ විට එළිදරව් වන තත්ත්වය කුමක්ද? අර හර්තාල්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කාලයේදීත් සමහර වෙඩි උණ්ඩ ගුවන මැද කැරකී යන සිරිතක් ඇති වී තිබුණා. ඒ විධියට මේ වෙඩි උණ්ඩත් රවුමේ ගිහින් කැරකැවී ඇවිල්ලයි මේ දුප්පත් අම්මණ්ඩිට වැදී තිබෙන්නේ.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
Boomerang bullets.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ඒ කාලයට නාම පුරුදු වුණේ නැහැ නෙ. ඒ ගැන කීම දැන් පසෙකට තබමු. මූලික ප්‍රශ්නය ගැන කතා කරමු. කිරිළ පොනේ පොලිස් ස්ථානය නිසි විධියට සංවිධානය වූ එකක් නොවෙයි. එතැනට වුවමනා පොලිස් භටයන්ගේ ප්‍රමාණයත් ඇත්තේ නැහැ. නිසි විධියට ක්‍රියා කරන්නට හැකි නිලධාරියෙකුත් එතැන නැහැ. එහි සිටින්නේ උප පොලිස් පරීක්ෂකවර යෙක් පමණයි. එදා එම සිද්ධිය ඇති වන විට ඔහු සිටියේත් නැහැ. ඔහු වෙනුවට තාවකාලිකව වැඩ බලන කෙනෙක් පම ණයි සිටියේ. එතන පැනනැගුණු සිද්ධිය මෙල්ල කර ගන්නට බැරි වූ විට ඒ මිනිහා බිය වුණා. බියෙන් යුක්තව ක්‍රියා කළා. මෙය සිදු වුණේ මේ විධියටය කියා මාත් පිළිගන්නවා. එහෙත් මෙම සිද්ධියෙන් තුවාල ලත් අයට කරන්නේ කුමක්ද? ඇතැම් පොලිස් භටයන්ටත් තුවාල සිදු වී තිබෙනවා. සමහරුන්ට ගල් පහරවලින් තුවාල සිදු වුණා. දුප්පත් අම්මණ්ඩි කෙනෙක් අන්තරා වුණා. ඒ උදවියගෙන් යැපෙන අයට සහ ඒ උදවියට ළඟ නෑදෑ කම් තිබෙන අයට කිසිම වන්දියක් ගෙවන්නටවත් තවම කල්පනා කර නැහැ. එම සිද්ධියෙහිදී තුවාල ලත් කෙනෙකුගේ කකුලක් ශල්‍යකර්මයකට භාජන කොට සම්පූර්ණයෙන් කපා වෙන් කර දමන්නට සිදු වුණා. එවැනි අයට වන්දියක් නොගෙවන්නේ ඇයි?

ඊයේ පෙරේදා අපි පනතක් සම්මත කර ගත්තා. එම පනත යටතේ මෙම සිද්ධිය වෙනුවෙන් නඩුවක් දැමීම සඳහා නීති උපදෙස් සොයන්නට ගිය අවස්ථාවේදී මට කීවේ එම පනත යටතේ වුවමනා කරන රෙගුලාසි පනවන තුරු එය ක්‍රියාත්මක කරන්නට බැරි බවයි. ඉතින් ඒ උදවියට කුමන පැත්තකින්වත් සහනයක් ඇත්තේ නැහැ. මෙතනදී මේ ප්‍රශ්නය මතු කළ විට කියනවා, එය විනිශ්චයට භාජනය වී තිබෙන දෙයක් නිසා එය මේ අවස්ථාවේ දී මතු කරන්න එපාය කියා. දැන් එය විනිශ්චයට භාජනය වී නැහැ. නීති උපදෙස් ගැනීම සඳහා එම පරීක්ෂණයේ වාර්තාව අපේ ඇටර්නි ජෙනරාල් දෙපාර්තමේන්තුවට යැව්වා. ඇටර්නි ජෙනරාල් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනය ගැන නම් කිසිම කෙනෙකුට සතුටු වෙන්නට පුළුවන් කමක් නැහැ. නමුත් උපදෙස් ගන්න යාම ගැන අගමැතිතුමාට දොස් කියන්නත් බැහැ. රජයට විරුද්ධව නඩුවක් ඇති වුණොත් එයට කතා කරන්නේ ඇටර්නි ජෙනරාල් දෙපාර්තමේන්තුවෙනුයි. ඒ නිසා ඒ දෙපාර්තමේන්තුවෙන් දෙන උප දෙස් භාර ගැනීම ගැන අගමැතිතුමාට අනු කම්පා කරනවා මිසක් එතුමාට දොස් කියන්න පුළුවන්කමක් නැහැ. නමුත් ඇටර්නි ජෙනරාල් දෙපාර්තමේන්තුවේ අමිහිරි වැඩපිළිවෙළ දැන් කාටත් තිත්ත වෙලයි තිබෙන්නෙ.

ඇටර්නි ජෙනරාල් දෙපාර්තමේන්තුවෙන් දුන්න උපදේශය කුමක්ද? මෙය කල් පනාකාරීව සිතා මතා කරන ලද මරණයක් නොවන බවයි කිව්වෙ. නමුත් වෙඩි තැබී මෙන් නැත්නම් වෙඩි සැරයකින් කෙනෙක් මරා දැමීමට වුවමනාවක් නො තිබුන බවත් ඔප්පු වී තිබුණා. මහෙස් ත්‍රාත්තුමාගේ වාර්තාවෙන් කියා තිබෙ නවා නඩුවක් වුවමනා නැත කියා. කෙසේ වුණත් මා මේ අවස්ථාවේදී ඉල්ලා සිටින් නේ ඒ අයට දඬුවම් කරන්න කියා නො වෙයි. යම්කිසි කෙනෙක් මරණයට පත් කළ නිසා ඒ දෙය කළ පුද්ගලයාත් මරණ යට පත් කළ යුතුය කියන පුද්ගලයෙක් නොවෙයි මා. මා එහෙම කියන්නෙ නැහැ. නමුත් මේ තුවාල ලත් අයට—පොලිස් භටයන් අතර සිටින අයට හෝ අනිකුත් මහජනතාව අතරේ සිටි අයට—වන්දියක් නොගෙවන්නේ ඇයිද කියන ප්‍රශ්නයයි මම අහන්නෙ. නමුත් නාත්සේලා සම්මත කර ගත් පනත යටතේ යමක් ලබා ගන් නටත් බැහැ. තවම එහි රෙගුලාසි පනව ලත් නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

Your Delict Bill cannot be operated. You have not framed your regulations.

ඒ නිසා මා ගරු අගමැතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ කිරුළපනේ පදිංචි තුවාල ලත් ඒ අයටත්, ඒ වගේම තුවාල ලත් පොලිස් භටයන්ටත්, මැරුම් කෑ අයගේ උරුමයන් ලබා ගැනීමට සිටින අයටත් යන හැම දෙනාටම නිසි විධියට වන්දියක් ගෙවීමට කටයුතු කරන ලෙසයි.

ඒ වගේම සියවස ප්‍රදර්ශනය අසලින් යන වාහනයකට අසු වී මැරුණ පොලිස් භටයෙක් ගැන කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමා (ඉලංගරත්න මයා.) මීට ඉහතදී මතක් කරන්න යෙදුණා. ඒ පොලිස් භටයාගේ නෑදෑයින්ට ඔහුගෙන් යැපෙන අයට යම්කිසි වන්දියක් ගෙවීමට දැන් තීරණය කර තිබෙනවාද කියා මා අහන්න කැමතියි. පොලිස්පතිතුමාගේ වාර්තාවක් තිබුණා, ප්‍රකාශයක් තිබුණා, සම්පූර්ණයෙන් ඒ සිද්ධිය තක්සේරු කර වන්දියක් ගෙවන්නට බලනවාය කියා. ඒ සම්බන්ධයෙන් කුමන පියවරක් දැනට අරගෙන තිබෙනවාද යන්න මා ගරු අගමැතිතුමාගෙන් දැන ගන්න කැමතියි.

ගරු සභාපතිතුමනි, පොලිසිය ගැන කතා කරන විට මා මේ කරුණ මතක් කළේ, නිසි විධියට පොලිස් භටයන්ගෙන්—නිලධාරීන්ගෙන්—සංයුක්ත වූ පොලිස් පාලක ස්ථාන ඇති නොකිරීමෙන් මතුවිය හැකි මේ විධියේ අතවරයක් ගැන විශේෂයෙන් ම පෙන්වා දීමටයි. නමුත් මෙහි තවත් පැත්තක් තිබෙනවා. මා ගරු අගමැතිතුමාට කියන්න කැමතියි, සාමය ආරක්ෂා කිරීමට සිටින සංවිධානයක් වශයෙන්, මහ ජනයා අතරේ ගැවසෙන පොලිස් නිලධාරීන් සිටියත් යම් පළාතක තත්ත්වය පිරිහුණාය, සමාජයේ අපරාධ වැඩි වේගෙන යනවාය කියන කාරණය උඩම නිගමනය කරන්න බැහැ, හැම පොලිස් නිලධාරියෙක්ම හොරෙක්ය නැත්නම් අපරාධකාරයෙක්ය කියා. හොඳ ශීලාචාර මනුස්සකම් දන්නා ශිෂ්ඨසම්පන්න පොලිස් නිලධාරීනුත් සිටින බව කියන්න ඕනෑ. නමුත් හැම දෙනාම ඒ විධිය නොවෙයි. සමහර අවස්ථාවලදී මට දැන ගන්න ලැබී තිබෙනවා, සමහර පොලිස් නිලධාරීන් මහජනයාට කතා කරන්න පටන් ගන්නේ කුනුහරුප පාවිච්චි කරමිනුයි. ඒ අය කල්පනා කරන විධියට එවැනි අවස්ථාවලදී පාරේ කිසිම කෙනෙක් ගමන් නොකළ යුතුයි. නමුත් ඒ පාරේ ගැවසෙන ජනයා බොහොමයි. වාහනයෙන් බහින්නේ කුණුහරුපයක් කියාගෙනයි. අපරාධකරුවෙක්ය කියන සැකය පිට යම් කෙනෙක් පොලිසියට අල්ලා ගෙන ගිය විට ඔහු ගැන ක්‍රියා කරන්නට පටන් ගන්නා විටම ඔහු අපරාධකාරයා හැටියට තීරණය කර ඉවරයි. කුණුහරුපයෙන් මිස ශීලාචාර භාෂාවෙන් කථා කරන්නට දන්නේම නැති සමහර පොලිස් නිලධාරීන් සිටිනවා. මා විශේෂයෙන් කියන්නේ අපරාධ මර්දනය වැනි කටයුතුවලට ශීලාචාරකමින් තොරව කටයුතු කරන්නට වුවමනාවක් නැත කියලයි. මා කලිනුත් කිව්වා, මීට කලින් අපි දේශපාලන කටයුතු සම්බන්ධයෙන් මේ රටින් පිට වෙනත් පොලිසිවලට අසු වී තිබෙනවා. මට මතකයි දේශපාලන වුවමනාවක් සම්බන්ධයෙන් කල්කටාවේ පොලීසිය මා හිරබාරයට ගත් අවස්ථාවේ ඒ පොලිස් නිලධාරීන් වෙනත් සිරකරුවන්ට සැලකූ අන්දම ගැන. ඔවුන්ට ගැහැව්වා. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ගේ වුවමනාව පිට දේශපාලන වශයෙන් වැරදිකරුවන්ය කියා පිළිගත් අයට ගැහැව්වා. එහෙත් ශීලාචාර භාෂාවෙන් කථා කරලයි ගැහැව්වේ. යටත් පිරිසෙයින් ඔවුන්ට ඒ භාග්‍යය වත් ලැබුණා. කය රිදෙන පහරක් ගැහැව්වාට සිත රිදෙන වචනයක් කීවෙ නැහැ.

අ. භා. 2.45

ගරු සභාපතිතුමනි, අපේ පොලීසියට විශේෂ අමාරුවකට තිබෙන්නේ මෙයයි: පොලීසියේ සේවා කොන්දේසි වෙනස් කරන්නය කියා අපි මෙතන වරින් වර කොපමණ කීවත්, අවුරුද්දෙන් අවුරුද්ද කොපමණ කීවත්, ඒවා වෙනස් වී ඇති ප්‍රමාණය මදි. පොලීසියේ පහළ නිලධාරියෙක් පගාවක් ගත්තාය, සත 50 ක් ගත්තාය කීවාට, වැඩක් නැහැ. ඔවුන්ට අපි ගෙවන පඩිය මදි. ජීවන වියදම නැග තිබෙන ප්‍රමාණය අනුව බලන විට එම පඩිය ඔවුන්ට ජීවත් වන්නට මදි. අද පොලිස් භටයා ජීවත් වන්නෙත් සාමාන්‍ය කම්කරුවාගේ තත්ත්වයෙන්මයි. කම්කරුවන්වත් අද ජීවත් වන්නට එම මුදල මදි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නම්, එයින් තමන්ගේ පවුල නඩත්තු කර ගන්නට බැරි නම්, පොලිස් භටයෙකුට, සරයන් කෙනෙකුට, උප පොලිස් පරීක්ෂක යෙකුට හෝ පොලිස් පරීක්ෂකයෙකුට, ඔවුන්ට ලැබෙන පඩියෙන් ජීවත් වන්නට පුළුවන්ද? ජීවන වියදම වැඩි වී ඇති ප්‍රමාණය අනුව බලන විට ඒ අයට ජීවත් වන්නට බැහැ. ඒ නිසා ඔවුන් ණය වෙනවා; කිට්ටුව තිබෙන කඩේට ණය වෙනවා; ගෙවල් කුලී ගෙවා ගන්නට බැරි වෙනවා. එවැනි තත්ත්වයකට මුහුණ පාන නිලධාරියා අපක්ෂපාතීව කටයුතු කරන්නට ඕනෑය කියා හිතේ තබාගෙන කටයුතු කරන්නේ කොහොමද? එය බොහොම අමාරු වැඩක්. ඒ නිසා පොලිස් භටයින් හා පරීක්ෂකවරුන් වැනි අය ණයගැති වීමෙන් වළක්වන්නට ඕනෑ. ඒ සඳහා ජීවන වියදමට සරිලන අන්දමට පඩිය සේවා කොන්දේසි වෙනස් කරන්නට සභාවක මාර්ගයෙන් කටයුතු කරගෙන යන නිසා මේවා වෙනස් කරන්නට, මේ සේවා කොන්දේසි වෙනස් කරන්නට, අවස්ථාව ගරු අගමැතිතුමාට තිබෙනවා.

ගරු සභාපතිතුමනි, රජයේ සේවකයින් වර්ග කීපයක් සිටිනවා. යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) මුදල් ඇමති වශයෙන් සිටි කාල යේ ඒ මන්ත්‍රීතුමාගේ වුවමනාව පිට භාණ්ඩාගාරයේ නිලධාරීන් සමග මා මේ ගැන පරීක්ෂණයක් කළ නිසා මේ ගැන මා දන්නවා. සේවකයින් වර්ග කීපයක් සිටිනවා. තමන්ගේ වැඩ කටයුතුවල ස්වභාව නිසාම පැය 8 ක දිනයක් දෙන්නේ නැත කියන කොටසකුත් සිටිනවා. එය වෙනස් කරන්නට දැන් කාලය පැමිණ තිබෙනවා. දැන් අපට ඕනෑ තරම් සේවක යින් බඳවා ගන්නට පුළුවන්. අද ඇති වී තිබෙන්නේ රැකිරක්ෂා නැති ප්‍රශ්නයයි. ඒ නිසා රැකිරක්ෂා සඳහා පුහුණු කර ගන්නට දැන් පුළුවන්කම තිබෙනවා. වෛද්‍ය හෙද ආරක්ෂක කටයුතු ආදී සේවාවල යෙදී සිටින අයට අතිකාල දීමනා නැහැ; පැය අටේ දිනක් නැහැ. නිසි විධියට පැය අට වැඩ කරනවාද, තමන්ගේ වැඩවලින් නිදහස් වන්නේ කොයි වෙලාවටද යනාදී වශයෙන් රාජකාරියට නියමිත වේලාවක් නැහැ. තමන්ට අයිති නිවාඩු කවදා කොයි වෙලාවට ලැබෙනවාද කියා විශ්වාසයක් තබා ගන්නට පුළුවන්කමක් නැහැ. තමන්ගේ ජීවිතය හරියාකාර පදනමක් උඩ සංවිධානය කර ගන්නට මේ අයට බැ. ඒ නිසා පොලිස් නිලධාරීන් දස වධ විඳින පිරිසක් හැටියට සලකන්නට සිදු වී තිබෙනවා. මේ අය වධ විඳිනවා. වධ විඳින උදවිය ඇතැම් අවස්ථාවලදී කේන්ති ගිය විට අනික් අයටත් වධ දෙන එක පුදුම යක් නොවෙයි. ඒ නිසා මේ තත්ත්වයෙන් මේ අය ගොඩ ගන්නට ඕනෑ. මීට පෙර අවස්ථාවකදී මේ නිලධාරීන්ට අතිකාල දීමනා නොගෙවීම ගැනත් මේ නිලධාරීන් ගේ පඩිය ප්‍රමාණවත් නොවීම ගැනත් මතක් කළ විට ගරු අගමැතිතුමා කීවේ පඩි කොමිෂන් සභාවට ඒ ප්‍රශ්න ඉදිරිපත් කරන බවයි. දැන් පඩි කොමිසන් සභාව වැඩ කරගෙන යනවා. හැබැයි, ඒ පඩි කොමිසන් සභාව අනෙක් රජයේ සේවකයන්ට මෙන් මේ උදවියටත් සාමාන්‍ය වැඩිවීමක් දෙන්නට නිර්දේශ කරනවා නම් එයින් සිදු වන්නේ දැනට පවතින විෂමතා ඒ විධියටම ඉදිරියටත් පවත්වා ගෙන යැමට ඉඩ ලැබීමයි. ඒ නිසා නිලධාරීන්ගේ පඩි වැඩි කරන අතර දැනට පවතින විෂමතා ඉවත් කළ යුතුව තිබෙනවා.

පොලිස් භටයන්ගේ නිවාස ප්‍රශ්නය ගැන කල්පනා කර බලමු. අද නිසි විධියට නිවාස නැහැ. ගෙවල් කුලී ගෙවා ගන්නට බැරිව හිඟ හිටි විට පදිංචිකරු අමාරුවේ වැටෙනවා. සමහර තැන්වල බැරැක්ක තිබෙනවා. එහෙත් ඒ බැරැක්ක නිවාස මනුෂ්‍ය වාසස්ථාන හැටියට සුදුසු නැහැ. නුවරඑළියේ පොලිස් නිවාස සම්බන්ධ යෙන් මා කියන දේට වලපනේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. එම්. හේරත් මයා.) සාක්ෂි දරනවා ඇති. ඇත්තෙන්ම ඒ නිවාස කිසිම විධියකින්වත් මනුෂ්‍ය වාස යට සුදුසු නැහැ. මා ඒ නිවාස දැක්කා. නිවාස සම්බන්ධයෙන් මතු වන ප්‍රශ්න යක් විසඳා ගැනීමට පොලිස් දෙපාර්තමේන් තුව එක්තරා වැඩ පිළිවෙළක් ගෙන යනවා. පොලිස් භටයකු ගොස් නිවාසයක් සොයා ගත්තායින් පසුව, ඔහුගෙන් ඉල්ලීමක් ඇති වුණත් නැතත් ගෙවල් හිමියාත් සමග ගිවිසුමක් අත්සන් කර ඒ නිවස පොලිස් දෙපාර්තමේන්තුවට බද්දට ගන්නට ඒ දෙපාර්තමේන්තුව ක්‍රියා කරනවා. පොලිස් දෙපාර්තමේන්තුවත් ගෙවල් හිමි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

යාත් අතර ගිවිසුමකින් ඒ ගෙය පොලිස් දෙපාර්තමේන්තුවට බද්දක් හැටියට ලැබුණාම අතුරු බද්දක ආකාරයකින් පොලිස් භටයාට ගෙය ලැබෙනවා. පොලිස් භටයාගේ පඩියෙන් මුදල් එකතු කර ගන්නට පුළුවන් වීම මෙහි පදනමයි. දෙවනුව ගෙවල් හිමියාගේ බලපෑමට යට වන්නට පොලිස් භටයාට සිදු වන්නේ නැහැ.

එහෙත් මෙහි තවත් පැත්තක් තිබෙනවා. ඉල්ලීමක් නැතිව මේ නිවාස ගත්තාම ඒ මාර්ගයෙන් නිවාස ප්‍රශ්නය විසඳන්නට පුළුවන් වෙතැයි දෙපාර්තමේන්තුව කල්පනා කරනවා. මම උදාහරණයක් දෙන්නම්. කොම්පඤ්ඤ වීදියේ වැඩ කළ පොලිස් භටයකු ගල්කිස්සට මාරු කර යැවූ අවස්ථාවේදී ඒ පොලිස් භටයා හැම තැනම රස්තියාදු වී බොහොම අමාරුවෙන් ගෙයක් කුලියට ගත්තා. ගෙට කුලිය රුපියල් 35 යි. අවුරුද්දක් පමණ ඔහු ඒ නිවිසේ වාසය කළා. ඊට පසුව සේවා කාලයට වුවමනා කරන වර්ෂ ගණන සම්පූර්ණ වී විශ්‍රා යෑමේ තත්ත්වයට ආවා. ඒ අවස්ථාවේ දී ඇති වුණු අමාරුකම් නිසා මාස දෙකක කුලී හිඟ හිටියා. පසුව මේ කුලිය බදින්නට ගෙවල් හිමියා ළඟට ගිය අවස්ථාවේදී, "දැන් මේ කුලිය මට දෙන්නට එපා; බටහිර කොට්ඨාශය භාර උප පොලිස්පතිට මේ කුලිය යවන්න; මම මේ නිවස පොලීසියට බදු දී තිබෙනවා; පොලිස් දෙපාර්තමේන්තුව මේ ගේ මගෙන් බද්දට ගෙන තිබෙනවා; ඒ නිසා දැන් තමුසේ පදිංචිව සිටින්නේ පොලිස් දෙපාර්තමේන්තුව මගෙන් බද්දට ගත් නිවසකයි" යනුවෙන් ඔහුට කියා තිබෙනවා. එවිට මේ දුප්පතා මුළා වී උප පොලිස්පතිට කුලිය යැව්වා. ඒ නිවාසය හිමියාත් පොලිස් දෙපාර්තමේන්තුවත් අතර ගිවිසුමක් අත්සන් කරගෙන තිබෙන්නේ ඒ නිවසේ පදිංචි පොලිස් භටයාගේ ඉල්ලීමක් පිට නොවෙයි. පොලිස් භටයාත් ගෙවල් හිමියාත් අතර ගිවිසුමක් ඇති කරගෙන තිබෙද්දී, පොලිස් භටයාගේ කිසිම ඉල්ලීමක් නොමැතිව ගෙවල් හිමියාත් සමග ගිවිසුමක් අත්සන් කරන්නට පොලිස් දෙපාර්තමේන්තුවට කිසිම යුතුකමක් නැහැ. එහෙතේ, ගේ බාර දෙනතුරු විශ්‍රාම වැටුප් ගෙවන්නට බැරියයි මේ දුප්පත් පොලිස් භටයා විශ්‍රාම ගිය වහාම ඔහුට දන්වනු ලැබුවා. රස්තියාදු වී බොහෝම අමාරුවෙන් ගේ හොයා ගත්තේ ඔහුමයි. එහෙත් දෙපාර්තමේන්තුවේ වුවමනාව අනුව එය බාර දෙන්න ඕනෑ. නැත්නම්, විශ්‍රාම වැටුප් ලැබෙන්නේ නැහැ.

මා මෙම කරුණ මෙහිදී මතු කොට මේ තැනැත්තාගේ විශ්‍රාම වැටුප් නොගෙවා නතර කරන්නට පුළුවන්කමක් නැති බව පෙන්නුම් කළාට පසු භාණ්ඩාගාරයේ විශ්‍රාම වැටුප් ගෙවීමේ කටයුතු භාර නිලධාරියා මේ පොලිස් භටයාගේ විශ්‍රාම වැටුප ගෙව්වා. එහෙත්, දැන් සිදු වී තිබෙන්නේ කුමක්ද? ඊයෙ පෙරෙයිදා මෙහිදී සම්මත කරන ලද භයානක පණත ක්‍රියාත්මක කිරීමට දැන් භාණ්ඩාගාරය චක්‍රලේඛනයක් යවා තිබෙනවා. ඒ අනුව, මේ පොලිස් භටයාගේ රු. 35 ගෙට රු. 70 ක් අය කර ගන්නට නියමවී තිබෙනවා. "රජයේ නිවාස (ස්වාමිත්වය ආපසු ලබා ගැනීමේ) නමැති මෙම පණත මේ ගරු සභාවට ඉදිරිපත් වුණු දවස්වලදී, මෙය සුළු සේවකයන්ට හිරිහැර කිරීම සඳහා යොදා ගන්නට පුළුවන් වන බව අප මෙහිදී ගරු අගමැතිතුමාටත් රාජ්‍ය ඇමතිතුමාටත් මුදල් ඇමතිතුමාටත් පෙන්වා දුන්නා. ඒ අවස්ථාවේදී එතුමන්ලා, "නෑ, නෑ, අප එහෙම දෙයක් කරන්නේ නැහැ, අපිත් මනුෂ්‍යයෝ, එවැනි දෙයක් ඇති වුණොත් අපට ඒ ගැන පැමිලි කරන්න, එවිට අප ඒ ගැන කටයුතු කරනවා" යි කිව්වා. එහෙත්, දැන් මේ විශ්‍රාම ගිය දුප්පත් පොලිස් භටයාට තර්ජනයක් එල්ල වී තිබෙනවා. පණත යටතේ මේ ගෙය ගන්නට තමුන්නාන්සේලා පියවර ගන්නවාද? එසේ ගන්නාතුරු, නියමිත කුලිය වශයෙන් රු. 35 කුත් දඩුවම් වශයෙන් රු. 35 කුත් මාස්පතා ගෙවන්නට මේ පොලිස් භටයාට සිදු වී තිබෙනවා. මොකක්ද මේ අසාධාරණකම? පොලිස්පතිතුමාට මේ ගැන පැමිණිලි කරනු ලැබූ විට එතුමාගේ මනුෂ්‍යකම අනුව එතුමා මේ පොලිස්භටයා කෙරෙහි අනුකම්පාවක් දැක්වූවා. එහෙත් මෙහි නීතිය පිළිබඳ තත්ත්වය කුමක්දැයි දැන ගැනීම සඳහා එතුමා මෙය ඇටර්නි ජනරාල්තුමාගෙනුත් විමසුවා. එතුමාගෙන් විමසීමෙන් පසු ලැබී තිබෙන තීරණය නම්, භාණ්ඩාරයේ චක්‍රලේඛනය අනුව වැඩිපුර රු. 35 අය කළ යුතු බවයි. එවැනි පිළි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තුරක් ඇටර්නි ජනරාල්තුමාගෙන් ලැබී තිබෙනවා. මෙයින් අපට තෘප්තිමත් වන්නට බැහැ. ආණ්ඩුවක් වශයෙන් තමුන්නාන්සේලාටත් මෙයින් තෘප්තියට පත් වන්නට බැහැ.

මේ පොලිස් භටයා තමාගේ වුවමනාවට ගේ සොයා ගත්තා. ගිවිසුමක් අත්සන් කොට එය පොලිස් දෙපාර්තමේන්තුවට බද්දට ගන්නයයි කිසිම ඉල්ලීමක් තිබුණේ නැහැ. මේ නිවස සම්බන්ධයෙන් එවැනි දෙයක් ක්‍රියාත්මක කිරීමට කිසිම වුවමනාවක් තිබුණේ නැහැ. තමන් පදිංචිව සිටි නිවස, විශ්‍රාම ගියාට පසු දැන් ඔහුට නැති වන්නට යනවා. විශ්‍රාම වැටුප් වශයෙන් මොහුට ලැබෙන්නේ ඉතාම සුළු මුදලක්. රු. 35 කුලිය දෙගුණයක් කර ගෙවන්නට ඔහුට නියම වී තිබෙනවා. මේ තත්ත්වයෙන් මෙම සේවකයා මුදා ගැනීමට ගරු අගමැතිතුමා පියවර ගන්නවා ඇතැයි මා විශ්වාස කරනවා.

මීළඟට මා පොලිස් නිවාස සම්බන්ධවත් වචනයක් කිව යුතුයි. තමුන්නාන්සේලා මා සමග නාරාහේන්පිටට යන්න එන්න. මීට පෙර තිබුණු ආණ්ඩුවේ ආරක්ෂක කට යුතු පිළිබඳ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්තුමාට මේ ගැන කරුණු ඉදිරිපත් කළ විට එතුමා ඒ සම්බන්ධයෙන් පිය වරක් ගන්නා බවට පොරොන්දු වුණා. එතුමා ඒ වැඩවලින් ඉවත් වුණාට පසු ඒ අංශය කවුරුන් විසින් බාර ගත්තාදැයි මා දන්නේ නැහැ. ඒ කෙසේ වෙතත්, නාරාහේන්පිට පොලිස් බැරැක්කය නම් මනුෂ්‍ය වාසයට සුදුසු ස්ථානයක් නොවෙයි. මීට පෙර මා මේ කරුණ මෙහිදී මතක් කළාට පසු ඒ ස්ථානයේ සුළු වෙනසක් කළා. එහෙත්, තවමත් ඒ ස්ථානය මනුෂ්‍ය වාස යට සුදුසු තත්ත්වයට පත් වී නැහැ. ගෙවල් ඕනෑ තරමක් හදන්නට ඉඩමේ ඉඩ කඩ තිබෙනවා. වුවමනා කරන්නේ, මුදල් වෙන් කර අවශ්‍ය අනෙක් පියවරවල් ගැනීමයි. ඒ ස්ථානයෙහි වාසය කරන්නේ, නාරාහේන්පිට පොලිසියේ සේවය කරන අය පමණක් නොවෙයි. වෙනත් පොලිසිවල වැඩ කරන අයත් මෙම ස්ථානයේ සිටිනවා. විශාල සංඛ්‍යාවක් පදිංචි වී සිටින මෙම ස්ථානයෙහි වුවමනා පහසුකම් නැහැ. තිබෙන පහසුකම් ප්‍රමාණවත් මදි. ඒ නිවාස ප්‍රශ්නය සම්බන්ධවයි.

අ. භා. 3

ඊළඟට පොලිස් රියැදුරන් ගැන සඳහන් කරන්න කැමතියි. අවුරුදු පතා මේ කාරණා ගැන නැවත නැවතත් මතක් කරන්න සිදු වීම කනගාටුවට කාරණයක්. ඇත්ත වශයෙන්ම දැනට පොලිස් රියැදුරන්ට ගෙවන්නේ සාමාන්‍ය රියැදුරන්ට ගෙවන වැටුප් ප්‍රමාණයමයි. නමුත් සාමාන්‍ය පොලිස් භටයන්ට බලපාන සේවා කොන්දේසි ඒ අයද පිළිපැදිය යුතුය කියන තත්ත්වයක් තිබෙනවා. මේ නිසා දෙවිධියකින්ම ඒ අයට අවාසියක් සිදු වී තිබෙනවා. ඒ පිරිස ඕනෑම වෙලාවක "ඩියුටි" පිට සිටිය යුතුව තිබෙනවා. සේවයේ කාලසීමාවක් ගැන නියමයක් කර නැහැ. එසේ වුණත් ඒ වෙනුවෙන් කිසිම විධියක විශේෂ දීමනා ගෙවීමක් නැහැ. එම නිසා මේ ප්‍රශ්නයත්, වැටුප් කොමිෂන් සභාව මාර්ගයෙන් විසඳන්නට පියවර ගත හැකි නම්, වැටුප් විෂමතාවක් හැටියට ගෙන වහාම විසඳීමට පියවර ගත හැකි නම්, ඒ පිරිස වෙනුවෙන් ඉටු කරන සාධාරණ ක්‍රියා මාර්ගයක් ලෙස පෙන්වා දෙන්න කැමතියි.

ඊළඟට හමුදාව සම්බන්ධයෙන් වචනයක් සඳහන් කළ යුතුව තිබෙනවා. රජයේ සේවකයන්ගේ පඩිනඩි වෙනස් කිරීම සඳහා කොමිෂන් සභාවක් පත් කර තිබෙන මේ අවස්ථාවේදී හමුදා භටයන්ගේ, ඒ ඒ තරාතිරම්වල නිලධාරීන්ගේ පඩි සංශෝධන කිරීමටද සුදුසු බව මතක් කරන්න කැමතියි. වැටුප් කොමිෂන් සභාවට පවරා ඇති බලතල අනුව, පාබල හමුදාවේ, නාවුක හමුදාවේ හා ගුවන් හමුදාවේ භටයින්ගේ පඩිනඩි වෙනස් කිරීමට මෙම කොමිෂන් සභාවට බලයක් නැහැ. එසේ වුණත්, සෑම සේවකයකුගේම වැටුප් ප්‍රමාණය වැඩි කළ යුතුය කියන ප්‍රතිපත්තිය මුල් කර ගෙන වැටුප් සංශෝධනයක් කරන්න දැන් අවස්ථාව සැලසී තිබෙනවා. ඇත්ත වශයෙන්ම මෙම භටයින්ගේ වාර්ෂික වැඩිවීම ශත හතරකට වඩා වෙන්නේ නැහැ. අවුරුදු හතරකට පමණ පසුව ශත විසි ගණනක

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

වැඩිවීමක් සිදු වෙනවා. මෙය බ්‍රිතාන්‍ය යුගයේ සිට කරගෙන එන පිළිවෙළක්. එය අපේ රටේ තත්ත්වයට කිසිසේත්ම ඔබින්නේ නැහැ. එම නිසා මෙම හමුදා තුනේම සිටින භටයන්ගේ සහ සාමාන්‍ය නිලධාරීන්ගේ වැටුප් ලේඛනවල විශේෂ වෙනසක් කිරීමට යුතුකමක් තිබෙන බව මතක් කරන්න කැමතියි.

ඊළඟට වැන්දඹු හා අනත්දරු අරමුදල ගැනත් වචනයක් කියන්න ඕනෑ. ඒ සඳහා පියවර ගෙන ඇති බවක් ගැන මට දැන ගන්න ලැබී තිබෙනවා. ඒ ගැන ගරු අගමැතිතුමාටත්, හමුදා ප්‍රධානීන්ටත් විශේෂයෙන්ම මගේ ප්‍රශංසාව හිමි කර නවා, අවුරුදු ගණනාවකට පසුව හෝ මෙය ඉටු කිරීමට ක්‍රියා කිරීම ගැන. නමුත් මෙය ආරම්භ කළේ දොම්පේ ගරු මන්ත්‍රීතුමා (ඒෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.) ආරක්ෂක ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම් වශයෙන් සිටියදීයි.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
**(The Hon. Dudley Senanayake)**

පටන් ගත් අය ගැන නොවෙයි, ක්‍රියාත්මක කළ අය ගැන කියන්න.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
**(Mr. Bernard Soysa)**

එය අවසන් කළේ තමුන්නාන්සේලා යයි කියන්න පුළුවනි. නමුත් තවමත් එය අවසන් කර නැහැ. පනතක් මෙම ගරු සභාවට ගෙනෙන්න ඕනෑ, එය අව සන් කරන්න. දොම්පේ ගරු මන්ත්‍රීතුමා මෙය ආරම්භ කළා. ඇත්ත වශයෙන්ම මෙම අරමුදල පිහිටුවීමට පෙර පුළුල් පරීක්ෂණයක් කරන්න වෙනවා. කොපමණ කල් ජීවතුන් අතර සිටීමට බලාපොරොත්තු වෙනවාද, වැන්දඹුවන් කොපමණ කල් ජීවත් වෙනවාද, දරුවන් කොපමණ ගණනක් සිටියිද, මේ අය වැඩි විය පැමිණෙන්න කොපමණ කලක් ගත වෙයිද, ඔය කියන කාරණා ගැන සාමාන්‍ය තක්සේරුවක් කර අවසානයේදීයි, වැන්දඹු අනත්දරු අරමුදලක් පිහිටුවන්නේ. ඒ කාරණා ගැන පරීක්ෂණ ආරම්භ කළ නමුත් පරීක්ෂණය අවසන් කරන්න ලැබුණේ නැහැ. දැන් එම පරීක්ෂණය කෙළවර වී අරමුදල පිහිටුවන්න බලාපොරොත්තු වෙනවා. සමහර විට මෙය පිහිටුවන්නත් පුළුවනි, නැති වන්නත් පුළුවනි. කෙසේ හෝ වේවා, දැනටමත් අරමුදල පටන් ගෙන ඇති නම් ඒ ගැන ගරු අගමැතිතුමාට ස්තුතිවන්ත වෙනවා. නමුත් ඒ සඳහා පනතක් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවක් ඇති බව මා දන්නවා. ඒ පනත ගරු සභාවට ඉදිරිපත් කළ විට ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නට අපේ සහයෝගය දෙන්න අප සූදානම්. මෙම රෙගුලාසි සකස් කිරීමේදී එක් ඉල්ලීමක් පමණක් කරනවා. එනම්, වැන්දඹු හා අනත්දරු අරමුදලක් පිහිටුවීමේදී සාමාන්‍යයෙන් එය වලංගු වන්නේ, එම නීතිය ක්‍රියාත්මක වන දිනයේ සිටයි. ඒ විධියට පනත සකස් කිරීමෙන් නම් දැනට සේවයෙහි යෙදී සිටින භටයන්ට එයින් ප්‍රයෝජනයක් සැලසෙන්නේ නැහැ. විශ්‍රාම ගන්නට ළංව සිටින උදවියට එතරම් වාසියක් ලැබෙන්නේ නැහැ. අනාගතයේදී එන අයට තමයි වාසියක් වෙන්නෙ. එමනිසා යටගියාවත් වලංගු වන ආකාරයට රෙගුලාසි පනවන්නට පුළුවනි. යම් කොටසකට වාසියක් ලබා දෙන ආකාරයට රෙගුලාසි පනවන්නට පුළුවනි. නීති සම්පාදනයේදී ඒ කට යුත්ත කරන්නට හොඳටම ඉඩ තිබෙනවා. මේ අදහස් ක්‍රියාත්මක කරන්නට පියවර ගැනීම ගැන ගරු අගමැතිතුමාට නැවත වරක් ප්‍රසංසා කරන අතර දැනට සේවයේ යෙදී සිටින අයට වාගේම විශ්‍රාම යන්නට ළංව සිටින අයටත් ප්‍රයෝජනයක් අත් වන ආකාරයට මේ නීතිය සකස් විය යුතු බව මා නැවතත් මතක් කරනවා.

ගරු සභාපතිතුමනි, මේ කාරණය ගැන විශේෂයෙන්ම මතක් කළේ දැනට රටේ අපරාධ වැඩි වේ ගෙන යන නිසයි. දිනෙන් දින වැඩි වන අපරාධ පොලීසියට හිස රදයක් වී තිබෙනවා. මෙසේ අපරාධ වැඩිවීමට සාමාජීය සහ ආර්ථික හේතූන් තිබෙන බවත් ඇත්තයි. ඒ සමගම තවත් පැත්තක් තිබෙනවා. ඒවාගේම බාලාපරාධ සංඛ්‍යාවත් වැඩි වෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

ඒ තරමටම වැඩි වෙලා නැහැ. ජනගහණයත් වැඩි වී තිබෙනවා.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ජනගහණයේ වැඩිවීමේ ප්‍රමාණයට ඒ ගණන එතරම් වැඩි නොවන්නට පුළුවනි. නමුත් අපට දැනගන්නට ලැබෙන කරුණුවල හැටියට නම් බාලාපරාධ සංඛ්‍යාව වැඩි වී තිබෙනවා.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

ජනගහණය වැඩි වෙන කොට ඒ ගණනත් වැඩි වෙනවා.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ඒක හොඳ තත්ත්වයක් නොවෙයි.

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා (අගලවත්ත)**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா—அகலவத்த)*
(Dr. Colvin R. de Silva—Agalawatta)

They are so appalled, Sir, at the increase in juvenile delinquency that they do not want to contribute to it.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

අප දෙදෙනාට නැති නිසා තමයි අනුන්ගේ දරුවන් ගැන අප වඩාත් සැලකිල්ලක් දක්වන්නේ.

මේ ප්‍රශ්නය අධිකරණ ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමාට හෝ ඇමතිතුමාට හෝ ස්වදේශ කටයුතු භාර ඇමතිතුමාට හෝ පැවරීමෙන් විසඳෙනවාය කියා මා කල්පනා කරන්නේ නැහැ. එමනිසා මේක ආරක්ෂක කටයුතුවල එක් අංශයක් හැටියට සලකා මෙසේ බාලාපරාධ වැඩිවන්නට හේතුන්—සාමාජයීය හේතුන්—මොනවාද කියා විධිමත් පරීක්ෂණයක් කර යම් පියවරක් ගන්නා මෙන් මා විශේෂයෙන් ඉල්ලා සිටිනවා.

පොලිස් භටයිනුත් යුද්ධ හමුදාවේ සාමාන්‍ය භටයිනුත් දැනට සිටින දුක්කිත තත්ත්වයෙන් ගොඩගන්නට දැන්වත් වැටුප් කොමිෂන් සභාවක් තිබෙන මේ අවස්ථාවේදීවත් පියවරක් ගන්නා ලෙස නැවතත් ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

**එම්. එච්. එම්. නයිනා මරික්කාර් මයා. (අධිකරණ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**
*(ஜனாப் எம். எச். எம். நயினா மரிக்கார்—நீதி அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*
(Mr. M. H. M. Naina Marikar—Parliamentary Secretary to the Minister of Justice)

Mr. Chairman, I am glad I have the opportunity of raising an important matter, one which vitally affects the minority communities of this country, namely, the Muslims and the Tamils. This is a matter which caused concern even to the Hon. Prime Minister. I refer to the registration of deeds under Section 60 of Finance Act, No. 11 of 1963, in terms of which it is the duty of the Registrar of Lands to register a deed effecting the sale of property to a person if he is satisfied that such person is a citizen of Ceylon, or, if such person is not a citizen of Ceylon, that the tax in respect of that land has been paid.

After this Bill was passed, you will remember, Sir, that there were complaints of harassment of the minority communities, the Muslims and the Tamils, in the matter of the registration of deeds. The previous Government set up a committee to go into this whole question and to find out ways and means of effecting such registrations so that genuine citizens would not be affected by this provision in Section 60 of the Finance Act. When we came into power, at the request and appeal of a large number

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[හමීද් මරික්කාර් මයා.]

of hon. Members, the Hon. Prime Minister went into this matter carefully. I think he even went to the extent of amending the law without attacking the basic principles underlying it. It was suggested that the Inland Revenue Department should be empowered to collect the tax. It was a very sensible and very practical solution suggested but unfortunately the Commissioner of Inland Revenue thought it was too much of a burden and responsibility to be placed on him. In those circumstances, the Hon. Prime Minister requested his Permanent Secretary to formulate a scheme, in consultation with a number of other people who were interested, whereby the registration of deeds could be effected under Section 60 of the Finance Act without causing grave hardship and difficulties to genuine nationals of this country

Thereafter, a circular was issued. I wish to read that circular because I want the public to know—most of the people do not know—the contents of that circular and the manner in which this problem has been approached and tackled. I thought it appropriate, perhaps, at this stage to read the circular for the purpose of record. I shall read only the relevant parts of the circular. A large number of people do not appear to be aware of the steps taken by the Hon. Prime Minister, under whose purview this particular matter falls, in an indirect way to meet the wishes of a large section of the people of this country who were, unfortunately, unable to establish their national identity although they were really Ceylon nationals.

අ. භා. 3.15

I quote :

"Circular No. N|10|SD|119,
Registrar-General's Office,
Colombo 1,
November 5, 1965.

FINANCE ACT, NO. 11 OF 1963

To : All Registrars of Lands.

........

2. As you are aware there have been complaints from non-Sinhalese citizens of Ceylon by descent about the manner in which section 60 of the Finance Act, No. 11 of 1963, has been administered. The complaint goes further to say that this is due to a mechanical application of instructions rather than at attempt genuinely made to satisfy oneself of the citizenship status of a transferee. On statistics collected conclusions have been reached that persons in certain districts have burden of proof placed on them which were unduly hard.

3. The Government, therefore, has taken two decisions in regard to this matter. The first is, that an explanatory circular should be sent indicating the manner in which Registrars should satisfy themselves as to whether a person is a citizen of Ceylon by descent or not. The second decision is, that if despite the application of more realistic criteria, still Registrars of Lands find difficulty in satisfying themselves of the citizenship status of a transferee, the matter, prior to returning the dead without admitting to the Day Book for registration, should be referred to the Government Agent of the District, who with the larger facilities for inquiry and investigations that he possesses, and with the discretionary judgment he has, may make a decision which will be communicated to the Registrar of Lands. Where a decision is so communicated by a Government Agent to the Registrar of Lands this would be adequate acquittance for the Registrar of Lands to register a deed without payment of tax where the only issue involved was the citizenship status of the transferee.

4. The Government has also decided that besides reference by the Registrar of Lands, a reference could also be made by either the transferee or his notary, direct to the Government Agent.

5. It is important, however, that as little inconvenience as possible should be caused to bona fide citizens of Ceylon in the matter. The reference by the Registrar of Lands *should therefore not be an automatic one*. where he has some little doubt, with the intention of passing the responsibility to higher authority. The Registrar of Lands should satisfy himself on the broad criteria suggested in the annexe to this letter and only where a genuine doubt exists should he refer a case to the Government Agent. A birth certificate should not be rejected unless there are other good reasons to doubt the nationality of a transferee, merely because the race is given as "Moor" or ' ' Very often the 'Gedera' name is given in the birth certificates of Muslim citizens by descent residing in the Kandyan Districts.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

6. The following procedure is now suggested in respect of deeds tendered by or on behalf of persons suspected to be non-citizens :

(*a*) The Day Book Clerk will refer the party tendering the deed to the Registrar of Lands who will go through the deed and any other documents produced and either order the acceptance to the Day Book immediately or ask the party to furnish any two of the Class 'A' documents referred in to in the note or satisfactory documents in Class 'B'."——

So there has been a categorization of documents as Class 'A' and Class 'B' to show the onus of proof.

"In the latter case the deed can be returned to the party for him to produce the documents indicated. The Registrar may explain to the tenderer the nature of documents that might be considered as satisfactory.

(*b*) In the production of these documents if the Registrar of Lands is still unable to decide, reference may be made to the Government Agent. At the same time the tenderer or his notary also may be asked to move in the matter to get the Government Agent's certificate early if early registration of the document is desired.

(*c*) On production of the Government Agent's certificate or on receipt of it direct by the Registrar of Lands, he should proceed to register the document without further delay.

(*d*) In respect of deeds sent by post without any indication of the citizenship status of the transferee too, action should be taken as suggested at (*a*) to (*c*) above *mutatis mutandis*.

7. Necessary instructions to expedite the issue of certificates by Government Agents will be issued to the Government Agents by the Home Ministry.

8. Provision for the issue of a certificate under the hand of the Permanent Secretary to the Ministry of Defence & External Affairs under section 60 sub-section 3 of the Finance Act, No. 11 of 1963, will continue to be in operation."

අ. භා. 3.15

Now, along with that there was an annex sent to the registrars of lands explaining the provisions of the Act and how they should conduct themselves in deciding whether a person is a citizen of Ceylon or not under the Finance Act. I want to read that too before I make my comments. It reads as follows :

"The citizenship status of a person who claims to be a citizen of Ceylon by descent is determined under section 4 of the Citizenship Act which reads as follows :—

'Citizenship by descent

4. (1) Subject to the other provisions of this Part a person born in Ceylon before the appointed date shall have the status of a citizen of Ceylon by descent, if—

(*a*) his father was born in Ceylon, or

(*b*) his paternal grandfather and paternal great grandfather were born in Ceylon.

(2) Subject to the other provisions of this Part, a person born outside Ceylon before the appointed date shall have the status of a citizen of Ceylon by descent, if—

(*a*) his father and paternal grandfather were born in Ceylon, or

(*b*) his paternal grandfather and paternal great grandfather were born in Ceylon.

It will be noted that the matters on which proof is required are—

(1) whether the transferee was born in Ceylon ;

(2) whether his father was born in Ceylon ;

(3) whether his paternal grandfather or/and paternal great grandfather were born in Ceylon.

There is no doubt that the best evidence is proved birth certificates, and where a proved birth certificate is produced the issue of citizenship can be determined expeditiously and without the slightest doubt.

It is also historically true that many persons in this country, especially in the early years, either have not had their births registered, or have difficulty in tracing and producing certificates of birth. In many cases the absence of these facilities does not make a person less a citizen of Ceylon by descent than otherwise. The issue, however, is what would be considered reasonably adequate proof for a specific purpose.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[නයිනා මරික්කාර් මයා.]

Section 60 (1) of the Finance Act No. 11 of 1963 required that all Registrars of Lands should be satisfied about the citizenship status of a person. The question of what is reasonable proof for the satisfaction of a Registrar of Lands, is the matter that should be now determined. It will be appreciated that there can be no hard and fast rule with regard to the nature of evidence that should be produced for the purpose of establishing the citizenship status of a person. As was stated earlier, the strictest and the most satisfactory proof is the production of birth certificates. To deprive a person of his rights as a citizen merely because he cannot produce a proved birth certificate is most unfair as it deprives him of some of his rights of citizenship. The kind of proof that could reasonably be obtained from persons in these categories could be grouped under various classes.

*Class A*

In the absence of a birth certificate the following documents may be considered as having a high standard of proof :

(*a*) Baptismal certificate (of transferee and/or parents) ;

(*b*) A local Marriage Certificate (of parents) ;

(*c*) Certified extracts of electoral registers establishing that the person or one of his ancestors about whose birth proof is required has his name in an electoral register. Care should be taken, however, of this evidence in the pre-1948 period ;

(*d*) Ration books and householders' lists ;

(*e*) Acts of Appointments issued by Government (to transferee or parent) ;

(*f*) Genealogy tables ;

(*g*) Deeds affecting transfer or gift of properties ;

(*h*) Last wills and testamentary proceedings ;

(*i*) Crown grants and permits under the Land Development Ordinance.

*Class B*

The following documents may have a lower proof rating but would be useful as supporting evidence :

(*a*) School reports ;

(*b*) Divorce proceedings (of transferee's or of parents) ;

(*c*) Registration certificates in respect of properties registered under Rubber Control Ordinance or Tea Control Ordinance ;

(*d*) Affidavits ;

(*e*) Employer's certificates (transferee's or of parents) ;

(*f*) Various types of old licences issued by Government as well as local authorities ;

(*g*) Tax receipts in respect of Income Tax, Poll Tax, V. C. tax, etc. (of transferee and/or parents) ;

(*h*) Extracts from registers maintained under various Ordinances such as Irrigation Ordinance, for example, *dappus* or *pangu* lists.

(*i*) Membership certificates of Co-operative Credit Societies.

Where there is doubt about the citizenship status of a transferee, it is desirable that not merely birth certificates be called for, but assistance should be given to such persons to produce other evidence of proof of the nature suggested above and the kind of proof that will be considered adequate explained to a transferee or his Notary before he is referred either to the Government Agent, or to this Ministry.

If on the production of this evidence the Registrar of Lands can be reasonably satisfied as to the citizenship status of the transferee, he should use his discretion in the matter. It is only if he is not satisfied that he should refer the subject to the Government Agent as indicated earlier."

My complaint is that these directions given to the registrars are not observed. There are a large number of cases where the transferee has satisfied the registrar as to the registration of the document on the basis of this direction. Nevertheless, the registrar does not want to register the deed because of a legal liability he has to incur. He does not want to take a decision sometimes for political and other reasons. Sometimes it may be purely for human reasons, as somebody is acquiring property while he is not. There are a large number of motivating factors for a registrar refusing to register a deed, but I think the basic cause or reason is that he is liable to the recovery of tax ; if the buyer is a non-national, he is wary and hesitant in complying with this direction.

Now, it is true that there is provision here for a government agent, where the district registrar finds it difficult to satisfy himself that the buyer is a national of this country,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

to go into the whole question on the basis of the evidence placed before him and to decide whether the land is to be registered in his name or not. But we know in practice it never happens. I suppose it is because the government agents are heavily taxed. They are very busy with other things and therefore there is not the opportunity or the leisure for them to go into this question as to whether a given case is to be registered or not.

I do not know what possible machinery we can devise in order to overcome this difficulty. I am not suggesting for a moment that the practice of allowing a non-national to own property should be done away with. We are all in favour of the main principle that only a national should own property mainly, for political reasons, although economic reasons will militate against that. But we must try and devise a method by which really genuine cases of Ceylon nationals, particularly Muslims and Tamils, are not obstructed in this way. I know one case where a Senator was refused registration of a deed and it had to be brought to the notice of the Defence Ministry before it could be done. There are a number of such cases. If the registrar is pressurized by some powerful person or M.P. or somebody known to him, he readily accepts it. This is very unsatisfactory. I do not know whether we can at this stage basically alter the machinery through which this can be implemented. As I said earlier, we did suggest that the Inland Revenue Department should be the proper authority for the recovery of the tax because the whole process of registration involves a number of legal difficulties.

We know, sometimes it happens that when a seller wants to sell a property he finds that the buyer cannot buy because of practical difficulties, legal difficulties, and he quietly disposes of it to somebody else. Apart from that, on a first glance of this section—Section 60—this is a matter which a court alone can ultimately decide—I find that where a registrar registers a deed and finds subsequently that the buyer is not a national, there is no way by which he can recover the penalty. Therefore he will be subject to surcharge. There is a hiatus in this Act. I do not know how it escaped our notice. The Minister of Finance then, Mr. Ilangaratne, was too hasty and did not go into the ramifications of this section. Now it is too late to cry over that. I do think there are a number of ways by which these difficulties can be overcome.

I would like to make one suggestion to the Hon. Prime Minister. There are other methods by which you can overcome this difficulty. Following the principle embodied in the circular, namely, that the discretion has to be exercised by the registrar and therefore he has to be satisfied either vicariously or directly, I suggest that in every kachcheri you have a panel of people, just as we have panels in respect of other matters, not merely of Muslims but Sinhalese and Tamils, before whom, if there is any case of doubt, a notary or a buyer can place his case, and they can go with leisure and care into the facts of the case and advise the district registrar. I think this is one way of getting over the difficulty. This does not involve any expense. I am sure there are a large number of public-spirited people with legal training who will be able to help the government agent to overcome this difficulty and eliminate the harassment the minorities in this country have to face.

It is true that the Defence Ministry can as a last resort give a certificate but in the normal working of this particular machinery it is rather difficult, when hundreds of cases are sent to the Defence Ministry, for them to deal with them expeditiously and for them also to be satisfied that a particular person is a national.

Therefore I do urge the Hon. Prime Minister to review the whole position in the light of what has been done. The suggestion I have already

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[නයිනා මරික්කාර් මයා.]

made is one that I have discussed with some of my Colleagues. That is one way of getting over it. There are even better methods. I would earnestly ask the Hon. Prime Minister to devise some method by which this grievance, which is a genuine grievance of Muslims and Tamils, may be removed as early as possible.

අ. භා. 3.30

**සභාපති**
*(அக்கிராசனர்)*
(The Chairman)

The hon. Member for Habaraduwa (Mr. Prins Gunasekera). Before he starts, I wish to say that six Members have already given their names to speak, and the Hon. Prime Minister will want at least one hour to reply. So the Debate will have to stop by 6.30 P.M. I would ask hon. Members to bear that in mind.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ගරු සභාපතිතුමනි, මේ වැය ශීර්ෂය පිළිබඳ විවාදය ආරම්භ කරන අවස්ථාවේදී මා මෙතැන නොසිටි නිසා මොන සම්මතයක් උඩ විවාදය ආරම්භ වුණාදැයි මා දන්නෙ නැහැ. අගමැතිතුමා යටතේ තිබෙන හැම අංශයක් ගැනම එකවර සාකච්ඡා කිරීමටද——

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

ඔව්.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

එහෙම නම් මම විදේශ තානාපති සේවයට සම්බන්ධ එක්තරා කාරණයක් ගැන සඳහන් කරමින් මගේ කථාව පටන් ගන්නම්. මේක විදේශ තානාපති සේවයට පමණක් සම්බන්ධ වූ කාරණයක්ම නොවෙයි, විදේශ තානාපති සේවයේ යෙදී සිටින උදවියගේ වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්නයකුත් මේ අනුව මතු වෙනවා. මේ වරප්‍රසාද බුක්ති විඳින එක්තරා විදේශ තානාපතිවරයකුගේ පුත්‍රයකු අතින් ලංකා පොලීසියේ අසරණ පොලිස් කොස්තාපල් කෙනෙකු මරුමුවට පත්වී තිබෙනවා. මා සඳහන් කරන්නේ පසුගිය අගෝස්තු 7 වැනිදා රාත්‍රි 10.55 ට පමණ කොළඹ රීඩ් මාවතේ මහජනයාට පාර හරහා යාමට කහ ඉරි ගසා වෙන් කර තිබෙන ස්ථානයකදී තානාපතිවරයෙකුගේ පුත්‍රයකුගේ රථයක හැපී මරුමුවට පත් fප්‍රැන්සිස් පාඩිගම පොලිස් කොස්තාපල් මහත්මයාගේ සිද්ධිය ගැනයි.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

ඒක ගැන දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) මතක් කළා.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

අද ?

**සභාපති**
*(அக்கிராசனர்)*
(The Chairman)

ඔව්. ඒ ගැන අගමැතිතුමා උත්තරයක් දෙයි. ඒ ගැන වෙන යමක් කියන්න තිබෙනවා නම් කෙටියෙන් කියන්න.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

හොඳයි. මම ඒ අවස්ථාවෙ හිටියෙ නැහැ. මේ කාරණය ගැන පාඩිගම මහත්මයාගේ වැන්දඹු භාර්යාව කරුණු රාශියක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ සම්බන්ධයෙන් දීර්ඝ ලිපිගොනුවක් මා අත තිබෙන නමුත් ඒ සෑම එකක්ම මේ අවස්ථාවේදී ඉදිරිපත් කරන්නට මා අදහස් කරන්නෙ නැහැ. එහෙත් තානාපති අයිතිවාසිකම් පිළිබඳව මෙතැනදී ප්‍රශ්නයක් පැන නැගී තිබෙනවා. අද පිළිගත් මේ ජාත්‍යන්තර තානාපති අයිතිවාසිකම් පිළිබඳ තත්ත්වය ඒ විධියටම පිළිගෙන එයට ඉඩ දී තානා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පති සේවයේ සිටින උදවියගෙන් සිදුවන මෙවැනි සිද්ධීන් පිළිබඳව අපි ඇස් දෙක වසාගෙන අහක බලාගෙන සිටිය යුතුද කියන ප්‍රශ්නය මා ගරු අගමැතිතුමා ඉදිරියේ තබනවා. තානාපති වරප්‍රසාද පිළිබඳව අද බලපවත්වන නීතිය සමහර විට අවුරුදු සිය ගණනක් පැරණි එකක් වන්නට පුළුවනි. අධිරාජ්‍ය යුගය ආරම්භ කාලයේදී රට වල් වෙනුවෙන් පෙනී සිටි තානාපති වරුන්ට ඒ අධිරාජ්‍යවාදී පාලකයින්ගේ සම්පූර්ණ බලතල පවරා තිබුණු බව හැබැයි. එහෙත් අද නිදහස් රාජ්‍ය අතරේ පවතින සම්බන්ධකම් වෙනත් ස්වරූපයකින් පවත්නා නිසා මේ රාජ්‍ය තාන්ත්‍රික අයිතිවාසිකම් දැනට පවත්නා පිළිවෙලටම අපි පිළිගෙන ක්‍රියා කළ යුතුද කියන ප්‍රශ්නය පැන නගිනවා.

මීට අවුරුදු සියයකට පෙර එංගලන්තයේ මහ රැජින වෙනුවෙන් ලංකාවේ යම් කෙනෙකු ඇවිත් මේ රටේ පදිංචි වුණාම ඔහු එංගලන්තයේ මහ රැජිනගේ සම්පූර්ණ බලතල ඇතිව මේ රටේ ජීවත් වූ බව ඇත්තයි. එහෙත් අද අපි ඒ නීතිය ඒ විධියටම පිළිගන්නවාද කියන ප්‍රශ්නයයි මා නගන්නේ. මේ තානාපති වරප්‍රසාද පිළිබඳ නීති සිවිල් නීති කෙරෙහි ඒ විධියටම බල පැවැත්වූවත් දණ්ඩ නීති සංග්‍රහය යටතේ සඳහන් කළ හැකි යම් යම් සිද්ධීන් සම්බන්ධයෙන් තානාපති වරප්‍රසාදවලට ඉඩ දිය යුතුද යන ප්‍රශ්නය ගැනයි මා ගරු අගමැතිතුමාගේ අවධානය යොමු කරවන්නට බලාපොරොත්තු වෙන්නේ. පාඩිගම මහතාගේ මරණය පිළිබඳව මේ දක්වාම නඩුවක් පවරා නැහැ. ඒ පිළිබඳව පොලිස් දෙපාර්තමේන්තුව අංග සම්පූර්ණ විභාගයක් පවත්වා තිබෙන බව මා පත්‍ර මාර්ගයෙන් දැක්කා. එහෙත් නොසැළකිලිමත් ලෙස රිය පදවා මිනී මැරුමට තැත් කිරීම සම්බන්ධයෙන් මේ දක්වා මේ ඇමරිකන් තානාපතිවරයාගේ පුත්‍රයාට විරුද්ධව දණ්ඩ නීති සංග්‍රහය යටතේ නඩු පවරා නැත්තේ මන්ද කියා මා ප්‍රශ්න කරනවා. ඔහුට උසාවියට ඇවිත් තානාපති වර ප්‍රසාද පිළිබඳ නීතිය ප්‍රයෝජනයට ගෙන නිදහස් වන්නට ඉඩ තිබෙන බව හැබැයි. එහෙත් දෙපාර්තමේන්තුව මෙතෙක් නඩු පවරා නැත්තෙ ඇයි? දෙපාර්තමේන්තුව නිශ්ශබ්ද මොකද? මේ සිද්ධිය ගැන අංග සම්පූර්ණ පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසු, තානාපතිවරයාගේ පුත්‍රයාගේ නොසැළකිල්ල නිසා මරණය සිදු වී තිබෙන බව පොලිස්පතිවරයා පිළිගෙන තිබෙන බවට වාර්තා කීපයක් පත්‍රවල පළ වී තිබෙනවා. තානාපතිවරයා පාඩිගම මහතාගේ භාර්යාවට සහ දරුවන්ට රුපියල් 10,000 ක් දී මෙය ගොඩින් බේරා ගන්නට යන බවටත් නවත් ආරංචි තියෙනවා. අනාථ වී සිටින ඒ වැන්දඹු භාර්යාවටත්, අනාථ වී සිටින ඒ දරුවන් 4 දෙනාටත් රුපියල් 10,000 ක පිං පඩුරක් ගෙවා මෙය අවසාන කරන්නට ඉඩ නොතබා මේ සම්බන්ධයෙන් මැදහත් වන ලෙස මා ගරු අගමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ සිද්ධිය සම්බන්ධයෙන් මේ රටේ එක්තරා ප්‍රබල මහජන මතයක් ඇති වී තිබෙන බව තානාපති කාර්යාලයට දැන ගන්නට සලස්වන්නට ඕනෑ. තානාපතිවරුන්ගේ වරප්‍රසාද සීමා රහිත ලෙස භුක්ති විඳින්නට ඉඩ දීම නිසා මේ රටේ සාමාන්‍ය මහජනයාට සිදු වන පාඩුවලින් විපත්වලින් ඔවුන් මුදා ගැනීමට නීතියක් නැති වුණත්, ඔවුන්ට වන්දි ලබා දීමට ඉඩකඩක් නැති වුණත්, ඒ හේතුව නිසාම තානාපති සේවයේ වර ප්‍රසාද පිළිබඳව ප්‍රබල ජන මතයක් ඇති වී තිබෙන බව ගරු අගමැතිතුමාගේ මාර්ග යෙන් විශේෂයෙන් ඇමෙරිකානු තානාපති කාර්යාලයට දැන්විය යුතුව තිබෙනවා.

ගරු සභාපතිතුමනි, ප්‍රැන්සිස් පාඩිගම මහත්මයා ලංගම බස් රථයක හැපී මිය ගියා නම් වන්දි වශයෙන් ලැබෙන්නේ රුපියල් 10,000 ද? ඔහුට දරුවන් 4 දෙනකු සිටිනවා. වැඩිමහල් දරුවාගේ වයස අවුරුදු 8 යි. බාලම දරුවාගේ වයස අවුරුදු දෙකයි මාස එකොළහයි. ඒ අතර, හතර හැවිරිදි නිඹුල් දරුවන් දෙදෙනෙකු සිටිනවා. මේ සිද්ධිය නිසා භාර්යාවට ස්වාමි පුරුෂයකු නැති වී ගියා; දරුවන් හතර දෙනකුට ආදරණීය පියකු නැති වී ගියා; භාර්යාවටත් දරුවන්ටත් ඉන්ට හිටින්නට තැනක් නැතිව ගියා. මේ සිද්ධිය නිසා වුනේ ප්‍රැන්සිස් පාඩිගම මහතා අභාවයට පත් වීම පමණක් නොවෙයි. ඒ පවුලට ඉන්ට හිටින්නට තැනක් නැතිව ගියා. තමන් පදිංචි වී සිටින පොලිස් දෙපාර්තමේන්තුවේ ගෙයින් අස් වන්නය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

කියා දෙපාර්තමේන්තුවෙන් දැන් ඔවුන්ට කියනවලු. දැන් ඔවුන්ට මහ මගට බසින්නටයි සිදු වී තිබෙන්නේ. එහෙත් මේ මරණයෙන් සිදු වූ පාඩුව රුපියල් 10,000 ක් හැටියට පමණයි, ඇමෙරිකානු තානාපති කාර්යාලයේ නිලධාරියා ගණන් බලා තිබෙන්නේ. සමහරවිට මේ පොලිස් භටයා ලංගම බස්රියක හැපී මැරුණා නම් රුපියල් ලක්ෂයක පමණ අලාභයක් ලබා ගන්නට පුළුවන්කම තිබුනා. මේ සිද්ධිය පිළිබඳව කරන ලද පරීක්ෂණයේ දී දැන ගන්නට ලැබී තිබෙනවා, හැප්පීම සිදු වූ තැන තිබෙන කහ ඉරේ සිට අඩි 110 ක් ඈතට පොලිස් භටයාගේ මළ සිරුර විසි වී තිබෙන බව. කොයි තරම් වේගයෙන් රථය පදවා තිබෙනවාද යන්න එයින් සිතා ගන්නට පුළුවන්. තානාපතිවරුන්ගේ පවුල්වල අයට නොසැලකිලිමත් ලෙස හැසිරෙන්නට ඉඩ දී රටවැසියකු මරණයට පත් වූ විට ඒ සඳහා රුපියල් 10,000 ක වන්දියක් පමණක් ලැබෙන්නට ඉඩ තැබීම වැරදියි. තානාපති කාර්යාල සමග පෞද්ගලික සම්බන්ධකම් ඇති ගරු අගමැතිතුමා ඒ පෞද්ගලික සම්බන්ධකම ප්‍රයෝජනයට ගෙන, සිදු වූ දේ ගැන ඇමෙරිකානු මහා තානාපතිතුමාට කරුණු අවබෝධ කරවා, රටේ ඇති වී තිබෙන ජන මතය ගැන අවබෝධයක් ලබා දී, මේ අසරණ පවුලට සෑහෙන වන්දියක් ලබා දෙන්නට උත්සාහ කරනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

මෙතෙක් අප මේ සිද්ධිය ගැන බැලුවේ තානාපති කාර්යාලය පැත්තෙන් පමණයි. දැන් පොලිස් දෙපාර්තමේන්තුව පැත්තෙන් මේ සිද්ධිය ගැන බලමු. මේ පොලිස් භටයා සියවස ප්‍රදර්ශනයේ සේවය කර රාත්‍රි 10.55 ට වැඩ ඇරී අත්සන් කරන්නට කුරුඳුවත්තේ පොලිසියට යන අතරයි, මේ මරණය සිදු වී තිබෙන්නේ. එසේ නම් මෙය සේවය කරන අතරතුරදී සිදු වූ මරණයක්. ඒ නිසා ලංකාණ්ඩුවෙනුත් මේ අහිංසක පවුලට කිසියම් වන්දියක් දිය යුතු බවයි, අපේ අදහස. තමන්ගේ සේවා කාලය තුළ මෙවැනි අනතුරුවලට මුහුණ පාන රජයේ සේවකයන්ගේ පවුල්වල නඩත්තුව සඳහා වන්දියක් ලබා ගැනීමට අවශ්‍ය ඉඩකඩ, ළඟදී සම්මත කර ගන්නා ලද නීතියක් යටතේ තිබෙන වායයි මා කල්පනා කරනවා. ඒ නිසා මේ කාරණය ගැන හැම පැත්තෙන්ම සලකා බලා, දැනට ඉතාමත් අසරණ තත්ත්වයකට පැමිණ සිටින, අද මහජන ආධාරයෙන් යන්තමින් ජීවත් වන, පාඩිගම පවුලට ලංකා රජයෙන් සහ ඇමෙරිකානු රජයෙනුත් හැකි තරම් ආධාර ලබා දෙන්නට ගරු අගමැතිතුමා පියවර ගනු ඇතැයි අප බලාපොරොත්තු වෙනවා.

මිය ගිය පාඩිගම පොලිස් රාළහාමි සම්බන්ධයෙන් කියන්නට පටන් ගෙන පොලීසිය ගැනත් සඳහන් කරමින් මගේ කථාව පටන් ගත්තත්, මේ අවස්ථාවේදී ජීවත් වන පොලිස්කාර මහත්වරුන් ගැනත් සඳහන් කරන්නට ඕනෑ. මහජන නියෝජිතයන් හැටියට ක්‍රියා කරන අප, අවුරුද්දේ දවස් 365 න් එක දවසක මෙවැනි අවස්ථාවක පොලිස්කාර මහත්වරුන් අල්ලාගෙන වචනවලින් හොඳටම තඩිබානවා. ඔය අතර, අවුරුද්දේ 365 දවසේම පොලිස් කොස්තාපල් මහත්වරු සාමාන්‍ය මහජනයාට තඩිබානවා, අතින් පයින්. මෙය අවුරුද්දේ හැමදාම සිදු වන දෙයක්. පොලීසිය මිනිසුන්ට ගහනවාය, පගාව ගන්නවාය යනාදි වශයෙන් හැම පැත්තෙන්ම වාගේ පැමිණිලි ලැබෙනවා. ඔවා අහගෙන ඉඳලා මහජන නියෝජිතයන් වන අප මන්ත්‍රී මණ්ඩලයට පැමිණ අවුරුද්දකට වතාවක් ඉදිරිපත් කරනු ලබන අයවැය ලේඛනය පිළිබඳ විවාදයේදී දවසක් නැත්නම් වැඩිම වුණොත් දවස් එක හමාරක් ඒවා ගැන කියනවා. මේ තත්ත්වය හැමදාම, හැම අවුරුද්දේම, වෙනසක් නැතිව සිදු වෙනවා. ඒ කොයි හැටි වෙතත් අද මේ සභා ගර්භයේදී පොලිස්කාරයන්ට වචනයෙන් හෙවත් කටින් දමා ගහන්නට මා නම් බලාපොරොත්තු වන්නේ නැහැ. ඒ වෙනුවට මා බලාපොරොත්තු වන්නේ මේ රටේ පොලිස් සේවය සම්බන්ධයෙන් ඇති වී තිබෙන මේ කනගාටුදායක තත්ත්වයට හේතු වී තිබෙන්නේ කුමන කරුණු ඇයි වග විභාග කර සොයා බලා සුදුසු ප්‍රතිකර්මයක් කරන්නැයි ගරු අගමැතිතුමා ගෙන් ඉල්ලන්නටයි.

මිනිසුන්ට ගසා, මිනිසුන්ගෙන් පගාව අරගෙන, නොයෙක් මාදිලියේ දූෂණ කර ඇයි මේ පොලීසියේ සේවය කරන උදවිය තමන්ගේ රක්ෂාව කෙලෙසන්නේ ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මෙයට හේතුවක් හෝ හේතු ගණනාවක් තිබෙන්නට ඕනෑ. ඒ නිසා ඒ හේතු මොනවාදැයි සොයා බලන්නට ඕනෑ. හේතු සොයා බලා, පිළියම් කළ යුත්තේ මෙතැන ටය යනුවෙන් නිගමනය කරන්නට ඕනෑ. රක්ෂාවේ නිරත වන අතර මෙන්ම ගෙදර ගියාට පසුත් ඉතාමත් සුළු ප්‍රමාණයකින් අමාරුවෙන් ජීවත් වන පිරිසක් නොවෙයි ද මේ උදවිය ? නිවාස පහසුකම් අතින් ඉතාමත් කනගාටුදායක තත්ත්වයකයි මේ උදවිය ඉන්නේ. ආදායම අතිනුත් ඉතාමත් කනගාටුදායක තත්ත්වයකයි මේ උදවිය ඉන්නේ. එවැනි කනගාටුදායක තත්ත්වයන් මධ්‍යයේ අමාරුවෙන් ජීවත් වන මේ උදවිය මෙවැනි දූෂණවල යෙදෙන එක ඇත්ත වශයෙන්ම පුදුමයක්දැයි කල්පනා කර බලන්නට ඕනෑ. මේ උදවිය පැය 24 ම වැඩ කරන්නට ඕනෑ. ඒ තරම් වැඩ කළත් ඒ අයට තමන් ලබන වැටුපට අතිරේකව අතිකාල දීමනාවක් ලැබෙන්නේ නැහැ. ජීවත් වන්නට ඇත්තේත් ඉතාමත් කනගාටුදායක පරිසරයකයි. ඒ අයට තිබෙන නිවාස පහසුකම් කිසිසේත් හොඳ නැහැ. රාජකාරියේ යෙදෙන්නට සිදු වී තිබෙන්නේ කොයි විධියේ පුද්ගලයන් සමගද ? තමන් වැඩ කරන්නේ කොයි විධියේ පුද්ගලයන් යටතේද ? උසස් නිලධාරීන් මොවුන්ට සලකන්නේ තිරිසනුන්ට වාගේ නොවෙයිද ? එය කොයි තරම් කනගාටුදායක තත්ත්වයක්ද ?

අ. භා. 3.45

පොලිස් සේවයේ උසස් පැලැන්තියේ උදවියත් පහත් පැලැන්තියේ උදවියත් අතර කිසිම සම්බන්ධතාවක් නැහැ. මෙවැනි බරපතල මානසික වේදනාවන් මධ්‍යයේ ජීවත් වන පොලිස්කාරයකුට සාමාන්‍ය මිනිසකු අහු වුණාම හිතේ හැටියට අතින් පයින් දෙකක් තුනක් ඇනලා, පුළුවන් කමක් තිබෙනවා නම් රුපියල් පහක් දහයක් සොයා ගැනීමට තැත් කිරීම පුදුමයක් නොවෙයි. තමන්ගේ සේවයේ සාමාන්‍ය පෙළේ පොලිස් රාළහාමිලාට උසස් පෙළේ නිලධාරීන්ගෙන් මානසික වශයෙන් කොයි තරම් වේදනා සහගත දේ සිදු වෙනවාද ? මානසික වශයෙනුත් කොයි තරම් වේදනා ගෙනදෙන දේවල් ඒ උදවියට කරන උසස් නිලධාරීන් සිටිනවාද ? එවැනි වේදනා සහගත තත්ත්වයක සිටින පුද්ගලයකුට සාමාන්‍ය මිනිසකු අහු වුණාම ගුටි බැට දී තුවාලයක් දෙකක්, රුපියල් පහක් දහයක් හම්බ කර ගන්නට බලනවා. පිළියම් කළ යුත්තේ පොලිස් සේවයේ තිබෙන මේ කනගාටුදායක තත්ත්වයටයි.

වර්තමාන පොලිස්පතිතුමා තමන් එම තනතුරට පත් වූ අවස්ථාවේ නොයෙක් විධියේ ප්‍රකාශ කළ බව අපට මතක තිබෙනවා. මිනිසුන්ට තළා පෙළා වැඩ කළොත් එහෙම බරපතල විධියට ක්‍රියා කරනවාය කිව්වා. 1968 අගෝස්තු 4 වැනි දා "ඔබ්සර්වර්" පත්‍රයේ මේ විධියේ පළ වී තිබුණා.

"I. G. P. to take firm action against Police assaults."

පොලීසිය මහජනයාට අඩන්තේට්ටම් කළොත් ඔවුන්ට විරුද්ධව බරපතල ලෙස ක්‍රියා කරනවා යයි පොලිස්පතිතුමා කියා තිබෙනවා. එහෙත් ඊට දවස් දෙකකට පසුව මට ලැබුණු ලිපියක, අහිංසක පවුලකට පොලිස් නිලධාරීන් පිරිසක් විසින් බරපතල ලෙස අඩන්තේට්ටම් කරන ලද ආකාරය විස්තර කොට තිබුණා. මෙවැනි වාර්තා පත්‍රවල පළ වීමෙන්, ඒ පිළිබඳ පරීක්ෂණ පැවැත්වීමෙන් මේ ප්‍රශ්නය විසඳන්නට බැහැ. රෝගය තිබෙන්නේ, වෙන තැනකයි. අප පිළියම් කළ යුත්තේ, එතැනටයි.

පොලිස් සේවයේ යෙදී සිටින සාමාන්‍ය රාළහාමිලා තමන්ගේ වැටුප් වැඩි කර ගැනීම සඳහා කළ යුත්තේ මොනවාදැයි සභාපතිතුමාත්, අගමැතිතුමාත් දන්නවා දැයි මා දන්නේ නැහැ. පොලිස් සේවයේ පවත්නා ඇතැම් වැරදි පිළිවෙත් නිසා, සමහර අසාධාරණ රෙගුලාසි නිසා, ඒවායින් තැලී පොඩි වී සිටින සාමාන්‍ය පොලිස් නිලධාරීන් තමන්ගේ ආදායම රුපියල් 5 කින් වැඩි කර ගැනීම සඳහා, ජීවිකාව ගෙන යාමට ආධාරයක් වශයෙන් රුපියල් 5 ක් උපයා ගැනීම සඳහා නොයෙක් විධියේ අසාධාරණ දේවල් කරන්නට පෙළඹෙනවා. පොලිස් රාළහාමි කෙනකුගේ වාර්ෂික වැටුප් වර්ධකය රුපියල් 36 යි නැත්නම් 42 යි. ඒ කියන්නේ, අවුරුද්දකට වරක් ඔවුන්ගේ මාසික වේතනය වැඩි වන්නේ රුපියල් 3 කින් නැත්නම් 3.50 කින් පමණයි. ඒ සුළු මුදල හෝ ලබා ගැනීම සඳහා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

පොලිස් ස්ථානාධිපති සතුටු වන ආකාරයට එක්තරා වර්ගයක නඩු ප්‍රමාණයක් පවරා එයින් දිනන්න ඔහුට සිදු වෙනවා. එවැනි පසුබිමක් මත පොලිස් රාළහාමිලාට සිදු වෙනවා, තමන්ගේ රුපියල් 3.50 ක වැටුප් වර්ධකය ලබා ගැනීම සඳහා, පළාතේ අපරාධ නැති වුණත් මිනිසුන් බොරු නඩුවලට හෝ පටලවන්න. මෙවැනි කණගාටුදායක පරිසරයකයි, පොලිස් සේවය තිබෙන්නේ.

එපමණක් නොවෙයි. මගේ කථාව ආරම්භ කළේ උසස් පොලිස් නිලධාරීන් සාමාන්‍ය පොලිස් නිලධාරීන්ට සලකන හැටි පෙන්නා දෙමිනුයි. ගෙදරදොරේ ඉංග්‍රීසියෙන් කථා කරන, ඉහළ පැළැන්තියේ ඉංග්‍රීසි පාසල්වල අධ්‍යාපනය ලබා පොලිස් සේවයට බැඳුණු උසස් පොලිස් නිලධාරීන් සාමාන්‍ය පොලිස් නිලධාරීන්ට සලකන්නේ, කථා කරන්නේ තමන්ගේ ගෙදර වැඩකාරයන්ටත් වඩා පහත් අන්දමටයි; වහලුන්ටත් අන්ත විධියටයි. පොලිස් කොස්තාපල්වරුන් වැඩ කරන්නේ මෙවැනි කනගාටුදායක තත්ත්වයක් යටතේයි. ඔවුන්ට වුවමනා වේලාවක නිවාඩු ගන්නට බැහැ. තමන්ගේම පවුලේ හෝ අසල්වැසි ගෙදරක අවමංගල්‍යයකට සහභාගි වීම සඳහා නිවාඩු ගන්න බොහොම අමාරුයි. අද නිවාඩු ඕනෑ යයි ඉල්ලුම් කළාම, ඒ ගැන පරීක්ෂා කර බලන්නට දවස් හතරක් පහක් ගන්නවා. එසේ පරීක්ෂා කොට නිවාඩු අනුමත කරන විට, ලැබෙන නිවාඩුවෙන් වැඩක් නැහැ. මෙවැනි කණගාටුදායක තත්ත්වයක පසු වන පොලිස් කොස්තාපල්වරුන් තුට්ටු දෙකක්, පැන්සයක්, සත 50 ක්, රුපියලක් සාක්කුවට දමා ගැනීම සඳහා අවස්ථා ලබා ගැනීමත් පුදුමයක්ද? ඔවුන්ට එවැනි සුළු මුදලක් පවා ලැබෙන්නේ දූෂණ ක්‍රියාවල යෙදීමෙනුයි. එම නිසා පොලීසියෙන් කෙරෙන දූෂණ ක්‍රියා, අකටයුතුකම් පිළිබඳව පොලීසියට චෝදනා කිරීමට පෙර, දැනට පොලීසියේ තිබෙන අසතුටුදායක තත්ත්වය මඟහැරවීමට අපට යුතුකමක් තිබෙනවා. පොලිස් සේවයේ පහළ පැළැන්තියේ උදවියගේ දුක්ගැනවිලි මේ විධියට සඳහන් කළත්, මිනිසුන්ට තාඩන පීඩන කිරීමේ චේතනාවෙන් හෝ මිනිසුන්ගෙන් පගාව ගැනීමේ චේතනාවෙන් හෝ බොරු නඩුවලට මිනිසුන් පටලැවීම වැනි දූෂණ ක්‍රියා කෙරෙහි අපගේ බලවත් අප්‍රසාදය පළ කරන්නට ඕනෑ.

පොලීසිය ගැන කතා කරන විට සාමාන්‍ය ජනතාවගේ බලවත්ම අප්‍රසාදය පොලීසිය කෙරෙහි ඇති වී තිබෙන්නේ අතින් පයින් තැළීම වැනි ක්‍රියා නිසා බව පෙනෙනවා. එම නිසා පොලිස් රාළහාමිලාගෙන් මා ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිනවා, මනුෂ්‍යයන් හැටියට හැසිරෙන ලෙස. කිසිම මිනිහෙකුට අයිතියක් නැහැ තවත් මිනිහෙකුට අතින් පයින් ගසා රිදවන්නට හෝ තුවාල කරන්නට. කිසිම ශීලාචාර මිනිසෙකුට එසේ කරන්නට අයිතියක් ඇත්තේ නැහැ. යම් කෙනෙකුට අතින් පයින් ගසා හිරිහැර කරන්නට හෝ තරවටු කරන්නට හෝ ශීලාචාර ලෝකයේ කිසිවෙකුට අයිතියක් නැහැ. එම සිරිත ම්ලේච්ඡ යුගයට අයිති දෙයක්. එම නිසා ශීලාචාර යුගයක ජීවත් වන අප ශීලාචාර මිනිසුන් හැටියට හැසිරෙන්නට කල්පනා කළ යුතුයි. එම නිසා පොලිස් කොස්තාපල් මහත්වරුන්ගෙන් මා ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිනවා පැරණි යුගයේ සිට පොලිස් සේවයට ඇබ්බැහි වී තිබෙන මෙම සිරිත කරුණා කර අතහැර දමන්නටය කියා. ඩවුබිගින්ලාගේ කාලයේ පටන්, එහෙම නැති නම් සොයිසාලාගේ කාලයේ පටන්, අතින් පයින් ගසා මිනිසුන් මෙල්ල කිරීමේ ම්ලේච්ඡ සිරිත පොලිස් සේවයට ඇබ්බැහි වී තිබුණා. අළුතින් පොලිස් සේවයට බඳවා ගන්න අයට තමන්ගේ සේවය පිළිබඳව අළුත් හැඟීම් රාශියක් ඇති කර දෙන්නට පොලිස් අභ්‍යාස මධ්‍යස්ථානයේදී මින් ඉදිරියට කටයුතු කරනු ඇතැයි මා විශ්වාස කරනවා. පැරණි උදවියගේ සිරිත ඒ තිබුණේ ඒ ක්‍රමයට කටයුතු කිරීම විය හැකියි. ඒ උදවියට උගන්වා තිබෙන්නේ ඒ ක්‍රමයට කටයුතු කරන්නට විය හැකියි. පැරණි ස්කෝලයකට ගොස් අධ්‍යාපන ලත් උදවිය ඒ ගතිගුණවලින් බේරෙන්නට නුපුළුවන් වීම නිසා බොහෝ තැන්වලදී මේ ආකාරයට ක්‍රියා කරන බව පොලිසියෙහිදී පමණක් නොව අනෙක් බොහෝ තැන්වලදීත් දකින්නට ලැබී තිබෙනවා. මෙන්න මේ අන්දමින් මිනිසුන්ට තළා පෙළීමේ ඇබ්බැහි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කම, මිනිසුන්ගෙන් පගා ගැනීමේ ඇබ්බැහිකම, මිනිසුන් බොරු නඩුවලට පට ලවා ගැනීමේ ඇබ්බැහිකම, යනාදී ඇබ්බැහිකම්වලට ගොදුරු වී ඒ මගින් තමන්ගේ පඩි වැඩි කර ගැනීමට උත්සාහ කිරීමේ පූරුද්ද අතහැර දමන හැටියට පොලිස් සේවකයන්ගෙන් මා ඉල්ලා සිටින්නට කැමතියි. මා පොලීසිය ගැන මීට වැඩියෙන් කථා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ.

ගරු අගමැතිතුමා යටතේ පවත්නා හමුදාව ගැනත් වචනයක් දෙකක් කිව යුතුයි. පොලීසිය කෙරෙහි තරම් ජන පිළිකුලක් තවම හමුදාව කෙරෙහි පැතිර ගොස් නැත්තේ මහජනතාව හා හමුදාව අතර එතරම් සම්බන්ධතාවක් මෙතෙක් ඇති නොවූ නිසයි. එහෙත් යම් අවස්ථාවකදී හමුදාව මහජනතාව අතරට පැමිණියා නම්, එදාට අපට බොහෝසෙයින් අසන්නට ලැබෙන්නේ කනගාටුදායක සිඞීන්මයි. 1955-1956 යුගයේදී විතර හමුදාවේ සෙබළුන් වගයක් දකුණේ ඈත ප්‍රදේශයකට ගොස් එක්තරා ආක්‍රමණයක් කොට ගංජා සංහාරයක යෙදුණු අවස්ථාවේදී ඇති වුණු කලබලය ගැන මට මතකයි. ඒ මීට අවුරුදු 10 කට 15 කට උඩදීයි. එහෙත් ඊට මෑත යුගයේදී සිදු වුණු දෙයක් ගැන සඳහන් කරන්නට කැමතියි. පසුගිය නිදහස් උත්සවයේදී හමුදාව විශ්ව විද්‍යාල භූමියට ගිය පසු ඇති වුණු සිද්ධිය පිළිබඳව අප හැමෝටම මතකයි. එම කනගාටුදායක සිද්ධියෙහිදී මහජන අප්‍රසාදයට ලක් වුණේ හමුදාව පමණක් නොවෙයි. හමුදාව ගැන කිසියම් විස්තරයක් කරන්නට ගොස්—ඔවුන්ගේ හැසිරීම හරියැයි කියන්නට ගොස්—හමුදා පාලනය පිළිබඳ වගකීම් ගන්න ගරු අගමැතිතුමාටත් බරපතළ මහජන අප්‍රසාදයකට මුහුණ දෙන්නට සිදු වුණා. [බාධා කිරීමක්] එම සිද්ධිය ඇති වී අවුරුද්දකට පමණ පසු, ඒ කියන්නේ ඊයේ, ඔබතුමාට සිදු වුණා එදා පේරාදෙණි විශ්ව විද්‍යාල භූමියේදී ඇති වුණු තත්ත්වය ගැන ඔබතුමාම සඳහන් කළ එක්තරා කනගාටුදායක ප්‍රකාශයක් ඉල්ලා අස් කර ගැනීමට. හමුදාවේ නොපනත්කම් සඟවා හමුදාව ආරක්ෂා කරන්නට ගිහින් ගරු අගමැතිතුමාට මහජන අප්‍රසාදයකට ලක් වන්නට සිදු වුණේ එක්තරා නොමනා කථාවක්

විමසා මහජන මන්ත්‍රී මණ්ඩලයේදී පැවසීම නිසයි. මෙම වැය ශීර්ෂය යටතේ මගේ කරුණු දැක්වීම අවසන් කරන්නට කලින් අගමැතිතුමාගෙන් කියැවී ඇති තවත් කථා දෙක තුනක් ගැන සඳහන් කරන්න සිදු වෙනවා ඇති. එහෙත් දැනට මා හමුදාවට පමණක් සීමා වූ කරුණු තුන හතරක් විස්තර වශයෙන් සඳහන් කරන්නයි බලාපොරොත්තු වෙන්නෙ.

හමුදාව අද වැඩිපුරම යොදවා තිබෙන්නේ උතුර හා නැගෙනහිර වෙරළේ හොර වැසියන් ගොඩ බැසීම වැළැක්වීම සඳහායි. එම කල්ලතෝනි සංහාරය සඳහා සේවයේ යොදවා තිබෙන පොලිස් සහ හමුදා සේවකයන්ගෙන් බලාපොරොත්තු වන සේවය අංග සම්පූර්ණ ලෙස ඉටු වෙනවාද කියා කරුණා කර ටිකක් සොයා බලන්න ඕනෑ. අද පවත්නා තත්ත්වය අනුව උතුර හා නැගෙනහිර නවතා තිබෙන ලංකා නාවුක හමුදාවේ ඇතැම් අංශවලින් කිසිසේත්ම ඒ බලාපොරොත්තු වන සේවය ඉටු වන්නේ නැති බවට පැමිණිලි රාශියක් ලැබී තිබෙනවා.

කල්ලතෝනීන් හැටියට හඳුන්වන ඒ හොර වැසියන් අල්ලා ගැනීමට විශේෂ යාත්‍රා වගයක් ගෙන්නා තිබෙනවාලු. එහෙත් ඒ යාත්‍රා, එම යාත්‍රාවලින් බලාපොරොත්තු වන සේවයට යොදවන්න බැරි යාත්‍රාය කියා ඒ ප්‍රදේශයේ නැවතී සිටින භටයින් බොහෝ දෙනෙක් පැමිණිලි කර තිබෙනවා. ගරු අගමැතිතුමා මේ කාරණය ගැන නොදන්නවාදැයි මා දන්නේ නැහැ. හමුදාවේ සිටින හමුදා භටයින් යම් කිසි විධියකින් මේ කරුණු අගමැතිතුමාට ලියා එව්වොත්, දෙපාර්තමේන්තුවේ රෙගුලාසි මාර්ගයෙන් ඔවුන්ට විරුද්ධව විනයානුකූලව ක්‍රියා කරන්නට පුළුවන් නිසා සමහර විට ඔවුන් කෙළින්ම එතුමාට ලියා එවන්නේ නැතුවා වෙන්න පුළුවන්. එහෙත් ඇක්සයිස් කොළවල පිටු ගණන් ලියා නිර්නාමිකව මන්ත්‍රීවරුන්ට තැපැල් කර එවනවා. උතුර හා නැගෙනහිර කල්ලතෝනි සංහාරයේ ඇත්ත තත්ත්වය මෙසේය කියා ඔවුන් විස්තර ලියා එවනවා. ඒ ලියුම්වල ඔවුන් සඳහන් කර තිබෙනවා, අනේ මේවා නිලධාරීන්ට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

පෙන්වන්න එපා, මේවා අගමැතිතුමාට පෙන්වන්න එපා, එසේ පෙන්නුවොත් අපේ අත් අකුරු සොයා බලා අඳුනාගෙන අපේ රක්ෂාව නැති කරන්න පුළුවන්ය කියා.

ගරු සභාපතිතුමනි, පසු ගිය සති දෙක ඇතුළත ඒ විධියේ ලියුම් පිටු 15ක් පමණ මට ලැබී තිබෙනවා. ඒ සේවකයන් ලියා එවා තිබෙන කරුණු මොනවාදැයි කියවා බැලුවොත් උතුර හා නැගෙනහිර සිදු වන ඒ සිඛීන් වැළැක්වීම පිණිස පියවර ගැනීමට, මා හිතනවා, ගරු අගමැතිතුමාට ඉතාමත් ප්‍රයෝජනවත් වේවි කියා.

**සභාපති**
*(அக்கிராசனர்)*
(The Chairman)

Order, please! The Sitting is suspended till 4.30 P.M.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ. භා. 4.30 ට නැවත පවත්වන ලදී.**

*அதன்படி அமர்வு பி.ப. 4.30 மணி வரை இடை நிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று.*

*Sitting accordingly suspended till 4.30 P.M. and then resumed.*

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ගරු සභාපතිතුමනි, මා සඳහන් කරමින් සිටියේ කල්ලතෝනීන් ඇල්ලීම සඳහා යොදවා තිබෙන සංවිධානය හරිහැටි ක්‍රියාත්මක නොවන බවට ඒ හමුදාවල සිටින සමහර සේවකයන් විසින් කර ඇති පැමිණිලි ගැනයි. ඔවුන්ට කෙළින්ම පෞද්ගලිකව ඉදිරිපත් වී මේ පැමිණිලි කරන්න පුළුවන්කමක් නැහැ, ඔවුන්ගේ ඉහළ නිලධාරීන්ගේ බලපෑම නිසා. යම් කිසි විධියකින් ඒ සේවකයන් තුළ තිබෙන ජාතික හැඟීම නිසා හෝ වේවා, රටට තිබෙන ආදරය නිසා හෝ වේවා, මහජන මුදල් අපතේ යනවා දැක එය ඉවසා ගන්නට බැරි කම නිසා හෝ වේවා, වෙන මොන හේතුවක් නිසා හෝ වේවා, හොර කල්ලතෝනීන් මැඩීමේ සංවිධානයේ නිෂ්පල ප්‍රයත්නය පිළිබඳ ඇත්ත තත්ත්වය ජාතික ප්‍රශ්නයක් වශයෙන් සලකා වග කියයුත්තන්ට පැමිණිලි කළොත් තමන්ගේ රක්ෂාව තමන්ට අහිමි වේවිය යන බය නිසා ඔවුන් කෙළින්ම ඉදිරිපත් වන්නේ නැති බව සම්පූර්ණයෙන්ම පැහැදිලි කාරණයක්. එහෙත් නිර්නාමික ලියුම් එවීමෙන් කරුණු පැහැදිලි කර දීමට බොහෝ සේවකයන් උත්සාහ ගෙන තිබෙනවා. කල්ලතෝනි සංහාරය සඳහා යෙදවීමට අලුතෙන් බෝට්ටු 20ක් පමණ තිබෙන වාලු. නමුත් ඒවා වැඩි පුර තිබෙන්නේ රෙපයාර් කරන තැන්වලලු. දවසක් දිව්වොත් සුමානයක් අලුත් වැඩියා කරන වාලු.

"විජය" කියා නැවක් තිබෙනවා. "අලියා" කියා අබලන් බෝට්ටුවක් අර ගෙන තිබෙනවා. ගජබාහු කියා තවත් කබල් නැවක් අරගෙන තිබෙනවාලු. මේ හැම නැවක්ම වැඩිපුර කරන්නේ වෙරළ මුර කිරීම නොවෙයි, අලුත්වැඩියා කරන ස්ථානවල තබා තිබීමයි. ඇණ සවි කිරීමට හෝ සායම් ගෑමට හෝ යම් යම් යන්ත්‍ර කොටස් සවි කිරීමට හෝ කියා රෙපයාර් කරන ස්ථානවල නවත්වා තිබෙනවා. ත්‍රිකුණාමලේදී රෙපයාර් කරන්න බැරි ඒවා කොළඹට එවනවා. කොළඹ මාස 6ක් පමණ තබා ගෙන රෙපයාර් කර එය නැවත ත්‍රිකුණාමලයට යවනවා. නැවතත් එය කැඩෙනවා. ඔන්න ඔය විධියටයි මේවා සිදු වන්නෙ. පසුගිය සුළි සුළඟට—කුණාටුවට—අසු වුණ නැවක් විනාශ වී ගොඩට ඇවිත් තිබුණා. එය අලුත්වැඩියා කරන්නය කියා ඇතුළේ වතුර පිරී තිබියදී පිටින් සායම් ගෑමට මුදල් වෙන් කරවා ගත්තා. නමුත් තවත් මුදල් ප්‍රමාණයක් වියදම් කර ඒ නැව රෙපයාර් කරන්න සිදු වී තිබෙනවා. මේ වාගේ නාස්තිකාරී වැඩ කොතෙකුත් කෙරෙනවා. ඒ නිසා මේ කාරණා ගැන පරීක්ෂණයක් පැවැත්වීමට අඩු ගණනේ කොළඹින්වත් නිලධාරියෙක් යවන්න. එහි සිටින නිලධාරීන්ට මෙය පැවරීමෙන් වැඩක් වන්නේ නැහැ. කල්ලතෝනීන්ගේ පැමිණීමට, හොර බඩු ගෙන ඒමේ ව්‍යාපාරයට, සමහර උසස් නිලධාරීන්ගේ සම්බන්ධකම් තිබෙන බවට පැමිණිලි තිබෙනවා. ඒ නිසා මේ කාරණා ගැන විභාග කිරීමට ඒ නිලධාරීන් යැවීමෙන් ප්‍රයෝජනයක් වන්නේ නැහැ. අසවල් වෙලාවට අසවල් ප්‍රදේශය මුර කිරීමට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යවනවාය කියා නියෝගයක් දුන් විට එම නියෝගය අනුව බෝට්ටුව පිටත්වන්නටත් කලින් හොර බඩු ගෙන එන නියෝජිත යන් අතට එම පණිවුඩය ලැබෙනවා. මේ හොර බඩු ගෙන්වන ලොකු මුදලාලිලා සමග සමහර උසස් නිලධාරීන් ඉතා කිට්ටු සබඳකම් පවත්වන බව අපට දැන ගන්න ලැබී තිබෙනවා.

ගරු සභාපතිතුමනි, සාමාන්‍ය භටයන්, සුළු භටයන්, මේ කාරණා ගැන හොඳට දන්නවා. නමුත් ඒවා ගැන පැමිණිලි කරන්න ඔවුන්ට ශක්තියක් පුළුවන් කමක් නැහැ. තත්ත්වය එහෙම නම් කල්ලතෝනින් මේ රටට ගොඩ බැසීම නතර කිරීම සඳහා වියදම් කරන මුදල් අපතේ යනවා නේද? මුදල් නාස්ති වුණත් කමක් නැහැ. මෙයින් සිදු වන භයානක ජාතික විපත්තිය කොතරම්ද කියා කල්පනා කර බලන්න. සමහර විට සුළු භටයන්ට ජාතික කැක්කුමක් තිබෙන නිසා වෙන්න ඇති, ඔවුන්ගේ කාල වේලාව වැය කරමින් මේ විධියට අපට ලියා එවන්නේ. ඇක්සයිස් කොළ අරගෙන තැන් තැන්වලට වී රහසිගත අන්දමට නිර්නාමිකව මේ විධියට පැමිණිලි ලියා එවන්නේ ඒ නිසා විය හැකියි. සම හර විට මා හිතනවා ගරු අගමැතිතුමාටත් මේ වගේ නිර්නාමික ලියුම් ලැබෙනවා ඇති. ඒ නිසා කරුණාකර මේ ගැන සොයා බලන්න. කල්ලතෝනි ව්‍යාපාරය නැති කිරීමට යොදවා ගත් බෝට්ටු ඕනෑ තරම් කැඩී ගියාවේ. නැව් රෙපයාර් කිරීමටය කියා නිලධාරීන් විසින් ඕනෑ තරම් මුදල් ප්‍රමාණයක් ලබා ගත්තාවෙ. නමුත් එය නොවෙයි ප්‍රශ්නය. ඊට වඩා වැදගත් බර පතළ ජාතික ප්‍රශ්නයක් මෙතන තිබෙ නවා. මේ ප්‍රශ්නයට එක්තරා විධියක උණු සුමක් ආධාරයක් ශක්තියක් ලැබෙන නිසා තමයි මා කිව්වේ, අපේ අගනුවර ටිකින් ටික උතුරු නැගෙනහිර පැත්තට ගෙන යන්නය කියා. අපේ අගනුවර ඒ පැත්තට අරගෙන ගියොත්, හමුදාවෙන් වැඩි කොටසක් එහි යැවෙන නිසා අපට සමහර විට පුළුවන් වේවි, මේ ප්‍රශ්නයට සාර්ථක අන්දමින් මුහුණ දෙන්න. එහෙම නැතුව මා ඒ විධියට කිව්වෙ කොළඹ අග නුවර වීම කෙරෙහි මගේ ඇති ද්වේශයක් නිසා නොවෙයි. අපට බරපතල ජාතික ප්‍රශ්නයක් තිබෙනවා. කොළඹ තිබෙන නාවික හමුදාවෙන් හා ගොඩ හමුදාවෙන් 100ක් 200ක් 300ක් නැත්නම් 400ක් පමණ උතුරු නැගෙනහිර ප්‍රදේශයට ගෙන ගොස් වෙරළ ආරක්ෂා කිරීමට යෙදවී මෙන් පමණක් මේ ප්‍රශ්නය විසඳන්න බැහැ. ප්‍රශ්නය විසඳෙනවා නොවෙයි, එය එන්න එන්නම උග්‍ර වෙනවා.

කල්ලතෝනි ප්‍රශ්නයත් සමගම එයට සම්බන්ධ වූ තවත් ප්‍රශ්නයක් තිබෙනවා නේද? එනම් ද්‍රවිඩ මුන්නේත්‍ර කසාගම් පක්ෂ ප්‍රශ්නයයි. ඒ දවස්වල තමුන්නාන් සෙලා සමග හිතවත්කම් දැක්වූ ද්‍රවිඩ මුන්නේත්‍ර කසාගම් පක්ෂ නායකයින් කියනවා, එහෙම දෙයක් උතුරේ නැත, එය බොරු හොල්මනක්, තර්ජන යක් පමණය කියා. එහෙම දෙයක් උතුරේ නැති බවයි ඒ අය කියන්නෙ. ඒ නිසා ඒවා ගැන කතා කරන්න වුවමනා නැතිලු. නමුත් දකුණු ඉන්දියාවේ මේ ද්‍රවිඩ මුන්නේත්‍ර කසාගම් පක්ෂයේ මොන තරම් බලපෑමක් තිබෙනවාද යන්න ඉන්දියාවේ දේශපාලනය දෙස බලන අයට පෙනෙනවා ඇති. මා අනාවැකියක් කියනවා නොවෙයි, සමහර විට අද ඉන්දියාවේ අලුත් ජනප්‍රියභාවයක් දිනා ගෙන සිටින ගාන්ධි මැතිනියගෙන් පසු මොන තත්ත්වයක් ඉන්දියාවේ ඇති වේවිද කියා කියන්න බැහැ. ගිරි ජනාධිපතිතුමා පිළිබඳ තරඟයෙන්, එතුමා ජය ගත් ආකාරයෙන්, එතුමාට ඡන්දය දුන් ආකාර යෙන්, දකුණු ඉන්දියාව කොයි විධියටද ගමන් කරන්නේ කියා සිතා ගන්න පුළුවනි. යළිත් වරක් ඉන්දියාව දෙකට බෙදීමේ අවස්ථාවකට මුහුණ දෙන්නට ඉන්දියාවට සිදු වේවි නේද ඉන්දිරා ගාන්ධි මැතිනියගෙන් පසුව? එහෙම වුනාම ලංකාවට උතුරෙන් හා නැගෙන ගිරින් තර්ජනයක් වී තිබෙන කල්ල තෝනි ප්‍රශ්නය හා ද්‍රවිඩ මුන්නේත්‍ර කළාගම් ප්‍රශ්නයත් යන දෙක එකට එක් වූ විට ලංකාව සැනසිල්ලේ ඉන්නේ කොහොමද? ඒ ගැනත් කල්පනා කරන්න. කල්ලතෝනි ප්‍රශ්නයත් ද්‍රවිඩ මුන්නේත්‍ර කළගම් පක්‍ෂයේ බලපෑමක් යන දෙක ගැන කල්පනා කර හමුදාවේ සේනාංක එකකට හෝ දෙකකට එම කටයුතත බාර නොදී එය බරපතල ජාතික ප්‍රශ්නයක් හැටියට සලකා මුළු හමුදාවම මේ සඳහා යොදවන්නට ඕනෑ නේද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

අද අපේ හමුදාව කරන්නේ කුමක්ද? ලේ බිඳක්වත් නොසොල්වා ලබා ගත්තාය කියන නිදහස පිළිබඳව අවුරුද්දකට වරක් පැවැත්වෙන උත්සව යේදී තුවක්කු කරගහගෙන වම දකුණ කිය කියා එහාට මෙහාට යන එක පමණක් නේද? කෝටි කීපයක් මහජන මුදල් වියදම් කර හමුදාවක් තබාගෙන ඉන්නේ පෙබරවාරි 4 වැනි දාට පැවැත් වෙන නිදහස් දින උත්සවයේදී පෙළපාළි දැක්වීමටද? මොකක්ද ඔකේ අදහස? යම් රටක නිදහස ලබා ගැනීම සඳහා සටන් කළ යුද හමුදාවකට සම්බන්ධකම් ඇති සේනාංකයක් ඒ නිදහස ලබා ගැනීම සඳහා සටන් කිරීමේ ගෞරවය හා සැලකිල්ල මහජනයාගෙන් ලබා ගැනීම සඳහා නිදහස් දින උත්සවයේදී පෙළපාළි දක්වනවා නම් මට එය තේරුම් ගන්නට පුළුවන්. එහෙත් මේ රටේ තිබෙන හමුදා වක් කවදාවත්ම අපේ නිදහස සඳහා සටන් කළාද? වෙන රටවල හමුදා ආඩම් බරයෙන් මහජනයා ඉදිරියේ පෙනී සිටින්නේ රට ආරක්ෂා කර ගැනීම සඳහා සටන් කළ හමුදා සේනාංක හැටියටයි. එහෙත් අපේ රටේ පෙබරවාරි 4 වැනි දා හමුදා පෙළපාළි දක්වන්නේ ගරු අග මැතිතුමා පේරාදෙනියේ ඇති චුණ්ඩය කියන විධියේ සිද්ධීන් ඇති කරන්නට පමණයි. නිකම් දුවන්නන් වාලේ කෙට එළදෙනත් දිව්වාය කියනවා වාගේ, වෙනත් රටවල නිදහස් දින උත්සවවලට හමුදා සේනාංක සහභාගි වන නිසා ලංකාවේත් සහභාගි කර ගන්නවා. එය තේරුමක් හෝ අර්ථයක් නැති වැඩක්; චාරිත්‍රයක්. කරුණාකර එය අත්හැර දමන්න. පෙබරවාරි 4 වැනි දා හමුදාංක ගෙන්වා පෙළපාළි දැක්වීමෙන් වැඩක් නැහැ. පාසැල් ළමයින් කීපදෙනෙකුට තමන්ගේ අධ්‍යාපන කටයුතු පිළිබඳව ලබා ගත් අත්දැකීම් වර්ණනා කර සිංදුවක් කියන්නට කියන්න. හමුදා සේනාංකයක් ගෙන්වා තුවක්කුත් කරගහගෙන වම දකුණ කියමින් එහාට මෙහාට යනවාට වඩා අපේ තරුණ ශිෂ්‍ය පරම්පරාවට එක්තරා තැනක් දී එදාට කටයුතු කිරීම වඩා වැදගත්. [බාධාකිරීමක්] තමුන්නාන්සේලා ඔය කප්පාදු කිරීමේ වැඩ කොන්ත්‍රාත් ගන්නා වෙලාවක කියන්න මමත් දෙන්නම්.

ද්‍රවිඩ මුන්නේත්‍ර කළගම් ප්‍රශ්නයේදී බරපතල දේශපාලන මතබේදයන්ට තුඩු දුන් අදහස් රාශියක් පසුගිය සති කීපය තුළදී පැතිර ගියා. ගරු සභාපතිතුමනි, ඔබතුමාට මතක ඇති ඔය පක්ෂය තහනම් කරන්නය කියා රටේ තැනින් තැන පැවැති රැස්වීම්වලදී ගරු අගමැතිතුමාගේ ඥාති සහෝදර දඹදෙනියේ ගරු මන්ත්‍රී තුමාත් (ආර්. ජී. සේනානායක මයා.) විරුද්ධ පාර්ශ්වයේ නායිකා සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියත් කියා සිටි බව. මේ ප්‍රශ්නයේදී ආණ්ඩුවේ නායකයා හැටි යට ගරු අගමැතිතුමාත් විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුනුත් අතර මතබේදයක් තිබෙනවා. අද නීතිගත වී තිබෙන නීතිය යටතේ එක දේශපලන පක්ෂයක් තහනම් කරන්නට තමන්ට බලයක් නැත කියා ගරු අගමැතිතුමා කියා හිටියා. ඒ පිළිබඳව අදහස් පළ කරන්නට ගොස් අපේ විරුද්ධ පාර්ශ්වයේ නායිකාව වන බණ්ඩාරනායක මැතිනිය යම් යම් කාරණා වගයක් කීවා. ද්‍රවිඩ මුන්නේත්‍ර කඝගම් ව්‍යාපාරය තහනම් කරන්නට බලයක් නැතැයි කීම වැරදි බවත්, ඒ සම්බන්ධ යෙන් ගත හැකි පියවරවල් කීපයක් ගැන කියා දෙන්නට තමන්ට පුළුවන් බවත් එතුමිය කීවා. ඒ සම්බන්ධයෙන් ගරු අගමැතිතුමා අදහස් පළ කරන්නට ගොස් එක එක තැන එක එක විධියට කථා කර ඇති බව පත්‍රවල පළ වී තිබුණා. පෞද්ගලික වශයෙන් අගමැතිතුමාගේ හිත රිදවන්නට මට වුවමනාවක් නැති බව මා ඊයේ කීවා. එය මා අදත් කියනවා. එහෙත් ගරු අගමැතිතුමා මේ කාරණය සම්බන්ධයෙන් — විරුද්ධ පාර්ශ්වයේ නායිකාව කළ කථාව සම්බන්ධයෙන් — කළ සඳහන ඉතාමත්ම කනගාටුදායක එකක් බව නොකියා බැහැ. [බාධා කිරීමක්]

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

මොකක්ද කිව්වේ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

He replied to that. He denied in Parliament that he said such a thing.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

මා එදා හිටියෙ නැහැ.

සභා පති
(அக்கிராசனர்)
(The Chairman)

He said so. I would also once again remind the hon. Member that there are only 8 hours for this Vote and he has spoken now for 45 minutes. There are two more Members on his side to speak. Please give the others also a chance.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

කෙසේ වුණත් මා මේ ගැන පැහැදිලි කර ගන්නට ඕනෑ. 1969 ජූනි මස 31 වැනි දා "ජනතා" පත්‍රයේ එක්තරා වාර්තාවක් පළ වී තිබුණා. ඒ වාර්තාව වැරදි යයි "ජනතා" පත්‍රයට දැන් වූ බවක් මා දන්නේ නැහැ.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

Not *patharey*; he said it in Parliament. He denied it. Once a Member of Parliament denies a thing, you have got to accept it.

අ. භා. 4.45

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

මා නෙ දන්නා නිසයි, අහන්නේ. නැතැයි කීවේ කවදාද? ගරු අගමැතිතුමා කථා කරන්නේ රාජ්‍ය භාෂාවෙන් නො වෙයි නොවැ? [බාධා කිරීමක්] කවදාද කිව්වෙ? එතකොට හැන්සාඩ් වාර්තාව බලා ඒ ගැන දැන ගන්නට පුළුවන් වෙනවා. "පෙන්නනවා කිව්වාට පෙන්නුවේ නෑ" යනුවෙන් නොකී බව කීවේ කවදාද?

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்ளி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

වැලිමඩ ගරු මන්ත්‍රීතුමා (පර්සි සමර වීර මයා.) එදා ඒ රැස්වීමේ හිටියා. මා එදා එහෙම දෙයක් නොකී බව එතුමා මේ ගරු සභාවේදී කීවා.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

පත්‍රයේ තියෙන්නේ වැලිමඩ ගරු මන්ත්‍රීතුමා කී දෙයක් ගැන නොවෙයි, ගරු අගමැතිතුමා කී දෙයක් ගැනයි. මේක මා නොමග යවන්නට කළ උත්සාහයක්. එහෙම දෙයක් නැතැයි වෙන මන්ත්‍රී වරයකු කීවත් ඇත්තෙන්ම රටේ නායක යා හැටියට එවැනි දෙයක් කීම ගැන මගේ කනගාටුව ගරු අගමැතිතුමාට දක්වන්න ට කැමතියි. මේ කාරණය ගැන සඳහන් කරන්නට උත්සාහ කරන අවස්ථාවලදී මා නොමග යවන්නට මේ මන්ත්‍රී මණ්ඩල යේ හැම දෙනාම උත්සාහ කිරීම ගැනත් මා කනගාටු වෙනවා. ගරු අගමැතිතුමා මේ ගැන කිසිවක් කිවේ නැහැ. මීට අවුරුද්දකට පමණ පෙර සිදු වූ කනගාටු දායක සිද්ධියක් ගැන ගරු අගමැතිතුමා මේ රටේ කාන්තා වර්ගයාගෙන් සමාව ඉල්ලුවාක් මෙන් මේ අන්දමේ නොමනා අමනෝඥ කථාවක් කීම ගැන ඒ කාන්තා පක්ෂයේ නායිකාව වන බණ්ඩාරනායක මැතිනියගෙන් සමාව ඉල්ලා ගන්නට ඕනෑ. මේ පළ වී තිබෙන වාර්තාව මට කිය වන්නට බැහැ. මේ වාර්තාව ඒ තරම් අසභ්‍යයි. අමනෝඥයි. අශ්ලීලයි. එවැනි දෙයක් කියවන්නට මා කැමති නෑ. 1969 ජූලි මස 31 වන බ්‍රහස්පතින්දා "ජනතා" පත්තරයේ 3 වන පිටුවෙහි "පෙන්නන වයි කිව්වට පෙන්නුවේ නෑ. මැතිණිගේ කතාවකට අගමැතිගෙන් පිළිතුරක්" යන හිසින් පළ වුණු මෙම ප්‍රවෘත්තිය වාර්තා ගත විය යුතු නිසා මා ඉදිරිපත් කරනවා. මෙය ඉතා ම අශික්ෂිත වාර්තාවක්. රටක අගමැතිවරයකු විසින් කළ යුතු කතාවක්


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]
නොවෙයි මේක. ශීලාචාර පුද්ගලයකු විසින් කළ යුතු කතාවක් නොවෙයි. මෙම වාර්තාවෙහි සඳහන් වන හැටියට, විනාඩි 5 ක පමණ වේලාවක් තිස්සේ මහජනයා හිනස්සමින් රටේ අගමැතිවරයා මෙවැනි අශ්ලීල අමනෝඥ ප්‍රකාශයක් කිරීම ගැන මගේ බලවත් කණගාටුව ප්‍රකාශ කරනවා. මෙපමණක් නොවෙයි. මීට පෙරත් ගරු අගමැතිතුමා මෙවැනිම කතාවක් මෙම ගරු සභාව තුළදීත් කර තිබෙනවා. වගා ව්‍යාපාරය සම්බන්ධව මෙම සභා ගර්භය තුළ ඇති වුණු එක්තරා විවාදයකදී එක්තරා එළවළු වර්ගයක් ගැන සඳහන් කරමින්—

**සභාපති**
*(அக்கிராசனர்)*
(The Chairman)
The hon. Member could have raised that matter under the Prime Minister's Votes. It is not relevant.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
ද්‍රවිඩ මුන්නේත්‍ර කසාගම් පක්ෂය සම්බන්ධ ප්‍රකාශයකදීයි මේ කතාව කර තිබෙන්නේ.

**සභාපති**
*(அக்கிராசனர்)*
(The Chairman)
Now he is talking about *elawalu*

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
එළවළු ගැන මා සඳහන් කෙළේ ගරු අගමැතිතුමා මෙවැනිම අමනෝඥ අශ්ලීල කතාවක් මීට පෙරත් කර තිබෙන බව පෙන්වා දීමට පමණයි. [බාධා කිරීම්] මා මෙම වාර්තාව නොකියවන්නේ, ශීලාචාර පිරිසක් ඉදිරියේ එය කියවිය නොහැකි නිසායි.

1969 අගෝස්තු 3 වන ඉරිදා "ඇත්ත" පත්තරය මේ කාරණය සම්බන්ධව ඉතාම වේගවත් කතුවැකියක් ලිව්වා. ඒ කර්තෘ වාක්‍යයේත් හැම දෙයක්ම මට කියවන්නට බැහැ. එහි එන අදහස් මා අනුමත කරතත්, එහි ශෛලිය මා අනුමත කරතත් එහි අඩංගු සමහර වචන මට මෙහිදී කියවන්නට බැරි නිසා මා එය කියවන්නේ නැහැ. එහෙත්, එයද වාර්තාගත වීම සඳහා ඉදිරිපත් කරනවා.

**සභාපති**
*(அக்கிராசனர்)*
(The Chairman)
I cannot allow it to be tabled. The hon. Member is not responsible for it.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
ඔව්, මා ඊට වගකියන්නේ නැහැ.

**සභාපති**
*(அக்கிராசனர்)*
(The Chairman)
What the hon. Member has got to say he has already said. The Prime Minister will reply to it. After speaking for fifty minutes he is elaborating the same point by reading what other people have written about it.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
සභාපතිතුමනි, මගේ තර්කය මට වුවමනා ශෛලියකින් ගොඩ නඟා ගන්නට කරුණා කර මට ඉඩ දෙන්න. රටේ නායකයා මෙවැනි දෙයක් කීම ගැන මගේ හිතේ වේදනාවක් තිබෙනවා. [බාධා කිරීම්]

**සභාපති**
*(அக்கிராசனர்)*
(The Chairman)
I have no objection to the hon. Member saying that, but he is trying to read editorials written by other people which have nothing to do with this. We are not concerned with them.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

අදාළ වන්නේ මෙහෙමයි. රටේ නායකයා මෙවැනි බරපතල ප්‍රශ්නයක් ගැන මේ විධියේ අමනෝඥ අශ්ලීල ප්‍රකාශයක් කිරීම නිසා මෙවැනි කර්තෘ වාක්‍යයක් ලියා තිබෙනවා. එය පටන්ගන්නේ, "ඔය අවලම් කට වහපන්" යනුවෙනුයි. මේ කතු වැකියෙහි එසේ සඳහන් කරන්නේ ගරු අගමැතිතුමා ගැනයි. මේ කර්තෘ වාක්‍යයේ හැම වචනයක්ම මට කියවන්නට බැහැ. සමහර වචන අශ්ලීලයි. එවැනි වචන එකක් දෙකක් මෙහි තිබෙන බව ඇත්ත. එහෙත් මා මෙම කතු වැකියේ ශෛලිය සම්පූර්ණයෙන්ම අනුමත කරනවා. මක්නිසාද ? රටේ නායකයා හැටියට, පක්ෂයේ නායකයා හැටියට මේ තරම් අමනෝඥ අන්දමේ කතාවක් කරන්නට අගමැතිතුමාට වටින්නේ නැති නිසායි. මේ තරම් බරපතල වේගවත් වචන පාවිච්චි කරමින් මෙබඳු කතු වැකියක් ලියන්නට මේ ලේඛකයා පෙළඹුණේ ඇයි ? අගමැතිතුමා අර විධියේ කතාවක් කළ නිසායි. අගමැතිතුමා කියා තිබෙන මේ කතාව වෙනත් පත්තරයක පළ වුණා නම්, එය බොරුවක්යයි තමුන්නාන්සේලා කියයි. මෙය පළ වුණේ ගරු අගමැතිතුමාට ඉතාම කිට්ටු ඥාති සම්බන්ධකමක් ඇති කෙනකුගේ පත්තරයකයි. විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් මේ කරුණ මතු කළාට පසු ගරු අගමැතිතුමා මේ ප්‍රවෘත්තිය ගැන ඕනෑ තරම් කරුණු දනගන්නට ඇති. නමුත් මේ දක්වා, අගමැතිතුමා ඒ ගැන කනගාටුව පළ කර නැහැ ; එහෙම නැති නම් එබඳු දෙයක් ප්‍රකාශ කර නැතැයි මෙම ගරු සභාවේදී කියා නැහැ. පේරාදෙනි විශ්ව විද්‍යාල ශිෂ්‍යාවනට නිග්‍රහ කර සිය කනගාටුව පළ කළා වාගේ මුළු කාන්තා පක්ෂයේම නායිකාව වශයෙන් අවිවාදයෙන් පිළිගෙන සිටින විරුද්ධ පාර්ශ්වයේ නායිකාව—

**ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන (කර්මාන්ත හා ධීවර ඇමති)**
*(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன—கைத்தொழில், கடற்றொழில் அமைச்சர்)*
(The Hon. D. P. R. Gunawardena—Minister of Industries and Fisheries)

කව්ද එහෙම කියන්නෙ ?

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ඒ කාරණයවත් පිළිගන්න තරම් සූදානම් නැති අනුගාමිකයන් පිරිසකුයි අගමැතිතුමාගේ නායකත්වයෙන් සිටින්නේ. ගරු අගමැතිතුමා, ඉන්දියාවේ අගමැති ඉන්දිරා ගාන්ධි මැතිණියගේ සභාය ඇතිව ජනාධිපති ගිරි මහතා පත් වුණු වෙලාවේදී එතුමාට සුභ පණිවුඩ යැව්වා. ඉන්දියාවේ අගමැති හැටියට පත් වූ ඉන්දිරා ගාන්ධි මැතිණිය ලෝකයේ දෙවන අගමැතිණිය වශයෙන් පිළිගනු ලැබුවා. ලෝකයේ පළමුවන අගමැතිණිය වශයෙන් පත් වූ කාන්තාවක් අද විරුද්ධ පාර්ශ්වයේ නායිකාව වශයෙන් සිටිනවා.

**ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන**
*(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன)*
(The Hon. D. P. R. Gunawardena)

පස්සා දොරෙන් පත් වුණේ.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

පස්සා දොරෙන් කැබිනට් මණ්ඩලයට රිංගා ගන්න ගිහින් සෙරෙප්පු පාර කාලා—

**ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන**
*(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன)*
(The Hon. D. P. R. Gunawardena)

පස්සා දොරෙන් සෙනෙට් එකට පත් වෙලා තමයි අගමැති වුණේ.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

සමාජවාදය පාවාදීලා—

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

පස්සා දොරෙන් නේද අරලිය ගහ මන්දිරයට ගියේ ?

**සභාපති**
*(அக்கிராசனர்)*
(The Chairman)

Order, please! The more you interrupt him the more will he speak.—[*Interruption.*] A Member

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සභාපති]
who is insulted will retaliate. So please stop these unnecessary interruptions.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
මා කාටවත් දොස් පැවරීමේ චේතනා වෙන් නොවෙයි කථා කළේ. අගමැති ධුරයට පස්සා දොරෙන් ඇතුළු වුණාය කියන කාන්තාව පදිංචි වී සිටි අරලියගහ මන්දිර යට පස්සා දොරෙන් ගොස් ඇමති පදවි යක් ගන්න උත්සාහ කර බැරි වුණු වෙලා වේදී—

**ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන**
*(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன)*
(The Hon. D. P. R. Gunawardena)
දන්නෙ නැති දේවල් ගැන කථා කරන්න එපා. මහත්මයා ගැන මම හොඳින් දන්නවා. ඕනෑ නැති දේවල් මගෙන් අහගන්න එපා.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
මමත් දන්නවා.

**ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන**
*(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன)*
(The Hon. D. P. R. Gunawardena)
උපන් තැන හිටන් මම දන්නවා. කොහොමද උපන්නෙ කියලත් මම දන්නවා.

**සභාපති**
*(அக்கிராசனர்)*
(The Chairman)
Hon. Minister of Industries and Fisheries, please do not interrupt.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
අරලිය ගහ මන්දිරයෙ පඳුරුවලට මුවා වෙවී, ඉටිපන්දම් පත්තු කරගෙන ඇමති පදවි ගන්න ගිහින් බැරි වුණ තැන වාමාංශික එක්සත් පෙරමුණෙන්, පැදුරට වත් නොකියා පැනලා ගිහින්—

**සභාපති**
*(அக்கிராசனர்)*
(The Chairman)
I have asked him not to interrupt, but the hon. Member is trying to provoke him. He has already taken fifty-five minutes and I am afraid that some of the Members on his side might not get a chance to speak.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
අරලිය ගහ මන්දිරයට හොරෙන් ගිය හැටි කියන්න තමුන්නාන්සේ මට ඉඩ දුන්නේ නැහැ නෙ.

**සභාපති**
*(அக்கிராசனர்)*
(The Chairman)
Please continue your speech without provoking hon. Members.—[*Interruption*].

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
ගරු සභාපතිතුමනි, ඒ කියන දේවල් වලට පිළිතුරු දෙන්න ඕනෑ.

**සභාපති**
*(அக்கிராசனர்)*
(The Chairman)
It has been stopped. Will the hon. Member please go on to some other point ?

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
ගරු අගමැතිතුමාගේ නිගරු කථාව නිසා බලවත් චිත්ත වේගයෙන් ලියන ලද ඇත්ත පත්‍රයේ කතෘ වාක්‍යය සම්පූර්ණයෙන්ම නොකිව්වත්, එහි අග කොටස පමණක්වත් කියන්න මා කල්පනා කරනවා.

ගරු සභාපතිතුමනි, බලවත් චිත්ත වේදනාවකින් යුක්තව මේ කර්තෘ වාක්‍යය ලියා තිබෙනවා. මෙයින් කියන්නේ අගමැතිතුමා එවැනි අශික්ෂිත කථාවක් කිරීම නොමනා වැඩක් බවයි. මේ කර්තෘ වාක්‍යයේ අග කොටස මට කියවීම අමාරුයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වේගවත් අදහසක් වුණත් නොකිව හැකි වචන කිහිපයක් යොදා තිබෙන නිසා මා මෙය කියවන්නේ නැහැ. නමුත් මා මේක අනුමත කරනවා. වේගවත් ශෛලියකින් වේගවත් බසකින් විරුද්ධත්වය දැක්විය යුතු ප්‍රකාශයක් තමයි අගමැතිතුමා කර තිබෙන්නෙ. එම නිසා මේ රටේ නායක සින්ගේ ගරුත්වයේ නාමයෙන්, ඔබතුමා දරන ඔය පදවියේ ගරුත්වයේ නාම යෙන් මා යළිත් වරක් ඒ ඉල්ලීම කර නවා. ඔබතුමා මෙබඳු අශික්ෂිත කථාවක් කළා නම්, අර කාන්තා වර්ගයාටම නිග්‍රහ දෙන පේරාදෙණියේ සිද්ධිය ගැන කළ ප්‍රකාශය ඉල්ලා අස් කර ගත්තා වාගේම මේ කථාවත් ඉල්ලා අස් කර ගන්නා මෙන් ශිෂ්ඨත්වයේ නාමයෙන් මා යළිත් වරක් ඉල්ලා සිටිනවා.

ඉන්දියාවේ ජනාධිපති තරගය පිළිබඳ ප්‍රතිඵල නිකුත් වූවාට පසු ගරු අගමැති තුමා ජනාධිපතිතුමාට සුබ පැතීමේ ලිපියක් යවා තිබෙනවා. ගරු සභාපතිතුමා වේලාව බලනවා. මට තව මිනිත්තු පහක් හෝ දහයක් ඕනෑ.

**සභාපති**
*(அக்கிராசனர்)*
(The Chairman)

It is not fair by other hon. Members. A certain amount of time has been allotted for the discussion of these Heads. The hon. Member has already taken one hour out of the eight hours allotted. The hon. Member must think of other hon. Members who are to follow.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

අපේ සම්මතිය එක් වැය ශීර්ෂයකට සීමිත වේලාව ප්‍රමාණවත් නොවෙනවා නම් ඊළඟ වැය ශීර්ෂයට නියමිත වේලා වෙන් කොටසක් ගෙන කථා කිරීමයි.

**සභාපති**
*(அக்கிராசனர்)*
(The Chairman)

That is what is said every time. I shall give the hon. Member another five minutes in which to finish his speech. I request the hon. Member to finish his speech within that time.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

මිනිත්තු පහකින් අවසාන කරන්නට මා උත්සාහ කරන්නම්.

අ. භා. 5

ඉන්දියාවේ ඇති වූ ඒ දේශපාලන ආන්දෝලනය අවසාන වුණේ ඉන්දිරා ගාන්ධි මැතිණියට ජය අත්වීමෙනුයි. ජනාධිපති පදවියට පත්වුණේ ගිරි මහත් මයා බව සැබෑයි. නමුත් ඒ ජයග්‍රහණයේ පසුපස ගමන් කළේ කව්ද? ඉන්දියාවේ අගමැතිණිය වන ඉන්දිරා ගාන්ධි මැතිණි යයි. ඉන්දියාවේ ප්‍රබල සමින්දාර්ලා, ටාටලා, බිර්ලලා ආදීන් සමග අත්වැල් බැඳගෙන ප්‍රතිගාමීන් ගෙන ගිය ඒ සටනට ජනතාවගේ ප්‍රගතිශීලී අංශයට පක්ෂ පාතව ඉන්දිරා ගත් එඩිතර පියවර නිසා ඉන්දියාවේ සමින්දාර්වරුන්ගේ සින්ඩි කේට් එක පරාජය වුණා. ලංකාවේත් ඔවැනි සින්ඩිකේට් කාරයො ඉන්නවා. 1956 න් පසු සමාජවාදයට එරෙහිව ලංකාවේත් ඔවැනි සින්ඩිකේට් එකක් වැඩ කළා. ඉන්දියාවේ හවුල වැනි හවුල් ලංකාවේත් තිබෙනවා. ධනවාදී හවුල්කාරයින් සමග එකතු වී සමාජවාදයට එරෙහිව සටන් කරන පිරිසක් ලංකාවේත් ඉන්නවා. නිජලිංගප්පලා, රෙඩ්ඩිලා ලංකාවෙත් ඉන් නවා. ඒ ලංකාවේ සිටින නිජලිංගප්පලාට රෙඩ්ඩිලාට විරුද්ධව ලංකාවේ ඉන්දිරා එක් තරා සටනක් මෙහෙයනවා. ඉන්දියාවේ ඉන් දිරා මෙහෙය වූ සටන සාර්ථක වන විට තමුන්නාන්සේලා සුබ පැතීමේ පණිවුඩ යව නවා. නමුත් ලංකාවේ ඉන්දිරා එම කාර් යය සඳහාම පැනවූ නීති තමුන්නාන් සේලා අවනීති බවට පත් කරනවා. ඉන්දි යාවේ ධනවාදී හවුල එකතු වුණේ මොක වද? මුදල් ඇමති මොරාජ් දේසායි මහත් මයා අස්කළේ මොන හේතුවක් නිසාද?

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

How does this come under my Votes?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

විදේශ සම්බන්ධකම් පිළිබඳවයි අප කථා කරන්නෙ. ඒකත් තෝරා දෙන්නට ඕනෑද? තමුන්නාන්සේ ඉන්දියාවේ ප්‍රතිපත්තිවලට ආවඩමින් එයට හාත්පසින්ම විරුද්ධ ප්‍රතිපත්තියක් ලංකාවේ ගෙන යනවා. හිටපු ගරු අගමැතිනිය මේ රට පාලනය කරන කාලයේදී විදේශ බැංකුවල ගිණුම් තැබීම නතර කර තිබුනා. මේ රජය බලයට පත් වුණාට පසු නැවතත් එයට ඉඩ දී තිබෙනවා. ඉන්දිරා ගාන්ධි මැතිනිය ඉන්දියාවේ බැංකු ජන සතු කළ බව කිව්වම තමුන්නාන්සේලා සතුට ප්‍රකාශ කළා. එහෙත් තමුන්නාන්සේලා මේ රටේ අනුගමනය කරන්නේ ඊට හාත්පසින්ම වෙනස් වැඩ පිළිවෙළක්.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

ඉන්දිරා ගාන්ධි මැතිනිය ගැන අගලවත්තේ ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා) මොනවාද කිව්වෙ?

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

තව ටිකකින් මම ඒ ගැන කියන්නම්. "දිනමිණ" පත්‍රය මා ගැන කිව්ව බොරුව මම විස්තර කරන්නම්.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

රටක විදේශ ප්‍රතිපත්තිය කියන්නේ සවදේශ ප්‍රතිපත්තියම ඉදිරියට ගෙන යාමය කියා අප බෙහෝ විට අසා තිබෙනවා. A country's foreign policy is really an extension of its internal policy. තමන්ගේ අභ්‍යන්තර ප්‍රතිපත්තිය විදේශයකට ගළපන්නට යාමයි, විදේශ ප්‍රතිපත්තියය කියන්නේ. එහෙත් මේ රටේ සිදු වන්නේ ඊට හාත්පසින්ම විරුද්ධ දෙයක්. ලංකාවේ සමාජවාදී ඉදිරි ගමන සඳහා අධිරාජ්‍යවාදයට ගැසූ හැම ගැටයක්ම ලිහමින් මේ වර්තමාන ආණ්ඩුව අධිරාජ්‍යවාදීන්ට වුවමනා හැටියට මේ රටේ සෙල්ලම් කරන්නට ඉඩ දෙනවා. එහෙත් ඉන්දියාවේ සිදු වන සිද්ධින් වලින් ඉගෙන ගත යුතු පාඩමක් තිබෙනවා. එනම් ඉන්දිරා ගාන්ධි මැතිනිය ඉන්දියාවේ ධනපති රොත්ත පරාජය කළා වගේම ලංකාවේ ධනවාදී රොත්තට විරුද්ධව කරන සටනේදී ලංකාවේ ගාන්ධි මැතිනියත් ජය ගන්නවා ඇත යන්නයි.

**ෂෙල්ටන් ජයසිංහ මයා.**
*(திரு. ஷெல்ற்றன் ஜயசிங்க)*
(Mr. Shelton Jayasinghe)

Mr. Chairman, before I raise a few matters that come under the Hon. Prime Minister's Votes I wish to say this. We have been witnessing in this House on numerous occasions heated exchanges of words between Members of the Government and Members of the Opposition, when Members have reason to be bitter about something that has been done or supposed to have been done by the Government, or *vice versa* when we had been in the Opposition. Some gentlemen who are more than proficient in the vitriolic art of reply have given without malice and taken without resentment. But in the last few minutes we unfortunately listened to a very deliberate maligning of the Hon. Prime Minister. A Member who got up and said that he did not want to read from a certain paper because it had things that were unreadable, deliberately proceeded to pick out words from that paper and repeat them here. Sir, I want to say this and I hope I will have your permission to say this to the hon. Member for Habaraduwa (Mr. Prins Gunasekera) : Of all the filth that he has been associated with a little while ago a large portion of it has got stuck in his bloody mouth.

**සභාපති**
*(அக்கிராசனர்)*
(The Chairman)

I think the hon. Member should withdraw that.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)
That does not improve the position.

ෂෙල්ටන් ජයසිංහ මයා.
(திரு. ஷெல்றன் ஜயசிங்க)
(Mr. Shelton Jayasinghe)
I am sorry, Sir.

I want to bring to the notice of the Hon. Prime Minister the position regarding the Police Service. I believe, the Hon. Prime Minister is aware of the services extended by the police, particularly in the Western Division in which my electorate is situated. May I say that there has been no material or physical change in this set-up for the past 30 years. Perhaps there has been an increase of an additional sub-inspector of police or a sergeant or two or three constables, but there has been no radical change in the operational methods, in the maintenance of the service or in the conduct of police affairs in this division. If there is any one single institution that has not made an effective change over the past 30 years, then we could say it is the Police Service.

I want to bring to the notice of the Hon. Prime Minister that at the end of 1967 the police force was short of 1,200 officers of all grades, as compared with the position at the end of 1966. Then in 1968 we started a programme of recruitment. At that time, I believe, the Police Department could take in only 300 people into the Police Training School. That was the amount that the Police Training School could hold. I think that even as at 1969 the programme of recruitment has not been fully completed, and there are not many months, not even three months, within which the recruitments could be made before the general election.

What is the position in the Wattala Electorate? There is a police station at Peliyagoda that looks after the whole of the Kelaniya Electorate, the major portion of the Wattala Electorate and a part of the Mahara Electorate.

What has been the increase in personnel over the last ten years? What has been the increase during the period 1960 to 1969? I do not think there has been an increase of even 10 per cent. On the other hand, while there were 30,000 voters originally in the electorate, the latest register shows that there are 48,500 voters. So it will be seen that in spite of an increase of almost 20,000 in voters, there has been no proportionate increase in police personnel.

The strength of the police force today is about 10,000. Out of this 10,000 how many actually perform police duties? There are a number of officers who perform guard duties. Then there are a number of officers who work in the police offices—both in the central office and in the other offices. Then there are a number of police officers who have duties in the law courts. If these officers are eliminated, you will find that on any single day the full effective service out of a force of about 10,000 is really 5,000 or 6,000.

As I have already pointed out, in spite of the tremendous increase in the number of persons in my electorate there has been no proportionate increase in the personnel attached to the Wattala police area, and I hope the Hon. Prime Minister will afford some relief as quickly as possible.

I wrote to the Hon. Prime Minister about the buildings of the Wattala police station. I asked whether if a new building could not be put up it would not be possible to convert an old garage into some sort of quarters. If in addition to the strain that is being already borne by the service, the members of the service have to worry about domestic problems, it would not be possible for them to give of their best.

I am totally against castigating the service generally as has been done by the hon. Member for Habaraduwa (Mr. Prins Gunasekera). He seems to think that the police service is the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ෂෙල්ටන් ජයසිංහ මයා.]

only service where there is corruption. He says policemen are prone to take bribes. Why does he say these things ? Policemen try to do their best under difficult conditions. What would happen if the Police Department failed to extend to the people the service that they are now rendering ? I do not know how often the hon. Member for Habaraduwa will be able to come to Parliament if this is the way he is talking about this service. He will be dealt with promptly, and then he might have wished that the police force he maligned so much were there to rescue him.

Maybe there has been a certain amount of corruption in the police force but these men are an unfortunate lot. They are under-paid and live under difficult circumstances having no redress or recourse to representation. It should be our duty to sympathize with their lot and to highlight the service they are rendering.

When the Sri Lanka Freedom Party was in power I had the opportunity of paying a very handsome tribute to the service rendered by the police even at that time purely on the ground that they are also as human as anybody else.

The other matter I want to refer to is about the amenities available to the service. I know that if I were to ask you to give me a full complement of police personnel for the Wattala Electorate you will think I am loony and you just cannot do it. You will say, " We are having a difficult time and it is not possible for me to give your electorate the best service in the way you want to have it. " I am prepared to accept that position. But there are some services which you should extend to the police personnel in the Wattala Electorate. I do not know what the position is in the other electorates but I think it may not be very much better than what we find at Wattala.

There is the question of quarters. Is it not possible for us to have some sort of temporary accommodation built for these people ? I ask that question because, when a policeman is moved from one station to another, he has sometimes to maintain two establishments. That is, he has to maintain his family in the previous place and also maintain himself in the new station. If we can provide some pre-fab houses as singleman's quarters, if we cannot provide family quarters, it will help these men to a great extent.

There is another small matter that I want to raise under these Votes and I think I am entitled to take this up with you. I want to bring to your notice the absence of certain essential amenities. The toilet facilities in this police station are deplorable. I do not think it will cost us very much to make available to these people these elementary facilities. Imagine the state of the police station at Wattala where the people have to queue up to draw a bucket of water. It is a terrible situation. This is an area where electricity is available. A small electric pump could be provided. Where electricity is available we should be in a position to provide this small service.

There is also another matter. I have had the opportunity to speak occasionally to some of the constables at this station, and they tell me that they find it extremely difficult to make purchases for their families today because items are sold on a coupon system and it necessitates their having to wait in queues. Some items are available only at co-operative stores where they have to take time to purchase them. I should like to make the suggestion that, where you have central offices, some form of stores be provided. This is a small administrative matter which could easily be attended to and to a great extent it will relieve the difficulties of the ordinary constable. It will also show to him that we are prepared to grant him what relief he wants and that we are aware of the difficulties he has to undergo and are attempting to do something in the matter.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 5.15

There was a Bill passed on the Floor of this House. During the period of the last Government, the services of the armed forces were made available for public works. Now, Sir, I want to find out from the Hon. Prime Minister the procedure regarding this matter I have put up a scheme for an agricultural pursuit at Muturajawela and I have requested the army to lend its assistance for this purpose. This is in close proximity to their Colombo station, and I see no physical difficulty for them to join in this venture. I should like to have a reply from the Hon. Prime Minister on this matter.

I thank you, Sir, for having given me these few minutes to speak about the difficulties of my electorate.

**ටී. බී. එම්. හේරත් මයා.** (වලපනේ)
*(திரு. ரீ. பி. எம். ஹேரத்—வலப்பனை)*
(Mr. T. B. M. Herath—Walapane)

ගරු සභාපතිතුමනි, ගරු කර්මාන්ත හා ධීවර කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම් තුමා පැලියගොඩ පොලීසියේ පවතින අඩු පාඩුකම් ගැන සඳහන් කළා. ආණ්ඩු පක්ෂයේ පාර්ලිමේන්තු ලේකම්වරයකුව සිටි මිනුත් එතුමා පොලීසියේ පවතින අඩු පාඩු ගැන අවංකව සඳහන් කිරීම ගැන මා විශේෂයෙන් සන්තෝෂ වෙනවා. පසුගිය දවස්වල පැලියගොඩ පොලීසියේ සිදු වූ ඉතා වැදගත් කරුණක් ගැන බලන විට ඒ අඩුපාඩුකම් එහි තිබෙන බව මා පිළි ගන්නවා. ඒ කියන්නෙ සිර භාරයට ගත් සැකකරුවකු පොලීසියේ සිර මැදිරියේ සිටියදී පිටස්තර කෙනෙකු විසින් ඔහු වෙඩි තබා මරනු ලැබූ පොලීසියක් තමයි පැලිය ගොඩ පොලීසිය.

**ෂෙල්ටන් ජයසිංහ මයා.**
*(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)*
(Mr. Shelton Jayasinghe)

නැහැ. පැලියගොඩ නොවෙයි.—[බාධා කිරීමක්]

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

මට වැරදුණා, වත්තල පොලීසිය. වත්තල තමුන්නාන්සේට ඊට වැඩිය ළඟයි. ඒ නිසා වත්තල ආසනයේ පොලීසිවල දුර්වලකම් තිබෙන බව පිළිගන්නට ඕනෑ. එහෙත් මේ ගරු සභාවේ කථා නොකර එතුමාට මේ අඩු පාඩුකම් හදා ගන්නට නොහැකිවීම ගැන විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරයකු හැටියට මට කනගාටු වන්නට සිදු වී තිබෙන බව මතක් කරන්න ඕනෑ.

**ෂෙල්ටන් ජයසිංහ මයා.**
*(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)*
(Mr. Shelton Jayasinghe)

ඔය සුළු කොනැහිලි වුවමනා නැහැනෙ.—[බාධා කිරීමක්] තමුන්නාන්සේ වලපනේ ගැන කථාකරන්න.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

තමුන්නාන්සේට අපේ දේශන ගැන සඳහන් කළ හැකි නම් අපටත් තමුන් නාන්සේගේ දේශන ගැන සඳහන් කළ හැකියි.—[බාධා කිරීමක්] වලපනේ ගැන නොවෙයි, මට ලංකාවම ගැන කථා කළ හැකියි. හැබැයි මම එංගලන්තයේ ඇමති කම් ගැන කථා කරන්නට කල්පනා කරන්නෙ නැහැ.

ගරු සභාපතිතුමනි, ගරු අගමැතිතුමා මේ සභාවෙන් පිටස්තරව දුන් යම් යම් පොරොන්දු ගැන මා සඳහන් කරන්නට යන්නෙ නැහැ. එහෙත් මේ සභාවේදී එතුමා විසින් මට දෙන ලද තවමත් ඉටු නොවුණු පොරොන්දු කිහිපයක් ගැන මේ අවස්ථාවේදී මතක් කිරීම මගේ යුතුකමක් හැටියට මා කල්පනා කරනවා. 1965 දී මා මේ ගරු සභාවේ ප්‍රශ්නයක් නැගූ අවස්ථා වේදී, වලපනේ නිල්දණ්ඩාහින්නේ පොලීසියක් ස්ථාපිත කිරීම අත්‍යවශ්‍ය කටයුත්තක් යයි එතුමා පිළිගත්තා බව ප්‍රකාශ කළා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. එම්. හේරත් මයා.]

ඒ ගැන එතුමාගේ සැලකිල්ල යොමුවී තිබෙන බවත් කියා සිටියා. එදා සිට දැනට අවුරුදු 4 කුත් මාස ගණනක් ගත වී ඇති නමුත් නිල්දණ්ඩාහින්නේ පොලීසියක් පිහිටුවීමට කිසිම උත්සාහයක් දරා තිබෙන බවක් අද වනතුරු මට දැන ගන්නට නැහැ. පොලීස් නිලධාරීන්ගෙන් මට ලැබෙන වාර්තාවල සඳහන් වෙන්නේ අපරාධ සංඛ්‍යාව අඩු නිසා එහි පොලීසියක් පිහිටුවීම අනවශ්‍ය බවයි.

මගේ කොට්ඨාශයේ වලපනේ ආදායම් පාලක කොට්ඨාශය පොලිස් වැයික්කියක් නොවෙයි. වතුකරයේ පොලීසි කිහිපයක් තිබෙන නමුත් ඒවාට අයිති වතු පමණයි. ගම්වල වැඩ කරන්නට ඒ පොලීසිවලට බල යක් නැහැ. මේ නිසා විශාල ජනගහනයක් සිටින වලපනේ ආදායම් පාලක කොට්ඨාශ යේ අපේ රජය පැවති කාලයේ තාවකාලික පොලීසියක් විවෘත කර තිබුණා. පසුගිය මහ මැතිවරණයෙන් පසුව ඒකත් වසා දැම්මා. ඒ ගැන මේ සභාවේ ප්‍රශ්න කළ අවස්ථා වේදී නිල්දණ්ඩාහින්නේ පොලීසියක් පිහිටුවන්ට සෑම උත්සාහයක්ම ගන්නා බවට ගරු අගමැතිතුමා පොරොන්දුවක් දුන්නා. එහෙත් ඒ පොරොන්දුව ඉෂ්ට කරන්ට දෙපාර්තමේන්තුව මෙතෙක් කිසිම උත්සාහයක් දරා නැති බවයි මට කරන්නට තිබෙන චෝදනාව. මේ පොරොන්දුව දෙන්නට ඉස්සරවෙලා පොලීසියක් සඳහා ගොඩනැගිල්ලක් තනන්නට ඉඩම් අත්පත් කර ගැනීමටත් ලැහැස්තියක් තිබුණා. ඒ වගේම කලින් පැවති තාවකාලික පොලීසිය ස්ථිර කිරීම සඳහා ගෙයක් කුලියට ගැනීමේ අදහසකුත් තිබුණා. එහෙත් අගමැතිතුමා පොරොන්දුව දුන්නාට පසුව කලින් කර ගෙන ගිය වැඩ ටිකත් අතහැර දමා තිබෙනවා.

දෙපාර්තමේන්තුව මොනවා කිව්වත් අපරාධ වැඩි වුණාට පසුව පොලීසියක් පිහිටු වීමේ ප්‍රතිපත්තියට මා විරුද්ධයි. අපේ පොලීසිය සූදානම් වී සිටින්නේ අපරාධ යක් වුණාට පසුව රාජකාරි කිරීමටයි. අපරාධ වැළැක්වීම පොලීසියේ රාජකාරියට අයිති නැද්ද? යමෙක් පොලීසියකට ගොස් අසුවලා මාව මරන්නට ලැහැස්තිවී සිටිනවා යයි පැමිණිල්ලක් කරන්නට ගියාම, "මැරුවට පස්සෙ වරෙන්" කියන පුරුද්දක් ඇතැම් පොලීස් නිලධාරීන් තුළ තිබෙනවා. අපරාධ සිදු වුණාට පසු රාජ කාරිය කිරීම නොවෙයි පොලීසියේ ක්‍රියා කලාපය විය යුත්තේ; අපරාධ වැළැක් වීමයි. ලෙඩක් හැදුනාට පසුව වෙදකම් කිරීමට වැඩිය ලෙඩය හැදෙන්නට පෙර එය වළක්වා ගැනීමට ක්‍රියා කිරීම තමයි හොඳ ක්‍රමය. ගරු අගමැතිතුමා මේ සභාවේ දී පොරොන්දුවක් දුන්නා. එතුමාගේ ඒ පොරොන්දුව ඉටු වෙනවාදැයි ජනතාව බලා සිටිනවා. රටේ, රාජ්‍යයේ නායකයා හැටියට ගරු අගමැතිතුමා මේ ගරු සභාවේ දෙන පොරොන්දුවක් ක්‍රියාවේ යොදවන්නට නිල ධාරීන් ඉඩ නොදෙනවා නම්, මේ සභාවෙන් වත්, අගමැතිවරයකු සිටීමෙන්වත්, කැබිනට් ක්‍රමයක් තිබීමෙන්වත් කිසිම ප්‍රයෝජනයක් නැහැ කියායි මා හිතන් නේ. ඇමතිවරයකු වගකීමක් ඇතිව මේ ගරු සභාවට ප්‍රකාශයක් කළා නම් එය ඉටු කරන්නට ඕනෑ. එය ඉටු කිරීම සඳහා නිලධාරීන් ක්‍රියා කරන්නට ඕනෑ. එහෙත් අද වන තෙක් ඒ ගැන කිසිවක් කර නැහැ. 1965 දීයි, ගරු අගමැතිතුමා ඒ ප්‍රකාශය කළේ. වුවමනා නම් නිල වාර්තා පිළිබඳ විස්තර මම ඉදිරිපත් කරන්නම්.

එක්තරා මනුෂ්‍යයකුගේ මරණය සම්බන්ධයෙන් මගේ ආසනයේ අහිංසක මිනිසුන් කීප දෙනෙකු මාස ගණනක් හිර භාරයේ තබාගෙන සිටි බව තමුන්නාන් සේට මතක ඇති. එහෙත් ඒ නැනැත්තා මළේ නැහැ, ගෙදර හිටියා. මා මේ ගැන මේ ගරු සභාවේ තුන් වරක් ප්‍රශ්න කළා. මා ඉදිරිපත් කළ විස්තරය ගැන බලා ගරු අගමැතිතුමා කිව්වා, මට ලැබී තිබෙන ආරංචි වැරදි වගේ පෙනෙනවා, පසුව උත්තර දෙන්නම්, කියා. එහෙත් අද වන තෙක් පිළිතුරක් දෙන්නට නිලධාරීන්ට පුළුවන් වුණේ නැහැ. මන්ත්‍රීවරයකු ගරු අගමැතිතුමාගෙන් ප්‍රශ්නයක් ඇසුවාම මේ ගරු සභාවේදී පිළිතුරක් දෙන්නට බැරි නම් පෞද්ගලිකව හෝ ඒ මන්ත්‍රීවරයාට පිළිතුරක් යවන්නට යුතුකමක් තිබෙනවා. එහෙත් මේ වන තෙක් පිළිතුරක් නොලැබීම ගැන මා කණගාටු වෙනවා.

ගරු සභාපතිතුමනි, ගරු අගමැතිතුමා වැඩ බහුල පුද්ගලයකු බව මා පිළි ගන්නවා. එහෙත් පොලිස් දෙපාර්ත

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මේන්තුවේ ප්‍රධානීන්ට යුතුකමක් තිබුනා, එවැනි වැදගත් ප්‍රශ්නයක් සඳහා පිළිතුරක් යවන්නට. එහෙත් අද වන තුරු මන්ත්‍රීවරයාට පිළිතුරක් නැහැ. පොලීසියේ ක්‍රියාකලාපය ගැන අප යම් යම් විවේචන කරනවා. පොලිසිය ගැන විවේචනය කරන් නට අපට ලැබෙන එකම අවස්ථාව මේකයි. පොලිසියේ සිටින වැරදි කරන උදවිය ගැනත් අහිංසක උදවිය ගැනත් අප දන් නවා. අප කෙළින්ම අමු අමුවේ හැම කෙන කුටම පහර ගහන්නට යන්නෙ නැහැ. එහෙත් වරදක් සිදු වී තිබෙනවා නම් මෙවැනි අවස්ථාවකදී එය පෙන්වා දීම අපේ යුතුකමක්.

වලපනේ ආදායම් පාලක කොට්ඨාශය සම්පූර්ණයෙන්ම පොලිස් වැයික්කියක් නොවෙයි. ආදායම් පාලක නිලධාරියෙකුට ඒ රාජකාරී කරන්නට බැහැ. ග්‍රාම සේවක යෙකුට ඒ රාජකාරි කරන්නට බලයක් නැහැ. පොලිසිය කියන්නේ අපට ඒ පැමි ණිලි සටහන් කරගෙන ඒ වැඩ කරන්නට බැහැ, මේක පොලිස් වැයික්කියක් නොවේය, කියායි. පසුගිය කාලයේ සිටි පොලිස්පතිතුමා පොලිසිවලට විශේෂ නියෝගයක් කර තිබුනා, අපරාධ තත්ත් වයේ ඒවා කෙළින්ම භාර ගෙන කටයුතු කරන්නය කියා. දැන් ඒ කටයුතුත් නවත් වලා. අළුත් පොලිසියක් ආරම්භ කරනවා වෙනුවට කරගෙන ගිය වැඩ කොටසත් නවත්වලා. ඒ නිසා මේ ගැන විශේෂ යෙන් සොයා බලන ලෙස මා තමුන්නාන් සේගෙන් ඉල්ලා සිටිනවා.

අනික් කාරණය මේකයි. පොලිස් නිල ධාරීන් මහජනතාවට සලකන්නට ඕනෑ, ජනතාවක් හැටියට. ලොකු උදවියට එක විධියකටත්, මන්ත්‍රීවරයකුට එක විධිය කටත්, සාමාන්‍ය පුරවැසියෙකුට එක විධිය කටත් සැලකීම වැරදියි. මීට කලිනුත් මා මේ ගරු සභාවේදී මේ ප්‍රශ්නය ඇසුවා. හඟුරන්කෙත කොට්ඨාශයේ ළමයෙක් නැති වුණා. ග්‍රාම සේවක නැනගේ යම්කිසි වරදක් නිසා ඒ ළමයා නැති වුණා. අදත් ඒ ළමයා නැහැ. ඒ ළමයා ජීවතුන් අතර ඉන්නවාද නැද්ද යන්න පවා දැනගන් නට විධියක්ද නැහැ. ළමයාගේ අතුරු දහන්වීම ගැන බලවත් ලෙස ශෝකයට පත් මව වහාම පොලීසියට ගිහිල්ලා මේ ගැන කියා සිටියා. ඈ තමන්ගේ දරු දුක උහුලන්නට බැරි නිසා පෙරළි පෙරළි පොලී සිය ඇතුළේ අඬන්නට පටන් ගත්තා. තමන්ගේ දරුවකු නැති වුණාම කාට වුණත් බලවත් ශෝකයක් ඇති වෙනවා. විශේෂයෙන්ම මවකට එයින් ඇති වන දුක විශාලයි. නැති වූ දරුවා ගැන කිසිම ආරංචියක් නොලැබීම නිසා ශෝකයට පත් වන මවක් ඒ ආකාරයට හඬා වැලපෙන් නට වීම ස්වාභාවිකයි. කොයි අම්මා වුණත් එවැනි අවස්ථාවක අඬනවා අඬනවාමයි. පොලීසියට පැමිණි මව, දරුවා නැතිවීම නිසා ඇති වූ චිත්ත වේදනාවෙන් හැපි හැපි අඬනවා දුටු පොලීස් පරීක්ෂකවරයා කෙළේ කුමක්දැයි දැනගත්තොත් තමුන් නාන්සේ පුදුම වෙනවා ඇති. “හිතට අමාරු නම් ඇසිඩ් බිපන්” කියලයි පොලීස් පරීක්ෂකවරයා කියලා තියෙන්නෙ.

නුවරඑළියේ දිසාපතිතුමා මේ ගැන පරීක්ෂණයක් පැවැත්වුවා. ඒ කොයි හැටි වෙතත්, තවමත් දරුවා ගැන ආරංචියක් ලැබී නැහැ. වැරදි කරන පොලිස් නිල ධාරීන්ට නිසි දඬුවම් පමුණුවන්නට පුළු වන් ක්‍රමයක් තිබෙන්නට ඕනෑ. රජයේ අනෙක් හැම දෙපාර්තමේන්තුවකමත් එවැනි වැඩ පිළිවෙලක් තිබෙනවා. විනය විරෝධී ලෙස ක්‍රියා කර අසුවන රජයේ අනෙක් නිලධාරීන්ට විනයානුකූලව දෙපාර්තමේන්තුවෙන්ම දඬුවම් පැමිණ වීමේ ක්‍රමයක් ඒ ඒ දෙපාතීමේන්තු තුළ පවතිනවා. ඒවා ක්‍රියාත්මක වෙනවා. පොලීසිය සම්බන්ධයෙනුත් ඒ විධියේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක විය යුතුයි. එහෙත් පොලීසියේ නිලධාරීන් කරන වැරදි සම්බන්ධයෙන් පමණක් උසාවියට යන්නට වුවමනාවක් තිබෙනවාද? එවැනි තත්ත්වයක් තිබීම කොහෙත්ම සුදුසු නැහැ.

පොලීසියට විරුද්ධව මහජනයාගෙන් ලැබෙන පැමිණිලි ගැන දැනට වඩා හොඳ සැලකිල්ලක් දැක්විය යුතුව තිබෙනවා. පොලීසියේ උසස් නිලධාරීන් එවැනි පැමි ණිලි ගැන දැනට වඩා ඇඩි සැලකිල්ලකින් ක්‍රියා කරන්නට ඕනෑ. හැකිතාක් ඉක්ම නින් ඒවා ගැන පරීක්ෂා කර බලන්නටත් ඕනෑ. යුක්තියත් සාධාරණයත් ඉටු වන ආකාරයට කටයුතු කරන්නට ඕනෑ. සමහර විට පැමිණිල්ලක් ඉදිරිපත් කරන නැනැත් තාම තමයි නැවත වරක් ගුටි කන්නේ,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. එම්. හේරත් මයා.]

පොලීසියෙ උදවියගෙන්. එය කනගාටු දායක තත්ත්වයක් බව කියන්නට ඕනෑ. ඒ නිසා පොලීසියේ නිලධාරීන්ට ඕනෑවට වඩා මහජනයා තළා පෙළා කටයුතු කරන්නට ඉඩ තැබීම භයානක බව ප්‍රකාශ කරන්නට කැමතියි. මෙවැනි දේ සිදු වන්නේ බොහෝ විට සමහර උසස් නිලධාරීන්ගේ නොසැලකිල්ල නිසායි කියන්නට මට සිද්ධ වෙලා තිබෙනවා. වරදක් කළ බවට පැමිණිල්ලක් ලැබුණු වහාම ඒ සම්බන්ධයෙන් ක්‍රියා කරනවා නම් මෙවැනි දේවල් තව දුරටත් සිද්ධ වන්නෙ නැහැ.

රාජ්‍යාරක්ෂක ඇමතිතුමාගේ වැය ශීර්ෂය යටතේ තවත් එක් කාරණයක් ඉදිරිපත් කරන්නට සිද්ධ වෙලා තිබෙනවා. රාජ්‍යයක් ආරක්ෂා කරන විට ජනතාවත් ආරක්ෂා වන්නට ඕනෑ. අද රජයේ යම් යම් ප්‍රතිපත්ති නිසා රටේ සාමාන්‍ය මහජනයාට නොයෙක් විධියේ අමාරුකම්වලට මුහුණ පෑමට සිදු වී තිබෙනවා. රජයේ කිසිම දෙපාර්තමේන්තුවක වාහනයක් රක්ෂණය කරන්නේ නැති බව තමුන්නාන්සේ දන්නවාදැයි මම දන්නේ නැහැ. ඔය තත්ත්වය නිසා මොන විධියේ දේවලට මුහුණ පෑමට ද මහජනයාට අද සිදු වී තිබෙන්නේ ? එය ඉතාමත් වැදගත් දෙයක් හැටියට මා සලකනවා. ඒ නිසා එය මේ අවස්ථාවේ ඉදිරිපත් කරන්නට ඕනෑ. රජයේ දෙපාර්තමේන්තුවකට අයිති වාහනයකින් යම්කිසි මිනිසෙකුට හානියක් සිදු වුණොත් ඒ පුද්ගලයාට මොනම ක්‍රමයකින්වත් වන්දියක් ලබා ගන්නට බැහැ. වලපනේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාලයට අයිති ජීප් රථයක් පෙරලී මුරකාරයා එතනම මළා. මේ රථය රක්ෂණය කර නොතිබුණු නිසා වන්දි වශයෙන් සතයක්වත් ලබාගන්නට බැරි වුණා. රාජකාරියේ යෙදී සිටි අවස්ථාවේදීයි මෙය සිදු වී තිබෙන්නේ. ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමා කියා තිබෙන්නේ රක්ෂණය නොකර තිබුණු නිසා දෙන්නට බැරි බවයි. ඒ නිසා අප කියා සිටින්නේ රජයේ වාහන සියල්ලක්ම රක්ෂණය කළ යුතු බවයි. එසේ කිරීමෙන් මේ ප්‍රශ්නය විසඳා ගත හැකියි නේද ? කෙලින්ම රජයේ මුදල් මේ සඳහා යොදන්නට බැරි නම් රක්ෂණ සංස්ථාවේ මුදල්වලින් ඒ කටයුත්ත කරන්නට දුෂ්කරකම තිබෙනවා නේද ? මම ඒ ප්‍රශ්නය අහන්නට කැමතියි. ඒ ගැන ඊට වඩා යමක් කථා කරන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ.

අ. භා. 5.30

විදේශිකයන් ඉඩම් ගැනීම ගැන වචනයක් කථා කරන්නට සිදු වී තිබෙනවා. අධිකරණ කටයුතු පිළිබඳ ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා මේ ගැන සඳහන් කළා. රටවැසියන් නොවන උදවිය ඉඩම් ගැනීමෙන් යම් යම් අමාරුකම් ඇති වෙනවා නොවේයිද ? මේ රටේ පුරවැසියන් නොවන අයට මේ රටේ ඉඩම් මිලයට ගැනීම තහනම් කරන්නට විරුද්ධ පාර්ශ්වයෙන් එක්තරා යෝජනාවක් ඉදිරිපත් කරන්නට යෙදුණා. ඇත්ත වශයෙන්ම කළ යුත්තේ එයයි. වලපනේ, රාගල, හැටන්, නුවරඑළිය, තලවකැලේ, ආදි ප්‍රදේශවල පුරවැසියන් නොවන අය විසින් ඉඩම් විශාල ප්‍රමාණයක් ගනු ලැබ තිබෙන බව සඳහන් කරන්නට සිදු වී තිබෙනවා. ඒ අය විශාල මුදලක් ගෙවා වුවත් ඉඩම් ගන්නට ලෑස්තියෙන් ඉන්නවා. රු. 10,000 කට විකුණන්නට බලාපොරොත්තු වන ඉඩමකට වුවත් රු. 15,000 නැත්නම් 20,000 වුවත් ගෙවන්නට මේ පුරවැසියන් නොවන උදවිය ලෑස්තියි. පුරවැසියන් නොවන උදවිය මේ රටේ ඉඩම් මිලයට ගැනීම හේතු කොට ගෙන කවදා නමුත්—කල් පසු වී හෝ—අපට කරදර රාශියකට මුහුණ පාන්නට සිද්ධ වෙනවා. ඒ නිසා පුරවැසියන් නොවන අයට ඉඩම් ගැනීම අවහිර කිරීමේ පනතක් ගෙන ආ යුතුව තිබෙනවා. කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමා (ඉලංගරත්න මයා.) මුදල් ඇමතිවරයා වශයෙන් හිටපු කාලයේ බදු පනතට සංශෝධනයක් ඉදිරිපත් කළා. කෙසේ හෝ පුරවැසියන් නොවන අය මේ රටේ ඉඩම් ගැනීම තහනම් කළ යුතුමයි. එය ඉතා වැදගත් කටයුත්තක් හැටියට මා සලකනවා. කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ සංශෝධනයෙන් අපේක්ෂිත වැඩ පිළිවෙල තහවුරු කරන්නට කටයුතු කරන්නැයි ඉල්ලනවා.

තවත් එක් වැදගත් කාරණයක් ගැන ප්‍රමාණයක් සඳහන් කරන්නට බලා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පොරොත්තු වෙනවා. තමුන්නාන්සේගේ සැලකිල්ලට භාජන කරන්නට මා බලා පොරොත්තු වන ඒ වදගත් කාරණය තාවකාලික බලපත්‍ර ඇතිව මේ රටේ නතර වී සිටින උදවිය පිළිබඳ ප්‍රශ්නයයි. වාස විසා ඇතිව මේ රටේ සිටින උදවිය සම්බන්ධයෙන් ආණ්ඩුව අනුගමනය කරන ප්‍රතිපත්තිය කුමක්දැයි පැහැදිලි නැහැ. ලංකා දුම්කොළ කර්මාන්ත ආයතනයේ සිටි සතාර් මහතාමයාගේ තාවකාලික බලපත්‍රය දික් නොකර තමුන්නාන්සේලා ඒ මහත්මයා ආපසු යැව්වා, කිසිම හේතුවක් නැතිව. ඒ කොයි හැටි වෙතත්, මේ රටේ නොසිටිය යුතු පුද්ගලයන් වාස විසා නැමැති තාවකාලික බලපත්‍ර පිට මේ රටේ ඉන්නවා.

ඒ සම්බන්ධයෙන් නිදර්ශන කීපයක් පෙන්වා දෙන්නම්. "ජේජ්ර්මන්" කම කටවත් නුසුදුසු නමුත් "ඩිරෙක්ටර්" යනුවෙන් හඳුන්වන දෙන්නෙක් "රෝලන්ඩ්ස්" සමාගමේ ඉන්නවා. එක් කෙනකුගේ නම හෙප්වර්ත්. අනෙක් එක්කෙනා කිං. මේ දෙන්නාගේ වාස වීසා හැම දාමත් දික් වෙනවා. හෙප්වර්ත් මහත්මයා 1928 දී ලාංකික සමාගමක හිටියා. ඉන් පසු විතු අධිකාරිවරයකු හැටියටත් සේවය කර තිබෙනවා. ඊට පසු ලංකාවෙන් ගියා. ඔහු නැවතත් ලංකාවට ඇවිත් රුපියල් 1,50,000 පමණ අවුරුද්දකට පඩි හා වෙනත් වාසි ඇතිව "රෝලන්ඩ්ස්" සමාගමේ ඩිරෙක්ටර් කෙනෙක් හැටියට වැඩ කරනවා. උන්නැහේ සම්බන්ධ විදේශ විනිමය වංචාවක් හෙළි කරන්න කැමැතියි. "රෝලන්ඩ්ස්" සමාගමට බඩු ගෙන්වීමේදී මොහුට එංගලන්තයෙන් සියයට 3 ක කොමිස් මුදලක් ලැබෙනවා. ඒ අනුව මොහුගේ නමින් එංගලන්තයේ බැංකුවල මුදලක් ඉතිරි වෙනවා. බැරි කාලයක මෙහෙන් ගොස් එංගලන්තයේදී ඒ මුදල් ලබා ගන්නට පුළුවනි. ඒ මදිවාට මේ අයට විවිහිස ක්‍රමයෙන් තොරව තමන්ගේ මුදල් පිටරට ගෙන යන්නත් අවසර දී තිබෙනවා. තාවකාලික බලපත්‍ර දික් කරමින් හෙප්වර්ත් වැනි මහතුන් මෙහි නතර කරගෙන ඉන්නා අතරම, සතාර් වැනි මහතුන්ගේ තාවකාලික බලපත්‍ර දික් නොකොට මේ රටින් පිට කරන්නේ ඇයි? සතාර් මහතාගෙන් යම්කිසි සේවයක් සැලසුණා.

ඒ මහතා දුම්කොළ කර්මාන්තයේ ඒකාධිකාරය බිඳිමින් තරගකාරී තත්ත්වයක් ඇති කළ නිසා සාමාන්‍ය දුම්කොළ වගා කරන්නන්ට වාසියක් සැලසුණා. හැබැයි, එතුමාගේ මැතිණිය මීගමු අතුරු මැතිවරණයට තරඟ කළ බව නම් ඇත්තයි. ඒ වුණාට සතාර් මහත්මිය ලාංකික පුරවැසියෙක් විනා තාවකාලික බලපත්‍ර පිට ලංකාවේ සිටින කෙනෙක් නොවෙයි.

**එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.** (මීගමුව)

*(திரு. என். டென்சில் பெர்னாண்டோ—நீர்கொழும்பு)*

(Mr. N. Denzil Fernando—Negombo)

එයා තාම ඉන්නවාද ?

**ටී. බී. එම්. හේරත් මයා.**

*(திரு. ரி. பி. எம். ஹேரத்)*

(Mr. T. B. M. Herath)

මහත්මයා යවා නෝනා නවත්වා ගත්තා නම් එය වඩාත් නරකයි. එහෙත් ඊට වඩා වැදගත් දේවලුත් අනාවරණය කළ යුතුව තිබෙනවා. මා කියන්නට යන කරුණු ආණ්ඩු පක්ෂයේ සමහර මන්ත්‍රීවරුනුත් දන්නවා. මේවා එළි කිරීම අපේ යුතුකමක්. වාස වීසා හෙවත් තාවකාලික බලපත්‍ර යටතේ මේ රටේ ඉන්නා විදේශිකයන්ට නීතියෙන් සම්පූර්ණයෙන්ම තහනම් කර තිබෙනවා, මේ රට තුළ මත්පැන් වෙළඳාම් කිරීම. ඔවුන්ගේ නමින් තැබෑරුම් ගන්න බැහැ. එහෙත් වාස වීසා ලබාගෙන ලංකාවේ ඉන්නා සමහර විදේශිකයන් මේ රටේ තැබෑරුම් මිළයට ගෙන මත්පැන් වෙළඳාම් කරන බව, ඒ ස්ථානත් ඇතුළුව මම පෙන්වා දෙන්නම්.

1. වී. අයි. වේලප්පු, 632, අළුත්මාවත පාර, කොළඹ. 2. කේ. ආර්. රාගවන්, මහයියාව තැබෑරුම, මහනුවර. 3. කේ. ගෝපිනාදන් නායර්, බදුල්ල අරක්කු තැබෑරුම. 4. එන්. සංගුනි, කුරුණෑගල අරක්කු තැබෑරුම. 5. නාරායන මාස්ටර්, නාරම්මල හා මාවතගම අරක්කු තැබෑරුම්. 6. ඒ. එස්. සංකරනාරායන්, 632, අළුත්මාවත පාර, කොළඹ. මොහු කොටහේනේ හා මාදම්පිටියේ රා තැබෑරුම්කරුගේ ගණන් තබන්නා. එහෙත් ඔහුටත් වෙනම තැබෑරුමක් තිබෙනවා. 7. කේ. ආර්. චාතුනි, 62/1, අල්විස් පෙදෙස, කොළඹ 13. මොහු මහනුවර,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. එම්. හේරත් මයා.]

කොළඹ, මඩකලපුව යන තැබෑරුම්වල කොටස්කරුවෙක්. එහෙත් වාස වීසා ලබා ගත්තේ කොටුවේ "ඩොමිනියන්" හෝටලයේ මැනේජර් වශයෙන් වැඩ කරන බවට ලිපියක් ඉදිරිපත් කිරීමෙනුයි. 8. කේ. ජී. වාසුදේවන්, "නිපෝන්" හෝටලය, කොළඹ. මොහු වාස වීසා ලබා ගත්තේ "නිපෝන්" හෝටලයේ මැනේජර් වශයෙන් වැඩ කරනවාය කියමිනුයි. එහෙත් මොහු තමා කොටුවේ, "බ්‍රිස්ටල්" හෝටලයේ මත් පැන් අංශයේ බඳුකරු.

වාස වීසා හෙවත් තාවකාලික බලපත්‍ර පිට මේ රටේ රැදෙමින් මෙරට පුරවැසියන්ට හිමි රක්ෂාවල් අයිති කරගෙන ඉන්නා අතරම, වාස වීසා කාල සීමාව ඉක්මෙන්නට කලින් කෙසේ හෝ නැවතත් ඒ කාල සීමාව දික් කරගෙන තවදුරටත් ලංකාවේ රැඳෙන්නට මොවුන්ට ඉඩ ලැබෙන්නේ කෙසේදැයි සොයා බැලීම අපේ යුතුකමක්. අගමැතිතුමා නොදැනුවත්ව, මෙවැනි දේවල් එතුමාගේ අමාත්‍යාංශයෙන් කෙරෙනවා ඇති. ගරු සභාපතිතුමනි, රහස් පොලීසියෙන් අප ගැනත් සොයනවා. ඒ ගැන අප වැරැද්දක් කියන්නේ නැහැ. ඒ වාගේම කරුණාකර තමුන්නාන්සේලාගේ ඔය රහස් පොලීසිය මෙවැනි කටයුතු කරන උදවිය ගැනත් සොයා බලන්නට යෙදවීම පිණිස සැලකිල්ල යොමු කරන්නැයි මා මතක් කරනවා. වීසා බද්දෙන් නිදහස් වී මේ රටට පිටරටින් ඇවිත් සිටින යම් යම් අය කරන තක්කඩිකම් සහ හොරමැරකම් වැළැක්වීම සඳහා යම්කිසි පියවර කීපයක් ගැනීම අවශ්‍යයි. මේ උදවිය අතින් විදේශ විනිමය පිළිබඳ වංචා රාශියක් සිදු වන බව ආරංචි මාර්ගයෙන් දැනගන්නට ලැබී තිබෙනවා. එම නිසා මේ ගැන විශේෂ සැලකිල්ල යොමු කරන මෙන් මා ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, හමුදාව පිළිබඳවත් වචනයක් කියා මගේ කතාව අවසාන කරන්නයි බලාපොරොත්තු වන්නේ. 1964 දී වලපනේ ආසනයේ පිහිටි පන්නල-සැර සුම්තැන්න පාර සති ගණනාවක් තුළ යුද හමුදාව මගින් සකස් කළ අන්දම මට මතකයි. එම පාරේ සැතැප්ම 4ක ප්‍රමාණයක් කපා අවසාන කිරීමෙන් එදා යුද හමුදාව දැක්වූ දක්ෂතාව ගැන මගේ ස්තුතිය පළ කරන්නට මා මෙම අවස්ථාව ප්‍රයෝජනයට ගන්නවා. යුද හමුදාව මගින් කරන ලද එවැනි වැඩ කටයුතු දෙස බලා ගරු අගමැතිතුමාට මතක් කරන්නට කැමතියි පෙළපාළි යන්නට, නිදහස් උත්සව පවත්වන්නට, නැති නම් වෙනත් අනවශ්‍ය වැඩවලට එම හමුදාව යොදවන්නේ නැතුව රටේ සංවර්ධනයට යෙදවිය හැකි බව. හමුදාවේ යම් යම් ක්‍රියා මාර්ගවලින් අපට ඔප්පු වී තිබෙනවා, එවැනි වැඩ පිළිවෙළක් ආරම්භ කළහොත් එය සාර්ථක වන බව. පහතරට වේවා, උඩරට වේවා නොදියුණු ප්‍රදේශ—විශේෂයෙන් උඩරට නොදියුණු ප්‍රදේශ—සංවර්ධනය කිරීම පිණිස යුද හමුදාවේ සේවය ලබා ගන්නට මහන්සි ගන්නැයි ගරු අගමැතිතුමාට මතක් කරනවා.

එසේම ගරු අගමැතිතුමා මෙම ගරු සභාවෙහිදී කරන ප්‍රකාශයන්වත් ක්‍රියාවෙහි යොදවන්නට නිලධාරීන්ට නියෝග කරන ලෙස ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)
නැඟි සිටියේය—
எழுந்தார்—
*rose—*

**සභාපති**
*(அக்கிராசனர்)*
(The Chairman)

I hope the hon. Member will be able to give an opportunity to the hon. Member for Kilinochchi also to speak before the Hon. Prime Minister replies.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

Sir, we are expected to start at 7.30 P.M. the discussion on Planning and Economic Affairs. We can take that up tomorrow. It is not very urgent and there are not many Members waiting to speak on it. We can take it up tomorrow and go on till 8 P.M. On this present matter the Hon. Prime Minister can reply a little later.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
*(கலாநிதி கொல்வின் ஆர். டி. சில்வா)*
(Dr. Colvin R. de Silva)

I do not propose to take very long.

ගරු ඩඩ්ලි සේනානායක
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

But we must finish the discussion on the Votes of the Ministry of Planning and Economic Affairs at the appointed time tomorrow.

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

Not only those Votes, we shall deal with the other Votes also in time.

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

Sir, I wish to speak a few words in English before I speak, as I customarily do in this House, in Sinhala, because I wish to pay the courtesy to the hon. Parliamentary Secretary to the Minister of Justice of speaking in the language he himself used and would understand on the matter which he raised with the Hon. Prime Minister.

This prohibition of the acquisition especially of real property in this country by nationals, first of all, has been a matter, apparently, of an absolute prohibition. As the law stands, a non-national may acquire a property on the payment of double the price, a hundred per cent upon the agreed price. How in heaven it is expected to work as an effective deterrent is frankly beyond me, save among people who are determined to be honest.

It is easy, after all, to agree on a price and nominate half the price, and thereby you will be selling it at the actual price. I think that is a big loophole.

If, indeed, this House is agreed on both sides that there should be an absolute bar, save, perhaps, in certain known and statutorily stated exceptions, against the purchase of real property in this country by non-nationals, then the only way is to prohibit it outright, and not to leave a loophole of that nature. That is one matter.

The second matter, which is what the hon. Parliamentary Secretary addressed himself to, is a matter of real consequence and undoubtedly much hardship. There is no known way really of distinguishing between the names of Ceylon Muslims and Indian Muslims. I do not think there is any known way of distinguishing them. There is also no known way of distinguishing between names of Ceylon Tamils and Indian Tamils.

So then, the question is how to ensure the rights of nationals while enforcing the prohibition of purchases by non-nationals. I should imagine that this required a great deal of thought and may need much revision of the methods that were adopted and may in the future be adopted.

First of all, in my own view, it is wrong in principle to place the responsibility for the determination of the non-nationality, that is to say, of the nationality, of a person upon the registrar of lands. How in heaven he is to fulfil that task it is very, very difficult to conceive. One could understand certain departments that concern themselves with the nationality question, having laid upon their shoulders the task of determining the nationality of a person who is the would-be purchaser, advising the registrar to register or not. But it is idle to expect every registrar of lands in this country, even if he were the most capable man in the world—in the light of the kind of department that he administers—to have the resources by which to satisfy himself upon such a question. So, I think that is an initial mistake in the law. How are we to get past it? On the basis of the principle

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා]

that we wish to prevent non-nationals acquiring real property in this country, the task is being sought to be done by prevention of the registration of a deed.

ප. භා. 5.45

Of course, strictly in law, as you know, Sir, yourself—in another capacity of yourself—non-registration of a deed is no bar to the passing of title. Registration only determines priority when there is competition of registration. It does not interfere with title. But, quite apart from that —I have not studied that aspect of the law ; so I do not wish to make any further comment on that—my point is elsewhere.

You can have any forums in which this matter could be determined. The ordinary forum is the law court. If a person has transferred to a non-national, if the law says that a transfer to a non-national shall be void and of no effect, then no title will pass to that person, and in case the title ever comes into dispute a court of law would rule out. That may not be sufficient for prevention. I merely mention that as a channel worthy of investigation.

We could have another within the framework of the law as it stands: that you shall not register a deed unless there is satisfaction in the registrar that a person is really a national. That really is what is required. I may be pardoned for being a little autobiographic. In the distant days when the Hon. D. S. Senanayake was Prime Minister and we were having some very tough debates here on the citizenship question, I remember I told him across the Floor that on the law that he was passing he himself might find it difficult to prove that he is a national of this country—if the necessary tests were applied to Mr. D. S. Senanayake not knowing that he is Mr. D. S. Senanayake. So I would not be surprised, quite apart from the Muslims and the Tamils, if there are also occasional cases of Sinhalese who come up against this law.

There are today many people of other nationalities or races in this country who have adopted Sinhalese names. So, the problem comes up in so many ways. How shall we deal with it ? What is needed is a proper authority to advise the registrar. And it could be done within the law in the following form.

If the registrar should entertain a doubt as to the nationality of the proposed purchaser, he could refer that particular case to an appropriate tribunal, or a body such as the hon. Parliamentary Secretary suggested, or any other reasonably authoritative body, which would rule on the matter ; and registration can automatically follow if the ruling of that independent body is in favour of the proposed purchaser. If ever the matter comes into a court of law, while it is an absolute protection for the registrar, there need not be any protection whatsoever to the purchaser if, in a court of law, he is found to have been a non-national when he was purchaser and successfully cheated the tribunal. That, Sir, is a secondary matter. I think, if there is some such ruling, by reference to this body flowing from the doubt arising in the mind of the registrar, the whole matter could be expedited. I say it is not necessary to go to the ordinary courts of law because of the delays to which the matter would be subject.

As it is, Sir, a transaction is required to be effected quickly. That is a natural business requirement. Therefore, one must create the kind of tribunal or body which can deal with the matter expeditiously. There may be much in what the hon. Parliamentary Secretary said, that there should be in each region, province or district, as the case may be, a convenient, suitable body, so that there may not be too great a flooding of work in two places. That would mean expedition.

I would also suggest, Sir, that it would not be wise to fix too many rules and regulations as to how those bodies are to proceed, that is, what

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

kind of evidence will be sufficient and what kind not. Well, it would be better left to the discretion of those bodies. In some cases the mere production of a letter might do; in other cases, because your mind is worried about the realities, better proof than that is required.

I would suggest to the Hon. Prime Minister that he ask his advisers or officials to consider this matter along those lines, for, I do agree, as things stand considerable hardship is caused to *bona fide* purchasers who are in fact nationals, by reason of, may I be permitted to use the phrase, a patronymic fact.

I wish to turn to a matter which I prefer to deal with in the Sinhala language, not because I am more competent in it but because it concerns a Sinhala report in a Sinhala newspaper, which touches upon—for giving me the opportunity to deal with it I have to thank the Hon. Minister of State for an interruption, because, otherwise, I was going to deal with it under Foreign Affairs—foreign policy in relation to India. I had some remarks to make on it.

ගරු සභාපතිතුමනි, ඉන්දියාව සහ ලංකාව අතර පැවතිය යුතු සබඳකම් ගැන මෙරට කාගේත් සිත් යොමු විය යුතු බව දෙපාර්ශවයේම උදවිය අපක්ෂපාතීව පිළිගන්නවා ඇතැයි මා කල්පනා කරනවා. ජනගහනය අනුව බැලුවත් ලෝකයේ රටවල් අතුරින් දෙවන තැන ලැබෙන්නේ ඉන්දියාවටයි. එම රට සමීපව පිහිටා තිබෙන අප රටට ඒ රට සමග නිසි සම්බන්ධකම් පැවැත්වීමට ඇති වුවමනාවන් සකස් කිරීම අත්‍යාවශ්‍ය කාරණයක් බව කාටත් පෙනී යනවා ඇති. මෙතැනදී ප්‍රශ්න කීපයක් මතු වෙනවා. ආණ්ඩු හැටියට බලන විට රාජ්‍යයන් දෙකක් අතර පවත්වන්නාවූ සම්බන්ධතාවය එක් දෙයක්. පක්ෂ වශයෙන් වේවා වෙනත් විධිවලින් වේවා වෙනත් රටක් සමග පවත්වන්නාවූ සම්බන්ධතාවය වෙන දෙයක්. මෙම අවස්ථාවේදී මේ රටේ කාටත් ඉන්දියාව පිළිබඳව තදින් සිත යොදවන්නට තරම් සිද්ධීන් මාලාවක් ඇති වී තිබෙන බව අප දන්නවා. ඒවානම් ඉන්දියාවට අළුත් ජනාධිපති කෙනෙක් පත් කිරීමේ ප්‍රශ්නයට තුඩුදුන් සිද්ධීනුයි. ඉන්දියා මහ ආණ්ඩුවේ වැඩි ආසන ගණනක් තිබෙන පක්ෂය නම් කොන්ග්‍රස් පක්ෂයයි. අද සිටින ඉන්දියානු අගමැතිනිය වන්නේ ජවහර්ලාල් නේරුතුමාගේ දියණියන් වන ඉන්දිරා ගාන්ධි මැතිනියයි. එම කොන්ග්‍රස් පක්ෂයෙන් තමයි එතුමිය පත්ව සිටින්නේ. සාමාන්‍යයෙන් අපේ රටේ නම් මෙවැනි ජනාධිපතිවරයකු පත් කිරීමකදී ඉන්දියාවෙහි ඇතිවුණු අන්දමේ රණ්ඩුවක් ඇති වන්නට ඉඩක් නැහැ. අන්තිමේදී අපේ රටේ එම පත්වීම ඉටු කරන්නේ එදා සිටින අගමැතිතුමා නැතිනම් අගමැතිනිය විසිනුයි. කවුරු සමග මොන අන්දමේ සාකච්ඡා පැවැත් වුවත් එය භාර වන්නේ එතුමාට හෝ එතුමියටයි. එහෙත් ඒ රටේ වෙනත් ක්‍රමයක් සකස් කර තිබෙනවා. ඒ අනුව එම කාරණයෙහිලා තරඟයන් ඇති වන්නට සම්පූර්ණයෙන්ම ඉඩකඩ තිබෙනවා. අන්න එම ප්‍රශ්නයෙහිදී කිසි අනුමානයක් නැතුවම කොන්ග්‍රස් පක්ෂයේ එක්තරා ප්‍රධානීන් පිරිසක් ඉන්දිරා ගාන්ධි මැතිණියට විරුද්ධව කච්චිවාදය ගෙන යාම පිණිස, තමන්ගේ පටු කච්චිවාදී අදහස්වලින් ප්‍රයෝජන ගැනීම පිණිස, අළුත් ජනාධිපතිවරයකු තෝරන මෙම අවස්ථාව පාවිච්චියට ගන්නට උත්සාහ කරන ලද බව දන් මුළු ලොවම දන්නවා. ඒ සටන ඒ විධියට මතු වුණාම, සටන මතු වුණ ආකාරයෙන්ම එය වමේ හා දකුණේ—වඩාත් හොඳින් කියනවා නම්, ප්‍රතිගාමීන් සහ ප්‍රගතිශීලීන් අතරේ—හැප්පීමේ ස්වරූපයක් ගත්තා. මම හිතන්නේ නැහැ, ප්‍රගතිශීලී අදහස් දරන්නා වූ කිසිම කෙනකුට, එම තරඟයේදී ප්‍රගතිශීලී පැත්ත ගත්තා වූ කිසිම කෙනකුට, ප්‍රගතිශීලී පැත්තේ සටනේ නායකත්වය දැරූ ඉන්දිරා ගාන්ධි මැතිණියගේ පැත්ත ජයට පත් වීම ගැන සන්තෝෂ වීම ඇර වෙන කිසි දෙයක් කියන්න ඉඩක් තිබුණාය කියා. මා කැමතියි මා කළ ප්‍රසිද්ධ කථාවක් ගැන මෙහිදී සඳහන් කිරීමට.

වරොව්ස්කි දිනය නිමිත්තෙන් කොළඹ නව නගරශාලාවේදී මා විසින් පවත්වනු ලැබූ කථාව අවසානයේදී ඉන්දියාවේ වූ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා]

සිද්ධිය ගැන කෙනෙක් මගෙන් ඇසුවා, මා ඒ සිද්ධිය ගැන එක්තරා පිළිතුරක් දුන්නා. උත්තරය වශයෙන් මා එහිදී කළ කථාවම මා නැවත මෙහි කියන්න යනවා නොවෙයි. නමුත් එහි සාරංශය සඳහන් කරන්න කැමතියි. මා කිව්වා, ඉන්දිරා ගාන්ධි මැතිණියගේ පැත්ත මෙම තරඟයේදී ජයට පත් වීම ගැන අපි කවුරුත් සන්තෝෂ වෙනවාය, සන්තෝෂ විය යුතුය, කියා. ඒ සමගම මෙම සිද්ධියේ මූල කොතැනද කියන එකත් පැහැදිලි කිරීමට මම උත්සාහ දැරුවා. මා කිව්වා අද පන්ති සටන පිළිබඳ අලුත් උග්‍රතාවක් ඉන්දියාවේ මහජනයා දරණ බවට නොයෙක් ලකුණු තිබෙනවාය කියා. ඒ ලකුණු තිබෙනවාය කීමට සාධක වශයෙන් මා ඉදිරිපත් කරන කරුණු නම් කේරළයේ කොමියුනිස්ට් නායකත්වය දරණ ප්‍රාන්ත ආණ්ඩුවක් ඇති වීම සහ බෙංගාලයේත් එසේම වීමයි. මේ ලකුණු අනුව, මහජනයා අතරේ මෙම පංති සටන උග්‍රවීමේ ප්‍රතිඵලයක් වශයෙන්ය මේ ප්‍රශ්නය කොන්ග්‍රෙස් එකේ ඉහළ කොනෙන් මතු වුණේ කියා මා විස්තර කළ අතර, ඒ අවස්ථාවේදී ඉන්දිරා ගාන්ධි මැතිණියට දකුණ හෝ වම හෝ යන ඇතකට බලන්න ඉඩ තිබුණාය, නමුත් ඇ බැලුවේ වමටය කියා මම කිව්වා.

ඔන්න ඔය විස්තරයයි මම කෙළේ. හැබැයි, එදා පාවිච්චි කළ වචනම නොවෙයි මා දැන් පාවිච්චි කෙළේ. එදා කී නියම වචන සියල්ලම මට හරියට මතක නැහැ. ඔය අදහසයි මා ඉදිරිපත් කරන්න යෙදුණේ. මා ඉදිරිපත් කළ ඒ අදහස අතරෙත් විරුද්ධ පාර්ශ්වයේ නායිකාව වන බණ්ඩාරනායක මැතිණිය ඉන්දිරා ගාන්ධි මැතිණියට යැවූ ලියමනේ සඳහන් අදහස් අතරෙත් මොන විධියේ පරතරයක් තිබෙනවාද කියා මට තේරෙන්නෙත් නැහැ. කෙසේ වුණත්, "මැතිණියත් කොල්විනුත් දෙපැත්තේ" කියා මේ තරම් ලොකු අකුරින් මුළු පළමුවැනි පිට හරහාම අච්චු ගසා ප්‍රසිද්ධ කිරීමට තරම් මොන වෙනසක් පෙනුනාද කියා මට සිතන්න අමාරුයි. ඒ වගේ වෙනසක් ඔවුන්ගේ නරක හීනවලදීවත් පෙනේවිය කියා මට හිතන්න බැහැ. ඒ නිසා මා ඒ ගැන බොහොම කනගාටු වෙනවා.

ගරු සභාපතිතුමනි, මා කියන්න හදන්නෙ මෙයයි. සමගි පෙරමුනේ ආණ්ඩුවක් බලයට පැමිණි විට ඉන්දියාවත් ලංකාවත් අතරේ පැවතිය යුතු සබඳතාවන් පවත්වා ගැනීමට අපට තිබෙන සහතිකයට හානි වන අ කාරයට මේ විධියේ සිරස්තල දැමීම ගැන මා කනගාටු වෙනවා. ඉතාමත් පටු අදහස් ඇතිව පක්ෂ අතරේ නැති භේද ඇති කරවීමෙන් වාසියක් ගැනීමට මෙවැනි ආයතනයක් උත්සාහ දැරීම ගැන මගේ කනගාටුව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න ඕනෑ. මගේ ගැන ඇත්ත නැත්ත කීවාට මගේ ඇඟේ ගැවෙන්නෙ නැහැ. මා මේ ලංකාවේ දේශපාලනයට ඉදිරිපත් වුණ දවසේ සිට අද දක්වා මා ගැන බෙරුවක් මේ ධනපති පුවත්පත්වලින් ප්‍රචාරය නොකර එක සතියක්වත් පසු වෙන්න ඉඩ හැරියොත් එය පුදුමයක්. ඒ නිසා මෙය ඒ තරම් කාරණයක් නොවෙයි.

අ. භා. 6

කෙසේ වුණත් ඉන්දියාව සමග අපේ තිබෙන සබඳතාවන් ගැන, ප්‍රශ්නය ගැන වචන සවල්පයක් මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න ඕනෑ. පළමුවැනි කරුණ මෙයයි. මට සමාවෙන්න මේ වචනය මා ගැන පාවිච්චි කිරීම ගැන. බෙහෝ කාලයක් තිස්සේ මා මේ ගරු සභාවේ සිටිනවා. මා යම්කිසි කාලයක් මන්ත්‍රිවරයෙක් වශයෙන් සිටියාද ඒ සිටි සෑම අවසථාවේදීම ඉන්දියාව සමග අපේ තිබිය යුතු සබඳතාවන් ගැනද, අපි විශේෂ තැනක් දිය යුත්තේ මොන පැත්තට ද කියන ප්‍රශ්නය ගැනද කිහිප වාරයක්ම කතා කර තිබෙනවා. මගේ විශවාසයේ හැටියට මේ පාර්ලිමේන්තුව තුළ බොහෝ අවස්ථාවන්හි ඉන්දියාව ගැන කතා කළොත් මොකක් ගැනද කල්පනා කරන්නෙ? අපි නිතරම කතා කරන්නෙ පුරවැසි ප්‍රශ්නය, නැත්නම් ඉන්දියන් කාරයන් මේ රටට යාම ඊම පිළිබඳ ප්‍රශ්නය ගැනයි. ඒ ප්‍රශ්නයටයි ප්‍රධාන තැනක් දෙන්නෙ. ආර්ථික වශයෙන් ඉන්දියාව සහ ලංකාව අතර තිබිය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යුතු සබඳතාවන් ගැන යම්කිසි සාකච්ඡාවක් එක්තරා කාලයක් තුළදී කෙරුනේ නැහැ. නමුත් ඒ තත්ත්වය ක්‍රමානුකූලව වෙනස් වී තිබීම ගැන මා සන්තෝෂ වෙනවා. මන්ද? එය එසේ වෙනස් කිරීමට මාද හවුල් කාරයෙක් වුණාය කියන විශ්වාසය මට තිබෙන නිසයි.

ගරු සභාපතිතුමනි, කොයි විධියට බැලුවත් ඉන්දියාව ආර්ථික අතින් විශේෂ රටක්. කොපමණ දුප්පත්කම් තිබුණත්, කොපමණ විශාල විධියට දුප්පත්කම හා පොහොසත්කම අතරේ පරතරය පැහැදිලිව පෙනුනත් ඉන්දියාවත් ලංකාවත් අතරේ ආර්ථික අතින් නිසි විධියේ සබඳකම් ඇති වීම අවශ්‍ය බව කාටත් පිළිගන්න පුළුවන් වේවි. මෙතන ප්‍රශ්නය මෙයයි: මා එක්තරා කාලයකදී පෙන්නුවා මේ විධියේ දෙයක්. ඒ ප්‍රශ්නය තවමත් තිබෙනවා. නමුත් එය එදා තරමටම අද ඉදිරියට ඇවිත් නැහැ. ඉන්දියාවේ පස් අවුරුදු සැලැස්මවල් හදන පුරුද්දක් තිබෙනවා. මා එක්තරා අවස්ථාවකදී පැහැදිලි ලෙස පෙන්නා දී තිබෙනවා, ඉන්දියාවේ මීට කලින් තිබුණ පස් අවුරුදු සැලැස්මට අනුව ඒ රටේ රබර් ඉඩම් සහ තේ ඉඩම් අලුතින් විශාල කිරීමට විශේෂ මුදල් යෙදවීමට ඔවුන් සූදානම් වූ බව. පොල් ඉඩම් වලටත් ඒ විධියයි. ඒ සැලැස්මවල් අනුව දෙපැත්තටම ප්‍රයෝජනවත් වන ආර්ථික ගිවිසුම්වලට පැමිණෙන්නට අපටත් ඉන්දියාවටත් පුළුවන්ය කියා එදා පැවැති ආණ්ඩුවට මතක් කරන්නට මා උත්සාහ කළා. ඒ කාලයේ දීත් අදත් අපට මෙන්ම ඉන්දියාවටත් විදේශ විනිමය මදි. අපට වගේම ඉන්දියාවටත් ඔවුන්ගේ සැලැස්මවල් සඳහා යෙදවීමට වුවමනා කරන මුදල් සොයා ගැනීම නොයෙක් අවස්ථාවල ඉතා අමාරු උග්‍ර තැනකට පැමිණි බව අපි දන්නවා. ඒ නිසා මෙන්න මේ විධියේ අදහසක් මා ඉදිරිපත් කළා. ඒ කරුණ ගරු අගමැතිතුමාට මා නැවත මතක් කරනවා එතුමාගේ වෙළඳ ඇමතිතුමාටත් මතක තබා ගැනීම සඳහා.

මා ඒ කාලයේ කීවේ ඉන්දියාව තම රටට ඕනෑ කරන තේ හෝ රබර් හෝ දෙපැත්ත පිළිගන්නා මිලකට අපේ රටින් ලබාගෙන ඒ වෙනුවට ඉන්දියාවෙන් අපට වුවමනා කරන බඩු හුවමාරුවකට වුවත් සූදානම්ව අවුරුදු 20 ක පමණ ආර්ථික ගිවිසුමක් ඇති කළොත්, ඉන්දියාවටත් විශාල විදේශ විනිමයක් වෙනත් වැඩකට හරවන්නට පුළුවන්ය කියා සාකච්ඡා ආරම්භ කරන්නට අපට පුළුවන් නේද කියන එකයි. අදත් ඒක වැදගත්. ඒ සම්බන්ධව තේ රබර් ගැනම මා කියනවා නොවෙයි. එය වඩාත් වැදගත් වන පැත්තකුත් තිබෙනවා. ඒ ප්‍රතිපත්තිය උඩ අප දෙරටේ සම්බන්ධ ආර්ථික අංශයෙන් ගෙනයන පිළිවෙළට දේශපාලන පැත්තෙනුත් අපේ මිත්‍රත්වය දියුණු කර ගැනීම මීට වඩා පහසුයි කියා කියන්න පුළුවන්. ඒ වෙනුවට අද සිදු වී තිබෙන්නේ කුමක්ද? අද සිදු වී තිබෙන්නේ අපේ විදේශ ප්‍රතිපත්තියට අයිති දෙයක් නොවෙයි. අප ඉන්දියාවත් සමග ආර්ථික ගිවිසුම්වලට ඇතුළත්ව සිටින නමුත් එන්න එන්නම ඉන්දියාව අපෙන් ලබා ගන්නා ආදායම අපි ඉන්දියාවෙන් ලබා ගන්නා ආදායමට වඩා වැඩි වේගෙන යනවා. එය සුදුසුද? එය සුදුසු නැත්තේ ඇයි? අපි ඉස්සරත් අදත් අධිරාජ්‍යවාදීන්ගේ මේ රටේ තිබෙන්නා වූ ආයතන, ඔවුන්ගේ වෙළඳ ක්‍රම, ඔවුන්ගේ නිෂ්පාදන ක්‍රම, ඔවුන් අතේ තිබීම ගැන විරුද්ධ වුණේ ඇයි? එයට අපි විරුද්ධ වුණේ ඒවා අපේ රට ආර්ථික අතින් සූරා කෑමේ මාර්ග වූ නිසයි. ඒ වෙනුවට අපි ඉන්දියාවේ විශාල ධනපති ආයතනවලට අපේ රට ඒ විධියට සූරාකෑමට මාර්ග සාදා ගන්නට දුන්නොත් අපි හිටියාටත් වඩා නරක තැනකට වැටෙනවා. කබලෙන් ලිපට වැටෙනවා.

මේ අවස්ථාවේ බිර්ලා සමාගම ගැන විශේෂයෙන් කථා කරන්නට මා කැමති නැහැ. ඉන්දියන් ආණ්ඩුව බිර්ලා කොම්පැනි බිස්ස ගැන විශේෂ පරීක්ෂණයක් කරන්නට කොමිෂන් සභාවක් පත් කිරීමට තීරණය කර ඇති බව පත්තර මාර්ගයෙන් දැනගන්නට තිබෙනවා. එවැනි අවස්ථාවකදී බිර්ලා සමාගමේ මා දන්නා වූ වැඩිකම් ගැන හෝ අඩුකම් ගැන මෙවැනි ස්ථානයකදී කථා කිරීම සුදුසු නැති නිසා මා ඒ ගැන කථා කරන්නේ නැහැ. එහෙත් ගරු සභාපතිතුමනි, මා මෙන්න මේ ටික පමණක් කියනවා. එය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා]

කවුරුත් දන්නා දෙයක්. යම්කිසි ජාත්‍යන්තර රැස්වීම්වලදී පැහැදිලි වූ දෙයක් තමයි එය. අද ඉන්දියානු ජනතාව අතරේ තේවලට තිබෙන ඉල්ලීමේ ප්‍රමාණයට තේ පාවිච්චි කරන්නට දෙනවා නම්, ඉන්දියාවෙන් තේ පිටරට යැවීම නොවෙයි සිදු වන්නේ දැනට පිටරට තිබෙන තේත් ආපසු හරවා යවන්නට හා පිටරටවලිනුත් තේ ගෙන්වන්නටයි. මෙයින් අපට වෙළඳ ගිවිසුමකට මාර්ගයක් තිබෙනවා යයි මා විශ්වාස කරනවා. මා විදේශ ප්‍රශ්නය ගැන කියන්නට යන්නේ එයයි. අපේ රටේ නිපදවන තේ යම්කිසි ප්‍රමාණයක් ඉන්දියාවට යවන්නට අපට ගිවිසුමක් ඇති කර ගන්නට පුළුවන් නේද? ඒ වාගේම ඒ වෙනුවට හුවමාරු ක්‍රමය අනුව ඉන්දියාවෙන් යම් බඩු භාණ්ඩයක් ගෙන එන්නට පුළුවන් නේද? මා මෙය අංග සම්පූර්ණ යෝජනාවක් හැටියට ඉදිරිපත් කරන්නට හදනවා නොවෙයි. යම්කිසි සංකල්පයක් ඉදිරිපත් කරන්නටයි, මා හදන්නේ. ඒ ගැන කල්පනා කරමින්, එන්න එන්නම ඉන්දියාව සමග ආර්ථික පැත්තෙන් අපේ තිබෙන්නා වූ සම්බන්ධතාව අලුත් විධියට දෙරටටම ප්‍රයෝජනවත් වන අන්දමට හැඩ ගස්වා ගැනීමට අප උත්සාහ ගත යුතු බවයි, මා මතු කරන්නට හදන්නේ. මා හිතන හැටියට මෙයට ඉන්දියාවේ තිබෙන්නා වූ දේශපාලන ව්‍යාපාරවල ප්‍රශ්න සම්බන්ධ වන්නේ නැහැ.

ඉන්දියාව ධනපති ආණ්ඩුවක් ඇති රටක් හෝ වේවා, ධනපති ක්‍රමය පවතින රටක් හෝ වේවා, හෙට විප්ලවකාරී රටක් හෝ වේවා, අනිද්දා සමාජවාදී රටක් හෝ වේවා, කුමන තත්ත්වයේ කුමන රටක් හෝ වේවා මේ අපේ පුංචි රටේ අසල්වැසියා හැටියට, ළඟම තිබෙන ප්‍රධාන රට හැටියට, ආර්ථික අතින් ඒ රටත් සමග සම්බන්ධකම් ඇති කර ගැනීම අවශ්‍ය බව කවුරුනුත් පිළිගත යුතුව තිබෙනවා. මා කියන්නේ අන්න ඒකයි. ඉන්දියාව මේ රටේ සිටින ඉන්දියානුවන් 5,25,000 ක් ආපසු භාර ගත යුතු බවට ගෙන තිබෙන තීන්දුව තමයි, ඉන්දියාවත් සමග අපේ සම්බන්ධකම් අවුල්වීමට දැනට ඇති එකම කාරණය. මා මේ අවස්ථාවේදී පරණ විවාදවලට නැවත වැටෙන්නට හදන්නේ නැහැ. මා හිතන හැටියට එදා අප ඉදිරිපත් කළ විවේචන ඇත්ත බව අද ඔප්පුවී තිබෙනවා. සිරිමා-ශාස්ත්‍රී ගිවිසුම අනුව මේ රටේ සිටින ඉන්දියානුවන්ගෙන් පිරිසක් මේ රටේ පුරවැසියන් හැටියට පිළිගන්නා අතර වැඩි පිරිසක් ඉන්දියාවට යා යුතුයි. ඒ ඉන්දියානුවන් පිරිස ආපසු ඉන්දියාවට ඇදෙනවා වෙනුවට මේ ආණ්ඩුව විසින් මෙම ගරු සභාවට ඉදිරිපත් කරන ලද නීතිය මගින් ඒ සම්බන්ධව වෙනත් විධියේ ඇදීමක් සිදු වන නිසා ඒ නීතිය ක්‍රියාත්මක කිරීමේදී ඒ කොටසෙන් කවුරුන් ඉන්දියාවට යා යුතුදැයි බල කිරීමක් නැහැ. බල කිරීමක් සිදු වන ආකාරයට ඒ නීතිය සාදා නැහැ. ඒ නීතිය කෙසේ වැඩ කෙරෙනවාද කියන ප්‍රශ්නය ගැන මා මේ අවස්ථාවේදී අමුතු විවාදයකට වැටෙන්නට අදහස් කරන්නේ නැහැ. එහෙත් අපි එකක් හිතට ගනිමු. මේ ප්‍රශ්නය මේ රටේ පළල් ජනතාව පිළිගන්නා ආකාරයට විසඳා ඉවර වන තුරු මෙය අපේ දේශපාලන ජීවිතයේ වනයක් මෙන් නිතරම පවතින බව ස්ථිරයි. ඊට වඩා ඒ ගැන කියන්නේ නැහැ.

ගරු අගමැතිතුමාත් මෑතකදී මෙම ගරු සභාවෙන් පිටතදී මතක් කළ කාරණයක් මට මෙයට ඈඳන්නට ඕනෑ. අග්නිදිග ආසියාවේ පොදු වෙළෙඳ පොළක් ඇති කිරීමේ ප්‍රශ්නය ගරු අගමැතිතුමාත් මතු කළා. අග්නිදිග ආසියාතික රටවල් අතර ආර්ථික පැත්තෙන් සහ දේශපාලන පැත්තෙන් මිත්‍ර සම්බන්ධතා ඇති කිරීම ප්‍රධාන කටයුත්තක් බව මුලින්ම මේ රටට ඉදිරිපත් කෙළේ ලංකා සමසමාජ පක්ෂය බව මා මේ අවස්ථාවේදී මතක් කිරීම ගැන මට සමාවන්න. ඒ ගැන සතුටු වන බවක් ගැන නොවෙයි. මා කියන්නේ. මා සතුටු වන්නේ ඒ දෙසට ගරු අගමැතිතුමාත් ඒම ගැනයි. එහෙත් මෙහි දෙපැත්තක් තිබෙන බව මතක තබා ගත යුතුයි. පොදු වෙළෙඳ පොළවල් හැදීම ගැන දැන් ලෝකයේ කථාව තිබෙනවා. කවුරුන් කොයි විධියට කීවත් කාර්මික භාණ්ඩ කෘෂිකාර්මික භාණ්ඩ සහ අමු ද්‍රව්‍ය සමග හුවමාරු කිරීම පොදු වෙළෙඳ පොළක් සෑදීමේදී ප්‍රධාන වෙනවා. එරොප්පේ පොදු වෙළෙඳ පොළට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඇතුළු වුණු රටවල් අතරේ එවැනි ප්‍රශ්නයක් නැති බව ඔප්පු වුණායයි සමහරුන් හිතුවා. එහෙත් දැන් ඔන්න මා කී වචනය පැහැදිලි වේගන එනවා. මැතදී ප්‍රංශයේ ප්‍රාන්කුව බාල්දු කිරීම නිසා, ඒරොප්පේ පොදු වෙළඳ පොළට ඇතුළු වුණු රටවල් 6 අතරේ කෘෂිකර්මය ගැන එකඟත්වයක් ඇති කිරීම සම්බන්ධ යෙන් ඇති වුණු අවහිරය නැවතත් උග්‍ර වී තිබෙනවා. ඒ අනුව, අග්නිදිග ආසියාවේ පොදු වෙළඳපොළක් ඇති කිරීමේ අමාරු තත්ත්වයක් මතු වන අතර එසේ ඇති කිරීමෙන් හානි වන තත්ත්වයක් ඇති වීමේ ඉඩකුත් තිබෙනවා. අග්නිදිග ආසියා වේ අද කාර්මික අතින් ඉහළ තැනට දියුණු වී තිබෙන රටක් ඇත්නම් ඒ ඉන්දි යාව පමණයි. එම නිසා අග්නිදිග ආසියාවේ පොදු වෙළඳපොළක් ඇති කිරීමේ යෝජ නාව ඉන්දියාව පැත්තෙන් ලංකාව වෙත ඉදිරිපත් කෙරෙන විට, ඒ යෝජනාව ගැන සාකච්ඡාවට බැසීම කොපමණ හොඳ වුවත්, ඒ සාකච්ඡාවට අපේ පැත්තෙන් බහින විට එය ඇත්තටම ඉන්දියාවේ කාර්මික ධනපතීන්ට අප රට සූරා කෑමට මාර්ග යක් නොවන තැනට සාකච්ඡා මඟින් ගිවිසුම් ඇති කර ගැනීම අත්‍යවශ්‍ය බව අප හිතේ මුදුන්පත් කර තබා ගත යුතුයි.

අ. භා. 6.15

අපට තිබෙන්නේ අග්නිදිග ආසියාවේ පොදු වෙළඳපොළක් සෑදීම පමණක් නො වෙයි. අපට තවත් පැත්තක් තිබෙනවා. අග්නිදිග ආසියාවේ රටවලටත් ලෝකයේ වෙනත් රටවලටත් යම් යම් අමු ද්‍රව්‍ය විශාල ලෙස සපයන නිෂ්පාදකයන් වශයෙන් අප පිටස්තර කාර්මික ලෝක යාට මුහුණ පෑමේ මාර්ග සෑදීමත් අත්‍යවශ්‍යයි. මෙය ස්ථිර ලෙසම පොදු වෙළඳ පොළක් සෑදීමක් නොවෙයි. මෙය ඇත්තටම එක් වැඩක් සඳහා එකතු වීමක්. මා මේ පිළිබඳව වෙළඳ කටයුතු බාර ගරු ඇමතිතුමා සමග මෙම සභා ගර්භය තුළදී කීප වරක්ම එක් එක් විධියේ වචන හුවමාරු කරගෙන තිබෙනවා. ඊට විරුද්ධ කමක් කවදාවත් එතුමා තුළ තිබුණේ නැහැ. විරුද්ධ වීමට හේතුවක් නැහැ. එහෙත්, මා ඉදිරිපත් කළ ආකාරයේ ඉල්ලීම පොදු වෙළඳපොළක් සෑදීමට වඩා හදිසි දෙයක් බව ගරු අගමතිතුමාට මතක් කරන්නට කැමතියි.

මීළඟට, දේශපාලන පැත්තෙන්, ඇත්ත ටම මිලිටරි පැත්තෙන් ප්‍රශ්නයක් මතු වී තිබෙනවා. ඒ ගැන ආරංචි පමණක් මිස ස්ථිර කරුණු දැනීමක් අපට නැති නිසා මා ඒ ගැන වැඩිපුර කතා කරන්නේ නැහැ. ඒ ප්‍රශ්නය නම්, අග්නිදිග ආසියා වේ රටවල පොදු ආරක්ෂාව පිළිබඳව යම් යම් ගිවිසුම් ක්‍රම ඇති කිරීමයි. මේ සම්බන් ධව මට කියන්න තිබෙන්නේ එක කරුණයි. ඒ පිළිබඳ මොන විධියේ ගිවිසුම් ක්‍රම ඇති කිරීමට අප රට එකඟ වුවත් රතු චීනයට විරුද්ධව එල්ල වන අන්දමේ කිසිම ගිවිසුමකට අපට නම් කවදාවත් එකඟ වන්නට බැහැ.

ගරු ඩඩ්ලි සේනානායක
(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)
(The Hon. Dudley Senanayake)
අප එකඟ වන්නෙත් නැහැ.

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(கௌரவ டட்ளி சேனநாயக்க)
(Dr. Colvin R. de Silva)
ගරු අගමැතිතුමනි, තමුන්නාන්සේ එවැනි දේකට එකඟ වෙනවායයි මා කිව්වේ නෑ. අගමැතිතුමා එවැනි ගිවිසුමකට එකඟ නොවන බව කීම ගැන මා බොහොම සන්තෝෂ වෙනවා. එහෙත් පසු ගිය මහා මැතිවරණ කාලයේදී නම් අපට ඔය ප්‍රශ්නය ගැන ලොකු බයක් ඇති වුණා. කෙසේ වුණත් මහා මැතිවරණ කාල යේදී ඡන්ද ගරා ගැනීමට කරන වැරදි ප්‍රකාශයන්, ආණ්ඩුව බලයට පත් වුණාට පසුව ක්‍රියාත්මක නොකිරීම ගැන අපට ප්‍රශ්නයක් නැහැ. කලින් ඒ අන්දමේ වැරදි ප්‍රකාශයන් කර බලය ලබාගැනීමට තැත් කිරීම ගැන අප දැන් දොස් කියන්න යන්නේ නැහැ. නමුත් මෙහිදී මා කියන්න යන්නේ මෙපමණයි. යම් යම් ජාත්‍යන්තර බලවේගයන් තිබෙනවා. මේවායේ ඇතැම් ක්‍රියා හොඳ වන්නටත් පුළුවනි. නමුත් හොඳ අදහසක් නොපිටට, නුහුරට හර වන්න උත්සාහ කරනවා නම් අප නිතරම එවැනි ක්‍රියාවලින් ප්‍රවේශම් වන්න ඕනෑ, නුහුරට යාමෙන් වළකින්න උත්සාහ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා]

දරන්න ඕනෑ. විදේශ ප්‍රතිපත්තියට අදාළව මට කියන්න තිබෙන්නේ එපමණයි.

අභ්‍යන්තර ප්‍රශ්න සම්බන්ධයෙන් යමක් සඳහන් කරන්න උත්සාහ කරන මේ වෙලාවේදී, යුද හමුදාව ගැනත් එක් වචනයක් කියන්න කැමතියි. මෙය යුද්ධ මය ප්‍රශ්නයකට අදාළ කරුණක් නොවෙයි. අපේ රටේ පැවැත්වෙන රගර් ක්‍රීඩාව ගැන යම්කිසි ඇල්මක්, ආසාවක් දක්වන පුද්ගලයකු හැටියට මා ප්‍රසිද්ධියේම කියන්න කැමතියි, ළඟදී අප රටට පැමිණි ඉතාම දක්ෂ බෝසත් රගර් ක්‍රීඩා කණ්ඩායම සමග හැප්පුනු සෑම කොටස්වලින්ම, අපේ යුද හමුදාවේ රගර් කණ්ඩායම වඩාත් ඉහළින් තරඟ කළ බව. මට වාසනාවක් ලැබුණා, එම තරඟය නරඹන්න.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

මටත් අවස්ථාව ලැබුණා.

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கலாநிதி கொல்வின் ஆர். டி. சில்வா)*
(Dr. Colvin R. de Silva)

අගමැතිතුමා සිටිනවා, මා දැක්කා. අගමැතිතුමා ඉස්සරහ පෙළේ සිටියේ, මා සිටියේ පසුපස පේලියක. අප දෙන්නාම, තෙම් තෙමී තරඟය නැරඹුවා. ඒ වාගේම, මා මෙන්ම අපේ ක්‍රීඩකයන්ගේ දක්ෂතාව ගැන එතුමාත් ආඩම්බරයට පත් වුණායයි මා විශ්වාස කරනවා. අපේ යුද හමුදාවේ ඒ ඉලන්දාරි පිරිස, තමන්ට වඩා එක හමාරක් පමණ බර මිනිසුන්, කෙසේ අල්ලා, වටලා, පෙරළා දමන්නේද කියන ක්‍රමය සොයා ගෙන ක්‍රීඩා කළ ආකාරය ඇත්ත වශයෙන්ම අපට ආඩම්බරයට කාරණයක් වුණා. දුවන දුවන සෑම වාරය කදීම තම ප්‍රතිමල්ලවයන් දනිස්සෙන් අල්ලා බිම පෙරළා ගන්නා ආකාරය ඇත්තෙන්ම පුදුමයි. නමුත් මා ඒ කාරණය ගැන කියන්නේ මෙපමණයි; ඔය ක්‍රමය රගර් පිටියට පමණක් සීමා කරන්න ඕනෑ බවයි කියන්නෙ. එපමණයි, යුද හමුදාව ගැන මට කියන්න තිබෙන්නෙ.

බාලවයස්කාරයන් අතර අපරාධ වැඩි වීමේ ප්‍රශ්නය සම්බන්ධයෙන් වචනයක් දෙකක් සඳහන් කිරීමේ යුතුකමක් තිබෙනවා. දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) නැගූ ප්‍රශ්නයකට ගරු අගමැතිතුමා පිළිතුරු දී තිබෙන්නෙ, බාලවයස්කරායන් වැඩි වන ප්‍රමාණයට අපරාධ වැඩි වී නැතැයි කියායි. අගමැති තුමාට එම ඉලක්කම් ලැබුණු හැටි නම් මා දන්නෙ නැහැ, එතුමා එසේ කියනවා නම් මා පිළිගන්නවා.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

එහෙමයයි මා කීවේ නැහැ. ජනගහනයත් වැඩි වී තිබෙන බවයි මා කීවේ.

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

මගේ හිතේ ඉලක්කම් නැහැ. කොහොම වුණත් බාලවයස්කාරයන් අතින් සිදුවන අපරාධ ප්‍රමාණයෙහි වැඩිවීම, එම පිරිසේ වැඩිවීමේ ප්‍රමාණයට වඩා වැඩි වී තිබෙනවා යයි අපට සිතන්නට හේතු තිබෙනවා. එම හේතුන් ගැනත් අප ටිකක් කල්පනා කළ යුතුයි. අපේ දූ දරුවන්ට බැණලා හදන්න අපට බැහැ. දරුවන් හැදුවේ අපම නොවේද කියා මතක තබා ගත්තොත්, අපේ දරුවන්ට අප බනින විට එයින් භාගයක් බැණ ගන්නේ අපටම නොවේද කියා සිතා ගත්තොත්, අප හැදූ දරුවන් නරක් වී ඇත්නම් අපෙත් අඩුවක් තිබෙන්න ඕනෑ නොවේද කියා සිතන්න ඕනෑ. එහෙම නම් අප සියළු දෙනාම එකතුව හිත දිය යුතු බොහොම බැරෑරුම් ප්‍රශ්නයක් මෙතන තිබෙන බව පැහැදිලියි. එම ප්‍රශ්නය කුමක්ද? නව තරුණ පරපුර තුළ, තමන්ගේ තත්ත්වය සහ අනාගත අනිස්ථිර භාවය ගැන විශාල බියකින් පෙළෙන බව අප කවුරුත් පිළිගන්න ඕනෑ. අන්න එතැනයි මෙහි රහස ඇත්තේ. නව තරුණ පරපුර සමග කථා කරන විට, ඔවුන් ඇත්ත කථා කරන අවස්ථාවලදී කෙනෙකුට හැඟී යනවා, කොපමණ දුරට ඉගෙන ගත්තත් කොපමණ හොඳට ඉගෙන ගත්තත් ඊළඟට තමන්ට වෙන්නේ කුමක්ද කියන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කාරණය ගැන ස්ථිර විශ්වාසයක්, සහතික යක් නොමැති නිසා විශාල අසහනයකින් ඔවුන් පෙළෙන බව.

අප හැදුණු කාලයත් අපේ වර්තමාන දූ දරුවන් හැදෙන කාලයත් අතර විශාල වෙනසක් තිබෙන බව මා මතක් කරන්නට සතුටුයි. අපේ කාලයේ ටික දෙනාටයි හොඳට ඉගෙනගන්නට ලැබුණේ. ඇත්ත වශයෙන්ම සමාජයේ සුළු කොටසකටයි ඉගෙන ගන්නටවත් ලැබුණේ. ඔවුන්'තරින් ඉතාම සුළු කොටසකට ඉහළටම ඉගෙනගන්නට පුළුවන් වුණා. අපේ කාලයේදී එක්තරා ප්‍රමාණයකට ඉගෙන ගත්තාම ඊළඟට හුරු වන රක්ෂාව ගැන හෝ වෙනත් ආදායම් මාර්ගයක් ගැන හෝ දෙමව්පියන්ට මෙන්ම ඒ දරුවාටත් අවබෝධයක් තිබුණා. කිසිම සැකයක් නැතිව එම රක්ෂාව හෝ ආදායම් මාර්ගය ලැබෙනවාමය යන විශ්වාසය තිබුණා. නමුත් අද එය නැහැ. තිබෙන මිනිසුන්ගේ දරුවන් තුළත් අද මේ විශ්වාසය නැති බව ලෝකයේ මොකක් හරි තිබෙන මිනිසුන්ට අවබෝධ කරවා දීම අමාරුයි. එතැනයි තිබෙන විශේෂය. අද ලොකු ආදායම් ලබන ලක්ෂපතියන්ගේ දරුවන් තුළත් ඒ අස්ථිර භාවය තිබෙනවා. ඔවුන් තුළ සැකයක් තිබෙනවා. තමන්ට ලැබිය යුතු ප්‍රමාණයේ ලැබීම ලැබේවිදෝ කියා සැකයක් තිබෙනවා. මේක එක් පැත්තකින් ආර්ථික අංශයෙන් එන ප්‍රශ්නයක් වුණාට අනෙක් පැත්තෙන් විශාල වශයෙන් ඇති වූ දුර්වලකමේ ප්‍රතිඵලයක් වශයෙන් මේ රටේ දූෂණ පැතිරීමට බොහෝසෙයින් ආධාර වී තිබෙනවා. දෙමව්පියන් ඉදිරිපිටදී මගේම ළඟ නෑදෑයන් වන, මට දූ පුතුන් වන මට ඒ විධියට නෑදෑකම් තිබෙන දරුවන් සමග මට යම් යම් අවස්ථාවලදී කථා කරන්නට සිද්ධ වී තිබෙනවා. ඒ සමහර දරුවන් කොටින්ම අසන්නේ මෙපමණයි: "හැමෝම නොයෙකුත් අනියම් විධිවලට මිත්‍රයින්ට රක්ෂා ලබා දී තිබෙනවා, උඹටත් බැරිද බං එහෙම එකක් කරන්නට?" ඉතින් ඒ ප්‍රශ්නයට මොකක්ද දෙන උත්තරය? කොපමණ බණ කිව්වත් රක්ෂාව නැහැ. අතුරු මැතිවරණවලදී ආණ්ඩුවේ ප්‍රධානීන්—ආණ්ඩුවට පමණයි ඒක කරන්නට පුළුවන් වන්නෙ —සෑම ගෙදරකටම ගොස් අපට ඡන්දය දීපන්, නුඹට රක්ෂාව දෙනවාය කිව්වාම මෙවැනි හැඟීම් තවත් තහවුරු වීම පුදුමයක් නොවෙයි.

මැතිවරණ ගැන නොවෙයි මා කථා කරන්නෙ; මේ පැන නැඟී තිබෙන ප්‍රශ්නය ගැනයි. මේ තත්ත්වය තුළ සෑම දරුවකුම අස්ථිර භාවයකින් පසු වෙනවා. එක කාරණයක් අප දන්නවා. මගේ ජීවිතයේදී, මගේ ව්‍යාපාරය සහ පක්ෂය තුළින් මා නොයෙකුත් උදවිය හඳුනා ගෙන තිබෙනවා. රක්ෂාවක් තිබී ඒ රක්ෂාව නැතිව ගොස් රක්ෂාවක් නැති කෙනෙකු බවට පත් වූ බොහෝ දෙනා මා දැක තිබෙනවා. කෙනෙකුගේ රක්ෂාව නැති වුණාම බලාගෙන සිටියදීම ඔහුගේ ගතිගුණ වෙනස් වෙනවා. ඔහුගේ ආත්ම ගෞරවය හීන වෙනවා; ආත්ම ශක්තිය දුර්වල වෙනවා. ඒ මක්නිසාද? ඔහුගේ තත්ත්වයෙහි පැවැත්මෙහි තිබෙන අස්ථිරභාවය නිසයි. අද මුළු පරම්පරාවකට සිද්ධ වී තිබෙන්නේ ඒකයි. අපේ පොඩි ඩන් අතර, අපේ බාලවයස්කාරයන් අතර අපරාධ වැඩිවී තිබෙන්නේ අන්න ඒ හේතුව නිසාය යන්නයි මගේ හැඟීම. මේක වළක්වන්නට බැහැ. පංගුවක් විනිශ්චයකාරවරුන් සිතන අන්දමට තද දඬුවම් පැමිණ වීමෙන් බාලාපරාධ වළක් වන්නට බැහැ. දෙමව්පියන්ට දෙන්නට දෙයකුත් නැති නිසා, හදා ගන්නට පුළුවන් තත්ත්වයකුත් නැති නිසා ගෙද රට කන්නට බොන්නට ක්‍රමයකුත් නැති නිසා අවුරුදු දහසයේ දහඅටේ කොලු පොඩ්ඩෙක් ඔය කවුරුහරි ගංජා විකුණන ගංජාකාරයෙකු යටතේ ගංජා විකුණන් නකු හැටියට හැඩ ගැසෙනවා. අසු වුණොත් අසුවන්නේ කොල්ලායි. ගංජා විකුණුවාය කියා උසාවි ගෙන යන්නේ කොල්ලායි. සමහර විට, ඔය කොල්ලා මාස දෙක තුනක් සිර ගෙයි සිට එළියට ආවාට මොකද, මට ගෙදරට මොනවා හරි කන්න දෙන්නම් කියනවා.

අද ඕනෑම සිරගෙයකට ගිහින් බලන්න. එවා තරුණයන්ගෙන් පිරී ඉතිරී තියෙනවා. අපට එක පැත්තකින් පමණක්—උසාවිය පැත්තෙන් පමණක් මේක බේරා ගන්නට පුළුවන් දෙයක් නොවෙයි; විසඳන්නට දෙයක් නොවෙයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා]

මේක අපරාධ පිළිබඳ ප්‍රශ්නයක් පමණක් නොවෙයි. මේක අළුත් පරම්පරාවට කරන අපරාධයක්. මම ගරු අගමැතිතුමාගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලීමක් කරනවා. අගමැතිතුමනි, කොපමණ ප්‍රශ්න බලපෑවත් මේ අපේ අළුත් පරම්පරාව පිළිබඳ තත්ත්වයට හේතු වන ප්‍රශ්න නොයෙක් පැතිවලින් බැලිය යුතුයි. ආර්ථික පැත්තෙන් පමණක් මේක විසඳන්නට බැහැ. අධ්‍යාපනය පැත්තෙන්, පරිසරය පැත්තෙන්, ආගම් පැත්තෙන්, සංස්කෘතික පැත්තෙන් ආදි නොයෙකුත් පැතිවලින් මේ ප්‍රශ්නයට අප ළඟා වන්නට ඕනෑ. අළුත් පදනමක් මත සමාජය අළුත්වැඩියා කිරීමෙන් මිස මේ ප්‍රශ්නය විසඳන්නට පුළුවන්කමක් නැත යන්නයි, මගේ විශ්වාසය. රට ආර්ථික අතින් සාර්ථක එකක් කළාටත් මේ ප්‍රශ්නය විසඳෙන්නෙ නැහැ. ඒ බව යුරෝපයේ යම් යම් රටවල ඇති වන සිද්ධීන්වලින් අපට පැහැදිලි වෙනවා. ආර්ථික අතින් ඉහළ තත්ත්වයක් ඇති වීමෙන් ගතිගුණ සියල්ලම හැඩගැසෙන්නෙ නැහැ. හැම දෙනාම පිළිගන්නා වූ සමාජයක් අප ඇති කරන්නට ඕනෑ. ඉස්සර සමාජ ක්‍රමය පිළිබඳව තිබුණු පිළිගැනීම දැන් කඩා වැටිලා. පිළිගන්නට පුළුවන් අළුත් සමාජයක් තවම ඇති වී නැහැ. කව්රුත් හිත තුළින්ම පිළිගන්නා වූ සමාජයක් ඇති වන තුරු—මේ තිබෙන පරතරය තුළ—මේ ප්‍රශ්නය පැවතීම කාටවත් නවත්වන්නට බැහැ. ඒ නිසා ඒ විධියට කල්පනා කර මේ ප්‍රශ්නයට ළඟා වන ලෙස මා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා. මා විසින් සඳහන් කළ යුතු වෙනත් ප්‍රශ්න තිබුණත් දැන් වේලාව 6.30 නිසා මගේ කථාව අවසාන කරනවා.

අ. භා. 6.30

**කා. පො. ඉරත්තිනම් මයා.** (කිලිනොච්චි)
*(திரு. கா. பொ. இரத்தினம்—கிளிநொச்சி)*
**(Mr. K. P. Ratnam—Kilinochchi)**

மாண்புமிகு தலைவர் அவர்களே, கௌரவ அகலவத்தைப் பிரதிநிதி (கலாநிதி கொல்வின் ஆர். டி சில்வா) அவர்களுடைய முழக்கத்தின் பின்னர் நான் இங்கு பேசுவதில் மகிழ்ச்சி அடைகிறேன். இன்றைய தினம் எனக்கு முன்பு பேசிய கௌரவ தம்பதெனியப் பிரதிநிதி (திரு. ஆர். ஜீ. சேனநாயக்க) வகுப்பு வாதம் என்றால் என்ன, தாம் ஒரு வகுப்பு வாதி அல்ல, ஏனையோர்தான் வகுப்புவாதிகள் என்று பேசி இங்கு வகுப்புவாதத்தையே கொட்டி இருக்கிறார். உதாரணமாக, குடிவரவு, குடியகல்வுத் திணைக்களத்தில் தமிழ் உத்தியோகத்தர்கள்தான் அதிகமாக இருக்கிறார்கள் என்று அவர் கூறினார்.

ஆனால், இங்குள்ள மதிப்பீட்டில் பதினான்காம் தலைப்பு, பாதுகாப்பு, வெளிநாட்டு அலுவல்கள் அமைச்சரைப் பற்றியது. அந்தத் தலைப்பில் முதலாம் இலக்க வாக்குப் பணத்தில் "ஊழியர் கோப்பும் சம்பளங்களும்" என்ற உப தலைப்பின் கீழ் உயர்பதவி வகிக்கும் உத்தியோகத்தர்கள் இருபதுபேர் இருக்கிறார்கள். ஏனைய பிற பணியாளர்கள் 506 பேர் இருக்கிறார்கள். உயர்பதவி வகிக்கும் இந்த இருபது பேரில் எத்தனை தமிழ் உத்தியோகத்தர்கள் இருக்கிறார்கள் என்பதை நான் பிரதமர் அவர்களிடமிருந்து அறிய விரும்புகிறேன். ஏனெனில் நான் அறிந்த அளவில் பதினைந்து பேருக்குமேல், அதாவது எழுபத்தைந்து சதவிகிதமான உத்தியோகத்தர்கள் இந்தக் குடிவரவு, குடியகல்வுத் திணைக்களத்தில் சிங்கள உத்தியோகத்தர்களாகத் தான் இருப்பார்கள். இப்பொழுது அங்கே தமிழ் உத்தியோகத்தர்கள்தான் கூடுதலாக இருக்கிறார்கள் என்பது பொருத்தமற்ற கூற்றாகும். இத்தகைய கருத்துக்களை இச்சபையிலே பேசுவது பொருத்தமுடையதென்று நான் கருதவில்லை. எனவே, இதுபற்றிய உண்மை நிலையை நான் அறிய விரும்புகிறேன்.

தமிழ் உத்தியோகத்தர் ஒருவர் ஒரு திணைக்களத் தலைவராக இருந்தால் அந்தத் திணைக்களம் முழுவதும் தமிழ் உத்தியோகத்தர்களால் நிரப்பப்பட்டுவிடும் என்றும் அவர் கூறினால் நான் அறிந்த அளவில் எந்த ஒரு திணைக்களத்திலும் அப்படிச் செய்யப்படவில்லை. தமிழர்களைப் பொறுத்த அளவில் திணைக்களங்களில் தமிழ் உத்தியோகத்தர்கள் தலைவர்களாக இருந்தால் அவர்கள் தமிழர்களுக்கு உதவ இன்றைய அரசியற் சூழ்நிலையில் பயப்படுகிறார்கள். சிங்கள மக்களில் நேர்மையானவர்கள் திணைக்களங்களுக்குத் தலைவர்களாக இருந்தால் அவர்களிடம் நாங்கள் நீதி பெறத்தக்கதாக இருக்கின்றது. எனவே, ஆதாரம் எதுவும் இன்றி தமிழ் உத்தியோகத்தர்களைப் பற்றிய கருத்துக்களைத் தெரிவிப்பது வகுப்புவாதம் என்றே நான் குற்றஞ்சாட்ட விரும்புகிறேன்.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தமிழ்ப் படங்கள், தமிழ்ப் பத்திரிகைகள் எல்லாம் எங்களுக்குத் தேவையில்லை என்ற முறையில் தம்பதெனியப் பிரதிநிதி வகுப்பு வாத அடிப்படையில் பேசி இருக்கிறார். பெரும் பான்மை இனத்தவர்களான சிங்கள மக்கள் தான் இன்று இந்த நாட்டை ஆளுகிறார்கள். அமைச்சரவையில் கூட ஓர் அமைச்சரைத் தவிர்ந்த ஏனையோர் சிங்கள இனத்தைச் சேர்ந்தவர்களே. எனவே பெரும்பான்மை இனத்தவர்களால் ஆளப்படுகின்ற ஒரு நாட் டில், பெரும்பான்மை இனத்தவர்களின் உரி மைகள் அழிந்து போகின்றன, அவற்றிற்கா கப் போராடுபவர் ஒருவரும் இல்லை என்று சொல்வது இந்த நாட்டிலே காணப்படும் ஒரு கேலிக்கூத்து என்றே நான் சொல்ல விரும்பு கிறேன். இப்படியாகப் பேசும் பொழுது எப் பொழுதும் தமிழரை இழுத்து இழுத்துப் பொருத்தமற்ற கருத்தைச் சொல்வதுதான் வகுப்புவாதம் என்று நான் தம்பதெனியப் பிரதிநிதி அவர்களுக்குச் சொல்லி வைக்க விரும்புகிறேன்.

திராவிட முன்னேற்றக் கழகம் பற்றியும் இங்கே பெரிய பிரச்சினை எழுந்தது. அதனால் பிரதமர் அவர்களுடைய பேச்சுக்கூட இங்கு சூட்டைக் கிளப்பக்கூடியதாக இருந்தது. ஆயி ரத்து எண்ணூறு ஆண்டுகளுக்கு முன்னர் தமிழ் நாட்டில் இயற்றப்பட்ட புத்த காப்பிய மான மணிமேகலையில் ஒரு பித்தனைப் பற்றி வர்ணிக்கப்படுகின்றது. அந்த வர்ணனை, அந் தப் பித்தன் தன்னுடைய நிழலோடு சண்டை போடுவதைப் பற்றியது. அந்தப் பித்தன் தன் நிழலோடு சண்டை போடுவதைப் போன் றதுதான் இந்த நாட்டில் தி. மு. க. பற்றிய பேச்சு ஏச்சுக்களும். இந்த நாட்டில் நாம் தமி ழர் இயக்கம் இருக்கின்றது என்று கூறுகிறார் கள். இத்தகைய இயக்கங்களின் முயற்சிகளை எல்லாம் ஆராய்ந்த பொலிஸ் பகுதியினர் ஓர் அறிக்கையை வெளியிட்டு இருக்கிறார்கள். அந்த அறிக்கையில் அவர்கள் இவ்விடயத் தைப் பெருப்பித்துக் கூறி இருக்கின்றார்கள் என்றுகூடச் சொல்லலாம். என்றாலும் அவர் களுடைய அந்த அறிக்கை ஒரு பொருத்த மான அறிக்கையாக இருக்கின்றது. அந்த அறிக்கைப்படி இங்கு தி. மு. க. இயக்கம் பற்றி எவரும் பயப்படத் தேவை இல்லை. தமிழ் நாட்டிலே இருக்கின்ற திராவிட முன் னேற்றக் கழகத்தினர் இங்கேயுள்ள திராவிட முன்னேற்றக் கழகத்திற்கும் தங்களுக்கும் எவ்விதமான தொடர்பும் இல்லை [illegible]ஙிய பின்னரும் கூட, இந்த நாட்டிலே அந்தத் திராவிட முன்னேற்றக் கழகத்தை இழுத்துக் கொண்டு தமிழ்பேசும் மக்களுக்கும் சிங்கள மக்களுக்குமிடையே வகுப்புவாதத்தைத் தேவையில்லாத முறையிலே வளர்ப்பது இந்த நாட்டின் தன்மையை விரும்பும் எவரும் வெறுக்கத்தக்கது.

வீரகேசரிப் பத்திரிகையைப் பற்றி இங்கே பலர் கூறி, "முரசொலி" என்ற பத்திரிகை யிலே வந்த செய்தியை அது வெளியிட்டது என்று கூறினார்கள். இங்கே வெளியிடப்படு கின்ற ஆங்கில நாளேடுகளும் கூட இந்தியப் பத்திரிகைகளிலே வருகின்ற செய்திகளை வெளியிட்டுவருகின்றன. இன்று இங்கே பத்தி ரிகைத் தணிக்கை நடைமுறையிலே இருக்க வில்லை. விரும்பிய செய்திகள் எவற்றையும் வெளியிடத்தக்கதாக இருக்கும் பொழுது, ஒரு பத்திரிகையிலே வந்த் ஒரு குறித்த செய் தியை ஒரு பெரும் குற்றமாக—அதைத் தேசத்துரோகம் என்று—கூறுவதற்கு என்ன நியாயமிருக்கிறது என்று எனக்குத் தெரிய வில்லை.

தலவாக்கலையில் நடந்த சில நிகழ்ச்சி களைப் பற்றியும் இங்கு கூறினார்கள். தலவாக் கலையிலே நடந்த நிகழ்ச்சிகள், சில வியாபாரி களின் சூழ்ச்சியால் தோன்றினாலும், சில வகுப்புவாதிகளின் தூண்டுதலினாலேயே அவை நடந்தன. அதைப் பொலிசார் உரிய நேரத் திலே—உடனடியாகத் தடுக்காவிட்டாலும்— வேண்டிய சில நடவடிக்கைகளை எடுத்துத் தடுத்து வைத்திருக்கிறார்கள். இதற்கும் அடிப் படைக் காரணத்தை நான் இங்கே சொல்ல வேண்டும். தோட்டப் பகுதிகளிலே வாழு கின்ற தமிழர்கள் இன்று மிகவும் இக்கட்டான நிலையிலே வாழ்கிறார்கள். தேயிலையின், இறப் பரின் விலை குறைந்தபடியால் அவர்களுக்கு மூன்று அல்லது நான்கு நாட்களுக்கு மட்டும் தான் வேலை கிடைக்கிறது. ஒரு வாரத்தில் ஆறு நாட்கள் வரை வேலை செய்த கணவன், மனைவி, பிள்ளைகள் எல்லோரும் இன்று வாரத் தில் இரண்டு அல்லது மூன்று நாட்கள் மட் டுமே வேலை செய்கின்றபடியால் அவர்களு டைய பொருளாதாரம் பாதிக்கப்பட்டுவிட் டது. அவர்களுடைய பிள்ளைகளுக்குக் கல்வி யூட்ட வசதியில்லாமல் போய்விட்டது. தப் பித் தவறிப் படித்த மக்களுக்கு உத்தியோகம் பெற வழியில்லாமல் போய்விட்டட்து. எனவே அவர்களுடைய பொருளாதாரம் சீர்குலைந் [illegible]த் தொழிலாளர்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org
PUBLIC LIBRARY
JAFFNA.

[ඉරත්තිනම් මයා.]

கள் பொறுக்கமுடியாத ஒரு நிலையில்—தங்களை அடக்க முடியாத ஒரு நிலையிலே—இருக்கிறார்களென்பதை நாம் மறுக்கக் கூடாது. இவ்விதமான தொல்லைகள் அவர்களுக்குப் பெரும் பிரச்சினையாக இருக்கின்றது. தோட்டத் தொழிலாளர்கள் இந்த நாட்டிலே அடிமை வாழ்வுதான் வாழ்கிறார்கள். அவர்கள் இந்த நாட்டு மக்களாக இல்லாமலிருக்கலாம். ஆனால், மனிதப் பண்பு படைத்த எவரும், அவர்கள் இன்று நல்ல வாழ்க்கை வாழ்கிறார்களென்று சொல்ல முடியாது. சில நேரம், அவர்கள் அங்கே வேலையில்லையென்று சொல்லி வேலை தேடி என்னுடைய தொகுதியான கிளிநொச்சிக்கும் வவுனியா போன்ற தொகுதிகளுக்கும் வந்தால் அவர்களைக் கள்ளத் தோணிகள் என்று பிடித்து அடைக்கும் சூழ்நிலை இருக்கிறது. அவர்கள் எங்கே போய்ப் பிழைக்கலாம்? இப்படிப்பட்ட சில சூழ்நிலைகள் அவர்களுக்கு வாய்ப்பாக இல்லாமல் வரும்பொழுது—இத்தகைய கலவரங்கள் வரும். அவர்களுக்கு பிழைக்க வேண்டிய—தங்கள் வருவாயைப் பெறவேண்டிய—ஒரு சூழ்நிலையை ஏற்படுத்த வேண்டுமென்பதைத் தான் இது விடயமாக நான் இங்கே வற்புறுத்த விரும்புகிறேன்.

அகலவத்தைப் பிரதிநிதி ஒரு விடயத்தைப் பற்றிக் கூறினர். எங்கள் கட்சியைப் பொறுத்தவரையிலே இது மிகவும் பிரதானமானதாகும். ஏனென்றால் ஆளும் கட்சியிலிருக்கின்ற பிரதம அமைச்சர் மட்டும் கூறவில்லை; எதிர்க் கட்சியிலேயிருக்கின்ற சிறந்த சட்டநிபுணரான அகலவத்தைப் பிரதிநிதிகூட ஸ்ரீமாவோ—சாஸ்திரி உடன்படிக்கையின்படி, இங்கே ஆக்கப்பட்ட சட்டத்திலே, கட்டாய நாடு கடத்தல் இல்லையென்று கூறியிருக்கின்றார். எங்களுக்கெதிராகச் சிலரால் கட்டிவிடப்பட்ட பொய்யுரை என்னவென்றால் நாங்கள் கட்டாய நாடுகடத்தலுக்கு உடன்பட்டோம் என்பதுதான். நாங்கள் கௌரவ டட்ளி சேனநாயக்க அவர்களின் அரசாங்கத்துக்கு மலைநாட்டுத் தமிழரை விற்றுவிட்டோம்; நாங்கள் முன்பு மலைநாட்டுத் தமிழர்களுக்காகப் பேசினோம்; இன்று அவர்களை விற்றுவிட்டோமென்று சொல்லுகின்ற பொய்யுரைக்கு அகலவத்தைப் பிரதிநிதி இச்சபையிலே நல்ல முறையிலே பதில் கூறியிருக்கிறார். எனவே பொய்யை இன்னும் விற்று விற்றுப் பிழைக்காமல் இருக்கும்படி எங்களுக்கு எதிராகப் பொய்ப் பிரசாரம் செய்கின்றவர்களை நாங்கள் கேட்டுக்கொள்ளுகிறோம்.

அடுத்ததாக, அகலவத்தைப் பிரதிநிதி காணி பதிதலைப் பற்றியும் இங்கே சில வழிவகைகளைக் கூறினர். ஆனால், அந்த வழிவகைகள்கூட, இதிலே சம்பந்தப்பட்ட சிறுபான்மை இனத்தைச் சேர்ந்த தமிழ் மக்கள், முஸ்லிம் மக்களுக்கு—அவர்கள் இந் நாட்டுப் பிரசைகள் என்ற முறையில் தம்முடைய காணிகளை உடனடியாகப் பதிய வேண்டிய வாய்ப்புக்களை விரைவிலே கொடுக்கா என்பது என்னுடைய கருத்து. அவர்களிடத்திலேயிருக்கின்ற சில பத்திரங்களை ஆதாரமாகக் கொண்டு—உணவுப் பங்கீட்டுப் புத்தகங்கள், வாங்காளர் இடாப்புக்கள் முதலியவற்றை ஆதாரமாகக் கொண்டு இந்த நாட்டுக் குடிமக்களுக்கு—விசேடமாகத் தமிழர்களுக்கும் முஸ்லிம்களுக்கும்—காணிகளை விரைவிலே பதிவுசெய்துகொள்ள வேண்டிய வாய்ப்பைக் கொடுக்க அரசாங்கம் முன்வரவேண்டுமென்று நான் கேட்டுக் கொள்ளுகிறேன்.

குடிவரவு, குடியகல்வுத் திணைக்களத் தலைவர்களைப் பற்றியும் நான் கூற வேண்டும். அவர்கள் உண்மையிலேயே மிகவும் கஷ்டமான ஒரு பதவியை வகிக்கின்றார்கள். என்னைப் பொறுத்தவரையிலே என்னுடைய தொகுதியில் நான் பாராளுமன்ற உறுப்பினராக வந்த காலத்திலே ஏறக்குறைய 2,000க்கு மேற்பட்ட நாடற்றவர்கள் இருந்தார்கள். இவர்கள் அந்த நேரத்திலே—நான் பாராளுமன்ற உறுப்பினனாக வந்த அந்தக் காலத்திலே—பயந்து வீதிக்கு வர மாட்டார்கள்; சந்தைக்கு வர மாட்டார்கள்; கடைகளுக்கு வர மாட்டார்கள். இவர்களில் கள்ளத் தோணிகள் எனப்படுபவர்கள் யாராவது சிலர் இருக்கலாம். ஆனால் நூற்றுக்குத் தொண்ணூற்றைன்பது வீதமானவர்கள் நாடற்றவர்கள். 1949 ஆம் ஆண்டுக்கு முன்னும் பின்னும் கிளிநொச்சித் தொகுதிக்குப் போய் உணவு உற்பத்தியில் ஈடுபட்டிருந்தவர்கள். இவர்களுக்கு அந்தக் காலத்திலே என்ன நடந்தது? இவர்கள் வெளியே வந்தால்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

உடனே வழியிலே, தெருவிலே பொலிசார் பிடித்துக் கொண்டு போவார்கள். அங்கே தரகர்கள் இருப்பார்கள். பணம் வாங்குவார்கள்; விடுவார்கள்; திரும்பப் பிடிப்பார்கள். இதனை நான் குடிவரவு குடியகல்வு திணைக்களக் கட்டுப்பாட்டாளருக்கும் பிரதம அமைச்சருக்கும் பொலிஸ் தலைவருக்கும் எடுத்து விளக்கியதன் பயனாக இன்று கைக்கூலி ஒழிந்து விட்டது. இன்று அந்த மக்கள் நல்ல முறையிலே வாழத்தக்கதாக இருக்கிறது. இன்று நாடற்றவர்கள் மீது பகைமை கொணடவர்கள் அவர்களைக் காட்டிக் கொடுத்தாலும், அரசாங்கம் அவர்களை துன்புறுத்தல் குறைந்திருக்கிறது. அதற்காக நான் பாதுகாப்பு, வெளிநாட்டலுவல்கள் அமைச்சிலுள்ள உத்தியோகத்தர்களுக்கும், குடிவரவு, குடியகல்வுத் திணைக்களக் கட்டுப்பாட்டாளருக்கும், பொலிஸ் தலைமை அதிபருக்கும் இந்தச் சபையிலே நன்றி தெரிவிக்கக் கடமைப்பட்டவனாக இருக்கிறேன். ஏனெனில், நாங்கள் சொல்வதிலுள்ள நீதியை உணர்ந்து அவர்கள் நடந்திருக்கிறார்கள்.

ஒரு காலத்திலே, அமைச்சரொருவர் எனது தொகுதிக்கு வந்தபொழுது என்னுடைய காணியிலே சில கள்ளக்குடியேற்றக்காரர்கள் இருக்கிறார்கள் என்று தாம் அறிவதாக எனக்குச் சொன்னார். அப்பொழுது நான் அவருக்கு, "எனக்கு இங்கே காணியும் இல்லை. கள்ளக்குடியேற்றக்காரர்கள் வேலை செய்யவும் இல்லை" என்று சொன்னேன். இப்படியாகக் கதை கட்டிவிட்டாலும், இப்பொழுது நாடற்ற மக்களுக்கு அதிகமாக அநியாயம் நடைபெறாமலிருப்பதனாலே அரசாங்க உத்தியோகத்தர்கள் நான் சொல்வதிலுள்ள நேர்மையை உணர்ந்து, உண்மையை உணர்ந்து நடக்கிறார்கள் என்று சொல்வதற்கு நான் பின் நிற்கவில்லை.

எனக்குத் தரப்பட்ட நேரம் மிக அண்மி விட்டது. அதற்கிடையில் ஒன்றை மாத்திரம் கூற விரும்புகிறேன். என்னுடைய தொகுதியிலே இருக்கும் பொலிஸ் நிலையத்திலே பொலிஸ்காரர்கள் தங்கி வாழ்கிற இடங்கள்—இவர்களுடைய விடுதிகள்—போதிய அளவு சிறப்பாக அமையவில்லை. அவர்கள் மிகவும் கஷ்டப்படுகிறார்கள். கிளிநொச்சித் தொகுதி குடியேற்றத்திட்டத்தைச் சேர்ந்த இடமாதலால் வீடுகளும் எடுக்க இயலாது. ஆதலால், அவர்கள் அங்கே வாழ்வதற்கு வேண்டிய வசதியை பிரதமர் செய்து கொடுக்க வேண்டும்.

எனக்கு முன் பேசிய பலர், பொலிஸ்காரர்களுக்கு, விசேடமாக கீழ்ப்படியில் உள்ள பொலிஸ்காரர்களுக்கு, உபபரிசோதகர்களுக்கு சம்பளத்தை உயர்த்த வேண்டும் என்றும், அப்படியாகச் சம்பளத்தை உயர்த்தினால்தான் அவர்கள் நல்ல முறையிலே வேலை செய்வார்கள் என்றும் கூறினார்கள். நானும் அதே கருத்தை இந்தச் சபையிலே இதற்கு முன்னரும் பல முறைகள் தெரிவித்திருக்கிறேன். அவர்கள் இருபத்திநாலு மணிநேரமும் வேலை செய்பவர்கள். அவர்களுடைய சம்பளத்தை உயர்த்திக் கொடுத்து அவர்கள் கஷ்டம் இல்லாமல் வாழத் தக்க நிலையை உண்டாக்க வேண்டியது அரசாங்கத்தின் கடமை என்பதை மீண்டும் நான் வற்புறுத்திக் கூற விரும்புகிறேன்.

இப்படியாகப் பல துறைகளிலே நாங்கள் சொன்ன குறைகளையெல்லாம் கேட்டுச் சில திருத்தங்கள் செய்யப்பட்டாலும் தமிழ்ப் பகுதிகளிலேயுள்ள பொலிஸ் உத்தியோகத்தர்கள், பிரதானமாக பொலிஸ் கொன்ஸ்ரபிள்கள் தமிழிலே முறையிடுபவர்களுடைய பதிவைத் தமிழிலே செய்யாமல் இருப்பதாலும்—சில வேளைகளில் செய்தாலும் அவை திருத்தமாக இல்லாமலிருப்பதனாலும்—தமிழ்ப் பகுதியிலேயுள்ள மக்கள் விரத்தியடைந்திருக்கிறார்கள். சொந்தப் பகுதியிலோ, சொந்த மாகாணத்திலோ பொலிஸ் கொன்ஸ்ரபிள்கள் வேலைகள் செய்யக் கூடாது என்று ஒரு பிரமாணம் இருப்பதனாலேயே, தமிழர்கள், தமிழ் தெரிந்த பொலிஸ்காரர்கள் தமிழ்ப் பகுதிகளில் இல்லாமல் மாற்றப்படுகிறார்கள் என்று கூறப்படுகின்றது. இதனை நான் முன்னர் பல முறை குறிப்பிட்டிருந்தாலும், இந்த நேரத்திலும் இதனைக் குறிப்பிட விரும்புகிறேன். இதை மாற்றியமைத்து தமிழ்ப் பகுதிகளுக்கு தமிழ் தெரிந்தவர்களை அனுப்புங்கள் என்று கேட்டுக் கொள்கிறேன். நாங்கள் சிங்கள பொலிஸ்காரர்களை அனுப்ப வேண்டாம் என்று சொல்லவில்லை. தமிழ் தெரிந்தவர்களை அனுப்புங்கள் என்றுதான் கேட்கிறோம். சிங்கள பொலிஸ்காரர்கள் தமிழ்த் தேர்ச்சிப் பரீட்சைகளில் சித்தியடைந்தால் அவர்களுக்கு இரண்டு அல்லது மூன்று சம்பள உயர்வுகளைக் கொடுங்கள். இந்த முறையில் செய்தால்தான் தமிழ்ப் பகுதிகளிலே, தமிழிலே காரியத்தைச் செய்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉරත්තිනම් මයා.]
யக் கூடிய முறையிலே பொலிசாரை நீங்கள் அங்கே அனுப்ப முடியும் என்பதைக் கூறி எனது உரையை முடித்துக் கொள்கிறேன்.

අ. භා. 6.45

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்ளி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

Mr. Chairman, it is not surprising that many matters have been raised on the Votes coming under Heads 14 to 18 which cover such subjects as external affairs, army, navy, air force, immigration, missions abroad and various others in which hon. Members of this House are particularly interested.

So many matters have been raised during the course of this discussion, but I do not intend answering or referring to every one of them, for the reason that some of them were really for my information so that I could follow them up, or my Ministry could follow them up, and take proper action. But certain very important matters have been raised and I shall deal with them.

Firstly, the hon. Member for Yatiyantota (Dr. N. M. Perera) raised the question of the Maritime Agreement with China. I find that this matter was raised on an earlier occasion, in 1966, and I gave an answer, and I am giving the same answer on this occasion.

"MR. F. R. DIAS BANDARANAIKE :

The Hon. Prime Minister forgets to refer to the Maritime Agreement with China.

THE HON. DUDLEY SENANAYAKE :

As far as the Maritime Agreement with China is concerned, on the last occasion I said that we would discuss the matter with the Attorney-General—

MR. F. R. DIAS BANDARANAIKE :

And China.

THE HON. DUDLEY SENANAYAKE :

We discussed it with the Attorney-General and the result is that it has been found that the Agreement is very loosely worded and capable of interpretation in various ways.

MR. F. R. DIAS BANDARANAIKE :

Does it damage our sovereignty.

THE HON. DUDLEY SENANAYAKE :

So far it has not been adversely acted upon by China as far as we are concerned, and therefore—

MR. F. R. DIAS BANDARANAIKE :

Is it dangerous ?

THE HON. DUDLEY SENANAYAKE :

So far it has not been dangerous.

DR. N. M. PERERA :

Does it infringe our sovereignty ?

THE HON. DUDLEY SENANAYAKE :

There are various ways in which it may be interpreted ; and if such an occasion arises we would certainly take the necessary action."—[OFFICIAL REPORT, 20th August 1966 ; Vol. 69, c. 448-50.]

That is the reply I gave then and that is the reply I give now.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

O. K.

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்ளி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

I hope you are satisfied.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

I am not.

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்ளி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

Why ?

The other matter raised was as regards the police. Various matters pertaining to the police were raised. I well remember the Committee stage discussion last year. Then I think the police got praised by all quarters. The marked improvement in the police was noticed and

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

